# කොරෝනා මරණ ඔට්ටමාවඩියේ භූමදානයට ගත් තීරණය ධීවර ඇමැතිගේ ප්‍රශංසාවට

ඉරණතිව් ප්‍රදේශයේ කොරෝනා මරණ භූමදානය නොකර ඔට්ටමාවඩි ප්‍රදේශයේ භූමදානයට රජය ගත් තීන්දුවට ධීවර ඇමැතිවරයා සිය ප්‍රශංසාව පිරිනමා තිබේ.

කොරෝනා මරණ භූමදානය කිරීම සඳහා රජය විසින් ඉරණතිව් ප්‍රදේශය තෝරා ගනු ලැබ තිබු අතර ඒ පිළිබඳ විවිධ පාර්ශව වෙතින් විරෝධය එල්ලවිය.

උතුරු නැගෙනහිර දමිළ ජනතාවගේ ගැටලු විසඳීමට සෘජුවම මැදිහත් වූ ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා මේ පිළිබඳව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ හා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහත්වරුන් සමඟ සාකච්ඡා කර ඉරණතිව් ප්‍රදේශයේ එම භූමදාන කටයුතු සිදු නොකරන ලෙස ඉල්ලීමක් කළේය.

කොරෝනා රෝගයෙන් මිය යන අයගේ මෘත දේහ මඩකළපු ඔට්ටමාවඩි සුඩුපත්තිනසේනෙයි ප්‍රදේශයේ පෙරේදා(7) දින සිට භූමදානය කිරීමට ගත් තීන්දුව අගැයීමට ලක්කරන ඇමැතිවරයා පෙන්වා දෙන්නේ විශේෂයෙන් රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන ඉරණතිව් වැනි දූපත් රැකගැනීම රජයක වගකීමක් බවයි.

# යාපනයේ දී මිය ගිය කාන්තාවකට කොරෝනා:

## දිස්ත්‍රික්කයේ ආසාදිතයෝ 21ක්



උතුරු පළාත් විශේෂ
රසුල දිල්හාර ගමගේ

යාපනය පේදුරුතුඩුව රෝහලේදී මියගිය වයස අවුරුදු 78 ක කාන්තාවකට කොරෝනා වෛරසය ආසාදිතව තිබූ බව උතුරු පළාත බාර නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඒ.කේතීස්වරන් මහතා ප්‍රකාශ කළේය.

එම කාන්තාවගේ දියණිය ගුරුවරියක වන අතර මුලින්ම ඇයට රෝගය ආසාදනය වී තිබූ බව පරීක්ෂණ වලදී හෙළි වී තිබේ. මෙම කාන්තාවගේ මරණයත් සමගම යාපනයේදී කොරෝනා රෝගයෙන් මෙතෙක් මියගොස් ඇති සංඛ්‍යාව දෙකක් දක්වා ඉහළ ගොස් තිබේ.

කෙසේ වෙතත් මියගිය කාන්තාවගේ ආදාහන කටයුතු යාපනයේ කොම්බෙයන්මනල් ආදාහනාගාරයේදී සිදු කළ බවද කේතීස්වරන් මහතා පැවැසීය.

මේ අතර උතුරු පළාතෙන් කොරෝනා රෝගීන් 21 දෙනෙකු පසුගය 08දා හමු වූ බව සඳහන් කළ නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ඔවුන් සියලුම දෙනා හමු වී ඇත්තේ යාපනය දිස්ත්‍රික්කයෙන් බවද පැවසීය.

යාපනයේ කරෙයිනගර් ප්‍රදේශයෙන් රෝගීන් 8 ක්,කයිට්ස් ප්‍රදේශයෙන් රෝගීන් 9 ක්, හා උඩුවිල් ප්‍රදේශයෙන් 4 ක් ආදී වශයෙන් රෝගීන් හමු වී ඇති අතර එදින යාපනයේ විවිධ පළාත් වල පී.සී.ආර්.පරීක්ෂණ 387 ක් සිදු කොට තිබේ.

# කාන්තා දිනය සමරමින් හිටපු ජනපති මෛත්‍රී පලතුරු පැළ බෙදයි

"අභියෝග ජයගනිමු" තේමාව මුල්කර ගනිමින් ශ්‍රී ලංකා නිදහස් කාන්තා පෙරමුණ ජාත්‍යන්තර කාන්තා දිනය ඊයේ (08) පක්ෂ මූලස්ථානයේදී පක්ෂයේ සභාපති හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන, මහලේකම් දයාසිරි ජයසේකර මහතා හා පක්ෂ මැති ඇමැතිවරුන්ගේ සහභාගීත්වයෙන් සැමරීමෙන් අනතුරුව හිටපු ජනපතිවරයා පැමිණි පිරිසට පලතුරු පැළ බෙදා දුන්නේය. පවතින කොවිඩ් අවදානම යටතේ පක්ෂයේ පළාත් පාලන මන්ත්‍රීවරියෝ පමණක් මේ අවස්ථාව සඳහා සහභාගී වූහ.

ඡායාරූප - දුෂ්මන්ත මායාදුන්න



# කොරෝනා පතුරන පුද්ගලයන් අල්ලන්න විශේෂ කණ්ඩායම්

සුභාෂිණී සේනානායක සහ රක්ෂණා ශ්‍රියන්ත

කොවිඩ් වයිරසය ව්‍යාප්ත කරන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට විශේෂ පොලිස් කණ්ඩායම් යොදවා ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

මෙම වැටලීම් වලදී ඔක්තෝබර් 20 වනදා සිට මේ දක්වා නිරෝධායන නීති උල්ලංඝණය කළ පුද්ගලයන් 3335 දෙනෙකු අත්අඩංගුවට ගත් බව ද ඒ මහතා කියා සිටියේය.

මේ වන විට ඔවුන් අතරින් පුද්ගලයින් 3300කට නිරෝධායන ආඥා පනත යටතේ නඩු පවරා ඇති බව කියා සිටි අජිත් රෝහණ මහතා මෙලෙස හැසිරෙන පුද්ගලයන් සම්බන්ධයෙන් නීතිය තදින්ම ක්‍රියාත්මක කරන බවද කීවේය.

එමෙන්ම ගතවූ පැය 24 තුළ දී නිරෝධායන නීති උල්ලංඝණය කළ තවත් පුද්ගලයන් දසදෙනෙක් අත්අඩංගුවට ගත් බවද ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

# කෝවිල් කමිටු රැස්වීමේදි මිය ගිය මස්කෙළියේ අයකුට කොරෝනා

මස්කෙළිය සමූහ - ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක

මස්කෙළිය, ශ්‍රී ෂන්මුගනාදන් හින්දු කොවිලේ, කෝවිල් කමිටුවේ රැස්වීමකට පසුගියදා (06) සහභාගී වෙමින් සිටියදී හදිසියේ රෝගාතුරුවී මිය ගිය පුද්ගලයකු කොරෝනා ආසාදිත බවට පි.සී.ආර්.පරීක්ෂණයෙන් සනාථ වි ඇති බව මස්කෙළිය මහජන සෞඛ්‍ය පරීක්ෂක නරේන්ද්‍ර කුමාර් මහතා දන්වයි.

ඉකුත් (06) දා මෙසේ මියගොස් ඇත්තේ, මස්කෙළිය, සාමිමලේ මාර්ගයේ පදිංචිව සිටි වී.ජෙයප්‍රකාෂ් නැමති (51) හැවිරිදි අවිවාහක පුද්ගලයෙකි.මෙම පුද්ගලයා රෝගී වීමෙන් පසුව මස්කෙළිය නගරයේ පිහිටි පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් වෙත ප්‍රථමයෙන් ගෙන ගොස් ඇති අතර අසාධ්‍ය තත්ත්වයේ පසුවූ නිසා මස්කෙළිය ප්‍රාදේශිය රෝහල වෙත ඇතුලත් කිරීමෙන් පසුව මිය ගොස් ඇත. මොහුගේ පී.සි.ආර්. පරීක්ෂණ වාර්තාව (08) ලැබුණු බවත්, ඒ අනුව ඔහු කොරෝනා රෝගී බවට සනාථ වී ඇති බවත් මස්කෙළිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය පවසයි.

මියගිය අයගේ මළ සිරුර මුද්‍රා තබා දික්ඔය මූලික රෝහල් මෘත ශරීරාගාරයේ තැන්පත් කර තිබුණු අතර ආදාහන කටයුතු නිරෝධායන නීති අනුව (08) දින සිදු කෙරුණි.

# අලි වැට රැකීමේ බළකාය පුහුණුවීම් අරඹයි

සුභාෂිණී සේනානායක

අලි මිනිස් ගැටුම පාලනය කර මිනිස් ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම සඳහා ආරම්භ කළ අලිවැට රැකීම පුහුණු කිරීමේ බළකායට අවශ්‍ය පුහුණුව ලබා දීම පසුගිය දා ත්‍රිකුණාමලය කුච්චවේලි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදි ආරම්භ කෙරිණි.

එම ව්‍යාපෘතිය භාරව කටයුතු කරන සංරක්ෂණ පර්යේෂණ ආයතනයේ ආචාර්ය පෘථිවිරාජ් ප්‍රනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ අතර නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මියගේ මුලිකත්වයෙන් මෙම අලිවැට රැකීම පුහුණු කිරීමේ බළකාය ආරම්භ කෙරිණි.

මූලික උපදෙස් ලබා දීමෙන් අනතුරුව ඔවුන්ට අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව ලබා දිම සඳහා කුච්චවේලි ප්‍රදේශයේ අලුතින් ඉදි කළ අලි වැට නිරීක්ෂණය කිරීමටද මෙම පිරිස සහභාගි වූහ. මෙසේ ප්‍රධාන කණ්ඩායම පුහුණු වීමෙන් අනතුරුව ඔවුන් ග්‍රාමීය මට්ටමින් තවත් කුඩා කණ්ඩායම් සඳහා මෙම පුහුණුව ලබා දීමට නියමිත අතර විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරමින් ඉදි කරන මෙම අලිවැට නිසි ලෙස නඩත්තු නොකිරීම අලිමිනිස් ගැටුම උත්සන්න වීමට හේතුව බව සංරක්ෂණ පර්යේෂණ ආයතනයේ මතය වි තිබේ.

ඊට අමතරව විදුලි වැට නිසියාකාරයෙන් ඉදි නොකිරීම ද මේ සඳහා හේතුවක් වී ඇත. මීට පිළියමක් ලෙස අලිවැට ආරක්ෂා කිරීමේ විශේෂ බලකායක් ප්‍රාදේශිය මට්ටමින් ඇති කිරීමට සංරක්ෂණ පර්යේෂණ ආයතනයේ මැදිහත් වීම මත ආණ්ඩුකාරවරිය පියවර ගත්තාය.

මෙම බළකාය සඳහා ගොවි සමිති නියෝජිතයකු සිවිල් ආරක්ෂක බළකායෙන් සාමාජිකයන් දෙදෙනකු ප්‍රාදේශිය ලේකම් කාර්යාල නියෝජිතයකු ග්‍රාම නිළධාරි සහ වනජීවි දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිළධාරියෙකු බැගින් පත් කර ඇත. එම බළකායේ අධීක්ෂණ කටයුතු සිදුවන්නේ අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහාය.

දෙවැනි සහ තුන්වෙනි අදියර යටතේ මෙම බළකාය අම්පාර සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වලද ස්ථාපනය කිරීමට ද ආණ්ඩුකාරවරිය වැඩිදුරටත් උපදෙස් දුන්නාය.

# මුහුදුබඩ මාර්ගයේ ධාවනයට මැදිරි 10ක් ඉන්දියාවෙන් එයි

සුභාෂිණී සේනානායක

ඉන්දියාවේ නිෂ්පාදිත දුම්රිය මැදිරි 10 ක් කොළඹ වරායට ඊයේ (9) ළගා වීමට නියමිතව තිබූ බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පවසයි.

ඉන්දියාවේ චෙන්නායි නගරයේ පිහිටි අයි.සී.එෆ් නිෂ්පාදනාගාරයේ නිෂ්පාදිත දුම්රිය මැදිරි 10ක් ඇනවුම් කළ බවත් එම දුම්රිය මැදිරි ඒ අනුව මෙරටට ළගා රැගෙන එන බවත් අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරි ප්‍රධාන ඉංජිනේරු යාන්ත්‍රික කීර්ති හේවාවිතාරණ මහතා කියා සිටියේය.

ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මෙරටට ආනයනය කිරීමට නියමිතව තිබූ මැදිරි 160 න් දුම්රිය මැදිරි 10 ක් මෙසේ ගෙන එන බවත් මෙම එක මැදිරියක් සඳහා වැය වන මුදල මිලියන 80 ක් බවත් හේවාවිතාරණ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

මෙම මැදිරි මීට පෙර මෙරටට ගෙන්වන ලද (M11) දුම්රිය එන්ජින් සඳහා සැකසු මැදිරියි. මෙලෙස ගෙන්වනු ලබන එම මැදිරි පහත රට ප්‍රධාන මාර්ගයේ සහ මුහුදුබඩ මාර්ගයේ ධාවනය කිරීමට නියමිත බවද ඒ මහතා කියා සිටියේය.

එමෙන්ම මෙරටට ගෙන්වීමට නියමිත දුම්රිය මැදිරි 160 යටතේ තිරිංග මැදිරි 17 ක්, භාණ්ඩ ප්‍රවාහන තිරිංග මැදිරි 8 ක් තුන්වෙනි පන්තියේ මැදිරි 41 ක්, දෙවන පන්තියේ මැදිරි 42 ක්, වායු සමනය කළ මැදිරි 35ක්, අවන්හල් වර්ගයේ මැදිරි 13ක් ඒ අනුව ඉදිරියේදී මෙරටට ගෙන්වීමට නියමිත බවත් ඒ මහතා වැඩිදුරටත් කියා සිටියේය.



# බෙරලපනාතර සමුපෙට වසර 50යි: 5000කට නොමිලේ ඇස් පරීක්ෂාව

තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ

ඌරුබොක්ක, බෙරලපනාතර විවිධ සේවා සමුපකාර සමිතියට වසර 50ක් පිරීම නිමිත්තෙන් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සිදු කරනු ලැබූ ප්‍රජා සත්කාරක සේවාවන් අතර නොමිලේ ඇස් පරික්ෂා කිරීමේ ජංගම අක්ෂි සායන ඉතා දුෂ්කර ගම්මාන කේන්ද්‍ර කර ගනිමින් පැවැත්විණි.

ඇඹිලිපිටිය සුවනෙත දෘෂ්ඨි විශේෂඥ ආයතනයේ නවීන පන්නයේ බස් රථයක් උපයෝගී කරගනිමින් දක්ෂ පළපුරුදු කාර්ය මණ්ඩලයක් යටතේ එම සායන පැවැත් වීම විශේෂත්වයකි. දින 27 ක් පුරා පැවති එම අක්ෂි සායන තුළින් ප්‍රදේශයේ 5000කට අධික පිරිසකගේ ඇස් පරීක්ෂා කිරීම නොමිලේ සිදු කිරීම සම්බන්ධයෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි සතුට පළ කර සිටිති. බෙරලපනාතර විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති ජයන්ත සේසිරි මහතා ඇතුළු කාර්ය මණ්ඩලය විසින් එම වැඩ වැඩසටහන සංවිධානය කර තිබුණි.



# අවිස්සාවේල්ලේ ග්‍රාමීය බැංකු 24ක් තැන්පත්කරුවන්ට මුදල් ආපසු දී නෑ

## ඇමැති බන්දුල ගුණවර්ධන

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

අවිස්සාවේල්ල නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතිය විසින් පාලනය කරන ග්‍රාමීය බැංකු 24ක තැන්පත්කරුවන්ට අයත් රුපියල් මිලියන 545ක් 2015 වසරේ සිට තැන්පත්කරුවන්ට ආපසු දී නැතැයි වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (09) ප්‍රකාශ කළේය.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. එම්. මරික්කාර් මහතා මතු කරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'බැංකු 24කට අයත් 1,15,000 වන තැන්පත්කරුවන්ට අයත් මුදල් මෙලෙස දී නෑ. එම සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කර නව පාලක මණ්ඩලයක් යටතේ විවිධ සේවා සමුපකාර සමිතියේ පාලන කටයුතු සිදුකරගෙන යෑම මේ වන විට සිදු කරනවා. එම තැන්පත් මුදල නැවත තැන්පත්කරුවන්ට දීමට මැදිහත් වෙනවා.

මහ බැංකුවේ ලියාපදිංචිය නොමැති ප්‍රාථමික ගැණුම්කරුවකු වන එන්ට්‍රස්ට් ලිමිටඩ් නම් ආයතනයක මේ මුදල් ආයෝජනය කර තිබෙනවා. අසාධාරණයට ලක් වූ තැන්පත්කරුවන්ට සාධාරණයක් ඉටු කිරීමට ඇමැතිවරුන් වන දිනේෂ් ගුණවර්ධන, ගාමිණී ලොකුගේ සහ මගේ ද සහභාගිත්වය සහිතව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා. මේ සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණයේ යුක්තිය පසඳලීමේ ක්‍රියාවලියක් සිදු වෙමින් පවතිනවා. හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය රිමාන්ඩ් බන්ධනාගාර ගත කළා. මේ වන විට එම පිරිස ඇප මත නිදහස්ව තිබෙනවා.'

# ඡන්ද හිමි නාමලේඛන උපුටන නිකුත් කිරීමේ කාර්ය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටත්

අනුර ප්‍රේමලාල්

දිස්ත්‍රික්ක මැතිවරණ කාර්යාල වෙතින් පමණක් ඉටුකරනු ලැබූ ඡන්ද හිමි නාම ලේඛන උපුටන නිකුත් කිරීමේ කාර්ය මහජනතාවගේ පහසුව සඳහා සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් නිකුත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කරන බව මැතිවරණ කොමිසම ප්‍රකාශ කරයි.

මෙම ප්‍රකාශය ඉකුත් (08) රැස්වූ මැතිවරණ කොමිසම් රැස්වීමේදි නිකුත් කර තිබේන අතර එහිදි මෙම වසර සඳහා දේශපාලන පක්ෂ වශයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචිය සඳහා අයදුම් පත්‍ර 38ක් ලැබී තිබෙන බවද සඳහන් කරයි. එම අයදුම් පත්‍ර 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන අනුව ඉදිරිපත් කළ යුතු මූලික ලේඛන වාර්තා ඇතුළත් වී තිබේද යන්න පරීක්ෂා කර සංක්ෂිප්ත ලේඛනයක් සකසා එම අවශ්‍ය සම්පූර්ණ කර ඇති සංවිධාන පමණක් ඉදිරි සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට තීරණය කිරීම සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදනවලට අනුකූලව එම සංවිධානවල ව්‍යවස්ථා අන්තර්ගතයන් පවතීද යන්න පරීක්ෂා කිරීමටද එහිදි තීරණය කර තිබේ.

# මයික්‍රෝ සමාගම් සමූහයට ISO සම්මාන



ජයසිරි මුණසිංහ

විවිධාංගීකරණය වූ නිපැයුම් ඔස්සේ ව්‍යාපාරික ලොව ජය ගැනීමට කටයුතු කරන මයික්‍රෝ එන්ටප්‍රයිස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල් පුද්ගලික සමාගම, මයික්‍රෝ ඉලෙක්ට්‍රික් ඉන්ටනැෂනල් සමාගම, රෝයල් ඕගනික් එක්ස්පෝට් පුද්ගලික සමාගම වෙත ජාත්‍යන්තර පිළිගත් ISO 9001:2015 සහ ISO 22000:2018 තත්ව සම්මාන ලබාදීම ඉකුත්දා සිදු විය.

එකම ව්‍යාපාරික ක්ෂේත්‍රයක් මත පදනම්ව ව්‍යාපාරික ලොව ජය ගැනීමට රැඳී නොසිට නව නිපැයුම් සිදුකරමින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ගෙන ඒමේ අරමුණින් තම සමාගම එලෙස කටයුතු කරන බව මයික්‍රෝ සමාගම් සමූහයේ සභාපති ධම්මික සමරවික්‍රම මහතා ප්‍රකාශ කළේය.

විදුලි උපකරණ සහ උපාංග නිෂ්පාදනය කරමින් රට පුරා බෙදාහරින මයික්‍රෝ ඉලෙක්ට්‍රිකල් පුද්ගලික සමාගම ඉකුත් කොරෝනා සමයේ විවිධාංගීකරණය වෙමින් කාබනික පොහොර භාවිතයෙන් නිෂ්පාදිත වස විසෙන් තොර එළවළු පලතුරු, කුළුබඩු පිටරට යැවීම සඳහා රෝයල් ඕගනික් එක්ස්පෝට් සමාගම ආරම්භ කළ බව ද ධම්මික සමරවික්‍රම මහතා සඳහන් කළේය.

# කොටින්ගෙන් බැට කෑ පිරිසකට ලියකියවිලි නැතිව වන්දි පමා වෙයි

උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ

කොටි ත්‍රස්තවාදී යුද්ධය හේතුවෙන් 1983 වසරේ සිට විපතට පත් වවුනියාවේ පුද්ගලයන් 1334 දෙනෙකු වන්දි ඉල්ලා ඇතත් ඔවුන්ගෙන් මේ වන විට වන්දි මුදල් ලැබී ඇත්තේ පුද්ගලයන් 302 කට පමණක් බව වවුනියාව අතිරේක දිසාපති එස්.තිරේස්කුමාර් මහතා පැවැසීය.

වවුනියාවේ පුද්ගලයන් වන්දි ඉල්ලා ඇත්තේ ජීවිත අහිමි වීම දේපළ අහිමිවීම හා ආගමික ස්ථාන විනාශ වීම වෙනුවෙන් බව කී අතිරේක දිසාපතිවරයා ඔවුන්ගෙන් ජීවිත හානි 82ක්,ආගමික ස්ථාන විනාශ වීම් 83 ක් හා දේපළ විනාශ වීම් 137 ක් වෙනුවෙන් වන්දි මුදල ලැබී ඇති බව පැවැසීය.

# නීති විරෝධීව මෙරටට ගෙනා එතනෝල් ලීටර් 15,200ක් රේගුව භාරයට

**සුභාෂිණී සේනානායක සහ මහින්ද අලුත්ගෙදර**

මෙරට පවත්වාගෙන යන කර්මාන්ත ශාලාවකට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය බව කියමින් නීති විරෝධී ලෙස මෙරටට ගෙනා රුපියල් මිලියන 18කට අධික වටිනාකමකින් යුත් එතනෝල් ලීටර් 15,200ක් ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මේ පිළිබඳව අදහස් දැක්වූ ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල් විශ්‍රාමික මේජර් ජෙනරාල් විජිත රවිප්‍රිය මහතා මෙසේ පැවැසීය.

'මේ එතනෝල් තොගය රේගුවෙන් නිදහස් වූයේ නම්, ශ්‍රී ලංකා රේගුවට අහිමි වන බදු මුදල රුපියල් මිලියන 22ක්. එම එතනෝල්වලින් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කර වෙළෙඳපොළට නිකුත් වූයේ නම්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අහිමි වන බදු මුදල රුපියල් මිලියන 40කට අධිකයි. 2016 ලියාපදිංචි රාජගිරියේ පිහිටි සමාගමක නමක් යොදා ගෙන මේ එතනෝල් තොගය මෙරටට ගෙන්වා තිබෙනවා. රේගුව සිදු කළ විමර්ශනයකදී එවැනි සමාගමක් නැති බව ද හෙළි වී තිබෙනවා.

අඩි 20යි 20ක කන්ටේනරයක බහා රැගෙන විත් තිබූ මෙය සම්බන්ධයෙන් සැක සිතී එහි සාම්පල පරීක්ෂණාගාර වෙත යවා ඉකුත්දා (05) ලැබුණු එහි වාර්තාවලට අනුව ඒවා එතනෝල් බවට තහවුරු වී තිබෙනවා. ඒවා ගෙන්වා ඇත්තේ කවුරුන්ද යන්න පිළිබඳව රේගු පරීක්ෂණයක් ආරම්භ කළා.'



ඡායාරූපය - රොෂාන් පිටිපන

## සියලුම සමෘද්ධි බැංකු පරිගණක ගත කෙරේ



*පරිගණක ගත කළ පළමු සමෘද්ධි බැංකුව ඇමැති ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත වූ අයුරු.*

**මහින්ද අලුත්ගෙදර**

සමෘද්ධිලාභීන්ගේ පහසුව වෙනුවෙන් සියලුම සමෘද්ධි බැංකු පරිගණක ගත කිරීමට රජය තීරණය කරයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව මේ වැඩසටහන ක්‍රියාත්මක කර තිබෙන අතර, මේ වන විට රට පුරා පිහිටි සමෘද්ධි බැංකු 1074කින් 183ක් පරිගණක ගත කර අවසන් බව රජය ප්‍රකාශ කරයි.

ගම්පහ දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු 86ක් පරිගණක ගත කිරීම මේ දිනවල ක්‍රියාත්මක අතර, එයින් 20ක් පරිගණක ගත කිරීම අවසන් කර තිබේ. මෙලෙස පරිගණක ගත කළ ගම්පහ දිස්ත්‍රික්කයේ පළමු සමෘද්ධි බැංකුව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කළ අතර, මිනුවන්ගොඩ, යාගොඩමුල්ල සමෘද්ධි බැංකුව මෙලෙස විවෘත කෙරිණි.

මෙහිදී අදහස් දැක්වූ ඇමැති ප්‍රසන්න රණතුංග මහතා මෙසේ සඳහන් කළේය.

'සමෘද්ධි බැංකු පරිගණක ගත කිරීම සිදු කෙරෙන්නේ ලක්ෂ 17ක් වූ සමෘද්ධිලාභීන්ගේ පහසුවටයි. පසුගිය රජය විසින් ස්වාභාවික මරණයක් දීමට සැලසුම් කර තිබූ සමෘද්ධි ව්‍යාපාරය මේ වන විට වත්මන් ආණ්ඩුව ශක්තිමත් කිරීමට කටයුතු කරනවා.

සමෘද්ධි පවුල් ලක්ෂ 2ක් හඳුනාගෙන ඔවුන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියක් ද මේ වන විට ආරම්භ කර තිබෙනවා. සමෘද්ධි ව්‍යාපාරය හරහා ව්‍යවසායකයන්ට ණය සහන දීමේ වැඩසටහනක් ද මේ වන විට ක්‍රියාත්මකයි.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් සුනිල් ජයලත්, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති කුමාර අරංගල්ල මහත්වරු ද මේ අවස්ථාවට සහභාගී වූහ.

## බන්ධනාගාර අධිකාරීවරයාට අල්ලස් දීමට තැත් කළ ජේලර්වරයකුගේ වැඩ තහනම්

**බුද්ධිකා ඉඹුලාන**

පාස්කු දා ප්‍රහාරයට සම්බන්ධ සැකකරුවකු ඇතුළු කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරගත තවත් සැකකරුවන් දෙදෙනකුට පහසුකම් දීමට එම බන්ධනාගාර අධිකාරිවරයාට රුපියල් ලක්ෂ ගණනක අල්ලසක් දීමට තැත් කළ ජේලර්වරයකුගේ වැඩ තහනම් කිරීමට බන්ධනාගර දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබේ.

මේ ජේලර්වරයා රිමාන්ඩ් බන්ධනාගාර අධිකාරීවරයා වෙත ගොස් 'පාස්කු දා ප්‍රහාරයට සම්බන්ධ සැකකරුවකු සහ මත් කුඩු ජාවාරම්වලට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙක් සර්ට ඕනෑම ආකාරයක උදව්වක් කරන්න සූදානම්ව සිටිනවා, ඔවුන් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වන්න.' යැයි ඉල්ලා ඇති අතර, එම යෝජනාවට කැමැත්ත දක්වන බව පෙන්වා ඇති අධිකාරීවරයා සැකකාර ජේලර්වරයාගෙන් උපායශීලීව ඉහත කී රැඳවූවන් තිදෙනා ඔහුගේ කාර්යාලයට ගෙන්වා ගෙන ඇත.

එසේ කැඳවීමෙන් අනතුරුව 'තමුන්ට මගෙන් මොනවාද වෙන්න ඕනෙ.' යනුවෙන් අධිකාරීවරයා එම සැකකරුවන්ගෙන් විමසීමේදී 'සර් ඕන මුදලක් සර්ට දෙන්නම්. අපට සිර මැදිරියේ දුරකතනයක් ළඟ තියාගෙන අපේ පාඩුවේ නිදහසේ ඉන්න ඉඩ දෙන්න.' යනුවෙන් එම සැකකරුවන් තිදෙනා අධිකාරීවරයාගෙන් ඉල්ලා ඇති බව වාර්තාවේ. එහිදී එම බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර්වරයා සහ තවත් නිලධාරියකු සාක්ෂි සේ රඳවා ගත් බන්ධනාගාර අධිකාරීවරයා මේ කරුණු රිමාන්ඩ් සිරකරුවන්ගෙන් විමසා ඇත.

## හෙරොයින් ග්‍රෑම් 350ක් - මුදලින් 140,000ක් සමඟ සැකකරුවෙක් දැලේ

**රක්ෂණ ශ්‍රියන්ත**

හෙරොයින් ග්‍රෑම් 350ක් සහ හෙරොයින් ජාවාරමෙන් උපයා ගත් රුපියල් 140,000ක් සමඟ සැකකරුවකු ගොතටුව පොලිස් වසමේ මැදපුර මාවතේදී පසුගියදා (07) ගොතටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් පිරිසක් සිදු කළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ. අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34ක් වූ කොළඹ 15, ෆර්ගියුෂන් පාර ප්‍රදේශයේ පදිංචිකරුවකු බව පොලිසිය පවසයි. සැකකරු පෙරේදා (08) අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර දින 07ක රැඳවුම් නියෝග ගෙන ගොතටුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරයි.

## සිසුවකු වෙනුවෙන් විභාගයට පෙනී සිටි අයෙක් අධිකරණයට

**රක්ෂණ ශ්‍රියන්ත**

සිසුවකු වෙනුවෙන් පෙනී සිටිමින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය ලිවීම සම්බන්ධයෙන් කළුවිල විභාග මධ්‍යස්ථානයේදී පුද්ගලයකු පෙරේදා (08) අනුරාධපුර හිඳෝගම පොලිසියෙන් අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21ක් වන අතර, ගණිතය විෂයයට ඔහුගේ ඥාතියකු වෙනුවෙන් සැකකරු විභාගය ලියා ඇති බව ද පොලිසිය පවසයි.

අත්අඩංගුවට ගත් සැකකරු තිස්සමහාරාමය, වීරවිල ප්‍රදේශයේ පදිංචිකරුවකු වන අතර, විභාගයට පෙනී සිටීම සඳහා මොහු අනුරාධපුරයට පැමිණ ඇති බව පොලිස් විමර්ශනවලදී අනාවරණය වී ඇත.

සැකකරු ඊයේ (09) අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

## කුවේට් හි රැඳී සිටි ශ්‍රී ලාංකිකයන් 118ක් දිවයිනට

**මහින්ද අලුත්ගෙදර**

කුවේටයේ රැකියා සඳහා ගොස් මෙරටට පැමිණීමට නොහැකිව සිටි ශ්‍රී ලාංකිකයන් 118 දෙනකු යළි ශ්‍රී ලංකාවට ගෙන්වා ගෙන තිබේ.

පෙරේදා (08) මධ්‍යම රාත්‍රියේ කුවේට් හි සිට විශේෂ ගුවන් යානයකින් එම පිරිස කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණි බව ගුවන් තොටුපොළ ආරංචි මාර්ග පවසයි.

පැමිණි පිරිස අතරින් වැඩි සංඛ්‍යාවක් එරට ගෘහ සේවයට ගොස් සිටි කාන්තාවන් වන අතර, යුද හමුදාව විසින් එම ශ්‍රී ලාංකිකයන් පිරිස නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමු කර තිබේ.

මේ අතර ත්‍රිවිධ හමුදාවෙන් පාලනය කරන නිරෝධායන මධ්‍යස්ථාන 104ක පුද්ගලයන් 10,000ක් පමණ තවදුරටත් නේවාසිකව ප්‍රතිකාර ලබන බව ද වාර්තා වේ.

ශ්‍රීකාන්තගේ ශ්‍රී පත



- ආණ්ඩුවෙ පොකැට් පෝඩර් ගිහිල්ල, තවත් දරා ගැනීමේ හැකියාවක් නැහැ කියල ගම්මන්පිල කියනව බං !
- ආණ්ඩුවෙ විතරද සර්, ඇයි අපෙත් එහෙමයි !



අපි නැත්තා

බැලුවට ගිහින් ජංගම සේවයට හැරී
රජයෙන් නොමැත කිසිවක් හරියකට කෙරී
සජිත් මැතිතුමන් හට මොන දෙයද බැරී
එතුමට බලය දුන්නොත් හරියටම හරී

අප රජයකින් නැත රට විකුණන් කන්නේ
නළලෙහි රැලි නඟා එතුමා පවසන්නේ
යහ පාලන යුගය යළි සිහියට එන්නේ
නොකියන තැනින් මෘදු හසරැලි මතුවන්නේ

රටේමුල්ලේ මුදන්නායක

ගිනිකොස්

නිම වූ පසුව අද සා පෙළ විභාගය
තරහා කෝන්තර හිත්වල තියෙන අය
කළහා කළොත් නොලැබේ කිසි විටෙක ජය
විසිරී යන්න සංතෝසෙන් තබා පය



ගජමන් නෝනා

## ඩෙල්ෆ්ට් මිරිදිය පොකුණුවලට ඉස්සන් පැටවු ලක්ෂයක් මුදා හැරීම ඇරඹේ

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනයේ ඩෙල්ෆ්ට් ප්‍රදේශයේ මිරිදිය පොකුණුවලට මිරිදිය ඉස්සන් පැටවු ලක්ෂයක් මුදා හැරීමේ කටයුතු පෙරේදා (08) සිට ආරම්භ කර තිබේ.

ඩෙල්ෆ්ට් ප්‍රධාන මිරිදිය පොකුණට ඉස්සන් පැටව් 80,000ක් මුදා හරින අතර, ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතාගේ ඉල්ලීමකට අනුව ධීවර හා ජලජ ජීවී දෙපාර්තමේන්තුව මේ මිරිදිය ඉස්සන් පැටවු මුදා හරිනු ලබයි.

මේ වන විට මිරිදිය ඉස්සන් ඉතා ජනප්‍රිය ආහාරයක් බවට පත්ව ඇති අතර, කිලෝවක මිල රුපියල් 1200ත් 1500ත් අතර වේ.

## පොලිස් නිලධාරීන් ලෙස සැරසී යතුරු පැදි දෙකක හිස් වැසුම් නොමැතිව යන දෙදෙනා ගැන විමර්ශන

**රක්ෂණ ශ්‍රියන්ත**

පොලිස් නිලධරයන් ලෙස සැරසී යතුරු පැදි දෙකකින් හිස් වැසුම් නොමැතිව ගමන් කරන කාන්තාවක සහ පිරිමි පුද්ගලයකුගේ ඡායාරූප සමාජ මාධ්‍ය ජාල ඔස්සේ හුවමාරු වීම සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් සිදු කරන ලෙස පොලිස් විශේෂ විමර්ශන ඒකකයට උපදෙස් දී තිබේ.

එම ඡායරූපයට අනුව යතුරු පැදිවලින් ගමන් කරන අදාළ කාන්තාව සහ පිරිමි පුද්ගලයා පොලිස් නිලධාරීන් ද යන්න තහවුරු කර ගැනීමට විමර්ශනයක් ආරම්භ කරන ලෙසට ද පොලිස්පතිවරයා විසින් පොලිස් විශේෂ විමර්ශන ඒකකයට උපදෙස් දී තිබේ.

## කහ කිලෝ 670ක් - යාත්‍රා 2ක් සමඟ සැක තිදෙනෙක් අත්අඩංගුවට

**ඊ. සී. ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ**

නීති විරෝධී ලෙස මෙරටට ගෙනා බව කියන වියළි කහ කිලෝ 670ක් සහ ඒවා ගෙන ආ බව කියන එක්දින යාත්‍රා දෙකක් සමඟ සැකකරුවන් තුන්දෙනකු එළුවන්කුලම සේරක්කුලිය කලපු ඉවුරේදී අත්අඩංගුවට ගත් බව නාවික හමුදා මාධ්‍ය ඒකකය කියයි.

කහ තොගයක් සේරක්කුලිය කලපු ඉවුර කරා ගෙනා බව දැන ගත් නාවික හමුදාවේ වයඹ විධානයේ තම්බපණ්ණි අනු කණ්ඩයේ නිලධාරීන් විසින් සිදු කළ සෝදිසි මෙහෙයුමකදී බෝට්ටු දෙකකින් මේ කහ තොගය උර 33ක බහා ගොඩබිමට ගෙන යන අතරතුර අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට පත් සැකකරුවන් කල්පිටිය පල්ලිවාසල් පාඩුවේ පදිංචි අය බවත්, මේ කහ තොගය රුපියල් ලක්ෂ 20ට අධික වටිනාකමකින් යුතු බවත්, එම කහ සහ යාත්‍රා දෙක සැකකරුවන් සමඟ කටුනායක රේගුවට භාරදීමට පියවර ගෙන ඇති බවත් නාවික හමුදා මාධ්‍ය ඒකකය කියයි.


වෙළෙඳ අමාත්‍යාංශය

රතු ළූණු
சிவப்பு வெங்காயம் / Red Onion

වෙළෙඳපොලේ අඩුම මිල

කිලෝවක් රු. 195/-

ලංකා සතොස
LANKA SATHOSA லங்கா சதொச

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 මාර්තු 10 බදාදා

# ආණ්ඩුවේ සහන පැකේජය !

භූමිතෙල් සහනාධාරය අවභාවිතයකින් තොරව මහජනයා වෙත ලබාදීමට කටයුතු කරන්නැ'යි අගමැතිවරයා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. භූමිතෙල් සහනාධාරය යැයි කියූ විට වැඩිදෙනකු විමතියට පත්වනු ඇත. රටපුරා විදුලිය ඇති බැවින් භූමිතෙල් කුමකටදැ'යි තව කෙනකු ප්‍රශ්න කරන්නට පුළුවන. ධීවර ජනතාව සිය බෝට්ටු ධාවනය සඳහා භූමිතෙල් යොදා ගනී. ගොවියා තමන්ගේ විවිධාකාර වූ කෘෂි මැෂින් ක්‍රියාත්මක කිරීම සඳහා ද භූමිතෙල් යොදා ගනී. ගොවියා හා ධීවරයා අපේ ජාතික ආර්ථිකයේ ප්‍රධාන හවුල්කරුවෝ වෙති. එබැවින් ඉහත කී භූමිතෙල් සහනාධාරය රටේ ආර්ථිකයට සෘජු බලපෑමක් ඇතිකරයි. වත්මන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන්නේ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත්කොට ආර්ථිකය ස්ථාවර තත්ත්වයකට ගෙන යෑමය. භූමිතෙල් සහනාධාරය ඊට හොඳින්ම ගැළපෙයි.

වත්මන් ආණ්ඩුවේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ ජනාධිපතිවරයා මෙන්ම අගමැතිවරයා ද පුංචි මිනිසුන් වෙනුවෙන් සහන ලබාදීමට ඉදිරිපත් වීමය. ගිය ආණ්ඩුව යටතේ දුෂ්කරතාවට පත්වූ ගොවියා අද ස්වකීය ආර්ථිකය ස්ථාවර මට්ටමකට ගෙන ඇත. ධීවරයා සිය කර්මාන්තය තෘප්තිමත් ලෙස කරගෙන යනු දැකිය හැකිය. කුඩා පරිමාණයේ ව්‍යාපාරික ප්‍රජාව කොවිඩ් වසංගතය තුළ ණය උගුලක හිරවූ අතර එය ලිහා දමන්නට ආණ්ඩුව පියවර ගත්තේය. ණය හා පොලී ගෙවීමට සහන පැකේජයක් ලබාදීමට ආණ්ඩුව ක්‍රියා කළේය. රටක ආර්ථික සංවර්ධනයේදී කුඩා ව්‍යාපාර ගැන සැලැකිල්ල යොමු කළ යුතු යැයි නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විශේෂඥ ආචාර්ය ඊ. එෆ්. ෂූමාකාර් පෙන්වා දෙයි. ලෝකය වෙනස් කළ හැක්කේ පුංචි මිනිසුන් සංවිධාන කිරීමෙන් යැයි ඩේවිඩ් බ්‍රොන්ස්ටින් නම් සමාජ විචාරකයා පෙන්වා දී ඇත.

රජය දෙන සහනාධාර නියමාකාරයෙන් සුදුසුම පුද්ගලයන් වෙත නොලැබීම දීර්ඝ කාලයක පටන් පවතින පොදු ගැටලුවෙකි. මීට වගකිව යුත්තේ ආයතන හා නිලධාරීන්ය. නිලධාරීන් සම්බන්ධ ගැටලු රාශියක් පවතී. සමහර නිලධාරීහු අල්ලස් ගනිති. තව නිලධාරීහු තමන් අකැමැති අයගේ සහන කපා හරිති. තවත් නිලධාරීහු සහන වැඩසටහන් කඩාකප්පල් කරති. නිලධාරීන් හා ගැමියන් අතර ගැටුමක් පවතී. නූතන සමාජ විචාරකයෝ අලි-මිනිස් ගැටුම, නිලධාරීන් හා ගැමියන් අතර ගැටුම ලෙසින් ඒවා විග්‍රහ කරති. නිලධාරීන් සමාජ සේවය හා සමාජ සුබසාධනය සඳහා කැපවීමකින් ක්‍රියා කළ යුතු වුව බොහෝ විට එය සිදුවන්නේ නැත. අගමැතිවරයා භූමිතෙල් සහනාධාරය ගැන කතා කරන්නේ ඒ නිසාය.

නිලධාරිවාදය ලෝකයේ පවතින ප්‍රධාන සමාජ ගැටලුවක් ලෙස හඳුනාගෙන ඇත. සෝවියට්දේශය 1991 දී බිඳ වැටුණු අතර ඊට බලපෑ ප්‍රධාන හේතු සාධකයක් ලෙස නිලධාරිවාදය පෙන්වා දී ඇත. නිලධාරීන් හිතුවක්කාරී තීන්දු තීරණ ගනිමින් ජනතාව පීඩාවට පත් කරන අතර දේශපාලන නායකයන්ගේ කීර්තිය බිඳ වට්ටනසුලු ක්‍රියාකාරකම්වල යෙදෙනු බව ද ප්‍රසිද්ධ කාරණයෙකි. සහනාධාර නියම පුද්ගලයන් වෙත නොලැබෙන විට ජනතාවගේ ඇඟිල්ල දිගු වන්නේ රටේ නායකයන් වෙත හා ආණ්ඩුව වෙතය. රජය දෙන භූමිතෙල් සහනාධාරය නියමාකාරයෙන් ධීවරයන් හා ගොවියන් වෙත ලැබිය යුතුය. කාලපරිච්ඡේද කිහිපයකදී එය සිදුවූයේ නැත. ධීවරයන් අවස්ථා කිහිපයකදීම මීට එරෙහිව විරෝධතා දක්වා ඇත.

රට පුරා විදුලිය ව්‍යාප්ත වී තිබුණ ද තවත් ගම්මාන ගණනාවක් විදුලිය ගත නොහැකිව කුප්පි ලාම්පු භාවිත කරයි. විදුලිය ගැනීමට නොහැකි වී ඇත්තේ විවිධ හේතු නිසාය. ඇතැම් පවුලකට විදුලිය සැපයීම සඳහා අවශ්‍ය මූලික ගෙවීම් සපුරාගත නොහැකිය. මෙබඳු ගම්මානවල අහිංසක දරුවෝ කුප්පි ලාම්පු දල්වා පාඩම් කරති. කුප්පි ලාම්පු දල්වා වෙනත් කර්මාන්තවල යෙදෙති. ඔවුන්ගේ අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයට භූමිතෙල් ද ඇතුළත්ය. ඒ අනුව ධීවරයන්ට, ගොවියන්ට පමණක් නොව; දුෂ්කර පළාත්වල ගැමියන්ට ද භූමිතෙල් අත්‍යවශ්‍ය වේ. මේ පිරිසට ද භූමිතෙල් සහනාධාරය දිය යුතුය. ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම අපහසු නැති බව අගමැතිවරයා පෙන්වා දෙයි.

තෙල් සංස්ථාවේ පාඩුව හා ණය ගැන ද අගමැතිවරයාගේ අවධානය යොමු වී ඇත. සංස්ථාව ගන්නා ණය ඩොලර්වලින් නොව රුපියල්වලින් ලබාගැනීම සුදුසු බව පෙන්වා දුන් අගමැතිවරයා ඒ ගැන මහ බැංකුව සමඟ සාකච්ඡාකොට තීරණයක් ගන්නැ'යි නිලධාරීන්ට උපදෙස් දී ඇත. තෙල් සංස්ථාව පාඩු ලැබිය යුතු ආයතනයක් නොවේ. රාජ්‍ය නායකයන්ගේ සෘජු අවධානය යොමු කළහොත් මේ ආයතන සාර්ථකව ඉදිරියට ගෙන යා හැකිය. රාජ්‍ය ආයතන හා අර්ධ රාජ්‍ය ආයතන පාඩු ලබන්නේ ඉහළ කළමනාකාරීත්වයේ වරද නිසාය. බොහෝවිට මේ ආයතනවල ඉහළ කළමනාකාරීත්වය පත් කරන්නේ නායකයන්ය. නැතහොත් නායකයන්ගේ උපදේශනය මත පත් කළ කමිටුය.

පොදු ජනතාවට සහන දීම සම්බන්ධයෙන් ඉතා යහපත් ප්‍රතිපත්තියක් වත්මන් රජයට තිබේ. පොහොර සහනාධාරය ගොවියා සඳහාය. වී ගොවියා කේන්ද්‍රකොට පවත්වාගෙන යන එම සහනාධාරයට වී සඳහා සහතික මිලක් ද එකතු වී ඇත. මේ කන්නයේ අස්වැන්න ඉතා සාර්ථක වී ඇති අතර සහල් අතිරික්තයක් ද ඇති විය හැකි බව සමහරු පෙන්වා දෙති. සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරිකයන්ට දී ඇති ණය සහන නිසා එම ව්‍යාපාර බංකොලොත් නොවී පවත්වාගෙන යනු ලැබේ. එය රැකියා ගැටලුවට ද විසැඳුමක් වී ඇත. කොවිඩ් වසංගතය තුළ අමෙරිකාවේ පමණක් දසලක්ෂ ගණනකට රැකියා අහිමි වී ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ එබඳු තත්ත්වයක් ඇති වූයේ නැත. වත්මන් ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක් ලෙස හැඳින්විය හැක්කේ ඒ නිසාය.




ඇඳ නිල ඇඳුම් පොලිසියෙ නිලදරුවන්නේ
හෙල්මට් නොදා දඬු මොනරෙන් ඉගිලෙන්නේ
කවුරුද සොයන්නට විමසුම් ඇරඹෙන්නේ
මොළ නැති අය මොට ද ඔළු ගෙඩි රැක ගන්නේ

# ඉහළ පොලීවලට අහුවෙන්න එපා



බොහෝ දුක් මහන්සියෙන් තමන් උපයා සපයාගන්නා මුදල් ඉහළ පොලී ආදායම් ලැබීමේ ගිජුකම නිසා අනවසර මුදල් ව්‍යාපාරයන්හි තැන්පත්කොට අමාරුවේ වැටෙන්නට එපායැයි යන පණිවුඩය අද දවසේ සමාජයේ දැඩිව කතාබහට ලක් කළ යුතු එකක් බව අමුතුවෙන් කිව යුතු නොවේ.

මේ අන්දමට අනවසර ව්‍යාපාරයන්හි මුදල් ආයෝජනය කොට තමන්ගේ මුදලත්, පොලී ආදායමත් දෙකම අහිමිකර ගන්නා ගනුදෙනුකාර ප්‍රජාව එවැනි ක්‍රියාදාමයකට පෙලඹීමට පෙර දෙවතාවක් සිතා බැලිය යුතු බව ද අවධාරණය කළ යුතු කරුණකි.

ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ ස්ථායිතාවය සහ කාර්යසාධනය මනාව පවත්වාගැනීමට වගකියන මෙරට බැංකුකරුවාගේ බැංකුව නම් ලත් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණු 2කි. මූල්‍ය ස්ථායිතාවය ඇති කිරීම සහ ආර්ථික ස්ථායිතාවය ළඟාකර ගැනීම එම අරමුණු 2 වේ. විශේෂයෙන් මූල්‍ය අංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් කතා කිරීමේදී ප්‍රධාන වශයෙන් බැංකු සහ අනෙකුත් තැන්පතු භාරගන්නා මූල්‍ය ආයතනවල දේශීය, විදේශීය ක්‍රියාකාරීත්වය ඉහළ ගුණාත්මකභාවයකින් පවත්වාගෙන යාමට මාර්ගෝපදේශ දීම මහ බැංකුවේ කාර්යභාරය වී තිබේ.

ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ නැති නම් පද්ධතියේ දැඩි අභියෝගාත්මක සහ අවදානම් සහිත තත්ත්වයක් ළඟා කර දීමට මඟ පාදන අයුරින් දිනෙන් දින හතු පිපෙන්නා සේ මහජනතාවගෙන් තැන්පතු භාරගන්නා අනවසර මූල්‍ය ආයතන බිහි වන බවට ප්‍රබල සමාජ කතිකාවක් ඇතිවී තිබේ. මෙහිදී අප විශේෂයෙන් අවධානය යොමු කළ යුත්තේ මෙවැනි අංශයක ක්‍රියාකාරීත්වයක් ඇති වීමට බලපාන සාධක මොනවාද? ඒවා වැළැක්වීමට ගත යුතු පියවර මොනවාද? සහ රටවැසි ජනතාවගේ ආයෝජන ඉතා සුරක්ෂිතව සහ ලාභදායි අයුරින් පවත්වාගෙන යාමට නීත්‍යනුකූලව ක්‍රියාත්මක බැංකු සහ මූල්‍ය ආයතනයන්හි කාර්යභාරය වැඩි දියුණු කිරීම, පොදුවේ ගත් කළ මිලියන 22ක් වන මෙරට ජනතාවට විනයගරුක මූල්‍ය සාක්ෂරතාවයක් දීම කෙරෙහිය. ඒ අනුව යමින් ශ්‍රී ලංකා මහ බැංකුව වශයෙන් අප බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, මූල්‍ය බුද්ධි ඒකකය ප්‍රධාන දෙපාර්තමේන්තු සියල්ල රටවැසි ජනතාවගේ යහපත සඳහාම කටයුතු කරන බව කිව යුතු වේ.

## මූල්‍ය අතරමැදිකරණය

අනවසර මුදල් ව්‍යාපාරයන්හි තම මුදල් තැන්පත්කොට විපතට පත් වූවන්ට සහන සැලසීමට පමණක් නොව එවැනි තැන්පතු භාරගන්නා ආයතනවලට සහ පුද්ගලයන්ට එරෙහිව නීත්‍යානුකූලව පියවර ගැනීමට අපි මේ වන විටත් කටයුතු කරමින් සිටිමු. මෙවැනි සන්දර්භයක් තුළ මෙරට මූල්‍ය පද්ධතියේ දක්නට ලැබෙන විධිමත් මූල්‍ය අතරමැදිකරණය, මූල්‍ය පද්ධතියේ මූලික ආයතන, එවැනි ආයතන නියාමනයට ඇති ආයතන, විධිමත් ආයතනවල ආයෝජනය කිරීම පිළිබඳ දැනුම්වත් කිරීමක් සිදු කෙරේ.

ඊට අමතරව විශේෂ කටයුත්තක් සේ සලකා අනවසර මුදල් ව්‍යාපාර මොනවාද? ඒවා පවත්වාගෙන යන්නන්ගේ ක්‍රියාකාරකම් නිසා මෙරට මූල්‍ය පද්ධතියට සිදු වන අහිතකර බලපෑම සහ මුදල් ව්‍යාපාර පවත්වාගෙන යමින් සිටියදී අර්බුදයට ලක් වූ මූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන්ට පිහිටවීමට ක්‍රියාත්මක නිරාකරණ සහ බලගැන්වීම් පිළිබඳව ද කෙටියෙන් සලකා බලමු.

මූල්‍ය අතරමැදිකරණය යන්නෙන් අදහස් කෙරෙනුයේ ඕනෑම ආර්ථිකයක මූල්‍ය සම්පත් අතිරික්ත අංශයක් සහ මූල්‍ය සම්පත් හිඟ අංශයක් පැවතීමය. මෙම අංශයන් දෙකට එකිනෙකාගේ උපයෝගිතාවයන් උපරිම කර ගැනීමට (සම්පත් අතිරික්ත අංශයට වැඩි ප්‍රතිලාභ සහ සම්පත් හිඟ අංශයට අඩුම පිරිවැයක් යටතේ මූල්‍ය සම්පත් ලබා ගැනීම) මූල්‍ය සම්පත් හුවමාරු කරගැනීමේ පහසුකම් සැලසීම මූල්‍ය අතරමැදිකරණයයි. මෙහිදී මෙම අංශ දෙක එකතු කිරීම අතරමැදිකරණ ආයතනවල ප්‍රධාන කාර්යය වේ. කාර්යක්ෂමව මූල්‍ය අතරමැදිකරණය සිදු වන විට අතිරික්ත අංශයේ සිට හිඟ අංශය කරා මූල්‍ය සම්පත් අවම පිරිවැයක් යටතේ මාරුවීම සිදුවේ.

මූල්‍ය අතරමැදිකරණයේ මූලික ලක්ෂණ වනුයේ ආයතන විශාල වශයෙන් විවිධ පුද්ගලයන්ගෙන් තැන්පතුවලින් ගන්නා මුදල්වලින් සිය ණය දීමේ සහ ආයෝජනය කිරීමේ ව්‍යාපාර කටයුතු සිදු කරන බැවින් මෙම ව්‍යාපාරය දැඩි අවදානම් සහිත ව්‍යාපාරයකි. ලෝකයේ බොහෝ රටවල් විවිධ විශේෂිත නීති මඟින් මූල්‍ය අතරමැදිකරණ ව්‍යාපාරික කටයුතු නියාමනයට ලක් කරයි. ඒවා ව්‍යවස්ථාපිත නීති මඟින්, එම නීති යටතේ නිකුත් කරනු ලබන විධාන, රීති, උපදෙස් මාලා ආදිය මඟින් සහ විශේෂිත ආයතන මඟින් නියාමනයට ලක් කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය මූලික වශයෙන් පහත සඳහන් ආයතනවලින් සමන්විතය. ඒවා නම් ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී බැංකු (වාණිජ සහ විශේෂිත), බලපත්‍රලාභී මුදල් සමාගම්, කල්බදු මූල්‍යකරණ සමාගම්, රක්ෂණ සමාගම්, කොළඹ කොටස් හුවමාරුව සහ ක්‍රියාකාරී ආයතන, අර්ථසාධක අරමුදල් ? විශ්‍රාමික අරමුදල්, ඒකක භාර, රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික වෙළෙඳුන් සහ විදේශ විනිමය සම්බන්ධ කටයුතු කරන ආයතන වේ.



**ඩී. එම්. ඩී. බී. දිසානායක**
අධ්‍යක්ෂ
නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මහජනතාවගෙන් තැන්පතු ලබාගැනීම සඳහා බලයලත් ශ්‍රී ලංකා මහ බැංකුවේ සෘජු අධීක්ෂණයට ලක් වන ආයතන වනුයේ බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගමය. මේවා සෘජුවම තැන්පතු ලබා ගැනීම සඳහා අවසරලත් ආයතන වේ. මෙම ආයතන අධීක්ෂණය සහ නියාමනය සඳහා බලපැවැත්වෙන නීති ප්‍රධාන වශයෙන් 1988 අංක 30 දරන බැංකු පනත (Banking Act), 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත (Finance Businesses Act) දැක්විය හැකිය.

අනෙකුත් නියාමන ආයතන ලෙස කොළඹ කොටස් හුවමාරු කොමිසම, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, කම්කරු කොමසාරිස්, රාජ්‍ය ණය අධිකාරී ආයතන ලෙස කටයුතු කරනු ලබයි.

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතට අනුව බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තකු හැර වෙනත් තැනැත්තකු විසින් මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම නොකළ යුතුය.

'මුදල් ව්‍යාපාර' යන්නෙන් අදහස් කරනුයේ තැන්පතු භාරගැනීමේ ව්‍යාපාරය, මුදල් ණයට දීම හෝ යම් කවර ආකාරයකින් හෝ මුදල් ආයෝජනය කිරීම හෝ යම් කවර ආකාරයකින් හෝ මුදල් ණයට දීම හා මුදල් ආයෝජනය කිරීමය.

ඒ අනුව 1988 අංක 30 දරන බැංකු පනත යටත් බලපත්‍රලාභී බැංකු 32ක් සහ මූල්‍ය සමාගම් 41ක් ක්‍රියාත්මක වේ.

මෙවැනි ආයතන හරහා තමන්ගේ ඉතිරිකිරීම් සහ ආයෝජන ගනුදෙනු පවත්වාගෙන යාමට කටයුතු කිරීම ප්‍රඥාගෝචර ක්‍රියාවකි. එසේ නොමැතිව මූල්‍ය අතරමැදිකරණ ආයතන පාලනය කිරීමක් සිදු නොවන, මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීමක් සිදු නොවන තත්ත්වයන් සහිත අනවසර මූල්‍ය ව්‍යාපාරයන්හි මුදල් තැන්පත් කිරීම හෝ මුදල් ආයෝජනය කිරීම නොකළ යුතුය.

මුදල් ව්‍යාපාර පනතට අනුව මූල්‍ය ආයතන අධීක්ෂණයේදී මූලික අවශ්‍යතා 2ක් පවතී. පළමුවැන්න පොදු සමාගමක් වීමය. දෙවැන්න නියමිත ප්‍රාග්ධනයක් තිබීමය. තැන්පතු ආරක්ෂාව සම්බන්ධයෙන් ගත කළ මුදල් සමාගමක් හැමවිටම තැන්පතු ආරක්ෂා කිරීමට පියවර ගත යුතුය. එවැනි ආකාරයෙන් ක්‍රියා නොකොට මුදල් ව්‍යාපාර පනත උල්ලංඝනය කරමින් සහ පනතේ නිකුත් කරන ලද විධානයන් නොපිළිපැදීම දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි වරදක් සඳහා අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු හෝ කළමනාකරුවකු වුව වරදකරුවකු කරනු ලැබිය හැකිය. මෙහිදී උපරිම වශයෙන් වසර 5ක බන්ධනාගාර ගත කිරීමක් සහ/ හෝ රුපියල් මිලියන 5කට නොවැඩි දඩයක් දඬුවම් ලෙස දිය හැකිය.

## පිළිගත් ගිණුම් ප්‍රමිතීන්

මූල්‍ය ආයතන අධීක්ෂණය සිදු කරන විට ප්‍රධාන වශයෙන් එම ආයතනයන්හි ප්‍රාග්ධන අවශ්‍යතාවය, ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යාම, බොල් ණය සඳහා වෙන්කිරීම, ඒක පුද්ගල ණය සීමාව, ආයතනික යහපාලනය, ණය දීමේ සීමා, පොලී ගෙවීම සම්බන්ධ සීමා (ලියාපදිංචි මුදල් සමාගම්වලට පමණි), ආයෝජන සහ ස්ථාවර වත්කම් අත්කර ගැනීම සම්බන්ධ සීමා, සුදුසුකම් සහ යෝග්‍යතාවය දැඩිව සොයා බැලීමට මහ බැංකුව පියවර ගනු ලබයි. මෙලෙස මහ බැංකුව අධීක්ෂණය කරන සහ ලියාපදිංචි මූල්‍ය සමාගමක් මහජනතාවට හඳුනා ගැනීමට හැකියාව ලැබෙන්නේ කෙසේදැයි දැනගැනීම කාලෝචිතය.

ඒ අනුව ලියාපදිංචි මුදල් සමාගමක් මගින් සපුරාලිය යුතු ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් යටතේ බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතුය. ලාභාලාභ ගිණුම හා ශේෂ පත්‍රය ප්‍රදර්ශනය කළ යුතුය. පිළිගත් ගිණුම් ප්‍රමිතීන් අනුව ගිණුම් වාර්තා විගණනය කිරීම සහ විගණන වාර්තා ප්‍රසිද්ධ කිරීම කළ යුතුය. ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම් පිළියෙල කිරීම, එම ප්‍රකාශවල ඇතුළත් විය යුතු තොරතුරු මොනවාද යන්න පිළිබඳ මහ බැංකුව නියම කර ඇත.

නියාමන ක්‍රමවේදය, දුරස්ථ පරීක්ෂණය සහ එතැන් පරීක්ෂණය ලෙස දෙයාකාරයකින් සිදු කරයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ සඳහා නීතිමය බලතල ලැබී තිබේ. ඒ අනුව මෙරට මූල්‍ය ස්ථායිතාවය සඳහා විශාල කාර්යභාරයක් අප විසින් සිදු කරනු ලබනවා. එවැනි පසුබිමක් යටතේ වුවත් අනවසර මුදල් ව්‍යාපාර ඇතැම් තැන්වල ක්‍රියාත්මක වේ.

## ආකර්ෂණීය පොලී අනුපාත


බොහෝ විට කිසියම් පුද්ගලයකු හෝ ආයතනයක් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ හෝ 1988 අංක 30 දරන බැංකු පනත යටත් බලපත්‍ර ලබා නොගෙන මහජනතාවගෙන් තැන්පතු භාරගැනීම ඇතුළු මුදල් ව්‍යාපාරවල නිරතවන්නේ නම් එම පුද්ගලයා හෝ ආයතන නීත්‍යනුකූල නොවන මුදල් ව්‍යාපාරයන්හි නියැළෙන්නකු සේ සැලකේ. එවැනි ව්‍යාපාර හරහා සමස්ත මූල්‍ය පද්ධතියට වන බලපෑම යහපත් නොවේ.

අනවසර මූල්‍ය ආයතනයන්ගේ අයුතු ක්‍රියාකාරීත්වය, සුපරීක්ෂණයක් හෝ නියාමනයක් නොමැතිකම, ඉහළ ව්‍යාපාරික අවදානමක් පැවතීම, අනවසර මුදල් ආයතනයන්ගේ බැඳ වැටීම, මූල්‍ය පද්ධති කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටීම, ලියාපදිංචි සමාගම්වල ක්‍රියාකාරීත්වය බිඳ වැටීම, මූල්‍ය පද්ධතිය අස්ථාවර වීම යනාදී අගතීන් සිදු වීම පෙන්වාදිය හැක. මේවා තුළ අප මුලින් කියූ පරිදි මෙරට මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය බිඳවැටීම ඉතා භයානක තත්ත්වයකි. මේ නිසා මෙවන් බේදවාචකයන්ගෙන් මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම අද දවසේ අපගේ ප්‍රමුඛ කාර්යයක් බවට පත්වී ඇත. ඒ නිසාම අනවසර මුදල් ව්‍යාපාරවල ආයෝජනය කිරීම ඉතා කනගාටුදායක ප්‍රතිඵල අත්කර දෙන්නක් බව මහජනතාවට ඒත්තු කර දීමට ද කටයුතු කෙරේ.

අනවසර මුදල් ව්‍යාපාරවල ආයෝජනය කිරීමේදී ආකර්ෂණීය පොලී අනුපාත දීම, බදු ගෙවීම් පැහැර හැරීම, මුදල් විශුද්ධිකරණය, ප්‍රකට ව්‍යාපාර නාමයන් වෙත යොමුවීම, පෞද්ගලික දැන හැඳුනුම්කම් සහ අනෙකුත් වරප්‍රසාද හිමිවන බවට මවා පෙන්වීම තුළ අහිංසක මිනිසුන් රැවටෙනු ඇත. ඒ නිසාම තමන් හරිහම්බ කරගත් මුදල් ආයෝජනය කිරීමේදී රැවටිලිකාරයන්ට හසු නොවී, ඉහළ පොලී අනුපාත සහ වරප්‍රසාදවලට ගිජු නොවී බුද්ධිමත්ව කටයුතු කිරීමට මහජනතාව වගබලා ගත යුතුය.

බැංකු පනත උල්ලංඝනය කරන, මුදල් ව්‍යාපාර පනත උල්ලංඝනය කරන පිරිසට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුව නීත්‍යානුකූලව පියවර ගන්නා අතර එය යම් තරමකට මෙවැනි අයහපත් තත්ත්වයන් මූල්‍ය අංශයේ සිදුවීම මන්දගාමී කිරීමට බලපා ඇත.

එනමුත් ඊටත් එහා ගොස් නව අණපනත් හඳුන්වා දෙමින් අහිංසක රටවැසියන් දුක් මහන්සියෙන් හරි හම්බ කරන දේ විධිමත් තැන්පතු සහ ආයෝජන සිදු කරන ආයතන වෙතට ගොස් තැන්පත් කරලීමට ජනතාව උනන්දු කරවීම හා දැනුම්වත් කිරීම කළ යුතුව ඇත. මෙහිදී මෙරට ක්‍රියාත්මක විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පමණක් නොව සමාජ මාධ්‍ය ජාල පවා සැලකිය යුතු ඉඩක් හා අවධානයක් මේ කෙරෙහි යොමු කොට රටවැසි ජනතාව අනවසර මූල්‍ය සමාගම්වල ගොදුරු බවට පත් වීම වළකාලීමට පියවර ගත යුතුව ඇත.




**ජයසිරි මුණසිංහ**

# රැකියා අපේක්ෂකයන්ට දෙන්නේ ඉලක්කගත පුහුණුවක්

රැකියා ලක්ෂයේ
වැඩ සටහන් සම්බන්ධීකාරක
**කුමාර වන්නිආරච්චි**



විරැකියාව තුරන් කළ හැකි ක්‍රමෝපාය පිළිබඳව අවධානය යොමු කිරීමේදී විරැකියාව යන්න කුමක්දැයි වටහා ගැනීම කාලෝචිතය. වැඩ කරන වයසේ පසුවන යම් අයකුට පූර්ණකාලීන රැකියාවක නිරත වීමට අවශ්‍ය වූ විට එය කළ නොහැකි අවස්ථාවකට පත්වීම විරැකියාව යනුවෙන් නිර්වචනය කළ හැකිය. සමාජ විද්‍යාඥයන්, මානව විද්‍යාඥයන් සහ බුද්ධිමතුන්ගේ අදහස් අනුව ශ්‍රී ලංකාව 1971 දීත්, 1989 දීත් විරැකියාව මූලික කර ගත් තරුණ අසහනය නිසා හටගත් ගැටලුවලට මුහුණ දුන්නේය. එසේ හෙයින් ඉදිරි සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමට ශ්‍රී ලංකාව විරැකියාව උදෙසා ස්ථිරසාර විසඳුමක් සොයා ගත යුතු වේ. ඒ සඳහා 69 ලක්ෂයකගේ ජනවරම ලබා ගත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තිය අනුව විරැකියාවට විසඳුම් සෙවීම සඳහා කඩිනම් වැඩපිළිවෙළ රැසක් ක්‍රියාවට නංවනු ලැබීය. ඉන් එක් වැඩපිළිවෙළක් ලෙස රට හදන සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළ යටතේ "ඔබට රටක් රටට හෙටක්" වැඩසටහන බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බළකා දෙපාර්තමේන්තුව මඟින් 2020 දී ආරම්භ කරනු ලැබීය. එම වැඩසටහනට අනුව රැකියාලාභීන්ට සුදුසු රැකියාවක නියුක්ත වීමට ලබා දෙන පුහුණුව සම්බන්ධයෙන් රැකියා ලක්ෂයේ වැඩසටහන් සම්බන්ධීකාරක, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරියේ ( NAITA) කර්මාන්ත පුහුණු සහකාර අධ්‍යක්ෂ කුමාර වන්නිආරච්චි මහතා සමඟ සාකච්ඡාවකි මේ.

**● රැකියා ලක්ෂයක් ලබා දීමේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරිය දක්වන දායකත්වය කුමක් ද?**

නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොළ මහත්මියගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරියේ සභාපති තරංග සම්පත් ගමලත්, අධ්‍යක්ෂ නිලන්ත ද සිල්වා මහතාගේ අධීක්ෂණය යටතේ සියලු පුහුණු කිරීම් සිදු කෙරෙනවා. මේ වන විට තෝරා ගත් රැකියා ලක්ෂයේ පත්වීම්ලාභීන් 34818 දෙනෙකුගෙන් 26765ක් පෙබරවාරි මස 24 වැනිදා වන විට මූලික පුහුණුව අවසන් කරනු ලැබුවා. මේ අය හය මාසයක පුහුණුවක් සඳහා තමයි යොමු කරන්නේ. මුලින්ම සති දෙකක නායකත්ව පුහුණුවක් ලබා දෙනවා. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය පුහුණු වැඩසටහනට එක්වන පුහුණුව සාර්ථකව නිම කරන අභ්‍යාසලාභීනට NVQ III ශ්‍රේණියේ සහතික පත්‍රයක් ප්‍රදානය කරනවා. පුහුණු කාලය තුළ සෑම අභ්‍යාසලාභියකුට රුපියල් 22,500ක මාසික දීමනාවක් ගෙවනු ලබනවා. මේ රැකියා ලක්ෂයේ වැඩසටහන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් "දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක්" බිහි කිරීමේ සංකල්පයට අනුව සැලසුම් කරනු ලැබූවක්. එය බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බළකා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන අතර අඩු ආදායම්ලාභීන්ගේ ආදායම නැංවීම, සමාජ සංරක්ෂණය තහවුරු කොට දිළිඳුකම පිටුදැකීම ආදායම් විසමතා හැකි තරම් සමනය කොට ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැගීම ඉන් අපේක්ෂා කෙරෙනවා.

**● මෙම වැඩසටහන ආරම්භ කරනු ලැබුවේ කුමන කාලයක ද?**

වැඩසටහන ක්‍රියාත්මක කිරීම 2020 වසරේ ජනවාරි මස 20 වැනිදා ආරම්භ වූවා. භාෂා තුනෙන්ම පළ කළ පුවත්පත් දැන්වීම් මගින් සුදුස්සන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබීමෙන් අනතුරුව සියලු අයැදුම්පත් තම ප්‍රදේශය භාර ග්‍රාම නිලධාරී වෙත යොමු කරන ලෙස දැනුම් දී තිබුණා. එසේ ලැබුණු අයැදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ගෙන්වා ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට අභ්‍යාසලාභීන් තෝරාගනු ලැබුවා. තෝරා ගත් කිසිවකු රජයේ හෝ පෞද්ගලික ආයතනයක රැකියාවක් නොකරන පවුල්වල සාමාජිකයන් වීම විශේෂත්වයක්. අඩු ආදායම්ලාභී පවුල්වල සිටින, අවම අධ්‍යාපන සුදුසුකම් සහිත සාමාජිකයන්ට, විධිමත් වෘත්තීය පුහුණුවක් ලබා දීමෙන් පසු රජයේ ස්ථිර රැකියා ලබා දීම ජනාධිපතිතුමාගේ විශේෂ අවධානය යොමු වුණා වගේම එවැනි පිරිසකට මෙම රැකියා ලබා දීම මගින් ඔවුන් ස්ථාවර ආදායම් ලබන්නන් බවට පත් කර, එම පවුල් දිළිඳු බවින් මුදවා ගැනීම සහ ශ්‍රම බළකායේ නිපුණතා සමෘද්ධිමත් රටක් ගොඩනැඟීමේ කාර්යයට, සඵලදායී ලෙස දායක කර ගැනීම මෙහි ප්‍රධාන අරමුණක් වුණා.

**● මේ වැඩසටහන යටතේ පුහුණුව ලබන්නේ කුමන ප්‍රදේශවල පිරිසක් ද?**

රට පුරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් මේ පිරිස තෝරා ගෙන තිබෙනවා. රැකියා විරහිත දිළිඳුබවින් පිරි පවුල්වලින් මේ අය තෝරා ගෙන තිබෙනවා. ඒ වගේම මේ පිරිස සත්‍ය ලෙසම දුෂ්කර පවුල්වල පිරිස්. එක් පවුලකින් එක් අයෙක් මේ සඳහා තෝරා ගැනෙනවා. කාන්තාවන්ගේ විරැකියා මට්ටම, තරුණියන්ගේ විරැකියා මට්ටමට වඩා ඉහළ බව පැහැදිලිව පෙනී ගොස් තිබෙනවා. මේ නිසා කාන්තාවන්ට සමතැන් දීමේ ගෝලීය ප්‍රවණතාව අනුව යමින් මෙරට කාන්තාවන් සඳහා ඇති රැකියා ඉඩකඩ ද පුළුල් කිරීම මෙහි එක් අරමුණක්. වත්මන් කොවිඩ් 19 අනාරක්ෂිත සෞඛ්‍ය තත්ත්වය යටතේ සුළු, මධ්‍යම හා විශාල පරිමාණයේ කර්මාන්ත ශාලා වැඩබිම් හා කාර්යාල වැසී යමින් පවතින වාතාවරණයක් යටතේ ලක්ෂ ගණනින් රැකියා අහිමි වී තරුණ අසහනය වඩාත් ඉහළ යෑමක් අපේක්ෂා කළ හැකි වුව ද පුහුණුව අය ලත් රැකියා සඳහා යොමු කිරීමෙන් රැකියා සුරක්ෂිත බව මෙන්ම රැකියාවට ප්‍රවිශ්ට වීමේදී වඩාත් පලදායීතාවයක් මොවුන්ගෙන් ලබා ගත හැකි වෙනවා. මේ පුහුණුව සඳහා අති දුෂ්කර දිස්ත්‍රික්ක නියෝජනය කරමින් පුහුණුලාභීන් එක්ව සිටිනවා. මොනරාගල, අනුරාධපුර පොළොන්නරුව, බදුල්ල, නුවරඑළිය වැනි අති දුෂ්කර දිස්ත්‍රික්කවල තෝරා ගත් මධ්‍යස්ථානවලදී මේ පිරිස පුහුණුව ලබනවා. මේ සඳහා ආබාධිත පුහුණුලාභීන් ද සහභාගී වීම විශේෂත්වයක්. ඒ අයටත් අවශ්‍ය සියලු පහසුකම් පුහුණු කාලය තුළ ලබා දී තිබෙනවා.



**පුහුණුවට ගත්තේ වයස අවුරුදු 18-40වල අයයි**

**මසක පමණ න්‍යායාත්මක පුහුණුවක් ලබා දෙනවා**

**පුහුණු කාලය තුළ සෑම අයකුටම රුපියල් 22,500ක මාසික දීමනාවක් ගෙවනවා**

**පුහුණුව ලබා දෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා**

**● මේ අයට පුහුණුවෙන් පසුව ලැබෙන අවස්ථා මොනවාද?**

හය මාසික පුහුණුවෙන් පසු අභ්‍යාසලාභීන්ට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ රජයට අනුබද්ධ ආයතනවල පුරප්පාඩු පිරවීම සඳහා යොමු කරවනවා. බඳවා ගනු ලබන පිරිස් රජයේ ගොවිපොළවල සහ අතහැර දමා ඇති වගා කළ හැකි ඉඩම්වල නවීන කෘෂි තාක්ෂණය උපයෝගි කර ගනිමින් එළවළු සහ පලතුරු නිෂ්පාදන කටයුතුවලට මෙන්ම වනජීවි හා වන සංරක්ෂණ, වාරිමාර්ග ගොවිජන සේවා, කෘෂි සේවා මධ්‍යස්ථාන, ග්‍රාමීය රෝහල්, පාසල් සම්බන්ධ කටයුතු සඳහා ද යොදවන්න පුළුවන්. සමාජ සංවර්ධනයේ යාන්ත්‍රණය ව්‍යවසායකත්වය ලෙස සැලකෙන අතර කාලයත් සමඟ ලෝකය සංවර්ධනය වෙද්දී ව්‍යවසායකත්වයේ අරුත කලින් කලට වෙනස් වෙනවා. නව තොරතුරු තාක්ෂණය සමඟ එය බෙහෙවින් වෙනස් වෙනවා වගේම එය විෂය අධ්‍යයනයකට වඩා ප්‍රායෝගික ව්‍යාපාර කටයුතුවලදී හඳුනාගත හැකි වෙනවා. අධ්‍යාපනය සාර්ථක නොවූ ව්‍යාපාරිකයකුට පවා එය පහසුවෙන් වටහා ගත හැකි වන අතර ආර්ථික විද්‍යාවේදී ව්‍යවසායකත්වය ඉඩම් ක්‍රමය, ස්වභාවික සම්පත් සහ ප්‍රාග්ධනය සමඟ සමගාමීව ලාභය නිර්මාණය කරන ආකාරය විස්තර වෙනවා. නවීකරණයත් අවදානම් දැරීමත් සමඟ ව්‍යවසායකත්වයේ ජීවය රඳා පවතිනවා. තරගකාරී ගෝලීය වෙළෙඳපොළේ සාර්ථකත්වය ළඟා කර ගැනීමට ව්‍යවසායකත්ව හැකියාවෙන් යුතු වීම වැදගත්. ඒ නිසයි මේ පුහුණුව අතිශය වැදගත් බවට ජනාධිපතිතුමා තීරණය කර තිබුණේ.

**● මේ පිරිස පුහුණුවෙන් පසුව රැකියා සඳහා යොමු කරන්නේ කුමන අයුරකින් ද?**

මේ වනවිට අප , ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) යටතේ තෝරා ගත් රැකියා ලක්ෂයේ පත්වීම්ලාභීන් 34818 දෙනෙකුගෙන් 26765ක් පෙබරවාරි මස 24 වනදා වන විට මූලික පුහුණුව අවසන් කරනු ලැබුවා. ඒ අයගෙන් මේ වනවිට on the job training සඳහා 12667ක් යොමු කර තිබෙනවා. මසක පමණ න්‍යායාත්මක පුහුණුවක් ද මේ පිරිසට ලබා දෙනවා. අනෙක් පුහුණු කාලය මාස හතර හමාරක් පමණ වෙනවා. මේ පුහුණුවෙන් පසුව තමයි "ඔන් ද ජොබ් ට්‍රේනින්" එක ලබා දෙන්නේ. පුහුණුවට යොමු කරායින් පසුව තාක්ෂණික අධ්‍යාපන වෘත්තිය පුහුණු කොමිෂන් සභාවේ (TVC) සහ ජාතික ආධුනිකත්ව පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) එක්ව අවසන් අදියර ඇගයීම සිදු කරනවා. ඉන් සමත් වන සිසුන් පමණයි රැකියාලාභීන් ලෙස සුදුසුකම් ලබන්නේ. මේ සඳහා පුහුණුලාභීන් දැඩි කැපවීමෙන් කටයුතු කරනවා. ඔවුන්ට පැවරෙන තක්සේරු වාර්තා ඔවුන් හොඳින් සිදු කර ඉදිරිපත් කරනු ලබනවා.

**● මේ අය පුහුණු කිරීමට විශේෂිත ස්ථාන තිබෙනවා ද? ඒවා හඳුනාගන්නේ කොහොම ද? ඒ මොනවා ද?**

රජයට අනුබද්ධිත කෘෂිකර්ම, ප්‍රවාහන, සෞඛ්‍ය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍ර ඇතුළු තෝරා ගත් ක්ෂේත්‍ර ගණනාවක මොවුන් පුහුණු කරනු ලබනවා. වතු ආශ්‍රිත පුහුණුලාභීන් එම ප්‍රදේශවල පවතින හඳුනාගත් කෂේත්‍රවලට මේ පිරිස යොමු කරනු ලබනවා. දිස්ත්‍රික්ක 25 නියෝජනය කරමින් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මේ පුහුණුව ලබා දෙන අතරම රට තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වයෙන් ආරක්ෂා වීමේ විශේෂිත සෞඛ්‍ය ක්‍රමවේද අනුගමනය කරමින් මේ පුහුණුව ලබා දෙනවා.

**● මේ පුහුණුවට තෝරා ගත් විශේෂිත වයස් කාණ්ඩයක් තිබෙනවා ද?**

ඔව්. වයස අවුරුදු 18-40 වයස් කාණ්ඩයේ අයවළුන් තමයි පුහුණුවට යොදා ගනු ලැබුවේ. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම පුහුණු වැඩසටහන් සඳහා යොමු වී සිටිනවා. මෙහි ආබාධ සහිත අයත් සිටීම විශේෂත්වයක්. මේ අයත් ඉතාමත් සාර්ථකව පුහුණුවට මුහුණ දෙනවා. සතියේ දින පහේම පුහුණුව ක්‍රියාත්මකයි. උදේ සිට සවස 4.15 දක්වා මේ පුහුණු වැඩසටහන් පැවැත්වෙනවා. පුහුණු කාලය තුළ මේ අයට සමාජයේ යහපත් පුරවැසියෙක් ලෙස ජීවත්වීමේ අවශ්‍යතාවය, හොඳ පුරුදු, ගුණ යහපත්කම් සෑම ආගමකම කියා දී තිබෙන යහ පැවැතුම් වැනි දේවල් පවා සාකච්ඡා කරනවා. මුදල් කළමනාකරණය මෙන්ම කාල කළමනාකරණය වැනි දේවලට අමතරව අන්තර් පුද්ගල සම්බන්ධතා පිළිබඳවත් හොඳින් කියා දෙනවා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ දැක්මට අනුව රටට වැඩදායී පිරිසක් බිහි කිරීමේ ඉලක්කගත පුහුණුවක් මේ අයට අපි ලබා දෙනවා.

**● මේ පුහුණුවෙන් පසුව ලැබෙන රැකියා අවස්ථා මොනවා ද?**

කෘෂි නිෂ්පාදන සහායක, සාත්තු සේවා පවිත්‍ර සේවා සහායක, ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සහායක, ආපදා කළමනාකරණ සහායක, පරිසර කළමනාකරණ සහායක, අලෙවි සේවා සහායක, ප්‍රවාහන කටයුතු සහායක, පරිගණක තොරතුරු තාක්ෂණ දුරකතන ක්‍රියාකරු හා සන්නිවේදන සහායක, මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සහායක, අරක්කැමි භෝජනාගාර සහායක සහ බොජුන්හල් සහායක, තරු පංතියේ සංචාරක හෝටල්, බංගලා සහායක සහ උද්‍යාන අලංකරණ සහායක, ක්‍රීඩා ආයතන, කායවර්ධන මධ්‍යස්ථාන සහායක, ක්‍රීඩාංගණ පිහිනුම් තටාක සහායක සහ ජීවිතාරක්ෂක සහායක, වඩු කාර්මික වඩු සහායක, ඇඳුම් මැසීම, පෙදරේරු සහ පෙදරේරු සහායක, රූපලාවණ්‍ය මධ්‍යස්ථාන සහායක, විදුලි කාර්මික හා විදුලි කාර්මික සහායක සේවා, රියැදුරු සහ රියැදුරු සහායක, සත්ත්ව පාලන හා ධීවර කටයුතු සහායක, ඉන්ධන පිරවුම්හල් සහ රථවාහන පිරිසුදු කිරීමේ සහායක, දැල් හා ධීවර ආම්පන්න අලුත්වැඩියා සහායක, අවි රහිත ආරක්ෂක නියාමක, පූර්ව ළමාවිය සංවර්ධන සහායක, වෑද්දුම්කරු සහායක සහ ජල නළ කාර්මික සහායක, ගෘහපාලනය සුබසාධනය සහ නඩත්තු සහායක ලෙසින් රැකියා අවස්ථා හිමි වෙනවා. මේ ක්ෂේත්‍ර අවධානයට යොමු කරමින් නිපුණතා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා.

**සුභාෂිණී සේනානායක**




## අනියත බිය දුරලමු

අප රට තුළ කොරෝනා හෙවත් කොවිඩ් වසංගත තත්ත්වය ඇතිව අවුරුද්දක් ඉක්මවා ගොස් තිබේ.කොවිඩ් වසංගත තත්ත්වය නිසා රට සම්පූර්ණයෙන්ම වසා දමමින් ඇඳිරි නීතිය පනවන ලැබුවේ 2020 මාර්තු මාසයේදීය. එතැන් සිට මෙම වසංගත තත්ත්වය ගැන සමාජය තුළ විශාල බියක් ඇති වුණි. ලෝකයේ බලවතුන් පවා අසරණ වූ මෙවැනි වසංගතයකට බිය වීමේ කිසිදු වරදක් නැත. එමෙන්ම මෙම බිය නිසා මුල් අවදියේ වසංගතය පැතිර යාමද සැලකිය යුතු මට්ටමකින් පාලනය වුණි. තවද වසංගත තත්ත්වය ගැන බලධාරීන් විසින් නිසි අවබෝධයක් මෙන්ම යහපත් සෞඛ්‍ය පුරුදු ගැන අවබෝධයක්ද සමාජය වෙත ලබා දුනි. එහෙත් රට වසා තිබූ මුල් මාස දෙකක කාලය තුළ රටට ආර්ථික වශයෙන් විශාල හානියක් සහ කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් සහ ව්‍යාපාරිකයන් විශාල අර්බුදයකට ලක්විය. එතැනින් නොනැවතුණු මෙම අර්බුදය රටේ පහළ සමාජ තලයන් විශාල ආර්ථික අර්බුදයකට ගොදුරු වූයේ රටක් ලෙස අප විශාල අගාධයකට යොමු කරමිනි.එයට හේතු වූයේ සමාජය කොවිඩ් තත්ත්තයට මුහුණ දීමට සිදු වීමයි.එහෙත් මෙවැනි තත්ත්වයක් තුළ රටකට හෝ සමාජයකට එක දිගට පවත්වා ගෙන යාමට හැකියාවක් නැත.

පසු ගිය අවුරුද්ද තුළ ලොකුම හානියට සහ දුෂ්කරතාවට පත් වූ අංශයක් ලෙස හඳුන්වා දිය හැක්කේ මෙරට අධ්‍යාපන අංශයයි. ජූනි මාසයේ දී දිවයින පුරා පාසල් පද්ධතිය සිසුන් සඳහා විවෘත වුවද එය නැවත වසාදමන ලද්දේ දෙවන රැල්ලේ කොරෝනා ව්‍යාප්තියත් සමඟය. එම තත්ත්වය තුළ රටේ පාසල් , විශ්වවිද්‍යාල, පිරිවෙන් සහ උපකාරක පන්ති යන සියලු අංශ වසා දමන ලද්දේ දින නියමයකින් තොරවය. එහි ප්‍රතිඵලය වූයේ රට නැවත අකර්මන්‍ය තත්ත්වයකට පත්වීමය. එහෙත් මේ තත්ත්වය රටක් ලෙස මෙය කිසිසේත්ම සුදුසු දෙයක් නොවේ. එහෙත් සියල්ලට පෙර රටත් සමාජයත් සුවපත් කළ යුතු නිසා ආණ්ඩුව මෙම දුෂ්කර තීරණ ගනු ලැබුවේ රටේ සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙනි. එහෙත් නව සාමාන්‍යකරණ පිළිවෙත ලොව පුරා සාර්ථක ලෙස ක්‍රියාත්මක වීමත් සමඟ රට ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් කිරීමට හැකියාව ලැබුණු අතර වසංගත අනතුරේ කේන්ද්‍රස්ථානය බවට පත්ව තිබූ බස්නාහිර හැර සෙසු පළාත්වල පාසල් පද්ධතිය සක්‍රීය කිරීමට රජය කටයුතු කර තිබේ.මුලින් එයට යම් පසුගාමී සහයෝගයක් මාපියන් විසින් ලැබුණද පසුව සිසුන් සහ මාපියන්ගේ යහපත් ප්‍රතිචාර ලැබුණි.

සමාජයේ සහභාගීත්වය යහපත් සෞඛ්‍ය පුරුදු සහ රජයේ වැඩපිළිවෙළ නිසා මේ වන විට කොවිඩ් වසංගත තත්ත්වය වේගයෙන් රට පුරා පැතිර යාම මේවන විට කිසියම් පාලනයකට ලක්ව තිබේ. එයට තවත් සවියක් ලැබී ඇත්තේ ප්‍රති ශක්ති එන්නත් ලබා දීමේ වැඩපිළිවෙළ ශක්තිමත් ලෙස ක්‍රියාත්මක වීමය. එයට සමාජයේ ප්‍රබල සහයෝගයක් සහ ප්‍රතිචාරයක්ද ලැබෙමින් තිබේ. ඒ නිසා වසංගත තත්ත්වය තිබුණද එය යම් කිසි පාලනයකට ලක්ව තිබේ. ඒ තත්ත්වය ගැන සහතික ලබා දෙන්නේ දේශපාලන අධිකාරිය නොවේ. මෙරට සෞඛ්‍ය අංශය. ඉදිරි කාලය තුළ 2020 ට පෙර තිබූ සාමාන්‍ය සෞඛ්‍ය තත්ත්වය ඇති වන බවට අතිශයොක්තියෙන් අනාවැකි පළ කළ නොහැකිය. එහෙත් නව සාමාන්‍යකරණය යටතේ අප ඉදිරියට කටයුතු කළ යුතුය. වසංගතයට බිය වී සැඟවීම තුළින් වසංගතය ජය ගැනීමට අපට හැකියාවක් නැත.සිදු කළ නව ක්‍රමවේද සහ සැලසුම් ඔස්සේ වසංගත අභියෝගයට මුහුණ දීමය.අද වන විට සමස්ත ලෝකයම එළඹ ඇති ක්‍රමවේදය බවට පත්ව ඇත්තේ මෙයයි. දියුණු රටකට යම් කාලයක් රට වසා තම ක්‍රමවේදය පවත්වා ගෙන යා හැකි වුවද අප වැනි දියුණුවන ආර්ථික ශක්තියෙන් පහළ තලයක ඇති රටකට ඒ සඳහා ලොකු හැකියාවක් නැත. එනිසා දැන් කළ යුතුව ඇත්තේ එක් දෙයකි එනම් නව සාමාන්‍යකරණ රටාව ඔස්සේ ජීවිත හැඩගස්වා ගැනීමය.එමගින් වසංගතයට ගොදුරු නොවී රටේ කටයුතුද සාර්ථක ලෙස කරගෙන යාමට හැකියාව ලැබී තිබේ. එනිසා දැන් කළ යුත්තේ අනිසි බියක් ඇති කරගෙන මුළු ගැන්වීමද වසංගයට මුහුණ දෙමින් ආරක්ෂිත ක්‍රමවේද අකුරට රකිමින් ඉදිරි කටයුතු සිදු කරනවාද යන්න ගැන නිසි ලෙස තීන්දු කිරීමය.

**උදිත ගුණවර්ධන**

# දේශීය නිෂ්පාදන රට යවන්න නව සමාගමක්

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

දේශීය නිෂ්පාදන විදේශීය වෙළෙඳපොළ වෙත යොමු කිරීම සඳහා නව සමාගමක් ස්ථාපිත කිරීමට කැබිනට් අනුමැතිය ලැබී තිබේ.

කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා මීට අදාළ යෝජනාව අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.

බතික්, අත්යන්ත්‍ර රෙදි හා ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ සංකල්පයක් මත විදේශයන්හි ප්‍රදර්ශනාගාර පිහිටුවමින් එම රටවලින් තෝරාගත් නියෝජිතයන් හරහා අන්තර්ජාතිකව ශක්තිමක් වෙළෙඳ ජාලයක් ඇති කරමින් ශ්‍රී ලාංකීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛ ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ.

ඒ අනුව, එම කාර්යය සඳහා ලංකා සළුසල සමාගමේ 100%ක් කොටස් සහිත සමාගමක් වශයෙන් නව සමාගමක් ස්ථාපිත කිරීමටත්, එම සමාගම පත් කර ගනු ලබන විදේශීය නියෝජිතයන් හා ප්‍රදර්ශනාගාර මඟින් බතික් නිෂ්පාදන, අත් යන්ත්‍ර පේෂකර්ම නිෂ්පාදන, දේශීය ඇඟලුම් නිෂ්පාදන ඇතුළු වෙනත් දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටත් කර්මාන්ත අමාත්‍යවරයා මෙමඟින් යෝජනා කර තිබේ.

# දේශපාලන පළි ගැනීම් සෙවූ කොමිසමේ නිර්දේශ බල රහිත කරන්න

## සරත් ෆොන්සේකාගෙන් අභියාචනාධිකරණයට රිට් පෙත්සමක්

**නෙල්කා මැදගෙදර**

දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලූ ජනාධිපති කොමිසමේ නිර්දේශ බලරහිත කරන ලෙස ඉල්ලා සමගි ජන බලවේගය පක්ෂයේ සභාපති හා පාර්ලිමේන්තු මන්ත්‍රී ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා විසින් ඊයේ (09) අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ඉදිරිපත් කළේය.

එම කොමිසම විසින් විමර්ශන කටයුතු කර ඇති ආකාරය සම්පූර්ණයෙන්ම නීතියට පටහැණි බවට පෙත්සම මගින් චෝදනා කර ඇත.

පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස එම කොමිසමේ සභාපති විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න, සාමාජිකයින් වන චන්ද්‍රසිරි ජයතිලක හා චන්ද්‍රා ප්‍රනාන්දු, එම කොමිසමේ ලේකම් හා නීතිපතිවරයා නම් කර තිබේ.

පෙත්සම්කාර සරත් ෆොන්සේකා මහතා කියා ඇත්තේ මෙම කොමිසම විසින් විමර්ශන සඳහා තමන් නොකැඳවූ බවත් ඒ සම්බන්ධයෙන් දැනුම් දීමක් හෝ නොකළ බව ය.

එහෙත් එම වාර්තාව අනුව දේශපාලන පළිගැනීම් පිළිබඳව සොයා බැලූ කොමිසම විසින් විභාග කළ පැමිණිලි කිහිපයක් සම්බන්ධයෙන් තමන් ද 'වගකිව යුතු පුද්ගලයකු' බවට නම් කර ඇති බව ට පෙත්සම්කරු සඳහන් කර ඇත .

මෙම කොමිසම සිය විමර්ශන සිදුකළ ආකාරය 1948 අංක 17 දරණ කොමිෂන් සභා පනතේ 7(2)දරන වගන්තිය ට පටහැනි බවට පෙත්සම මගින් පෙන්වා දී ඇත.

එම කොමිසම විමර්ශනය කල ආකාරය සම්පූර්ණයෙන්ම නීතියට පටහැණි යැයි පෙන්වා දෙන සරත් ෆොන්සේකා මහතා තමන්ට පැවරී ඇති බලතල ඉක්මවා ඔවුන් ක්‍රියාකර ඇතැයි ද සඳහන් කරයි.

# කොමිෂන් වාර්තා 2ක් සභාගත කරයි

**ස්වර්ණා විජේකෝන්, සන්ධ්‍යා කරුණාරත්න**

යහපාලන සමයේ සිදුවූ දේශපාලන පළිගැනීම් පිළිබඳ හා වංචා දූෂණ සෙවීමට පත්කළ ජනාධිපති කොමිසමේ වාර්තා සභානායක , අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවේදී ඊයේ (09) සභාගත කළේය.

පාර්ලිමේන්තුවේ ඊයේ (09) දිනට නියමිත කටයුතු ආරම්භ වීමෙන් පසුව සභානායකවරයා අදාළ වාර්තා සභාගත කළේය.

# රන්ජන්ට සෙල්ෆි ගන්න දුන් ජේලර්ගේ වැඩ තහනම්

**රක්ෂණා ශ්‍රියන්ත**

අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ බරපතළ වැඩ සහිත සිරදඬුවම් විඳින රංජන් රාමනායක බැලීමට එහි පැමිණි පාර්ලිමේන්තු මන්ත්‍රීවරකුට ඔහු සමඟ සෙල්ෆි ඡායාරූපයක් ගැනීමට ඉඩ සැලසීම සම්බන්ධයෙන් පළමු පෙළ ජේලර්වරයෙකුගේ වැඩ තහනම් කර ඇති බව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා පැවසීය.

සිද්ධියට අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් විෂය භාර ඇමැතිවරුන් දෙදෙනා හරහා කතානායකවරයා දැනුවත් කිරීමටද පියවර ගෙන ඇති බවද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා කියා සිටියේය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා මේ බව කියා සිටියේ ඊයේ (09) බන්ධනාගාර මූලස්ථානයේ පැවැති විශේෂ මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

පෙරේදා (08) දිනයේදී අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ දඬුවම් විඳින රංජන් රාමනායක ගේ සැපදුක් බැලීමට ගිය පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මහතා එහිදී සෙල්ෆි ඡායාරූපයක් ගෙන ඇති අතර පසුව ඔහු එය සිය ෆේස්බුක් සමාජ මාධ්‍ය ගිණුමේ පළකර තිබුණි. මේ සම්බන්ධයෙන් බොහෝ අය විවිධ අදහස් පළකර ඇති පසු බිමක බන්ධනාගාර කොමසාරිස් වරයා මෙම තීරණය ගෙන තිබුණි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඇති වරප්‍රසාද යටතේ සිරකරුවන් බැලීමට අවස්ථාව ලබා දෙන අතර ඇතුලු වීමේදී ඔහු සතු ජංගම දුරකථන භාර දෙන ලෙස උපදෙස් ලබා දෙන බවත් ඒ අවස්ථාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජංගම දුරකථනය සිය සාක්කුවේ දමාගෙන ගොස් ඇති බවද උපුල්දෙණිය මහතා කියා සිටියේය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ගරු කිරීමක් වශයෙන් ඔවුන්ගේ ශරීර පරීක්ෂාවක් සිදු නොකරන බවත් ඒ අවස්ථාවේ ආරක්ෂාවට සිටී පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්ට ඔහු ජංගම දුරකථනය ලබා නොදී ඇතුලුවී ඇති අතර අනතුරුව ඔහු පළමු පෙළේ ජේලර්වරයෙකු විසින් රන්ජන් රාමනායක බැලීමට කැඳවාගෙන ගොස් ඇත.

# ලේක්හවුස් ආයතනයේ හිටපු ඡායාරූප මාධ්‍යවේදී වොල්ටර් පෙරේරා මහතා අභාවප්‍රාප්ත වෙයි

ලේක්හවුස් ආයතනයේ ඡායාරූප මාධ්‍යවේදියෙකු ලෙස සේවය කළ වොල්ටර් පෙරේරා මහතා අභාවප්‍රාප්ත විය

මියයන විට ඒ මහතා 83 තුන් වැනි වියේ පසුවිය .

කරලයින් මාරසිංහ මහත්මිය ගේ දයාබර සැමියා වූ ඒ මහතා දියණියන් තිදෙනෙකුගේ සහ පුතුණුවකගේ දයාබර පියාවිය.

ඒ මහතාගේ දේහය පිළිබඳ අවසන් කටයුතු අද දින (10) සවස 4.00ට මෝදර මාදම්පිටිය කතෝලික පොදු සුසාන භූමියේ භූමියේ දී සිදු කෙරේ.

දේහය දැනට ඒ මහතාගේ නිවස වන 64/7 බොනවිස්ටා නිවාස සංකීර්ණය මෝදර වීදිය කොළඹ15හි තැන්පත් කර ඇත.

# ලේක්හවුස් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුණ මල්ලව ආරච්චිගේ මාමණ්ඩිය අභාවප්‍රාප්ත වෙයි

ලේක්හවුස් ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දැන්වීම්) වරුණ මල්ලව ආරච්චි මහතාගේ දයාබර මාමණ්ඩිය වූ සිරිසෝම අබේරත්න මහතා අභාවප්‍රාප්ත වී තිබේ.

නැසීගිය තිලකා අබේරත්න මහත්මියගේ ආදරණීය ස්වාමි පුරුෂයා වූද, වින්දන්‍යා හා යෝෂිත යන දූ දරුවන්ගේ පියාණන් වූද, සජිත් කෝදාගොඩ මහතාගේ ද මාමණ්ඩිය වූ ඒ මහතාගේ මෘත දේහයට ගෞරව දැක්වීම පිණිස මේ වන විට බොරැල්ල ජයරත්න මල් ශාලාවේ තැන්පත් කර තිබේ.

ඒ මහතාගේ දේහය පිළිබඳ අවසන් කටයුතු බොරැල්ල කනත්තේ දී අද (10) පස්වරු 3.00ට සිදු කිරීමට නියමිතය.

# ගානියා බැරිස්ටර්ට අධි චෝදනා භාර දෙයි

**රෝෂන් තුෂාර**

කිසියම් පිරිසක් විසින් පැහැරගෙන ගොස් රඳවා ප්‍රශ්න කර ලිංගික අතවරද කර මුදා හැරියේයැයි පවසමින් පොලිස්පතිවරයාට අසත්‍ය පැමිණිල්ලක් කර රජය අපහසුතාවට පත්කළ ස්විස්ටර්ලන්ත තානාපති කාර්යාලයේ සේවිකා ගානියා බැරිස්ටර් ප්‍රැන්සිස් විත්තිකාරියට අධි චෝදනා බාරදීම ඊයේ(09)කොළඹ මහාධිකරණය හමුවේ සිදු කෙරිණි.

2019 දෙසැම්බර් 27 දින වැඩබලන පොලිස්පතිවරයාට කළ ලිඛිත පැමිණිල්ල අසත්‍ය හා ගොතන ලද්දක් බවට සඳහන් කරමින් නිතිපතිවරයා මෙම නඩුව පවරා තිබිණි.

වත්තිකාරියට අධි චෝදනා බාරදුන් මහාධිකරණ විනිසුරුවරයා නඩුවේ අධි චෝදනා කියවාදිම ජුනි 04 දිනට නියම කළ අතර එදින නඩුව විභාග කිරිමට දින නියම කරන බවද දන්වා සිටියේය. විත්තිකාරිය පෙර ඇප මත මුදා හැරීමටද නියෝග කළේය.

ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ සේවය කරන මාලිගාවත්ත පදිංචි ගානියා බැරිස්ටර් ෆැන්සිස් යන ශ්‍රී ලාංකික විත්තිකාරිය කුරුඳුවත්ත බල ප්‍රදේශයේදී පැහැරගෙන ගොස් ලිංගික අතවර කර දැනට රටින් පළාගොස් සිටින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වාට වීසා දීම පිළිබඳ ප්‍රශ්න කර පැය කිහිපයක්ද රඳවා තබා ගෙන මුදා හැරීයේ යැයි පවසමින් අසත්‍ය කරුණු දක්වා පැමිණිල්ලක් ඉදිරිපත් කිරිමට එරෙහිව මෙම අධි චෝදනා ගොනුකර ඇත.

## 01 පිටුවෙන් ...

### සංවර්ධන වැඩවලට ...

අගමැති මහින්ද රාජපක්ෂ මහතා මේ බව කියා සිටියේ මුදල් අමාත්‍යාංශය යටතේ ඇති විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා එක්වෙමිනි. එම රැස්වීම මුදල් අමාත්‍යාංශයේ දී පැවැත්විණි.

විදේශ ණය යෝජනා ක්‍රම යටතේ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති පිළිබඳ මෙහි දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරුණු අතර සාගර විශ්වවිද්‍යාලය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ ද මෙහි දී අවධානයට ලක්විය.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා එහි දී කියා සිටියේ සංවර්ධන ව්‍යාපෘති හුදෙකලා ප්‍රදේශයක් සංවර්ධනය කිරීමේ අරමුණෙන් ක්‍රියාත්මක කළ යුතු බවයි.

විදේශ ණය මත දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති, ඉදිරියේ දී ලබා ගැනීමට අපේක්ෂිත ණය සහ ණය වාරික ගෙවීම ඇතුළු කරුණු රැසක් පිළිබඳ මෙහි දී අවධානය යොමු විය. රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල්, භාණ්ඩාගාර ලේකම් එස්.ආර්. ආටිගල, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අජිත් අබේසේකර, අගමැති කාර්ය මණ්ඩල ප්‍රධානී යෝෂිත රාජපක්ෂ, මුදල් ඇමැතිවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරුන් වන ගැමුණු කරුණාරත්න සහ චරිත් විජේසිංහ මහත්වරුන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක් වූහ.

### 2014 දක්වා ...

එමෙන්ම මෙම ආයතනය පසුගිය සමයේදී සැපයුම්කරුවන් වෙනුවෙන් ගෙවිය යුතු මුදල බිලියන අටක් වන අතර විමර්ශන සිදුකළ නොහැකි තරමට මෙහි වියවුල් තත්ත්වයක් පවතින බවද ඇමැතිවරයා කීය.

ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා මේ බව සඳහන් කළේ පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් ප්‍රනාන්දු මහතා මතුකරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා සඳහන් කළේ ගත වූ කාල සීමාව තුළ පාඩු ලබන ආයතනයක් වූ සතොස ආයතනයේ භාණ්ඩ අලෙවිය සියයට එකසිය දෙකකින් වැඩිකිරීමට හැකි වී ඇති බවයි. වෙළෙඳසැල් 415 කින් සමන්විත සතොස ජාලයේ අලෙවිසල් 279ක් අලාභ ලබන තත්ත්වයෙහි පැවැති අතර එම තත්ත්වය වෙනස් කිරීම සඳහා ද යම් යම් ක්‍රමවේද අනුගමනය කරමින් සිටින බව ද ඇමතිවරයා කීය. එමෙන්ම පසුගිය පාලන සමයේදී සතොස ආයතනයේ ශාඛා ආරම්භ කිරීම කිසිඳු විනිවිද භාවයකින් සිදු කර නොමැති අතර වෙළෙඳාමට සුදුසු නොවන ස්ථානවල පවා වෙළෙඳසල් ආරම්භ කර ඇති බවද හෙතෙම පැවැසීය. එවන් ස්ථාන කෙරෙහි අවධානය යොමුකර අදාළ ශාඛා වෙනත් ස්ථාන කෙරෙහි ගෙනයාමට සැලසුම් කරන බවද ඇමතිවරයා වැඩිදුරටත් පැවසීය.

### හිස කඳෙන් ...

තරුණිය ඝාතනය කර ඇත්තේ අවසන් වරට ආහාර ගෙන පැය දෙකත් තුනත් අතර කාලයකදී බවද එම තරුණිය ගැබිණියක් නොවන බවද පශ්චාත් මරණ පරීක්ෂණයේදී අනාවරණය වී තිබේ.

වේල්ල වීදියේ තිබී සොයා ගත් හිස නොමැති තරුණියගේ මළ සිරුරේ ඩී.එන්.ඒ. සාම්පල් මවගේ සහ සහෝදරයාගේ ඩී.එන්.ඒ සාම්පල් සමග සැසඳෙන බවට රජයේ රස පරීක්ෂකවරයා විසින් වාර්තා කිරීමෙන් අනතුරුව මෙම පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකළ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

පසුගිය මාර්තු මස 01 වෙනිදින ගමන් මල්ලක බහා කාන්තා මළ සිරුරක් වේල්ලවීදිය ප්‍රදේශයේ අතහැර දමා තිබුණු අතර එම ඝාතනය සිදුකළ බවට හඳුනාගත් බුත්තල පොලිසියේ සේවය කළ උප පොලිස් පරීක්ෂකවරයාද වස පානය කර ගෙල වැලලාගෙන මිය ගිය ගොස් තිබුණි.

මෙම මළ සිරුර කුරුවිට තෙප්පනාව ප්‍රදේශයේ පදිංචි දිලිණි ජයසූරිය නැමැති තරුණියගේ බව හඳුනා ගැනුණු අතර එහි හිස නොමැති නිසා නිසැක විද්‍යාත්මක හඳුනා ගැනීමක් සඳහා ඩී.එන්.ඒ පරීක්ෂාවක් සිදුකිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ඩී.එන්.ඒ පරීක්ෂාව රජයේ අතිරේඛ රස පරීක්ෂක ඩී.එච්. එල්.ඩබ්ලිව්.ජයමාන්න මහතා විසින් වාර්තාව නිකුත් කර තිබුණි.

එම ඩී.එන්.ඒ පරීක්ෂාව අනුව ඇය කුරුවිට තෙප්පනාව ප්‍රදේශයේ පදිංචි 30 හැවිරිදි තරුණිය බවට නැසැකවම ජීව විද්‍යාත්මක සාක්ෂි මගින් සනාථ වී ඇත. මිය ගිය තැනැත්තිය අදාළ මවගේ ජෛව විද්‍යාත්මක දියණිය බවත් අදාළ පුද්ගලයා මෙම මියගිය තැනැත්තියගේ ජෛව විද්‍යාත්මක සහෝදරයා බවත් අනාවරණය වන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

එම තරුණියගේ හිස මෙතෙක් සොයාගෙන නොමැති අතර ඒ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ වේල්ලවීදිය පොලිස් ස්ථානය විසින් සිදුකරයි.

### රන්ජන් ඇදවැටෙයි ...

ඊයේ සවස 1.30ට පමණ රන්ජන් රාමනායක මහතාව බන්ධනාගාර නිලධාරීන් විසින් කොළඹ කාසල් වීදියේ පිහිටි පුවත්පත් මණ්ඩලය වෙත රැගෙන විත් යළිත් පිටව යන අවස්ථාවේ ඔහුගේ හිතවතුන් පිරිසක් එම ස්ථානයට රොක් වී සිටි අතර ඔවුන් සහ එහි සිටි මාධ්‍යවේදීන් අසලින්යම් කිසිවක් පවසමින් බන්ධනාගාර බස්රථය අසලින් ගමන් කරන අවස්ථාවේදී රන්ජන් රාමනායක මෙසේ ඇදවැටී තිබේ.

වහා යුහුසුළු වූ බන්ධනාගාර නිලධාරීහු ඔහුව දැඩි පරිශ්‍රමයකින්බන්ධනාගාර බස්රථයට නංවාගෙන පිටව ගියහ.

### මද්‍රසා පාසල් ගැන ...

බොදු බල සේනා සංවිධානය තමනම් කිරීම සුදුසු නැති බවත් එම සංවිධානය සම්බන්ධයෙන් පාස්කු කොමිසම දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම අසීරු බවද ඇමතිවරයා කියා සිටියේය.

බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ පසුගියදා පැවැති මාධ්‍ය හමුවකදී අමාත්‍යවරයා මේ බව කියා සිටියේය.

පාස්කු කොමිසම දුන් සෙසු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බව කී ඇතැමැතිවරයා බොදු බල සේනා සංවිධානය තහනම් කිරීමෙන් යහපතක් වේ යැයි විශ්වාස නොකරන බවද කියා සිටියේය.

පාසල්වල උගන්වන්නේ මොනවාද ඒවායේ හර පද්ධතීන් කෙබඳුද යන්න සොයා බැලීමට රජයට වගකීමක් ඇති බවද පෙන්වා දුන්නේය.

අධ්‍යාපනය ආරක්ෂාව ඇතුළු සෑම ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන්ම පාස්කු කොමිසම් වාර්තාවේ කරුණු ඇතුළත් හෙයින් එය විවේචනය කිරීමට පෙර එම වාර්තාව හොඳින් කියවා බලන ලෙසද ඇමැතිවරයා ඉල්ලා සිටියේය.

### සමෘද්ධියෙන් සහන ...

ශ්‍රී ලංකාවේ සෑම නිවසකටම විදුලිය ලබාදීමේ අරමුණෙන් රජය මගින් ක්‍රියාත්මක "සැමට විදුලිය" වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මැදිහත් වී තිබෙන අතර ඒ අනුව දැනට විදුලිය පහසුකම් නොමැති අඩු ආදායම්ලාභීන්ගේ නිවාසවල අභ්‍යන්තර පරිපථ සකස්කර ගැනීම සඳහා එම දෙපාර්තමේන්තුව මඟින් සහන ණය ලබාදෙයි.

"සැමට විදුලිය" වැඩපිළිවෙළ යටතේ මෙම වසර අවසන් වනවිට විදුලිය නොමැති සියලු නිවාස වෙත විදුලිය ලබාදීමට අපේක්ෂා කෙරෙන අතර ඒ අනුව නිවාස වෙත විදුලි රැහැන් ඇදීම හෝ වෙනත් ප්‍රභවයන් ඔස්සේ එම නිවාස වෙත විදුලිය ලබාදීමට නියමිතයි.

එහෙත් අභ්‍යන්තර විදුලි පරිපථ සකස් කර ගැනීමේ ගැටලුවට මුහුණ දී ඇති අඩු ආදායම්ලාභී ජනතාව විශාල පිරිසක් සිටින බවත්, ඔවුන් වෙනුවෙන් මෙම තීරණය ගත් බවත් සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා පවසයි.

### වී මිල ...

අතරමැදි වී මෝල් හිමියන් රජය සමඟ තරගකාරී ලෙස වී මිලදී ගැනීම සිදුකරන බවත් රජය විසින් රුපියල් 55ට වී මිලදී ගන්නා විට ඔවුන් රුපියල් 60 දක්වා වී මිල ඉහළ දැමීමට කටයුතු කර ඇති බවත් මෙම ක්‍රියාවලියේදී රජයට යම් පාඩුවක් සිදුවුවද පාරිභෝගිකයා මත ඒ බර පැටවීම සිදු නොකරන බව හෙතෙම පැවසීය.

අප්‍රේල් අග වන විට වී අලෙවි මණ්ඩලය සතුව වී මෙට්‍රික් ටොන් ලක්ෂ 03ක් ගබඩා කරගෙන පාරිභෝගිකයාට අඩුමිලට හාල් ලබාදීම ආරම්භ කළ හැකි බවත් වී මාෆියාවට එරෙහි ජාතික ක්‍රියාන්විතය මාර්තු 07 සහ අප්‍රේල් 08 ඇතුළත ක්‍රියාත්මක වන බවත් කීවේය.

මේ වන විට වී මෙට්‍රික් ටොන් තුන්ලක්ෂ විසිතුන්දහස් හත්සීයක ධාරිතාවක් ගබඩා කළ හැකි අතර ඒ සඳහා සමූපකාර හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සතුවද ගබඩා පහසුකම් ඇති අතර මෙට්‍රික් ටොන් ලක්ෂ 05ක ගබඩාවක් සූදානම්ව පවතින බව අමාත්‍යවරයා අවධාරණය කළේය.

### අදානි සමාගම ...

මෙම බටහිර පර්යන්තය සංවර්ධනය කිරීම සඳහා මෙසේ ඉන්දියානු සමාගමක් එක්ව සිටින්නේ වත්මන් රජයේ සම්බන්ධයකින් තොරව බව ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යාංශය ද ප්‍රකාශ කර ඇති බවත් ඇමැතිවරයා කියයි.

ඊයේ (09) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදීන් මේ සම්බන්ධව නැගූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඇමැතිවරයා මේ බැව් පැවැසීය. 'කොළඹ වරායේ බටහිර පර්යන්තය සංවර්ධනය කරන්නට පුළුවන් අදානි සමාගමට පමණක්ද කියා මෙහිදී ප්‍රශ්නයක් නැගුණා .මේ සමාගම ඒ සඳහා නම් කළේ ඉන්දියානු ආණ්ඩුව. නැගෙනහිර ජැටිය ඉන්දියාවට ලබා නොදීමට ආණ්ඩුව ගත් ප්‍රතිපත්තිමය තීන්දුවක ප්‍රතිඵලයක් ලෙසයි බටහිර ජැටිය ඔවුනට ලබා දුන්නේ. නැගෙනහිර ජැටිය සංවර්ධනයට ඉන්දියාව නම් කළ සමාගමටම බටහිර ජැටිය සම්බන්ධයෙන් සාකච්ඡාවන්ට ශ්‍රී ලංකා රජය ආරාධනා කළා .'යැයිද මෙහිදී ඇමැතිවරයා අවධාරණය කළේය.

### බස්නාහිර පළාතේ ...

බස්නාහිර පළාතේ පාසල් ආරම්භ කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතාගේ ලිඛිත නිර්දේශය ඊයේ (9) අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබුණු බවත්, ඒ අනුව මෙම තීරණය ගත් බවත් අධ්‍යාපන ඇමැතිවරයා සඳහන් කරයි.

අධ්‍යාපන අමාත්‍යංශයේ ඊයේ (9) පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ඇමැතිවරයා මේ බව පවසයි.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා,

'බස්නාහිර පළාතේ පාසල් ආරම්භ කිරීම පිළිබඳ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතාගේ ලිඛිත නිර්දේශය අප වෙත ලැබී තිබෙනවා. ඒ අනුව ලබන සඳුදා එනම් මාර්තු 15 වැනිදා බස්නාහිර පළාතේ පාසල් ආරම්භ කළ යුත්තේ 5, 11 සහ 13 ශ්‍රේණි සඳහා පමණයි. සෙසු ශ්‍රේණිවල පන්ති ආරම්භ කළ යුතුයි කියා නිර්දේශ කර තිබෙන්නේ අප්‍රේල් නිවාඩුවෙන් පසුවයි. ඒ නිසා අපි තීරණය කර තිබෙනවා බස්නාහිර පළාතේ සෙසු ශ්‍රේණි අප්‍රේල් 19 පාසල් ආරම්භ කරන්න.

1වන ශ්‍රේණියේ පන්ති සඳහා සිසුන් මේ වනවිටත් පාසල්වලට ඇතුළත් කර තිබෙනවා. නමුත් එම පන්ති තවම ආරම්භ කර නැහැ. බස්නාහිර පළාතේ කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවලට 1 වන ශ්‍රේණියේ පන්ති ද ඇතුළු ව අනෙකුත් සියලු ම පන්ති අප්‍රේල් 19 ආරම්භ කිරීමට කටයුතු කරනවා. දිවයිනේ සෙසු ප්‍රදේශවල පාසල් ආරම්භ කිරීම පිළිබඳ කිසිදු ගැටලුවක් නැහැ. ඒ අනුව මාර්තු 15 වන දින බස්නාහිර පළාත හැර දිවයිනේ අන් සියලු ප්‍රදේශවල සියලු ම පාසල් සියලු ම ශ්‍රේණි සඳහා විවෘත කෙරෙනවා' යනුවෙන් ද පැවසී ය.

### පාස්කු කොමිසමේ ...

දින තුනක විවාදයක් ලෙස අදාළ විවාදය පැවැත්වෙන අතර අද (10) දවස පුරා විවාදය සිදුකිරීමෙන් පසුව මෙම මස තුන්වන සතියේ තවත් දින දෙකක් මේ සඳහා වෙන් කරන බව සභානායක දිනේෂ් ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (09) ප්‍රකාශ කළේය.

ඒ අනුව පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව පිළිබඳ විවාදය , රජය විසින් ගෙන එනු ලබන සභාව කල් තැබීමේ යෝජනාවක් ලෙස විවාදයට ගැනීම සිදුවේ. විවාදය පැවැත්වෙන අද දිනයේදී අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න වටය සිදු නොකෙරෙන අතර 10.00 සිට පෙරවරු 11.00 දක්වා මන්ත්‍රීවරුන්ගේ වාචික ප්‍රශ්න සඳහා කාලය වෙන් කිරීම සිදුවේ.

ඉන් පසුව ආණ්ඩු පක්ෂය විසින් ඉදිරිපත් කරනු ලබන සභාව කල්තැබීමේ යෝජනාවක් ලෙස පාස්කු ඉරිදා ප්‍රහාරය සඳහා සොයා බැලූ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳ විවාදය පෙරවරු 11.00 සිට පස්වරු 5.30 දක්වා පැවැත්වීමට නියමිත වේ.

### මුතුරාජවෙල ගැන ...

මුතුරාජවෙල තෙත්බිම් කලාපය තුළ සිදුවන නීති විරෝධී ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සහ කැලි කසල බැහැර කිරීම අත්හිටුවීමේ නියෝගයක් නිකුත් කරන මෙන් ඉල්ලා කොළඹ අග රද ගුරු කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් සහ පරිසර යුක්ති කේන්ද්‍රය විසින් ඉදිරිපත් කර තිබූ පෙත්සම් කැඳවූ අවස්ථාවේදී මධ්‍යම පරිසර අධිකාරිය සහ නීතිපති වරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජෙනරාල් ප්‍රියන්ත නාවාන මහතා මෙම දැනුම් දීම කළේය.

මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අභියාචනාධිකරණය විසින් ඉකුත් 03වැනිදා නීතිපති වරයා ට නියම කර තිබුණි.

අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර සහ විනිසුරු මායාදුන්නේ කොරයා යන මහත්වරුන් හමුවේ මෙම පෙත්සම් කැඳවනු ලැබිණි.

එහිදී අතිරේක සොලිසිටර් ජෙනරාල් වරයා කල ඉල්ලීම පිළිගත් අධිකරණය එම වාර්තාව 24වැනිදා ඉදිරිපත් කරන ලෙස නියම කල අතර පෙත්සම් මෙම මස 30වැනිදා කැඳවීමට තීරණය කලේය .

මුතුරාජවෙළ වගුරු ආශ්‍රිත බිම් පෙදෙස් පිරවීම සඳහා එම තෙත්බිමට අපද්‍රව්‍ය දැමීම වළකාලමින් තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසත් , මුතුරාජවෙළ ඇතුළු පාරිසරික වැදගත්කමකින් යුතු අනෙකුත් තෙත්බිම් ආරක්ෂා කිරීමට ව්‍යවස්ථාමය පියවර ගන්නා ලෙසට මධ්‍යම පරිසර අධිකාරි , පරිසර අමාත්‍ය මහින්ද අමරවීර , වනජීවි හා වන සංරක්ෂණ අමාත්‍ය ඇතුළු බලධාරීන්ට නියෝග කරන්නැයි ඉල්ලා මෙම පෙත්සම් ගොනු කර තිබුණි.

තවද මෑතකදී පෞද්ගලික සමාගමක් මෙම මුතුරාජවෙළ තෙත්බිමේ අක්කර 50 ක් නීතිවිරෝධී ලෙස පස් පිරවීම සඳහා ලබා ගෙන ඇතැයි දැනගන්නට ලැබී ඇතැයි සඳහන් කර තිබේ.

මෙම පෙත්සමෙහි වගඋත්තරකරුවන් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය , පරිසර අමාත්‍ය මහින්ද අමරවීර , වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍ය සී.බී.රත්නායක , වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල් චන්දන සූරියබණ්ඩාර , වන ජීවී අධ්‍යක්ෂක ඩබ්ලිව්.ඒ.සී වේරගොඩ , ගොවිජන සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක රෝහණ රාජපක්ෂ , පොලිස්පති සී.ඩී වික්‍රමරත්න , වත්තල , මීගමුව , හා ජා ඇළ ප්‍රාදේශීය ලේකම්වරුන් , නීතිපති ඇතුළු 12 දෙනෙකු නම් කරනු ලැබ සිටිති.

මුතුරාජවෙළ තෙත් බිම ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි තෙත් බිමකි.මෙම තෙත් බිම සුවිශේෂ ජෛව විවිධත්වයක් සහිත පරිසර පද්ධතියක්ද වේ.ඊට අමතරව සෞන්දර්යාත්මක වටිනාකමකින් යුක්තවේ.

මුතුරාජවෙළ කුඹුරු යාය , ඇළ මාර්ගය සහ වගුරු බිම් වලින් සමන්විතවන අතර අක්කර 635 ක් ප්‍රමාණයක කුඹුරු යායකින් සමන්විත වේ.

තත්ත්වය මෙසේ තිබියදී මෙම වගුරු බිමෙහි නීතිවිරෝධී ආකාරයට පස් යොදා වගුරු බිම ගොඩ කිරීම වසර ගණනාවක සිට සිදුවේ.මෙය මහපරිමාණයෙන් සිදුවන නීතිවිරෝධී ව්‍යාපාරයකි.මේ හේතුවෙන් මෙහි ජලපෝෂක ප්‍රදේශය අහිමිව ගංවතුර තත්ත්වයක් ඇති විය හැක.

තවද මෑතකදී පෞද්ගලික සමාගමක් මෙම තෙත්බිමේ අක්කර 50 ක් නීතිවිරෝධී ලෙස පස් පිරවීම සදහා ලබා ගෙන ඇතැයි දැනගන්නට ලැබී ඇත.මෙම තත්ත්වය දිගටම පැවතුණහොත් මෙම පරිසර පද්ධතිය සම්පූර්ණයෙන්ම විනාශ වීමේ තත්ත්වයක් උදාවේ.

එබැවින් වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කරන ලෙසද, මුතුරාජවෙල වගුරු ආශ්‍රිත බිම් පෙදෙස් පිරවීම සඳහා අපද්‍රව්‍ය දැමීම වළකාලන ලෙසට වගඋත්තරකරුවන්ට එරෙහිව අතුරු නියෝගයක් නිකුත් කරන ලෙසද පෙත්සමෙන් ඉල්ලා සිටී.

ඊට අමතරව මෙම තෙත්බිම ආරක්ෂා කිරීමය අවශ්‍ය ව්‍යවස්ථාමය පියවර ගැනීමට වගඋත්තරකරුවන්ට නියෝග කරන ලෙසත් , මෙම තෙත්බිම ඇතුළු අනෙකුත් පාරිසරික වැදගත්කමකින් යුත් තෙත්බිම් අවභාවිතය කිරීම වළක්වාලන පියවර ගැනීමට වගඋත්තරකරුවන්ට නියෝග කරමින් අතුරු නියෝගයක් නිකුත් කරන්නැයිද පෙත්සම්කාර පාරිසරික යුක්ති කේන්ද්‍රය සිය පෙත්සමෙන් ඉල්ලා තිබිණි.

පෙත්සම්කාර සංවිධානය වෙනුවෙන් නීතිඥ රවින්ද්‍රනාත් දාබරේ මහතා පෙනී සිටියේය.

නීතිපති වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ප්‍රියන්ත නාවාන මහතා පෙනී සිටියේය.

### දේශපාලන බලපෑම්වලට ...

ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතා මේ බව පැවසුවේ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට කොවිඩ් මර්දන එන්නත දීමේදී දේශපාලන බලපෑම් සිදුවන බවට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය කරන චෝදනාව සම්බන්ධයෙන් රජය ගෙන ඇති පියවර කුමක්දැයි ඊයේ (9) පැවති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියකු මතුකරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

එන්නත්කරණය සම්බන්ධයෙන් කිසිදු බලපෑමක් සිදුනොවන ආකාරයට වග බලා ගන්නා ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාත්, සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මියත් උපදෙස් ලබා දී තිබෙන බවද ඇමැතිවරයා එහිදී පැවසීය.

කොවිඩ් 19 රෝගය පැතිරීම ප්‍රමුඛව සිදුවූ බස්නාහිර පළාතේ කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල රෝගීන් වැඩිපුර හමුවූ ප්‍රදේශ කේන්ද්‍ර කර ගෙන කොවිඩ් මර්දන එන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මක වන බව කී ඇමැතිවරයා, එය ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ බලය සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩල මඟින් සිදුකරන බවද, එයට දේශපාලන බලපෑම් සිදුකිරීමට කිසිවකුට හැකියාවක් හෝ අවකාශයක් නැති බවද කීවේය.

'රජය වෙනුවෙන් අපි සෞඛ්‍ය සේවකයන්ගෙන් ඉල්ලා සිටිනවා එවැනි කිසිම බලපෑමකට කවුරුන් හෝ ඔබව නතු කර ගැනීමට සූදානම් වෙනවා නම්, ඔබ එයට යටත් වෙන්න එපා කියලා. ඔබ ස්වාධීනව විශාල කාර්යයක් මේ රට වෙනුවෙන් සිදුකර තිබෙනවා. ජනාධිපතිතුමාගේ නියමය සහ සෞඛ්‍ය ඇමැතිනියගේ නියමය ඉතාම පැහැදිලියි. ඔබ කිසිවකුට යටත් විය යුතු නෑ. ඔබ විශිෂ්ට රාජකාරියක් ඉෂ්ට කර තිබෙනවා කියන කාරණයත් අපි සෞඛ්‍ය සේවකයන්ට දන්වනවා. ඒ නිසා එවැනි දේශපාලන බලපෑම් රජය බොහොම පැහැදිලිව ප්‍රතික්ෂේප කරනවා. එවැනි කිසිම කටයුත්තකට ඉඩක් නොමැති බවත්, විශේෂයෙන් ම ඒ සම්බන්ධයෙන් පැමිණිලි තිබෙනවා නම් ඒ පිළිබඳ කටයුතු කිරීමට අපිට හැකියාව තිබෙන බවත් ප්‍රකාශ කරනවා' යනුවෙන් ද ඇමැතිවරයා පැවසීය.

ඉන්දියාවෙන් ගෙන්වන එන්නත් ප්‍රමාද වීම සම්බන්ධයෙන් සමාජයේ දැඩි කතාබහක් ඇතිවී තිබෙන බව හා එරටින් ඒ පිළිබඳ දැනුම්දීමක් කර ඇතිදැයි මෙහිදී මාධ්‍යවේදියකු මතුකරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඇමැතිවරයා පැවසුවේ, ඉන්දියාවේ සීරම් ඖෂධ නිෂ්පාදන ආයතනයේ ඇති වූ ගින්න හේතුවෙන් එන්නත ගෙන්වීමේ සුළු ප්‍රමාදයක් ඇතිවීමට ඉඩ තිබෙන බවයි. එහෙත්, මෙරටින් කරන ලද ඇණවුමට ගරු කරන බවත්, ඉදිරියේ දී හැකිතාක් ඉක්මනින් එම එන්නත් ලබා දීමට කටයුතු කරන බවත් ඔවුන් ප්‍රකාශ කර තිබෙන බවත් පැවසීය.

'අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවට දැනට ලැබී තිබෙන එන්නත් ප්‍රමාණය ගැන අප සතුටට පත්විය යුතුයි. දැනටමත් එන්නත එක ම මාත්‍රාවක් හෝ ලැබී නැති රටවල් 110කට වැඩි ප්‍රමාණයක් ලෝකයේ තියෙනවා. අපිට එන්නත් මිලියන 1.26ක ප්‍රමාණයක් දැනට ලැබිලා තියෙනවා. ඉදිරියේ දී මිලදී ගැනීමට බලාපොරොත්තු වන එන්නත් මිලියනයක ප්‍රමාණයක් ලැබීමට යෝජිතව තිබෙනවා. ඉන්දියාවේ සීරම් ඖෂධ නිෂ්පාදන ආයතනයේ ඇති වු ගින්න නිසා සුළු ප්‍රමාදයක් ඇතිවීමේ අවකාශයක් තියෙනවා. නමුත් ඔවුන් අප විසින් කරන ලද ඇණවුමට ගරු කරන බවත් ඉදිරියේ දී හැකිතාක් ඉක්මනින් එම එන්නත් ලබා දීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරලා තියෙනවා.

පළමු වටයේ එන්නත ලබා ගත් අයට දෙවන වටයේ එන්නත ලබා දීම සඳහා තව සති කීපයක් තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා ඉදිරියේදී එම එන්නත් ප්‍රමාණය ලංකාවට ලැබෙයි කියලා' යනුවෙන් ද ඇමැතිවරයා එහිදී පැවසීය.

# පාස්කු ප්‍රහාරය ගැන නීතිමය කටයුතු කඩිනමින් යටපත් කිරීමට - සැඟවීමට රජයට කිසිම වුවමනාවක් නෑ

## ඇමැති, සම කැබිනට් ප්‍රකාශක, වෛද්‍ය රමේෂ් පතිරණ

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් නීතිමය කටයුතු ඉතා පැහැදිලි හා කඩිනමින් සිදු කරන බවත්, එය යටපත් කිරීමට හෝ සැඟවීමට රජයට කිසිම කාරණයක් නොමැති බවත් වැවිලි කර්මාන්ත අමාත්‍ය හා සම කැබිනට් ප්‍රකාශක අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා පැවසීය.

පාස්කු ප්‍රහාරය සිදු වූවෙත්, ජනාධිපති කොමිෂන් සභා ස්ථාපනය කළේත් පසුගිය යහපාලන ආණ්ඩුව බව නැවත නැවත තමන් සිහිපත් කරන බවත්, ඒ සම්බන්ධයෙන් වත්මන් රජය කිසිදු මැදිහත් වීමක් සිදු නොකළ බවත් කීවේය.

ඊයේ (9) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී පැවැති කැබිනට් දැනුම්දීමේ මාධ්‍ය හමුවට එක් වෙමින් ඇමැතිවරයා මේ බව කීය. මාධ්‍යවේදීන් විමසූ පැනයකට පිළිතුරු දෙමින් ඇමැතිවරයා මෙසේද කීය.

පසුගිය රජය පත් කළ ජනාධිපති කොමිෂන් සභා ස්වාධීනව පරික්ෂණ වාර්තාව ඉදිරිපත් කළා. ඒ පරික්ෂණ වාර්තාව ඉතාමත් කෙටි කාලයක් තුළදී ජනාධිපතිවරයාට හා පාර්ලිමේන්තුව ඉදිරිපත් කර නීතිපතිවරයාට ලබා දෙමින් අනෙකුත් ආගමික නායකයන්ට ද ලබා දුන්නා. එහිදී පසුගිය යහපාලන රාජ්‍ය ආරක්ෂාව හා රාජ්‍ය පාලනය බිඳ වැටීම පිළිබඳ නැවත නැවත සඳහන් වනඅතර, එම රාජ්‍ය පාලනයට සම්බන්ධ වී සිටි සියලු දෙනාම ඒ සම්බන්ධයෙන් වග විය යුතු බව බොහෝම පැහැදිලිවම එම කමිටු වාර්තාවේ සඳහන් වනවා.

එහිදී මේ කරුණ සම්බන්ධයෙන් අදහස් දැක්වූ බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල මහතා - කොමිසන් සභා වාර්තාවල අඩංගු වන්නේ නිර්දේශ පමණයි.

ලංකා ඉතිහාසයේ කවරදාකවත් කිසිම ජනාධිපති කොමසන් වාර්තාවක අඩංගු සියලු නිර්දේශ ක්‍රියාත්මක වූයේ නැහැ. එසේම මෙම නිර්දේශ කොටස් දෙකකින් යුතු වනවා. ඒ නීතිමය නිර්දේශ හා දේශපාලහා සමාජමය නිර්දේශයි. නීතිමය නිර්දේශයන්ට අනුව යම් අයකුට නඩු පවරන්න යැයි නිර්දේශ කර තිබුන හොත් එය අනිවාර්යයෙන් නීතිපතිවරයා වෙත යොමු කරනවා. ඒ තැනැත්තාට එරෙහිව නඩු පවරනවාද, නැද්ද යන කාරණය නීතිපතිවරයාගේ තීරණයක්. එයට වෙනත් කිසිම කෙනෙකුට මැදිහත් නොවන්නට අප වගබලා ගන්නවා. අනිකුත් කාරණා සම්බන්ධයෙන් ජනාධිපති අනුකමිටුව සලකා බලනවා. මෙම අනිකුත් නිර්දේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ද යන්න ගැන එහිදී අවධානය යොමු කරනවා. එමෙන් ම එසේ ක්‍රියාත්මක කළ හැකි නම් ඒවා ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේ ද යන කරුණු සොයා බලා ඉදිරියේ ජනාධිපතිවරයාට එම වාර්තාව ද ලබා දෙනවා.

# සාරා ඉන්දියාවේ සිටින බවට නිශ්චිත තොරතුරක් නැහැ

## ඇමැති, සම කැබිනට් ප්‍රකාශක උදය ගම්මන්පිල




මෙහිදී මාධ්‍යවේදියකු ප්‍රශ්න කළේ ,පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාර මාලාව කළ බෝම්බකරුවකුගේ බිරිය වන "සාරා" නැමැති කාන්තාව ඉන්දියාවේ සිටින බවට වාර්තාවන අතර, දෙරටේ සබඳතා මත ඇයව මෙරටට ගෙන්වා නොගන්නේ ඇයිද යන්නයි.

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාර මාලාව සිදුකළ බෝම්බකරුවකුගේ බිරිය වන "සාරා" නැමැති කාන්තාව ඉන්දියාවේ සිටින බවට නිශ්චිත තොරතුරු ලැබී නැති බවත් එසේ නිවැරදි තොරතුරක් වේ නම් ඇය මෙරටට ගෙන්වා ගැනීමට අනිවාර්යයෙන්ම අවශ්‍ය කටයුතු සිදු කරන බවත් අමාත්‍ය උදය ගම්මන්පිල මහතා කීවේය.

සාරා නැමැති කාන්තාව ඉන්දියාවට පැනගිය බවට ඇත්තේ විශ්වාසයක් පමණක් බව පැවසූ අමාත්‍යවරයා, ඒ පිළිබඳ මෙතෙක් කිසිදු නිල තහවුරු කිරීමක් සිදුව නොමැති බව කීය. ඉන්දියාවේ ඇය සිටින බව තහවුරු වුණොත් අනිවාර්යයෙන්ම ඇයගෙන් ප්‍රශ්න කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස අප ඉන්දියානු ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. ඇය ශ්‍රී ලාංකිකයෙක් නිසාත් නීති විරෝධීව ශ්‍රී ලංකාවෙන් පිටමං වී ඇති නිසාත් ඇයව නැවත ශ්‍රී ලංකාවට භාරදෙන මෙන්අප ඉන්දියාවෙන් ඉල්ලා සිටිනවා. නමුත් ඇය නීතිවිරෝධීව ඉන්දියාවට පැනගිය බවට විශ්වාසයක් මිසක් තහවුරු වූ තොරතුරක් නෑ.

# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ස්ථාපිත වෙයි

**බුද්ධිකා ඉඹුලාන,සිතාරා සේනානි**

ජාතික ආරක්ෂක විද්‍යායතනයේ අධ්‍යයන කටයුතු සිදු කරන විද්‍යාර්ථීන්ට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධි පිරිනැමීමට හැකි වන පරිදි ජාතික ආරක්ෂක විද්‍යායතනය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය යටතේ ප්‍රතීතනය කිරීමට කැබිනට් අනුමැතිය හිමි වී ඇත.

ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

"ජාතික ආරක්ෂක විද්‍යායතනය" පාර්ලිමේන්තු පනතකින් සංස්ථාපනය කිරීම සඳහා 'ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යායතන පනත' කෙටුම්පත් කිරීම පිණිස 2019 දෙසැම්බර් මස 18 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එම ආයතනයේ අධ්‍යයන කටයුතු 2021 මැයි මසදී ආරම්භ කිරීමට නියමිත අතර මාස 11ක පූර්ණකාලීන පාඨමාලාවක් සාර්ථකව හදාරන විද්‍යාර්ථීන්හට ndc සුදුසුකම ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඉහත පනත මගින් සැලසෙනු ඇත. ලෝකයේ බොහෝ රටවල් විසින් එම රටවල ජාතික ආරක්ෂක විද්‍යායතන මගින් ndc පාඨමාලාවට සමගාමීව ජාතික විශ්වවිද්‍යාලයන් සමග සම්බන්ධ වී විද්‍යාපති හෝ දර්ශනපති උපාධි පිරිනමයි.

# රැකියා අවසන් කිරීම - කාර්මික ආරවුල් තීන්දුවලට එරෙහි රිට් පෙත්සම්වලට ඇප මුදල්

## නීති සංශෝධනයට රජය තීරණය කරයි

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි,**

කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සහ කාර්මික ආරවුල් පනත යටතේ ලබා දෙන ප්‍රදානයන් සහ තීන්දුවලට එරෙහිව අභියාචනා, ප්‍රතිශෝධන සහ රිට් අයදුම්පත් ගොනු කිරීමේදී ඇප මුදලක් තැන්පත් කළ යුතු වන පරිදි නීති සංශෝධනය කිරීමට රජය තීරණය කළ බව බලශක්ති ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක උදය ගම්මන්පිල මහතා පැවසීය.

කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබුණු බවද ඇමැතිවරයා සඳහන් කළේය.

ඇමැති උදය ගම්මන්පිල මහතා මේ බව පැවසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (9) පැවති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී ය.

සේවකයින්ගේ සේවය අවසන් කිරීම වැළැක්වීමේ අරමුණින් 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත හඳුන්වා දී ඇති අතර, එම පනතේ ප්‍රතිපාදනවලට පටහැනිව කටයුතු කරන සේවායෝජකයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් සේවක රැකියා සුරක්ෂිතාව තහවුරු කර තිබේ.

එසේම, සේවායෝජකයන් හා සේවකයන් අතර ඇති වන කාර්මික ආරවුල් කඩිනමින් සාධාරණව විසඳීම සඳහා 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත හඳුන්වා දී ඇත. එකී පනත් දෙක යටතේ සේවක පාර්ශ්වයට පක්ෂව නියෝග ලබා දෙන අවස්ථාවලදී එම නියෝග ක්‍රියාත්මක කිරීම වැළැක්වීම සඳහා ඇතැම් සේවායෝජකයන් අධිකරණ ක්‍රියාමාර්ගවලට යොමු වීමේ ප්‍රවණතාවක් පවතින බව නිරීක්ෂණය වී තිබේ. එම තත්ත්වය යටතේ අදාළ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා වසර 15 - 20 අතර කාලයක් ගත වූ අවස්ථා පවතින බවත්, එම කාලසීමාව අතරතුර සේවායෝජකයන් මිය යාම, විදේශගතවීම, අධිකරණය මගහැරීම, සමාගම් ඈවර කිරීම් වැනි හේතූන් නිසා සේවකයන්ට අපේක්ෂිත සහනයන් ලබා ගැනීමට නොහැකි වී ඇති බවත් පෙනී ගොස් ඇත.

එබැවින්, 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ පනත යටතේ කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝගයට එරෙහිව හෝ එකී නියෝගයන් බලාත්මක කරවා ගැනීම සඳහා වන මහේස්ත්‍රාත් අධිකරණයේ තීන්දුවකට එරෙහිව හෝ 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ විධිවිධාන පරිදි කාර්මික බේරුම්කරණ ප්‍රදානයකට හෝ කාර්මික අධිකරණ ප්‍රදානයකට එරෙහිව හෝ සේවායෝජකයන් විසින් අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමු වීමේදී ඇප මුදලක් තැන්පත් කිරීමෙන් අනතුරුව පමණක් අධිකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට හැකි වන පරිදි, 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සහ 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම සඳහා කම්කරු ඇමැතිවරයා ඉදිරිපත් කළ යෝජනාවට මෙසේ කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

මෙම යෝජනාව සම්බන්ධයෙන් කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී වැඩි දුරටත් අදහස් දැක්වූ **සම කැබිනට් ප්‍රකාශක, ඇමැති උදය ගම්මන්පිල මහතා** - යම් ආයතනයක් හෝ හාම්පුතෙක් සේවකයකුගේ සේවය අවසන් කළ විට සේවකයන්ට වන්දි ගෙවීම සඳහා අධිකරණය නියෝගය කරන අවස්ථාවලදී එම වන්දිය ගෙවීම පමා කිරීම සඳහා තීන්දුවට එරෙහිව අභියාචනා කරන බවට සේවකයන් චෝදනා නගනවා. එයට පිළියමක් ලෙස 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ විශේෂ විධිවිධාන පනතත්, 1950 අංක 43 දරන කාර්මික අරවුල් පනතත් යන පනත් දෙක සංශෝධනය කරන්න පෙරේදා (8) ඇමැති මණ්ඩල තීරණය කළා.

ඒ අනුව, යම් සේවකයකුට වන්දියක් ගෙවන මෙන් අධිකරණය නියෝග කළාට පසු එයට එරෙහිව අභියාචනාවක්, ප්‍රතිශෝධනයක්, රිට් නියෝගයක් වෙන්න පුළුවන්, කුමන ආකාරයකින් හෝ ඒ තීන්දුවට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ගයක් ගන්නවා නම් අධිකරණය විසින් සේවකයාට ගෙවිය යුතු යැයි නියම කළ වන්දිය අධිකරණයේ තැන්පත් කිරීමෙන් පමණයි අභියාචනාවක් කිරීමට අවස්ථාව ලැබෙන්නේ.

# මුල් ළමා විය අධ්‍යාපනය නියාමනයට ජාතික කමිටුවක්

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

මුල් ළමා විය අධ්‍යාපනය පිළිබඳ කළමනාකරණ සහ නියාමන ජාතික කමිටුව' පත් කිරීමට අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් අනුමැතිය හිමි වී තිබේ.

- දැනට පවතින නෛතික රාමුවට අනුව ශ්‍රී ලංකාවේ මුල් ළමා විය අධ්‍යාපන ක්‍රමවේදය මධ්‍යම රජය සහ පළාත් සභාවලට අයත් ආයතනික ස්ථර කිහිපයක් හරහා සිදු වන සම්බන්ධීකරණයකින් ක්‍රියාත්මක වන අතර, එම ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් ජාතික මට්ටමින් පවත්වා ගැනීමේ හා අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය බලගැන්වීමේ අවශ්‍යතාව හඳුනා ගෙන ඇත. ඒ අනුව, පෙර පාසල්, මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ජාතික මට්ටමින් නියාමනය, අධීක්ෂණය සහ මග පෙන්වීම සඳහා අදාළ ක්ෂේත්‍රයේ විද්වතුන්ගෙන්, තීරණ ගන්නා නිලධාරීන්ගෙන් සමන්විතව මුල් ළමා විය අධ්‍යාපනය පිළිබඳ කළමනාකරණ සහ නියාමන ජාතික කමිටුව යනුවෙන් කමිටුවක් පත් කිරීම සිදු කෙරේ.

ඊයේ (9) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙ පැවැති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවට එක්වෙමින් වැවිලි ඇමැති, සම කැබිනට් ප්‍රකාශක වෛද්‍ය රමේෂ් පතිරණ මහතා පැවැසුවේ පෙර පාසල් දරුවන්ගේ අනාගත සුරක්ෂිතභාවය හා අධ්‍යාපන පසුබිම ගැන අවධානය යොමු කරමින් රජය මෙම පියවර ගෙන ඇති බවයි.

# වනඅලි ගැසට්ටුව ඉදිරි දින කීපයේ

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

ඉදිරි දින කිහිපය ඇතුළත වනඅලි කළමනාකරණ රක්ෂිතය සම්බන්ධ ගැසට් නිවේදනය නිකුත් කර රක්ෂිත කලාපය ප්‍රකාශයට පත්කරන බව වැවිලි ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක වෛද්‍ය රමේෂ් පතිරණ මහතා පැවසීය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (9) පැවති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියකු වනඅලි රක්ෂිතය ගැසට් කිරීම මෙතෙක් ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

# මිල්ලෑව ඖෂධ කලාප ව්‍යාපෘතිය කඩිනමින්

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

හොරණ, මිල්ලෑව ප්‍රදේශයේ ඖෂධ කලාපයක් ස්ථාපිත කිරීමේ යෝජිත ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් මෙහෙයුම් කමිටුවක් පත් කිරීමටත්, එයට අවශ්‍ය තාක්ෂණික කරුණු ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ව්‍යාපෘති කළමනාකරණ කමිටුවක් පත් කිරීමටත්, පූර්ව හා පසු කොන්ත්‍රාත් සේවා සහ මූල්‍ය උපදේශන සේවා සැපයීම සඳහා ව්‍යාපෘති කළමනාකරු වශයෙන් පූර්ණ රජය සතු සමාගමක් වන සෙලෙන්දිවා ආයෝජන සමාගම පත් කිරීමටත් කැබිනට් අනුමැතිය ලැබී තිබේ.

නාගරික සංවර්ධන හා නිවාස විෂය භාර ඇමැතිවරයා වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සහ සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය මීට අදාළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබේ.

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සිය ඖෂධ වැඩි වශයෙන් දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා උපායමාර්ගික ක්‍රමෝපායන් අනුගමනය කරමින් පවතී. ඒ අනුව, මේ වන විට හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරබොක්ක සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔයාමඩුව යන ප්‍රදේශවල ඖෂධ කලාප පිහිටුවීමේ කටයුතු ආරම්භ කර ඇත.

ඊට අමතරව තවත් ඖෂධ කලාපයක් කළුතර දිස්ත්‍රික්කයේ හොරණ, මිල්ලෑව ප්‍රදේශයෙහි ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබේ. එම ඖෂධ කලාපයේ විකලාංග හා ස්නායු ශල්‍ය උපකරණ, පිළිකා මර්දන ඖෂධ, පෙති හා කරල් ඖෂධ නිෂ්පාදනය සහ හෘද සැත්කම් උපකරණ. අභ්‍යන්තර අක්ෂි කාච නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

# කැබිනට් තීරණ

### කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පාකිස්තාන කොම්සැට්ස් සරසවිය අතර අවබෝධතා ගිවිසුමක්

පාකිස්තානයේ කොම්සැට්ස් විශ්වවිද්‍යාලයේ (COMSATS UNIVERSITY, PAKISTAN) ජෛව වෛද්‍ය විද්‍යාත්මක ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය, ජෛව ද්‍රව්‍ය පටක ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව අන්තර්ජාතික පේටන්ට් බලපත්‍ර ගණනාවක් හිමි කරගෙන ඇති ආයතනයකි. එම විශ්වවිද්‍යාලය සමග ජෛව ද්‍රව්‍ය, පටක ඉංජිනේරු, පුනර්ජනනීය වෛද්‍ය විද්‍යාව, සංවේදක සහ ජෛව සංවේදක වැනි ක්ෂේත්‍රයන්ට අදාළව දැනුම හුවමාරු කර ගැනීම හා දෙරටට අන්‍යොන්‍ය වශයෙන් වැදගත් වූ අංශයන් පිළිබඳ සහයෝගී පර්යේෂණ පැවැත්වීම සඳහා අවබෝධතා ගිවිසුමකට අස්සන් තැබීමට යෝජනා වී ඇත. ඒ අනුව, ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ පාකිස්තානයේ කොම්සැට්ස් විශ්වවිද්‍යාලය අතර යෝජිත අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස ආරක්ෂක ඇමැති ලෙස ජනාධිපතිවරයා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි.

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ ඒ යටතේ වන ආයතන එක් ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීම.

දැනට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු හා ආයතන ස්ථාන කිහිපයක පවත්වාගෙන යන බැවින්, අමාත්‍යාංශය සහ එම ආයතන එක් ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව පැන නැඟී ඇත. ඒ සඳහා කොළඹ 10, ඩී.ආර්. විජයවර්ධන මාවතේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සඳහා දැනට ඉදි කෙරෙමින් පවතින මහල් 09 කින් යුත් ගොඩනැගිල්ල සුදුසු බවට හඳුනාගෙන තිබේ. ඒ අනුව, එකී ගොඩනැගිල්ල සහ එය පිහිටි ඉඩම බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත පවරා ගැනීමටත්, ඉන් අනතුරුව ඉදිකිරීම් කටයුතු අවසන් කර අමාත්‍යාංශය සහ ඒ යටතේ වන සියලු ආයතන එම ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමටත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ඇමැති ලෙස අගමැතිවරයා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කළේය.

### ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) ආයතනිකකරණය

ජාතික නවෝත්පාදන පරිසර පද්ධතියක් නිර්මාණය කර, එය වැඩිදියුණු කර පවත්වාගෙන යාම පිණිස අමාත්‍යාංශ, ආයතන සහ පෞද්ගලික අංශය සම්බන්ධීකරණය කිරීම සහ නවෝත්පාදන අදහසේ සිට වෙළෙඳ පොළ දක්වා අදාළ නවෝත්පාදනයන් සඳහා අවශ්‍ය සහාය ලබා දීම පිණිස 2019 අංක 22 දරන පාර්ලිමේන්තු පනතින් ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) ස්ථාපිත කරනු ලැබ ඇත. එම නියෝජ්‍යායතනය, ආයතනිකකරණය කිරීමේ කාර්යය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යයක් වශයෙන් හඳුනාගනු ලැබ තිබේ. දැනට එකී රාජ්‍ය අමාත්‍යාංශය යටතේම ක්‍රියාත්මක වන විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රය හා සම්බන්ධ කාර්යයන් සඳහා පිහිටුවා ඇති විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI) ජාතික විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ අධිකාරිය (NASTICA) වශයෙන් ස්ථාපිත කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස 2017 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය දී ඇත. යෝජිත ජාතික විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ අධිකාරියේ (NASTICA) අරමුණු හා කාර්යයන් ද බොහෝ දුරට ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ (NIA) කාර්යයන් හා සමාන වේ. එබැවින්, එම අධිකාරිය පිහිටුවීමේ කටයුතු අත්හිටුවීමටත්, විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය(COSTI) සඳහා වෙන් වී ඇති අරමුදල් සහ අනෙකුත් සම්පත් භාවිත කරමින් ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) ආයතනිකකරණය කිරීම පිණිසත් අධ්‍යාපන ඇමැති ඉදිරිපත් කළ යෝජනාව අනුමත විය.

### සමුද්‍ර සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ II වැනි අදියර

ශ්‍රී ලංකාව සහ නෝර්වේ රජය අතර ද්විපාර්ශ්වික සහයෝගීතාව යටතේ, "ශ්‍රී ලංකාවේ සමුද්‍ර සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම" ව්‍යාපෘතියේ I වැනි අදියර 2017 සිට 2020 දක්වා කාල සීමාව තුළ ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එම ව්‍යාපෘතියේ II වන අදියර ද නෝර්වේජියානු ප්‍රධාන ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබේ. යෝජිත ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ සමුද්‍ර ධීවර සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා නෝර්වේ රාජ්‍යයේ සමුද්‍ර පර්යේෂණ ආයතනය සහ ශ්‍රී ලංකාවේ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) යන ආයතනවල සහයෝගය ඇතිව කටයුතු කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතියේ එම අදියර යටතේ ධීවර දත්ත එකතු කිරීම, දත්ත ගබඩා කිරීම, භාවිතය , වැඩිදියුණු කිරීම සහ සමුද්‍ර ධීවර සම්පත් තිරසර ලෙස කළමනාකරණය කිරීම සඳහා ධීවර පර්යේෂණවල ධාරිතාව වැඩි කිරීමත් සිදු කිරීමට නියමිතය. ඒ අනුව, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) සහ නෝර්වේ රාජ්‍යයේ සමුද්‍ර පර්යේෂණ ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අස්සන් තැබීම පිණිස ධීවර ඇමැතිගේ යෝජනාව කැබිනට් මණ්ඩලය අනුමත කළේය.

### කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ අන්තර් පළාත් මගී බස්රථ ධාවන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ අන්තර් පළාත් මගී බස්රථ ධාවන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බස් ධාවකයින්ගෙන් අය කරනු ලබන යාවත්කාලීන කිරීමේ ගාස්තු, ප්‍රමාද ගාස්තු, ටෙන්ඩර් ගාස්තු, ලොග් පත්‍ර ගාස්තු, පිවිසුම් පත්‍ර ගාස්තු හා අධිවේගී මාර්ගයේ තාවකාලික අවසර පත්‍ර ගාස්තු 2020 වර්ෂයේ අවසානය දක්වා නිදහස් කිරීම පිණිස 2020 නොවැම්බර් මස 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය දී ඇත. බස් රථ ධාවනය යථා තත්ත්වයට පත් කිරීමට තවදුරටත් කල් ගත විය හැකි බව පෙනී යන බැවින්, එම සහන අතුරින් පහත සඳහන් සහන 2021 මාර්තු 31 දින දක්වා තවදුරටත්

සලසා දීම පිණිස ප්‍රවාහන ඇමැති ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කළේය.

වාර්ෂික ටෙන්ඩර් ගාස්තුවෙන් 10%ක් හෝ රුපියල් 15,000/- යන අගයන්ගෙන් වැඩි අගය සහිත මුදල අය කිරීම, අධිවේගී මාර්ගයේ තාවකාලික අවසර පත්‍ර ගාස්තුවෙන් 10% ක් අය කිරීම, ලොග් හා පිවිසුම් පත්‍ර ගාස්තු නිදහස් කිරීම අපේක්ෂා කෙරේ.

### රක්වාන පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීම සඳහා ඉඩමක් වෙන් කිරීම

සබරගමුව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන රක්වාන පශු වෛද්‍ය කාර්යාලය දැනට පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින්, අලුතින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් වටිනාකම අය කිරීමකින් තොරව වෙන් කර දීමට හපුගස්තැන්න වැවිලි සමාගම එකඟතාව පළ කර ඇත. ඒ අනුව, හපුගස්තැන්න වැවිලි සමාගමට අයත් හැදර්ලි වතු යායේ හැදර්ලි කොටසින් හෙක්ටයාර 0.15ක් වන ඉඩම් කොටසක් වන්දි ගෙවීමෙන් තොරව රක්වාන පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීමම සඳහා වෙන් කරදීම පිණිස රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන ඇමැති ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලැබිණි.

### වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ වැව්/අමුණුවල රක්ෂිත සීමා ලකුණු කිරීමට මිනුම් කටයුතු සිදු කිරීම

වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ඉදිරි වසර 4ක කාලය තුළ වැව්/ අමුණු 5000ක් පමණ ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇත. එවැනි විශාල වැව් ප්‍රමාණයක මැනුම් කටයුතු අවුරුදු 3ක් වැනි කාලයක් තුළ නිම කිරීම සඳහා දැනට මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත් පරිදි මානව සම්පත් නොමැති බව එම දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. එබැවින්, එම ගැටලුව විසඳීම සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයෙන් හෝ ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් උපාධිය හදාරා මැනුම් පුහුණුව ලැබීමට අපේක්ෂිත සිසුන් 70 දෙනෙකු තාවකාලික පදනමින් වසර 03 ක කාලයකට අභ්‍යාසලාභීන් වශයෙන් මිනුම්දෝරු දෙපාර්තමේන්තුව වෙත බඳවාගෙන ඔවුන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර මිනුම්දෝරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මිනුම්දෝරුවරුන් දෙදෙනෙකුගේ අධීක්ෂණය යටතේ මැනුම් කටයුතු සඳහා යෙදවීම පිණිස වාරිමාර්ග ඇමැති සහ ඉඩම් ඇමැති ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අනුමත විය.

### 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම

තාක්ෂණික, වෙළෙඳ, නිපුණතා හා පාරිසරික වැනි කර්මාන්ත අංශයේ කාලීන අවශ්‍යතාවන් සපුරා ගැනීම පිණිස ඉවහල් වන කර්මාන්ත ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ දැනට පවතින 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව පෙනී ගොස් ඇත. ඒ අනුව, වර්තමානයට ගැළපෙන පරිදි 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම පිණිස කෙටුම්පතක් සකස් කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ අදාළ රාජ්‍ය ආයතන හා පුද්ගලික අංශයේ කර්මාන්ත සංවිධාන / කර්මාන්ත මණ්ඩල නියෝජිතයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත් කිරීම පිණිස කර්මාන්ත ඇමැති ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි.

**බුද්ධිකා සමඟ සිතාරා**



# මාතර වාණිජ - සංචාරක නගරයක් ලෙස දියුණු කරන්න අගමැතිගෙන් උපදෙස්

**මහින්ද අලුත්ගෙදර**

මාතර නගරය වාණිජ හා සංචාරක නගරයක් ලෙස දියුණු කරමින් එහි පරිපාලන නගරය කොටවිල ප්‍රදේශයේ ස්ථාපිත කිරීමේ කටයුතු කඩිනම් කිරීමට අගමැති මහින්ද රාජපක්ෂ මහතා උපදෙස් දුන්නේය.

මාතර නව නගරය, අකුරැස්ස, දෙවිනුවර, දික්වැල්ල, කඹුරුපිටිය, කිරින්ද-පුහුල්වැල්ල, තිහගොඩ සහ වැලිගම නගරවල නාගරික සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල පවතින ගැටලු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ කමිටු ශාලා 2හි පැවැති සාකච්ඡාවකට එක්වෙමින් අගමැතිවරයා මේ බව සඳහන් කළේය.

පළාත් පාලන ආයතන 17ක් මාතර දිස්ත්‍රික්කයට අයත්වන අතර ඉන් පළාත් පාලන ආයතන 7ක් මුල් කරගෙන නාගරික සංවර්ධන අධිකාරිය යටතේ 2021-2030 දක්වා සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කරයි.

ඒ යටතේ මාතර මහනගර සභාව, මාතර ප්‍රාදේශිය සභාව, වැලිගම නගර සභාව, වැලිගම ප්‍රාදේශිය සභාව, දෙවිනුවර, හක්මන හා මාලිම්බඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශ සංවර්ධනය කෙරෙන බව මෙහි දී නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් අගමැතිවරයාට දැනුම් දුන්නේය. නිල්වලා ගඟ දෙපස ඇති අනවසර ඉදිකිරීම් සංවර්ධන කටයුතුවලට බාධාවක් වී ඇති බව ද එම නිලධාරින් හෙළි කළේය.

පසුගිය ආණ්ඩු සමයේ නවතා දමා තිබු මාතර දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති නැවත ආරම්භ කරන්නැයි මෙහි දී මහින්ද රාජපක්ෂ මහතා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දුන්නේය. විශේෂයෙන් දැනට මාතර මහ රෝහල පවතින ස්ථානයේ හදිසි අනතුරු ප්‍රතිකාර සඳහා පමණක් වෙන්කරමින් අනෙකුත් ප්‍රතිකාර කටයුතු කොටවිල ඉදිකෙරෙන නව රෝහලට ගෙනයාම සම්බන්ධයෙන් මෙම සාකච්ඡාවේ දී අවධානය යොමු විය.

එහිදී පසුගිය ආණ්ඩුව කොටවිල රෝහලේ ඉදිවෙමින් තිබූ ගොඩනැගිලි 9ක කටයුතු නවතා දමා ඇති බව අනාවරණය විය. ඒ අනුව එම ගොඩනැගිලි ඉදිකිරීම වහාම ආරම්භ කරන්නැයි දැනුම් දුන් අගමැතිවරයා රෝහලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් වියයුතු බව ප්‍රකාශ කළේය. මේ අතර ගොඩගම හංදියේ සිට කඹුරුපිටිය දක්වා මාර්ගය මංතීරු 4 කටත් කඹුරුපිටිය-කොටවිල දක්වා මාර්ගය මංතීරු දෙකකටත් සංවර්ධනය කිරීමට මහා මාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා අදාළ නිලධාරීන්ට මෙහිදී පැවරුවේය.

විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා අදහස් පළ කරමින් කොටවිල ඉදි වූ මාතර නව උසාවි සංකීර්ණය නොබෝදිනකින් විවෘත කිරීමට හැකිවනු ඇතැයි විශ්වාසය පළ කළේය. එහි ඉදිකිරීම්වලට සමගාමීව නීතිඥයන් වෙනුවෙන් කාර්යාල පහසුකම් සහිත ගොඩනැගිල්ලක් ද ඉදිකරන්නැයි අගමැතිවරයා පැවසීය. මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ රුපියල් මිලියන 700ක වියදමෙන් ඉදිකිරීම් ඇරඹූ ගොඩනැගිලි පසුගිය ආණ්ඩු සමයේ අතරමග නවතා දැමීමෙන් ඒවා දිරාපත්වෙමින් ඇති බව ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා පෙන්වා දුන්නේය.

දෛනිකව මාතර නගරයේ සහ වැලිගම නගරයේ ඝන අපද්‍රව්‍ය ටොන් 80ක් පමණ ඒකරාශිවන අතර ඉදිරියේ දී මෙම ඝන අපද්‍රව්‍ය තුළින් විදුලිය නිෂ්පාදනය කිරීම කෙරෙහි රජයේ අවධානය යොමු වී තිබෙන අතර රුපියල් මිලියන 632ක් වැයකරමින් ඉදිකළ මාතර නගරයේ නිල්වලා ගඟ බඩ උද්‍යානයේ පළමු, දෙවැනි හා තෙවැනි අදියර මේ මස 31 වැනිදාට පෙර අවසන් කිරීමට නියමිතය. එහි සිවුවැනි අදියර මිශ්‍ර ව්‍යාපෘතියක් ලෙස ඉදිරියටත් ක්‍රියාත්මක වේ.

කඹුරුපිටිය නගර සංවර්ධනයට සමගාමීව එහි පිවිසුම් මාර්ග මන්තීරු 4කින් යුතුව අඩි 66ක් දක්වා පළල් කිරීමටත් කඹුරුපිටිය මහා විද්‍යාලය සංවර්ධනය කිරීම පිළිබඳවත් මෙහි දී අගමැතිවරයාගේ අවධානය යොමු විය. කඹුරුපිටිය මහ විද්‍යාලය මෙන්ම රටේ අනෙකුත් පාසල් සංවර්ධනය කිරීමේ දී ඒ සෑම පාසලකටම මීටර් 400ක ධාවන පථයක් සහිත ක්‍රීඩා පිටියක් ලබාදීමට සැලසුම් කරන්නැයි අගමැතිවරයා අදාළ බලධාරින්ට දැනුම් දුන්නේය.

මෙම අවස්ථාවට කථානායක මහින්ද යාපා අබේවර්ධන, ඇමැතිවරුන් වන ඩලස් අලහප්පෙරුම, ජොන්ස්ටන් ප්‍රනාන්දු, රාජ්‍ය අමාත්‍යවරුන් වන කංචන විජේසේකර, නාලක ගොඩහේවා, පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වන නිපුණ ආර් රණවක, වීරසුමන වීරසිංහ, කරුණාදාස කොඩිතුවක්කු, අගමැති ලේකම් ගාමිණී සෙනරත්, අගමැති කාර්ය මණ්ඩල ප්‍රධානී යෝෂිත රාජපක්ෂ මහත්වරුන් සහ මාතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන ප්‍රධානීන් ඇතුළු නාගරික සංවර්ධන අධිකාරියේ සහ රජයේ උසස් නිලධාරීහු පිරිසක් එක්ව සිටියහ.



සියවසකට වැඩි දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන 'දිනමිණ' ජාතික පුවත්පත සහෘද පාඨකයන් වෙනුවෙන් නවමු මුහුණුවරකින් එළිදැක්වීමට ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස්) පියවර ගෙන තිබේ. ඒ අනුව නව මුහුණුවරකින් පාඨකයන් වෙත නිකුත් කෙරෙන දිනමිණ පුවත්පත රට පුරා ප්‍රධාන නගරවල දී බෙදාහැරි අයුරු.

## අන්තර්ජාතිකව දැනුම හුවමාරුවට Expo-2020 ප්‍රදර්ශනය කදිම අවස්ථාවක්

### ● ඇමැති නාමල් රාජපක්ෂ

**නුවන් කොඩිකාර**



වෙනත් රාජ්‍යයන් සමග මෙරට පවතින සබඳතා ශක්තිමත් කරගනිමින් තාක්ෂණික දැනුම හුවාමාරු කරගැනීමට Expo -2020 ප්‍රදර්ශනය කදිම අවස්ථාවක් බව තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා පැවසීය.

පසුගියදා ඩුබායි රාජ්‍යය බලා පිටත් වූ ඇමැති නාමල් රාජපක්ෂ හා රාජ්‍ය ඇමැති ඩී.වී. චානක යන මහත්වරුන් Expo -2020 ප්‍රදර්ශනය පැවැත්වෙන ස්ථානය නැරඹීමට පෙරේදා (8) එක්වීමෙන් අනතුරුව එසේ කියා සිටියේය.

එක්සත් ආරාබි එමිර් රාජ්‍යයේ 2020 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනිදා සිට 2021 වර්ෂයේ අප්‍රේල් 10 වැනිදා දක්වා පැවැත්වීමට නියමිතව තිබූ Expo -2020 ප්‍රදර්ශනය Covid -19 තත්ත්වය හමුවේ පැවැත්වීමට නොහැකිවීම හේතුවෙන්, 2021 ඔක්තෝබර් 1 දා සිට 2022 මාර්තු 31 වැනිදා දක්වා පැවැත්වීමට එහි සංවිධායක මණ්ඩලය කටයුතු සූදානම් කර ඇත.

ලෝකයේ දියුණු රටවල් බොහෝමයක් තම නවීනතම තාක්ෂණය මුසු නිෂ්පාදන හා සේවාවන් මෙහිදී ප්‍රදර්ශනය කරන අතර, මෙම එක්ස්පෝ ප්‍රදර්ශනය තුළ ශ්‍රී ලංකාව සඳහා ප්‍රදර්ශන කලාපයක් වෙන්කර තිබීම ද ඉතා සුවිශේෂී කරුණකි.

Expo -2020හි ප්‍රධාන විධායක නිලධාරිවරයා ඇතුළු නියෝජිත පිරිස තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා ඇතුළු නියෝජිත පිරිස පිළිගත් පසු Expo -2020හි ශ්‍රී ලංකාවේ සහාගීත්වය පිළිබඳ කරුණු පැහැදිලි කිරීම සිදු කෙරිණි.

ලෝකයේ වෙනත් රාජ්‍යයන් සමඟ අප රට පවතින සබඳතා ශක්තිමත් කරගැනීමටත් තාක්ෂණික දැනුම හුවාමාරු කරගැනීමටත් Expo -2020 මෙම ප්‍රදර්ශනය අපට ලැබෙන කදිම අවස්ථාවක් බවත්, මෙම ප්‍රදර්ශන භූමිය නැරඹීමට පැමිණෙන ජනතාවට විස්මිත අත්දැකීම් ගෙනදිය හැකි ලෝකයේ වඩාත්ම විචිත්‍රවත් ප්‍රදර්ශනයක් ලෙසින් ඩුබායි එක්ස්පෝ 2020 සංවිධාන වනු ඇති බවටත් එහිදි නාමල් රාජපක්ෂ මහතා කියා සිටියේය.

නිවැරදි දැක්ම, නායකත්වය සහ ජනතාවගේ සහයෝගය ඇත්නම් ඕනෑම ජාතියකට අත්පත් කරගත හැකි දේට සීමාවක් නොමැති බව පැවසූ ඇමැතිවරයා උපායමාර්ගිකව මෙම Expo -2020 ප්‍රදර්ශනය හරහා අපේ රටට වාසි සහගත හවුල්කාරිත්වයක් ඇති කරගැනීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කළේය.

මෙම ප්‍රදර්ශනය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව විශ්මිත අයුරින් පැවැත්වීමට කටයුතු සංවිධාන කිරීම පිළිබඳ Expo -2020 ප්‍රදර්ශනයේ ප්‍රධාන විධායක නිලධාරී කලීඩ් මාතර් අල් මන්නායි මහතා ඇතුළු නියෝජිත පිරිසට ඇමැතිවරයා සිය විශේෂ ස්තූතිය පළ කළේය.



## පාර්ලිමේන්තු මන්ත්‍රිනීන්ගේ සංසදයේ නිල වෙබ් අඩවිය එළි දැක්වෙයි

**ස්වර්ණා විජේකෝන්**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ නිල වෙබ් අඩවිය එළි දැක්වීම පාර්ලිමේන්තු සංකීර්ණයේදී අද (9) සිදු කිණි.

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාගාමීව මෙම වෙබ් අඩවිය එළිදැක්ණි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිනිය වන ප්‍රාථමික සෞඛ්‍ය සේවා වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ ආරාධනය පරිදි, අගමැති මහින්ද රාජපක්ෂ සහ කථානායක මහින්ද යාපා අබේවර්ධන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මෙම වෙබ් අඩවිය එළි දැක්වීම සිදු විණි.

ඉන් පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සියලුම සාමාජික මන්ත්‍රීවරියන් සහභාගී වන ප්‍රවෘත්ති සාකච්ඡාවක් පැවැත්විණි. මෙරට කාන්තාවන්ට සිදුවන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම පිළිබඳ සොයා බලා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා තේරීම් කාරක සභාවක් පත් කරන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් ගෙනා යෝජනාව එම සංසදයේ සභාපතිනිය වන සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටද සිටීර විණි.



ඉන් අනතුරුව මෙරට කාන්තාවන් සවිබල ගැන්වීමේ අරමුණින් "අභියෝගයට සූදානම් ද?" මැයෙන් පැවැත්වෙන සංවාදයට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිනිය වන රාජ්‍ය අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, පාර්ලිමේන්තු මන්ත්‍රීරියන්ගේ සංසදයේ උප සභාපතිනි රෝහිණී කුමාරි විජේරත්න, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් වන තලතා අතුකෝරළ, ගීතා කුමාරසිංහ, මංජුලා දිසානායක, සහ ඩයනා ගමගේ යන පිරිස සහභාගී වූහ.

"රටකි, දැයකි,ලොවකි ඇය" මැයෙන් පැවැත්වෙන දෙවන සංවාදය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ උප සභාපතිනි නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය සීතා අරඹේපොළ, සෞඛ්‍ය අමාත්‍ය වන්නිආරච්චි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් වන කෝකිලා ගුණවර්ධන, මුදිතා ප්‍රශාන්ති, රාජිකා වික්‍රමසිංහ, ආචාර්ය හරිනි අමරසූරිය යන පිරිස සහභාගී වූහ.

## ඉදිරි මාස එකහමාරේදී කොවිඩ් පාලනය කළ හැකියි

### හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා

**රත්නසිරි පතිරණ**

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාවේ කොවිඩ් පාලනය ඉතා ඉහළ මට්ටමක පවතින බවත් ඉදිරි මාස එක හමාරක පමණ කාලය තුළදී මෙම වසංගත තත්ත්වය බොහෝ දුරට පාලනය කිරීමට හැකියාව ඇති බවද ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා සඳහන් කළේය.

යුද හමුදාපතිවරයා එසේ සඳහන් කළේ පෙරේදා (8) ගම්පහ බැලුම්මහර ප්‍රදේශයේ පැවැති විශේෂ උත්සවයකට සහභාගී වෙමිනි.

එහිදි වැඩි දුරටත් අදහස් දැක්වූ ශවේන්ද්‍ර සිල්වා මහතා - කොවිඩ් 19 වයිරසයට සමාන තවත් වයිරස වර්ග ඉදිරියට පැතිරී යාවී. එහෙත් අප මේ සෑම අභියෝගයකටම සැලසුම් සහගතව මුහුණ දීමේ හැකියාව තිබෙන නිසා අපේ රට සුරක්ෂිතයි කියා මා විශ්වාස කරනවා. රජයක් හැටියට ජනාධිපතිතුමා කොවිඩ් මර්දන කාර්ය සාධක බළකාය සමග නිරතුරුවම පවතින තත්ත්වය පිළිබඳ සාකච්ඡා කරනවා. ඒ සාකච්ඡාවලින් අවශ්‍ය ඉදිරි පියවර ගත් නිසා කොවිඩ් වසංගත තත්ත්වය විශාල ලෙස පාලනය කරන්න අපට පුළුවන් වුණා. වයස අවුරුදු 60ට වැඩි වැඩිහිටියන් සඳහා එන්නත් ලබාදීම ආරම්භ කළ බව කී ඒ මහතා, කොවිඩ් මරණ භූමදාන කටයුතු මඩකලපුව ප්‍රදේශයේ ඔට්ටමාවඩිහිදි යුද හමුදාවේ අධීක්ෂණය යටතේ සිදුකරණ බත් සඳහන් කළේය.

දැන් කිසිම ගැටලුවක් නැහැ. මේ වන විට කොවිඩ් මළ සිරුරු 24ක් භූමදාන කටයුතු සිදුකර තිබෙනවා. ඊට අමතරව තවත් මළ සිරුරු 7ක් භූමදාන කිරීමට නියමිතයි. කොළඹ සහ ගම්පහ අධි අවදානම් කලාප වල ජනතාවට මේ වන විට ඉතා සාර්ථකව එන්නත් ලබාදීම සිදු කරනවා යැයිද ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා වැඩි දුරටත් සඳහන් කළේය.



## 'සුරකිමු ගංගා' ව්‍යාපෘතිය ජනාධිපති ප්‍රධානත්වයෙන් කතරගම මැණික් නදිය අසලදී

**බුද්ධිකා ඉඹුලාන**

ගංගා 103කින් සමන්විත මෙරට සමස්ත ගංගා පද්ධතිය පවිත්‍ර කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන 'සුරකිමු ගංගා ව්‍යාපෘතිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 22 දින කතරගම මැණික් නදිය අසලින් ආරම්භ කෙරේ.

මේ සම්බන්ධව සාකච්ඡාවක් පසුගිය දා කතරගම අභිනවාරාමයේ දී පැවැත් වූ අතර, එයට අභිනවාරාමාධිපති කපුගම සරණතිස්ස හිමි, පරිසර අමාත්‍යමහින්ද අමරවීර, අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ, මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිතයන්, කතරගම දියවඩන නිළමේතුමන්, කතරගම නගර සභාව, ආරක්ෂක අංශ ඇතුළු නිලධාරිහු පිරිසක් ඊට සහභාගී වූහ.

මැණික් ගඟේ ඉහළ කොටසේ සිදු කෙරෙන අනවසර වැලි ගොඩදැමීම් හා ගොඩ වැලි සේදීම් නිසා එම ගඟේ පහළ කොටසේ ජලය සම්පූර්ණයෙන්ම බොර වී ඇති හෙයින් අනවසර වැලි ගොඩදැමීම හා වැලි සේදීම සිදු කරන අය අත්අඩංගුවට ගෙන නීතිය අනුව කටයුතු කරන්නැයි ඇමැතිවරයා මෙහිදී ආරක්ෂක අංශවලට උපදෙස් දුන්නේය.

සුරකිමු ගංගා යටතේ කතරගම නගරය මුළුමනින්ම පරිසර හිතකාමී හරිත නගරයක් වශයෙන් සංවර්ධනය කිරීමටත්, මැණික් ගඟ දෙපස කුඹුක් පැළ රෝපණය කර එම ගඟ ආරක්ෂිත ගංගාවක් බවට පත් කිරීමටත්, මිනිසුන්ට පමණක් නොව යාල අභයභූමිය මැදින් ගලන මෙම ගඟේ ජලය වනසතුන්ට ද උපයෝගී කර ගත හැකි වන අයුරින් සංරක්ෂණය කිරීමටත් මෙම සාකච්ඡාවේදී තීරණය වී තිබේ.



පරිසර අමාත්‍ය මහින්ද අමරවීර, අමාත්‍යංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ යන මහත්වරුන් සුරකිමු ගංගා සමාරම්භක වැඩ සටහන පැවැත්වෙන ස්ථානය නිරීක්ෂණයට සහභාගී වෙමින්.

# දක්ෂිණාංශික බලවේග කුමන්ත්‍රණකාරී ලෙස බලය ගැනීමට කටයුතු කරනවා

## ඇමැති වාසුදේව නානායක්කාර

අනුර ප්‍රේමලාල්

සෞභාග්‍යයේ දැක්මෙන් ජනතා සුබසිද්ධිය ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීමේදී විවිධ වූ දක්ෂිණාංශික බලවේග විවිධ මුහුණුවරින් අප අතරේ අවුල් ඇති කර කුමන්ත්‍රණකාරී ලෙස බලය ගැනීමට කටයුතු කරන බව ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක, ජල සම්පාදන ඇමැති වාසුදේව නානායක්කාර මහතා ප්‍රකාශ කරයි.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ ඉකුත්දා (06) සෞභාග්‍යයේ දැක්ම උදෙසා ජනතා කේන්ද්‍රීය ප්‍රකාශනය එළිදැක්වීමේ අවස්ථාවට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'අපේ සෞභාග්‍ය දැක්ම යථාර්ථයක් බවට පත් කර ගන්න නම් මේ දක්ෂිණාංශික දේශපාලන පවුරු බිඳ දමන ක්‍රියාදාමයකට එක් විය යුතුයි. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ප්‍රමුඛ වමේ පුළුල් සන්ධානයේ අනාගත වැඩපිළිවෙළ ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරිපත් කර ඇති සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් බවට පත් කර ගැනීමේ අරමුණින් එම වැඩසටහනට මුල් වූ ජනතා කේන්ද්‍රීය වැඩපිළිවෙළ මේ ප්‍රකාශනයෙන් විමර්ශනය කර තිබෙනවා.

සෞභාග්‍යයේ දැක්මේ තිබෙන කරුණු අප අනුමත කර ජයග්‍රහණය කළා. අප ජයග්‍රහණය කළ කරුණු ක්‍රියාවට නංවන පියවර ගැන සෞභාග්‍යයේ දැක්මේ විස්තරව තිබෙනවා. ඒ පියවරවල තර්කානුකූල ඊළඟ පියවර කුමක් විය යුතුද? ඒ පියවර මොනවාද? යන්න ඒ පිළිබඳව තමයි මේ මොහොතේ අප විග්‍රහ කරන්නේ.

නමුත් ජේ. ආර්. ජයවර්ධන මහතාට 1977 දී අප ගෙන ගිය වැඩපිළිවෙළ අත්හිටුවන්න අවශ්‍ය වුණා. ඔහුට අවශ්‍ය වුණේ ව්‍යවස්ථා වෙනසක් කරන්න.

ජනාධිපති බලය පාර්ලිමේන්තුවටත්, ඇමැති මණ්ඩලයටත් ඉහළින් පිහිටවූවා. සමහරු කියනවා, ක්‍රමය කුමක් වුණත් කමක් නෑ, අපට වුවමනා දේ කිරීමනේ අවශ්‍ය කියලා. හැබැයි අපට තිබෙන්නේ ජනතාවට වුවමනා දේ කිරීමයි. එය කරන්න නම් ජනතාවගේ බලයට වග කියන වග වන මහජන නියෝජිතයන්ගේ බලයක් තිබිය යුතුයි. ඒක තමයි අපගේ අදහස. අප අතරේ වෙනස්කම් තිබෙන්න පුළුවන්. නමුත් එක දෙයක් ඉතා පැහැදිලියි. 1956, 60, 70, 77 දක්වා තිබුණාට වඩා වෙනස් තත්ත්වයකයි අද අපේ පාර්ලිමේන්තුව තිබෙන්නේ. අද අපේ පාර්ලිමේන්තුවට බලයක් නෑ.

විනය ගරුක සමාජය නීති ගරුක වන තරමටයි නීතිගරුක සමාජයක් අපට හදන්න පුළුවන් වෙන්නේ. මෙහි විවිධ අංශජනතා කේන්ද්‍රීයව ක්‍රියාත්මක වීම අනුව මතු වන පරස්පරතා විසඳන්න අවශ්‍යයි.'

පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන මහාචාර්ය තිස්ස විතාරණ, ජයන්ත සමරවීර, ප්‍රේමනාත් සී. දොලවත්ත



මහත්වරු ද මෙහිදී අදහස් දැක්වූහ.

ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ඉංජිනේරු ප්‍රියත් බන්දුවික්‍රම මහතා 'විධායක රාජ්‍ය යාන්ත්‍රණය සහ සෞභාග්‍යයේ දැක්ම' මැයෙන් විශේෂ දේශනයක් ද පැවැත්වීය.

# පාස්කු කොමිෂන් වාර්තාව අධ්‍යයනය කර ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කරන්න

## ගලගොඩඅත්තේ ඥානසාර හිමි මහානායක ස්වාමීන් වහන්සේලාගෙන් ඉල්ලීමක් කරයි

අසේල කුරුළුවංශ



පාස්කු දා ප්‍රහාරය පිළිබඳ ජනපති කොමිෂන් වාර්තාවේ නිර්දේශවලින් ඇති කර තිබෙන විකෘතිය විධිමත් ලෙස අධ්‍යයනය කර ඒ සම්බන්ධව ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කරන්නැයි මහනායක ස්වාමීන් වහන්සේලාගෙන් ඉල්ලීමක් කළ බව බොදුබල සේනා සංවිධානයේ මහ ලේකම් ගලගොඩඅත්තේ ඥානසාර නාහිමියෝ පැවැසූහ.

උන් වහන්සේ මේ බව පැවැසුවේ පාස්කු දා ප්‍රහාරය පිළිබඳ ජනපති කොමිෂන් වාර්තාව සම්බන්ධව පෙරේදා (08) අස්ගිරි මහනායක වරකාගොඩ ශ්‍රී ඥාණරතන මහා නාහිමියන් දැනුම්වත් කර ඒ පිළිබඳ සංදේශයක් උන් වහන්සේට භාර දීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ උන් වහන්සේ මෙසේ ද කීහ.

'මෙරට 70%ක් වන බෞද්ධ ජනතාවට නායකත්වය දෙන මහනායක ස්වාමීන් වහන්සේලා රටේ ඇති වන ජාතික, ආගමික සහ සමාජ ප්‍රශ්නවලදී ඒවා සමනය කිරීමේ කාර්යභාරය මැනවින් ඉටු කරනවා. මේ අවස්ථාවේ බරපතළ ගැටලු රැසක් නිර්මාණය කර තිබෙන පාස්කු දා ප්‍රහාරය පිළිබඳ වර්තාව ද උන් වහන්සේලා නිසි ලෙස අධ්‍යයනය කර රටට පැහැදිලි කිරීමක් කරයි. මේ වාර්තාවෙන් පාස්කු දා ප්‍රහාරයේ වින්දිතයන්ට මෙන්ම සමස්ත බෞද්ධ සමාජයටම විශාල අවාසනාවක් කැඳවා තිබෙනවා.

යුගයේ කාර්යභාරයක් ලෙස සලකා දිස්ත්‍රික්කයක් දිස්ත්‍රික්කයක් පාසා ගොස් ඉස්ලාම් අන්තවාදය නිසා රට පත් වූ විපත පිළිබඳව දැනුම්වත් කරනවා. නිදහස ලැබූ දා පටන් ජාතිවාදය, අන්තවාදය, බෙදුම්වාදය මේ රටේ ක්‍රියාත්මක වූණා. බෞද්ධ සමාජයේ අන්තවාදී හෝ ජාතිවාදී උමතුවක් පැවතියේ නම් කෝවිල්, පල්ලි හැදෙන්නේ නෑ. මනුෂ්‍යත්වයට පයින් ගහන සියල්ලන් එකට තබා පරාජය කිරීමට දැන් අවස්ථාව එළැඹ තිබෙනවා. ක්‍රිස්තියානු මූලධර්මවාදීන් මෙන්ම ඉස්ලාම් අන්තවාදීන් දෙපැත්තකින් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.'

# මේ වසරේ සියලු නිවෙස්වලට විදුලිය දී අවසන් කරනවා

## රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක

තිසර සමල් - අනුරාධපුර සහ අනුරාධපුර අතිරේක



සැමට විදුලිය ව්‍යාපෘතිය යටතේ නොමිලේ විදුලි සම්බන්ධතා දෙන බවත්, මේ වසරේ සියලු නිවෙස්වලට විදුලිය දී අවසන් කරන බවත් රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක මහතා පැවැසීය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කර සිටියේ වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ අනුරාධපුර, ඉපලෝගම, පල්ලේකාගම වැව ප්‍රතිසංස්කරණය කිරීමේ සමාරම්භක උත්සවයට සහභාගී වෙමිනි.

මේ යටතේ පල්ලේකාගම වැව රුපියල් මිලියන 18ක වියදමින් ප්‍රතිසංස්කරණය කෙරේ.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

'මේ වසරේ සියයට සියයක් විදුලිය දී අවසන් කිරීමට අප බලාපොරොත්තු වෙනවා. තමන්ගේ ගමට, තමන්ගේ නිවෙස ළඟට විදුලිය ලැබී සම්බන්ධතාවය නොගත් කවුරු හෝ ඉන්නවා නම් සිංහල අවුරුද්දට කලින් ඒ සියලු දෙනාටම නොමිලේ විදුලිය අප දෙනවා. සම්බන්ධතාවය දෙන්න අය කරන රුපියල් 15,000ක මුදල අප අය කරන්නේ නෑ. ඒ වගේම එක් පුද්ගලයකුට වියදම් කරන මුදල ලක්ෂ 3 ½ වෙන්නත් පුළුවන්. ලක්ෂ 05ක් වෙන්නත් පුළුවන්. අපි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන තිබෙනවා, සෑම නිවෙසක් ඉදිරිපිට කණුවකම විදුලිය තිබෙන්න ඕනෙ කියන එක. මේ සඳහා රජයට රුපියල් මිලියන 1500ක් පමණ වැය කරන්න සිද්ධ වෙනවා. මේ වියදම දරන්නේ ආණ්ඩුව.

තමන්ගේ නිවෙස වයරින් කර ගන්න සිටින සමෘද්ධි පවුලක් නම් සමෘද්ධිය හරහා අඩු පොලියට ණයක් ගෙන ඒ කටයුතු කර ගත හැකියි. ඒ වගේම සමෘද්ධි පවුල් ලක්ෂයකට අමතර ආදායමක් ගැනීම වෙනුවෙන් කිලෝ වොට් 05ක සූර්ය බල පද්ධතියක් දෙන වැඩසටහනක් අප ක්‍රියාත්මක කරනවා. මේ වැඩසටහනත් කඩිනමින් ආරම්භ කරනවා. අනුරාධපුරයේ පමණක් සමෘද්ධි පවුල් 2000කට කිලෝ වොට් 05ක සූර්ය පැනල සවි කර, මාසයකට රුපියල් 2000ක 3000ක අමතර ආදායමකුත්, තමන්ගේ ණය මුදල අවුරුදු 07කින් ගෙවී අවසන් වූ පසු රුපියල් 10,000කට වඩා වැඩි ආදායමකුත් ඒ පවුල්වලට දෙන වැඩසටහන අප ආරම්භ කරනවා.

ඒ වගේම ගමට බලාගාරයක් කියන ව්‍යාපෘතිය යටතේ බලාගාර 7000ක් අප නිර්මාණය කරනවා.ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා. ඒ ව්‍යාපෘතියත් කඩිනමින් ආරම්භ කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ අනුව අප අනුරාධපුරයේ පමණක් කුඩා බලාගාර 750කට වැඩි ප්‍රමාණයක් නිර්මාණය කරනවා. ඒ හරහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව ගොවිතැනින් ආර්ථිකය ශක්තිමත් කර ගන්නවා වගේම බල ශක්තිය නිෂ්පාදනය හරහාත් කුඩා ව්‍යාපාරිකයන් බිහි කර ගැනීමේ අරමුණ ක්‍රියාත්මක කරන්න විශාල වැඩ කොටසක් අපේ අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වෙනවා.

අපේ අමාත්‍යාංශයේ පමණක් පසුගිය කාලයේ කුණුවලින් විදුලිය නිෂ්පාදනය කරන බලාගාරයක් ආරම්භ කළා. මීට සති කිහිපයකට පෙර ඩීසල්වලින් තොරව ද්‍රව වායු භාවිතයෙන් විදුලිය නිෂ්පාදනය කිරීමේ මෙගා වොට් 350 බලාගාරයක් ආරම්භ කළා. එය තව අවුරුදු 03ක් ඇතුළත අංග සම්පූර්ණව නිම කර විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම තවත් මෙගා වොට් 150ක බලාගාර 23කට අවසර දී එයත් දැන් ක්‍රියාත්මක කරගෙන යනවා. මේ බලාගාර 23ත් ලබන වසරේ දෙසැම්බර් මාසය වන විට ජාතික විදුලි බල පද්ධතියට එකතු කරන්න බලාපොරොත්තු වෙනවා.

දේශපාලනය පැත්තකින් තියන්න. දේශපාලනය අවශ්‍ය වන්නේ මැතිවරණ කාලයට පමණයි. මැතිවරණයක් අවසන් වුණාට පසුව ජයග්‍රාහී කණ්ඩායමත් එක්ක පරාජය වූ අය එකතු වුණොත් තමයි ජයග්‍රහණය කළ අයට මේ රටට සංවර්ධනය කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා මේ අවුරුදු පහ රට හදන අවුරුදු පහක් බවට පත් කර දේශපාලන වාද භේද පසෙකලා වැඩ කළොත් අපට මේ ගමන යන්න පුළුවන්.

ඇමැතිවරයා මාරු වන විට, ආණ්ඩු මාරු වන විට රජයේ ප්‍රතිපත්ති මාරු වන ක්‍රමය නවතා රටේ ස්ථිරසාර ප්‍රතිපත්ති හදා ඒවා ක්‍රියාත්මක කරවන්න අප බලාපොරොත්තු වෙනවා. අපේ රටට සෘජු ප්‍රතිපත්ති අවශ්‍යයි. ස්ථිරසාර වැඩපිළිවෙළක් අවශ්‍යයි. නුපන් දරුවාටත් ශක්තිමත් රටක්, දියුණු රටක්, සංවර්ධිත රටක් නිර්මාණයට අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය වෙනස්කම් වෙනුවෙන් අප අඩිතාලමක් දැම්මා. ඒ වෙනුවෙන් අප කැප වුණා.'

# ඉරණතිවු දූපත රැක ගන්නැයි ටී.එන්.ඒ. මන්ත්‍රීවරුන්ගෙන් ජනතාවට උපදෙස්

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන් දෙදෙනකු සහ තවත් පිරිසක් කිළිනොච්චියේ ඉරණතිවු දූපතට ගොස් එම දූපත ආරක්ෂා කර ගන්නා ලෙස එහි වැසියන්ට පෙරේදා (08) උපදෙස් දී තිබේ.

දෙමළ ජාතික සන්ධානයේ යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන් සහ කිළිනොච්චියේ එස්. ශ්‍රීධරන් මන්ත්‍රීවරුන් සමඟ තවත් නියෝජිතයන් පිරිසක් මෙලෙස එහි ගොස් තිබේ. රජය යළිත් වරක් කොරෝනා මළ සිරුරු මිහිදන් කිරීමට ඉරණතිවු දූපත තෝරා ගැනීමට ඉඩ ඇති නිසා ඒ පිළිබඳව ඉතා විමසිල්ලෙන් සිටින ලෙසත්, කිසියම් නිලධාරියකු දූපතට පැමිණ යමක් කරන්නේ නම් වහාම ඒ බව දැනුම් දෙන ලෙසත් මේ මන්ත්‍රීවරුන් සහ නියෝජිතයන් දූපත්වාසීන්ට දන්වා තිබේ.

ඉරණතිවු දූපතේ වැසියන් මේ දිනවල මුහුණ දෙන ගැටලු පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කර ඇති අතර, ඔවුන්ගේ අවශ්‍යතා ඉතා ඉක්මනින් ඉටුකිරීමට පියවර ගන්නා බවත් දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන් සහ නියෝජිතයන් ප්‍රකාශ කර තිබේ.

# ආර්. සම්පන්දන් තරම් පරිණත දෙමළ දේශපාලනඥයෙක් දකුණු ආසියාවේම නෑ

## මන්ත්‍රී රාසමානික්කම් චානක්‍යන්

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

දෙමළ ජාතික සන්ධානයේ නායක ආර්. සම්පන්දන් මන්ත්‍රීවරයාට දෙමළ දේශපාලන පක්ෂ නායකයන් විවිධ චෝදනා එල්ල කළත් සම්පන්දන් තරම් පරිණත දෙමළ දේශපාලනඥයකු මුළු දකුණු ආසියාවේම නොමැති බව දෙමළ ජාතික සන්ධානයේ රාසමානික්කම් චානක්‍යන් මන්ත්‍රීවරයා පැවැසීය.

මන්ත්‍රීවරයා මේ බව පැවැසුවේ ජිනීවා මානව හිමිකම් මණ්ඩලයේ සැසිවාරයත් සමඟම සම්පන්දන් මන්ත්‍රීවරයා සම්බන්ධයෙන් පළ වන විවිධ අදහස් පිළිබඳව මාධ්‍යවේදීන් විමසූ අවස්ථාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේ ද කීය.

'මේ රටේ දෙමළ දේශපාලනඥයන්ගෙන් විශාල පිරිසක් දේශපාලනයේ මුල්පොත කියෙව්වේ සම්පන්දන් මන්ත්‍රීවරයාගේ ආභාෂයෙන්. පසුව ඔවුන් පෞද්ගලික සහ වෙනත් වාසි වෙනුවෙන් සම්පන්දන් මන්ත්‍රීවරයාත්, දෙමළ ජාතික සන්ධානයත් අතහැර ගොස් නායකයාට විවිධ චෝදනා එල්ල කරනවා.

දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් මේ දක්වා වසර 50ක් පමණ එක දිගටම පෙනී සිටිමින් විශාල දේශපාලන කාර්යයක් සම්පන්දන් මන්ත්‍රීවරයා ඉටු කරනවා. ඒ මහතාගේ තැනට ඒමට තවමත් ශ්‍රී ලංකාවෙන් දෙමළ දේශපාලනඥයකු බිහි වී නෑ.'

# පළාත් සභාවට තරග කිරීමට මුලින්ම අවස්ථාව දුන්නේ එක්සත් ලක් වනිතා පෙරමුණටයි

## එජාප නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන

මැද කොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ

ඉන්දු ලංකා ගිවිසුම යටතේ ඇති කරන ලද පළාත් සභාවට තරග කිරීමට අප රටේ කාන්තා පක්ෂයට මුලින්ම අවස්ථාව දුන්නේ එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ එක්සත් ලක් වනිතා පෙරමුණේ කාන්තාවන් බවත්, එයින් පළාත් සභා මැතිවරණයට කාන්තාවන් රැසක් තේරී පත් වූ බවත් එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා පැවැසීය.

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් පිටකෝට්ටේ සිරිකොත මන්දිරයේ එක්සත් ලක් වනිතා පෙරමුණේ මෙහෙයවීමෙන් පැවති උත්සවයේදීය.

මෙහිදී හිටපු ඇමැතිවරියන් මෙන්ම පුරපතිනියක්, ආණ්ඩුකාරවරියක් ලෙස කටයුතු කළ සුනේත්‍රා රණසිංහ සහ අමරා පියසීලි රත්නායක මහත්මීන්ට උපහාර දක්වමින් රනිල් වික්‍රමසිංහ මහතා අතින් සමරු තිළිණ පිළිගැන්වීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා මෙසේ ද කීය.

'ඉදිරියේ පැවැත්වීමට යෝජිත පළාත් පාලන මැතිවරණයේදී එක්සත් ලක් වනිතා පෙරමුණේ 25%ක කාන්තා නියෝජනයක් සෑම පළාත් සභාවකටම දෙන ලෙස එක්සත් ජාතික පක්ෂයට යෝජනා කර තිබෙනවා. එම යෝජනාව පක්ෂය පිළි ගන්නවා.



වත්මන් ආණ්ඩුව යටතේ අද රන් මාලයක්, පෙන්ඩනයක්, වළල්ලක් දමාගෙන කාන්තාවකට, තරුණියකට මඟ තොටේ යෑමට නොහැකි තත්ත්වයක් උදා වෙලා. ආණ්ඩුව ඒ සඳහා ගෙන තිබෙන පියවර කුමක් දැයි මා රජයේ වගකිව යුත්තන්ගෙන් ප්‍රශ්න කරනවා.'

**දෙහිවල ගල්කිස්ස විපක්ෂ නායිකා සුනේත්‍රා රණසිංහ මහත්මිය**

'1977 බලයට පැමිණි ජේ. ආර්. ජයවර්ධන මහතාගේ රජය යටතේ මට මුලින්ම නියෝජ්‍ය ඇමැතිවරියක් ලෙස කටයුතු කිරීමට ඉඩ දුන්නා. ඉන්පසු පළාත් සභා ක්‍රමය යටතේ එක්සත් ලක් වනිතා පෙරමුණේ අපේක්ෂිකාවන් රැසකටම මැතිවරණවලට තරග කිරීමට ඉඩ ලැබුණා. මේ වන විට එක්සත් ජාතික පක්ෂයෙන් තරග කළ කාන්තාවන් 803ක් ඉන්නවා.'

**හිටපු ඇමැති සහ හිටපු ආණ්ඩුකාරවරියක් වන අමරා පියසීලි රත්නායක මහත්මිය**

'මා උපන්දා සිටම එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක්. හිටපු ජනාධිපති දිවංගත ජේ. ආර්. ජයවර්ධන, දිවංගත රණසිංහ ප්‍රේමදාස, දිවංගත ඩී. බී. විජේතුංග සහ හිටපු අග්‍රාමාත්‍ය එක්සත් ජාතික පක්ෂයේ වත්මන් නායක රනිල් වික්‍රමසිංහ මහතා සමඟ කටයුතු කිරීමට ලැබීම මාගේ වාසනාවක්. ඉදිරි කාලයේදී අප එකතුවී එක්සත් ජාතික පක්ෂ රජයක් බිහි කරමු.'

පරිසරවේදිනී ආචාර්ය අජන්තා පෙරේරා, එක්සත් ලක් වනිතා පෙරමුණේ හිටපු සභාපතිනී, මහනුවර එජාප දිස්ත්‍රික් නායිකා ශාන්තිනී කෝන්ගහගේ මහත්මීහුද මෙහිදී අදහස් දැක්වූහ.

එජාප මහ ලේකම් පාලිත රංගෙ බණ්ඩාර, එජාප සභාපති වජිත අබේවර්ධන, එජාප උප නායක නීතිඥ අකිල විරාජ් කාරියවසම්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන පාලිත තෙවරප්පෙරුම, ආනන්ද කුලරත්න, හිටපු ඇමැතිවරයකු වන ඩී. එම්. ස්වාමිනාදන්, සීතා මාලනී, චාමිකා පතිරණ, දෙහිවල ගල්කිස්ස නාගරික මන්ත්‍රිනී මරීනා ආබ්දීන්, කොට්කාවත්ත මුල්ලේරියා නාගරික මන්ත්‍රී මොහොමඩ් සහබ්දීන් මහත්ම මහත්මීහු ද මේ අවස්ථාවට සහභාගි වූහ.

# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ලොව පුරා ස්ත්‍රීන් අත්විඳින දෙයක්

## පාර්ලිමේන්තු මන්ත්‍රිනී ආචාර්ය හරිනි අමරසූරිය

නදී මාණික්කගේ

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ලෝකය පුරාම ස්ත්‍රීන් අත්විඳින දෙයක් බව පාර්ලිමේන්තු මන්ත්‍රිනී ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය පැවැසුවාය.

ඇය මේ බව පැවැසුවේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ දී ඊයේ (09) පැවැති මාධ්‍ය හමුවට එක් වෙමිනි.

එහි දී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇය මෙසේ ද කීවාය.

'වාමාංශික සහ ස්ත්‍රීවාදී අදහස් දරන අය මීට වසර දෙකකට පමණ පෙර ප්‍රගතිශීලී ස්ත්‍රී එකමුතුවක් ලෙස සංවිධානය වුණා. ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජ සාධාරණත්වය වෙනුවෙන් අරගල කරන සහෝදරියන්ට එකතු වෙන්න පුළුවන් වේදිකාවක් ලෙස එය නිර්මාණය කළා. සංවිධාන 15කට වඩා මේ එකමුතුව නියෝජනය කරනවා. ඒ වගේම ස්වාධීන මත දරන්නියන් එකතුවී ඉන්නවා. අපේ ප්‍රධානම අරමුණ අප අතර විවිධ දේශපාලන මතවාද තිබුණත් වාමාංශික, ස්ත්‍රීවාදී සහ ප්‍රජාතන්ත්‍රවාදී අදහස් අගය කරන ස්ත්‍රීන් ලෙස එකතු වෙලා ප්‍රධාන ධාරාවේ දේශපාලන ව්‍යාපාරවලට සහ දේශපාලන සංස්කෘතියට බලපෑම් කළ හැකි කණ්ඩායමක් ලෙස වර්ධනය වීමයි. ඒ වගේම අපේ මතවාද සමාජගත කිරීමත් ප්‍රධාන අරමුණක්.

අප ස්ත්‍රීවාදීන් සහ වාමාංශිකයන් ලෙස විශේෂයෙන් හඳුන්වන්නේ ඇයි කියන එකත් පැහැදිලි කරන්න ඕනෑ. ස්ත්‍රීවාදීන් කියන එක සහ වාමාංශික කියන එක අලුත් දෙයක් නොවෙයි. අපේ අනන්‍යතාවට මේ සංකල්ප යොදා ගන්නේ ඇයි කියන එකත් පැහැදිලි කර ගැනීම අවශ්‍යයි. මේ මොහොතේ අත්විඳින නව ලිබරල්වාදී ධනවාදී ක්‍රමය තුළ ස්ත්‍රීන් වන අපට විශාල අභියෝග රාශියකට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. පුද්ගල නිදහස වෙනුවෙන් යම්කිසි අවකාශයක් හැදිලා තිබුණත් මේ ආර්ථික ක්‍රමය තුළ අපට අභියෝග රාශියකට මුහුණ දෙන්න සිදු වෙලා. කොවිඩ් කාලයේ මෙය වඩාත් තීව්‍ර වුණා. කොවිඩ් පාලනය කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා නිවෙසත්, එයින් පිටතත් විශාල කැපකිරීම් කරන්න සිද්ධ වුණේ ස්ත්‍රියට. ඒ හා සමානවම ස්ත්‍රියක් වීම නිසාම අභියෝග රාශියකටත් මුහුණ දෙන්න සිද්ධ වුණා.



උදාහරණ වශයෙන් කීවොත් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අපේ රටේ විතරක් නොවෙයි ලෝකය පුරාමත් ස්ත්‍රීන් අත්විඳින දෙයක්. ධනවාදී ක්‍රමයේ වැටුප් ලබන හෝ නොලබන ස්ත්‍රීන්ගේ ශ්‍රමය සූරාකෑම තුළ මේ ආර්ථිකයේ විශාල පංගුවක් රඳා පවතිනවා. විදේශ රැකියාවලට ගිය අපේ සොහොයුරියන් ආපසු රටට එන්න බැරිව අනේක දුක් විඳිමින් ඉන්නවා. ඔවුන්ව ආපසු ගෙන්වා ගන්න සැලසුම් සකස් කර තිබෙන බවට රජය මොනවා කීවත් ප්‍රායෝගිකව එය සිද්ධ වෙන්නේ නෑ. මුදල් ගෙවන්න බැරි අය රටවල් ගණනාවක ඉතාම අවිනිශ්චිත ජීවිත ගත කරමින් ඉන්නවා. අනික් පැත්තෙන් නිදහස් වෙළෙඳ කලාපයේ අර්බුද රාශියකට අපේ සහෝදරියන් මුහුණ දෙනවා. ලොක්ඩවුන් වෙලාවේ ඔවුන් අඩුම තරමින් ආහාර වේලක්වත් සපයා ගන්න බැරි අසරණ තත්ත්වයකට පත් වුණා. ක්ෂුද්‍ර මූල්‍ය ණය බරින් හිර වුණු කාන්තාවන් අද හිඟුරක්ගොඩ දී සත්‍යග්‍රහයක් ආරම්භ කළා. ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා ස්ත්‍රීන් විශාල සංඛ්‍යාවක් සිය දිවි නසා ගත්තා. කෘෂිකාර්මික ක්ෂේත්‍රය ගත්තත්, වතු වගා ක්ෂේත්‍රය ගත්තත් ඔවුන්ගේ ශ්‍රමය සූරාකෑම ඉතාම ඉහළයි. වැටුප් නොලබා සුරැකුම් ආර්ථිකය වශයෙන් නිවෙසේ හිඳිමින් කරන වැඩ කොටස ගත්තත් මේ තත්ත්වය පොදුයි.

මෙවැනි තත්ත්වයක පවතින ආර්ථික ව්‍යුහයට අප අභියෝග කළ යුතුයි. ඒ වගේම සමාජ සංස්කෘතික සහ දේශපාලනිකවත් ස්ත්‍රියක් වීම නිසා කොන් කිරීම අත්විඳිනවා. අපි පුරුෂයන්ට විරුද්ධ නෑ. නමුත් පුරුෂාධිපත්‍යයට විරුද්ධ වෙනවා. පුරුෂාධිපත්‍ය අභියෝගයට ලක් කළ යුතුයි. ඒ වගේම ඕනෑම කණ්ඩායමක් තවත් කණ්ඩායමක් ආධිපත්‍යයෙන් යට කිරීමට විරුද්ධ වෙනවා. සමාජ සාධාරණත්වය, සමානාත්මතාව වෙනුවෙන් නැඟී සිටීමට අවශ්‍යයි කියන එක අපේ දැක්මේම තිබෙනවා. අප අත්විඳින මේ අර්බුද සමයේ ස්ත්‍රීවාදී නායකත්වය සහිත අලුත් නායකත්ව මොඩල් එකක් අවශ්‍ය යැයි කියන හැඟීමත් එක්ක අප අද මේ ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන් සංවිධාන කළා.

සියලු දෙනාට සාධාරණත්වය, යුක්තිය තහවුරු කරන එකිනෙකාට පීඩා නොකරන මිනිසුන් විසින් තව මිනිසෙක්ව පාගන්නේ නැති සමාජයක් වගේම පරිසරය රැක බලා ගන්න සමාජයක් වෙනුවෙන් නායකත්වය දැරිය හැකි සහ අලුත් ආකාරයේ නායකත්වයක් බිහි කර ගැනීම අපේ වාමාංශික ස්ත්‍රීවාදී දැක්මයි. ඒ දැක්ම අනුව මේ නායකත්වයක් බිහි කර ගන්න පුළුවන් කියන විශ්වාසය අප තුළ තිබෙනවා. ඒ ගැන වඩාත් පුළුල් ලෙස සාකච්ඡා කිරීමේ පියවරක් ලෙස මේ කාන්තා දිනය අප යොදා ගන්නවා. අද විතරක් නොවෙයි සෑම දවසකම ශක්තිමත්ව, එකමුතුව අප අතර තිබෙන විවිධත්වය අගය කරමින් සමගිය ශක්තිමත් කරගෙන සාමූහිකව අභියෝගවලට මුහුණ දෙන්න අධිෂ්ඨාන කර ගනිමු.'



# ටැබ්ලොයිඩ් ප්‍රකාශ මටත් - බිරියටත් රට හැර යන්න හේතු වුණා

## හැරී කුමරු මාධ්‍යට දෙහි කපයි

## රාජකීය පවුලේ පුවත්පත් ඔවුන් ආරක්ෂා කළේ නෑ

### මාධ්‍යයෙන් චෝදනා

ටැබ්ලොයිඩ් ප්‍රකාශනවලින් ජාතිවාදය සෙසු සමාජයට ගලා යාම තම සහ තම බිරිඳ එක්සත් රාජධානියෙන් ඉවත්වීමට බලපෑ හේතු අතරින් "විශාල කොටසක්" වූ බව සසෙක්ස් ආදිපාදවරයා වන හැරී කුමරු පවසයි. හැරී කුමරු ඔප්රා වින්ෆ්‍රේට මේ බව පැවැසුවේ මාධ්‍ය සාකච්ඡාවක් අතරතුරය. එහිදී ඔහු වැඩි දුරටත් පැවැසුවේ එක්සත් රාජධානියේ ටැබ්ලොයිඩ් මාධ්‍යය "මහා මෝඩ" බවත් "පාලනය සහ බිය" පිළිබඳ "අහිතකර පරිසරයක්" නිර්මාණය කරන බවත් ය. ඔහු කියා සිටියේ වේල්සයේ කුමරු "එය සමඟ සාමය ඇති කර ගත යුතු" බවයි. මෙයට පිළිතුරු දෙමින් සංස්කාරකවරුන්ගේ සංගමය කියා සිටියේ ජනමාධ්‍ය යනු විශාල මෝඩකමක් නොවන අතර එය "ධනවත් හා බලවත්" බවයි. සමාජ මාධ්‍ය විසින් "වනචාරී සහ වනචාරී බටහිර" වැනි මාධ්‍යයන් සමඟ සම්බන්ධතාව ඇති කර ගත් බවත්, රාජකීය පවුලේ පුවත්පත් මෙහෙයුම ඇය සහ හැරී අසත්‍ය කතාවලින් ආරක්ෂා කිරීමට අසමත් වූ බවත් මේගන් පැවසීය. බොහෝ දෙනා අපේක්ෂාවෙන් සිටි ඔප්රා සමඟ පැවැති මේ සම්මුඛ සාකච්ඡාවේදී හැරී සහ මේගන් ජාතිවාදය, මානසික සෞඛ්‍යය, මාධ්‍ය සමඟ ඔවුන්ගේ සම්බන්ධතාවය සහ රාජකීය පවුලේ ගතිකතාවයන් ඇතුළු ගැඹුරු පෞද්ගලික මාතෘකා ගණනාවක් ආවරණය කළහ. පැය දෙකක මේ සම්මුඛ සාකච්ඡාව ඊයේ රාත්‍රියේ එක්සත් ජනපදයේ විකාශය වූ අතර එක්සත් රාජධානියේ අයිටීවී ඔස්සේ සඳුදා රාත්‍රියේ සහ අයිටීවී හබ්හි තිරගත කෙරිණි.

# හමුදාව රැකවල් තර කරයි මියන්මාර් විරෝධතාකරුවෝ පිට වීමට නොහැකිව හිර වෙති




හමුදාව රැකවල් තර කිරීම නිසා සිර වී සිටි මියන්මාර් විරෝධතාකරුවන් දුසිම් ගණනක් මේ වන විට එම ස්ථානයෙන් පලා ගොස් ඇත.

සඳුදා යැන්ගොන් දිස්ත්‍රික්කයක පුද්ගලයන් 200ක් පමණ රැඳී සිටි වීදි හතරක ප්‍රදේශයකින් පිටවීම ආරක්ෂක අංශ අවහිර කර තිබුණි. මෙයින් අවම වශයෙන් පුද්ගලයන් 40 දෙනෙකු අත්අඩංගුවට ගෙන එක රථයකින් රැගෙන ගිය බව ප්‍රදේශවාසියෙක් බීබීසී ප්‍රවෘත්ති සේවයට පැවසීය.

තවත් සමහරු රාත්‍රියේ නිහඬ පැයවලදී පොලිස් බලය අඩුවෙද්දී පැන යෑමට සමත් වූහ. කුමන්ත්‍රණයකින් පෙබරවාරි 1 වැනි දින හමුදාව බලය අල්ලා ගත් දා සිට මියන්මාරය පුරා මහජන විරෝධතා දක්නට ලැබුණි. මිලිටරි පාලනය අවසන් කරන ලෙසත්, කුමන්ත්‍රණයෙන් පෙරළා දමා රඳවාගෙන සිටි අවුන් සාන් සූ කී ඇතුළු රටේ තේරී පත් වූ රජයේ නායකයින් නිදහස් කරන ලෙසත් ඉල්ලා සිටින විරෝධතාවලින් අවම වශයෙන් පුද්ගලයින් 54 දෙනෙකු මියගොස් තිබේ. එක්සත් ජාතීන්ගේ ප්‍රධානී ඇන්ටෝනියෝ ගුටරෙස් පවසන පරිදි සඳුදා සිරවී සිටි බොහෝ දෙනා අන්තර්ජාතික කාන්තා දිනයට සහය පළ කරමින් පෙළපාළි ගිය කාන්තාවන්ය. "ආරක්ෂිතව නිදහස් කරන ලෙස" එක්සත් ජාතීන් හමුදාවට ආයාචනා කර තිබූ අතර ගුටරෙස් මහතා "උපරිම සංයමයෙන් කටයුතු කරන ලෙස" ඉල්ලා සිටියේය. අඟහරුවාදා අලුයම එක් විරෝධතාකරුවෙක් බීබීසීයට පැවසුවේ දේශීය වේලාවෙන් 06:30ට පිටත්ව යා ගත හැකි වූ බවයි. ආරක්ෂක අංශ අලුයම එම ප්‍රදේශයෙන් පිටව ගොස් ඇති බව ඔහු පැවසීය. එක් රථයකින් පුද්ගලයන් 40 දෙනකු අත්අඩංගුවට ගත් නමුත් සෙසු අය උදේ වන තුරුම සැඟවී සිටි අතර පසුව ඔවුන්ට පිටත්ව යෑමට හැකි විය.






# පිලිපීනයේ කොරල්පර ලොකු අවදානමක



ඉවත දමන පුද්ගලික ආරක්ෂක උපකරණ (පීපීඊ) පිලිපීනයේ අගනුවර වන මැනිලාවට ආසන්න මුහුදේ කොරල් පරවල තිබී හමුවීමත් සමඟ එම කොරල්පර සම්බන්ධ අවධානයක ඉහළ ගොස් තිබේ.

ආසියානු සංවර්ධන බැංකුවේ ඇස්තමේන්තුවකට අනුව, කොවිඩ් -19 වසංගතය ආරම්භයේ සිට එම නගරය දිනකට අමතර වෛද්‍ය අපද්‍රව්‍ය ටොන් 280ක් උත්පාදනය කරයි. මුහුණු ආවරණ ඇතුළත ඇති ප්ලාස්ටික් කඩා වැටීමෙන් අනතුරුව සමුද්‍රීය වන සතුන් ඒවා ආහාරයට ගන්නා බවට පරිසර කණ්ඩායම් අනතුරු අඟවයි. ඔවුන් පිලිපීන රජයෙන් ඉල්ලා සිටින්නේ වෛද්‍ය අපද්‍රව්‍ය හැසිරවීම වැඩි දියුණු කරන ලෙසත්, තව දුරටත් මුහුදේ දූෂණය වීම වැළැක්වීමට කටයුතු කරන ලෙසත් ය. ගිනිකොනදිග ආසියාවේ තිරසර සමුද්‍රීය සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ හරිත වෙරල්වලට අනුබද්ධ කණ්ඩායමක් වන ඇනිලාවෝ ස්කූබා කිමිදුම් මධ්‍යස්ථානයේ කිමිදුම්කරුවන් සමඟ ගවේෂණයේ නිරත වීමට බීබීසීයේ හොවාර්ඩ් ජොන්සන් සම්බන්ධ විය.

# තායිලන්තයට එන සංචාරකයන්ට නිරෝධායනයට යාත්‍රාවක්




තායිලන්තයට පැමිණෙන සංචාරකයන්ට දැන් සති දෙකක කොරෝනා වයිරස් නිරෝධායනය යාත්‍රාවක ගත කළ හැකිය.

මෙම නව පියවර මඟින් යාත්‍රා සංචාරක ආදායමෙන් බාට් බිලියන 1.8ක් (ඩොලර් මිලියන 42 ක්) ලැබෙනු ඇතැයි රජය අපේක්ෂා කරයි. වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ රටේ අරගලකාරී තත්ත්වයකට පත් වී තිබෙන සංචාරක කර්මාන්තය පුනර්ජීවනය කිරීම මෙම පියවරේ අරමුණයි. මීට පෙර, ජනවාරි මාසයේදී එරට විසින් සංචාරකයන්ට ඔවුන්ගේ නිරෝධායනය ගොල්ෆ් පිටියක ගත කිරීමට යෝජනා කරන ලදී. මේ අග්නිදිග ආසියානු ජාතිය සංචාරකයින් මත දැඩි ලෙස රඳා සිටින නමුත් වයිරසය පැතිරීම සීමා කිරීම සඳහා පසුගිය වසරේදී එය තහනම් කළේය. සඳුදා නිවේදනය කරන ලද, යාත්‍රා නිරෝධායන වැඩසටහන මඟින් සෘණාත්මක කොරෝනා වයිරස් පරීක්ෂණ වාර්තාවක් ඇති අමුත්තන්ට ෆුකෙට්හි යාත්‍රාවක් හෝ කුඩා නෞකාවක කාලය ගත කිරීමට ඉඩ සැලසේ. ජනප්‍රිය සංචාරක ගමනාන්තයක් වන එහි වසංගතයෙන් පසු සංචාරකයන්ගේ සංඛ්‍යාව දිනකට 40,000-50,000 සිට සිය ගණනක් දක්වා පහත වැටුණි.

# ලෝක වකුගඩු දිනය හෙට

## ‘වකුගඩු රෝග සමඟ හොඳින් ජීවත් වීම’ මෙවර තේමාවයි



මෙවර ලෝක වකුගඩු දිනය හෙටට (11) යෙදී ඇති අතර, සෑම වසරකම ලෝක වකුගඩු දිනය මාර්තු මාසයේ දෙවැනි බ්‍රහස්පතින්දාට යෙදෙයි.

මෙවර තේමාව "වකුගඩු රෝග සමඟ හොඳින් ජීවත්වීම" (Living well with kindly Disese) යන්නයි.

වකුගඩු රෝග රාශියක් ඇති අතර, සරල වකුගඩු රෝග සමඟ ජීවත් වීම කිසිදු අභියෝගයක් නොවන අතර, තමා නියම සටන ඇත්තේ දරුණු මාරාන්තික වකුගඩු රෝග සමඟ වේ. ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන මෙම වකුගඩු රෝග අද දින සාමාන්‍ය රෝගී තත්ත්වයක් බවට වර්තමානයේ පත්ව ඇත. ඕනෑම දරුණු රෝගී තත්ත්වයක් වළක්වා ගැනීමට එම රෝගය පිළිබඳ සමාජයේ දැනුවත්භාවය ඉතා ඉහළ මට්ටමකින් තිබිය යුතු වේ. වකුගඩු රෝගය හේතුවෙන් ශ්‍රී ලාංකිකයන් රැසකගේම ජීවිතවලට මහත් බලපෑමක් ඇති වී තිබීම නිසා රජයට විශාල බරපැනක් දැරීමට සිදුව ඇත. ලෝක වකුගඩු දිනය නම් කිරීමේ අරමුණ වී ඇත්තේ වකුගඩු රෝග ගැන සමාජ අවබෝධය පුළුල් කිරීම, දියවැඩියාව හා අධික රුධිර පීඩනය වකුගඩු නරක් වීමට බලපාන ප්‍රධාන සාධක බව පෙන්වා දීම සහ ඔවුන් ඒ වකුගඩු රෝග ඇත් දැයි පරීක්ෂා කිරීම, වකුගඩු රෝග වළක්වා ගැනීමට අවශ්‍ය පිළිවෙත් දැනුවත් කිරීම, වෛද්‍ය කාර්ය මණ්ඩලය මෙ රෝගය හඳුනා ගැනීමට සහ අවදානම් අඩු කර ගැනීම පිළිබඳ දැනුවත් වීම, වකුගඩු බද්ධ කිරීම සහ ජීවිත බේරා ගැනීම වකුගඩු ප්‍රදානය කිරීමේ වැදගත්කම ගැන දැනුවත් කිරීම වේ.

දරුණු වකුගඩු රෝගවලින් බොහෝවිට වකුගඩු සම්පූර්ණයෙන්ම අකර්මන්‍ය වන අතර, එහිදි රෝගියාට සහ පවුලේ අයට රුධිර කාන්දුපෙරණය හා වකුගඩු බද්ධ කිරීම යන ක්‍රියාවලියන්ගේ පිහිට ගැනීමට සිදුවේ.

මෙවැනි තත්ත්වයකට පත්වූවන්ට උපකාර කිරීමට ඔවුන්ගේ දුක තේරුම් ගත් ශ්‍රී ලංකාවේ පැරණිතම වකුගඩු රෝගීන්ගේ සංගමය පසුගිය දශකය පුරාවට එම රෝගීන්ට සිදු කළ සුපින්වත් මෙහෙවර කියා නිම කළ නොහැකිය.

මෙවැනි තත්ත්වයකට පත් වූවන්ට උපකාරී කිරීමට ඔවුන්ගේ දුක තේරුම්ගත් ශ්‍රී ලංකාවේ පැරණිතම වකුගඩු රෝගීන්ගේ සංගමය පසුගිය දශකය පුරා එම රෝගීන්ට සිදුකළ සුපින්වත් මෙහෙවර කියා නිම කළ නොහැකිය.

රෝගීන්ගේ මනස ශක්තිමත් කරමින් අභිමි වන්නට යන ජීවිතය එක් තප්පරයකින් හෝ බේරා ගැනීමට කාලය සමඟ සටන් වදින වකුගඩු විශේෂඥ වෛද්‍ය සංජය හෙයියන්තුඩුව මහතා අද වැනි දිනක අමතක කළ නොහැකි චරිතයක් වන අතර, මෙවැනි නායකත්වයක් ගෙන කටයුතු කිරීමට සුදුසු පුද්ගලයකු ලැබීමට සියලුදෙනාම සුපින්වත් වී ඇත. වකුගඩු රෝගීන්ට ඩයලයිසින් ප්‍රතිකර්මය සඳහා උපකාරී කිරීම, මිල අධික පරීක්ෂණය සඳහා අපකාර කිරීම, විශේෂඥ වෛද්‍ය සේවය ලබාදීම, අසීරු අවස්ථාවන්හිදි රෝගීන්ගේ පවුල්වලට ආධාර වියළි සලකා ලබාදීම, ප්‍රථමවරට වකුගඩු රෝගීන්ට සෞඛ්‍ය ප්‍රතිලාභ ක්‍රමයක් හඳුන්වාදීම, රෝග පිළිබඳ දැනුවත් කිරීමට භාෂා තුනෙන්ම පොත් 13 ක් මුද්‍රණය කර එළිදැක්වීම, රෝගීන්ගේ දරුවන් හට ශිෂ්‍යත්ව ක්‍රමයක් සැකසීම, වකුගඩු කැලැන්ඩරයක් වාර්ෂිකව නිර්මාණය කිරීම, රෝගීන්ට හැඳුනුම්පතක් ලබාදීම තුළින් සමාජයේ පිළිගැනීමක් ලබා දීම, රෝගීන් මිය ගිය විට අවමංගල්‍ය කටයුතු සඳහා උපකාර කිරීම, වකුගඩු රෝගය පිළිබඳ වෛද්‍ය විද්‍යා පුවත්පතක් (වකුගඩුව) එළිදැක්වීම ඇතුළු මෙහෙවර රාශියක් මෙම සංගමයෙන් සිදු කරමින් පවතී.

අප සියලු දෙනා මෙම රෝගීන් සමඟ එකතුව ඔවුන් ගෙවන එක් මොහොතක් අප සියල්ලන්ගේම මොහොතක් ලෙස ගෙන මෙම ලෝක වකුගඩු දිනයේදී මෙම සුපින්වත් සංවිධානය සමඟ එක්වෙමින් මෙම මෙහෙවරට එක් වචනයකින් හෝ සහයෝගය පළ කිරීමට සිත් පහළ වේවායි අදිටන් කර ගනිමු.

# අමෙරිකාවේ නම් කරන අන්තර්ජාතික දිරිය කාන්තා ලයිස්තුවට නීතිඥ රනීතා ඥානරාජාත් එක් වෙයි





**මහින්ද අලුත්ගෙදර**

අමෙරිකානු රාජ්‍ය ලේකම් දෙපාර්තමේන්තුව වාර්ෂිකව පිරිනමන 2021 වසරේ අන්තර්ජාතික දිරිය කාන්තාවන් 14 දෙනාගේ ලැයිස්තුවට ශ්‍රී ලාංකික නීතිඥවරියක හා සිවිල් ක්‍රියාකාරිනියක වන රනීතා ඥානරාජා මහත්මිය තේරී පත්ව ඇති බව අමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව පවසයි.

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් සඳහා ලබාදුන් විශිෂ්ට දායකත්වය වෙනුවෙන් රනීතා ඥානරාජා මහත්මිය වෙත එක්සත් ජනපද ජනාධිපති ආර්යා ආචාර්ය ජිල් බයිඩන් අතින් අන්තර්ජාතික දිරිය කාන්තා සම්මානය පිරිනමා තිබේ.

ලොව පුරා ධෛර්යමත් කාන්තාවන් ඇගයීමට පත්කිරීම සඳහා ඇමෙරිකා රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව පවත්වන මෙම සම්මාන උලෙළේ සම්මාන ප්‍රධානෝත්සවය ලෝක කාන්තා දිනය යෙදී තිබූ පෙරේදා (08) ඇමෙරිකා ජනපති ආර්යාව වන ජිල් බයිඩන් හා ඇමෙරිකා රාජ්‍ය ලේකම් ඇන්ටනී බ්ලින්කන්ගේ ප්‍රධානත්වයෙන් වීඩියෝ තාක්ෂණය ඔස්සේ පැවැති අතර එහිදී සම්මාන පිරිනැමූ බවද ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

ඒ අනුව මෙම ලාංකික කාන්තාව සමඟ බෙලරුස්, මියන්මාරය, කැමරූන්, චීනය, කොලොම්බියාව, කොංගෝ රාජ්‍යය, ගෝතමාලාව, ඉරානය, නේපාලය, සෝමාලියාව, ස්පාඤ්ඤය, තුර්කිය හා වෙනිසියුලාව යන රටවලින් තෝරා ගත් ධෛර්යමත් කාන්තාවන් 14 දෙනකු මෙම සම්මානයෙන් පිදුම් ලැබූහ.

මෙවර ජාත්‍යන්තර ධෛර්යසම්පන්න කාන්තාවට හිමි පිරිනැමූ අතර මානව හිමිකම් ආරක්ෂා කිරීම, යුක්තිය, සාමය හා ලිංගික සමානාත්මතාවය වෙනුවෙන් ඔවුන් කළ මෙහෙය අගයා මෙම සම්මානය පිරිනැමීමට ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබේ.

අමෙරිකානු රාජ්‍ය ලේකම් දෙපාර්තමේන්තුව සඳහන් කර ඇත්තේ රනීතා ඥාණරාජා මහත්මිය තර්ජන හා අභියෝග මධ්‍යයේ වුවද රටේ අවධානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් දිගින් දිගටම සටන් වදින හා ඔවුන් ආරක්ෂා කරන නීතිඥවරිය ලෙස කටයුතු කරන්නියක වන බවයි.

බලහත්කාරයෙන් අතුරුදහන් වීම්වලට ගොදුරුවූවන් සහ නීතියේ පිළිසරණක් නොමැතිව වසර ගණනාවක් පුරා සිරගතව සිටින සිරකරුවන් වෙනුවෙන් වගකිවයුතු සහ යුක්තිය වෙනුවෙන් නීතීඥ රනීතා ඥානාරාජා සිය වෘත්තිය කැපකර ඇති තැනැත්තියක් යැයිද අමෙරිකා රාජ්‍ය දෙපාර්තමේන්තුව කියා සිටී.

ක්‍රීඩා SPORTS

sports.dinamina@lakehouse.lk



# ශ්‍රී ලංකා - කොදෙව්
## එක්දින තරගාවලිය අද ඇරඹේ

වසර 2023 එක්දින ලෝක කුසලාන තරගාවලියට සුදුසුකම් ලබාදෙන අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයේ ලෝක කුසලාන සුපර් ලීග් එක්දින තරගමාලාවේ ශ්‍රී ලංකා පිල තරග වදින පළමු තරගාවලිය අද (10) බටහිර ඉන්දීය කොදෙව් දූපත් කණ්ඩායම සමඟ ඇන්ටිගුවාහි ශ්‍රීමත් විවියන් රිචඩ්ස් ක්‍රීඩාංගණයේදී ආරම්භ වේ. තරග 3කින් සමන්විත මේ තරගාවලියේ පළමු තරගය ශ්‍රී ලංකා වේලාවෙන් අද රාත්‍රී 7.00ට ආරම්භ කෙරේ.

කොරෝනා වසංගතය හේතුවෙන් මාස ගණනාවක් ප්‍රමාද වූ අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයේ ලෝක කුසලාන සුපර් ලීග් එක්දින තරගමාලාව පසුගිය වසරේ අප්‍රේල් මාසයේදී ආරම්භ වූයේ එංගලන්තය සහ අයර්ලන්තය අතර එක්දින තරගාවලියෙනි. පසුගිය 2019 වසරේ දී අවසන් වරට පැවති එක්දින ලෝක කුසලාන තරගාවලිය සුදුසුකම් ලැබීමේ ක්‍රමය යටතේ සහ අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයේ එක්දින ශ්‍රේණිගත කිරීමේ අනුපිළිවෙළ අනුව කණ්ඩායම් තෝරා ගෙන තිබූ අතර, මීළඟ ලෝක කුසලාන තරගාවලියේ සිට මේ ලෝක කුසලාන සුපර් ලීග් එක්දින තරගමාලාව පැවත්වීමට තීරණය විය. ඒ අනුව නව ක්‍රමවේදය යටතේ ශ්‍රී ලංකාව සිය පළමු තරගාවලියට අද එක් වෙයි. පසුගිය ජනවාරියේදී බංග්ලාදේශයේ සංචාරය කළ කොදෙව් පිල එහිදී පළමුවරට ලෝක කුසලාන සුපර් ලීග් එක්දින තරගමාලාවට ඇතුළත් තරගාවලියට ක්‍රීඩා කළ අතර, එහිදී තරග 3-0කින් පරාජයට පත්වී තිබිණි. ඒ අනුව අද ඇරඹෙන මේ තරගාවලිය දෙපිලටම එක සේ වැදගත් වනු ඇත.

වසර 1975 ජූනි මාසයේ 7 වැනිදා එවකට පැවති පළමු එක්දින ලෝක කුසලාන තරගාවලියේදී පළමුවරට බටහිර ඉන්දීය කොදෙව් පිල සමඟ එක්දින තරග සටන ආරම්භ කළ ශ්‍රී ලංකා පිල මේ දක්වා තරග 60කට ක්‍රීඩා කර ඇති අතර, ඉන් තරග 29ක් ජය ගැනීමට සමත්විය. තරග 28ක් පරාජයට පත් වූ අතර, තවත් තරග 3ක් නිමාවට පත් වූයේ විසඳුමකින් තොරවය. අවසන් වරට පසුගිය වසරේ පෙබරවාරියේ ශ්‍රී ලංකාවේ සංචාරය කළ කොදෙව් පිල එහිදී පැවති එක්දින තරගාවලියෙන් 3-0කින් පරාජයට පත් කිරීමට ශ්‍රී ලංකා පිල සමත් විය. වසර 2016 නොවැම්බර් මාසයේ සිම්බාබ්වේහි හරාරේ නුවර පැවති එක්දින තරගයේදී ලකුණු 62කින් කොදෙව් පිල හමුවේ පරාජයට පත් වූ ශ්‍රී ලංකා පිල මේ දක්වා දෙපිල අතර පැවති තරග 5 ම ජය ගැනීමට සමත් විය.

අදින් ඇරඹෙන මේ එක්දින තරගාවලිය පැවැත්වෙන ශ්‍රීමත් විවියන් රිචඩ්ස් ක්‍රීඩාංගණයේ තණතීරුව වේගපන්දුවට උචිත එකක් බැවින් දෙපිලේහිම වේගපන්දු යවන්නන් තරගයට එක් වන්නේ සිය දක්ෂතා මුවහත් කරගනිමිනි. ශ්‍රී ලංකා පිල මේ ක්‍රීඩාංගණයේ දී එක්දින තරගයකට සහභාගි වූයේ එක් අවස්ථාවකදී පමණි. 2007 වසරේ එක්දින ලෝක කුසලාන තරගමාලාව වෙනුවෙන් ඉදිකළ මේ ක්‍රීඩාංගණයේ කොදෙව් පිල සමග තරග වැදුණු ශ්‍රී ලංකා පිල එහිදී ලකුණු 2ක සියුම් පරාජයක් අත්විඳ ගත්තේය.

වීසා ගැටලුවක් හේතුවෙන් කණ්ඩායම සමඟ සංචාරය කිරීමට නොහැකි වූ තුන්ඉරියව් ක්‍රීඩක දසුන් ශානක පසුව ප්‍රංශය හරහා සිය ගමනාන්තයට ළඟා වූ අතර, දින කිහිපයක නිරෝධායන කාලසීමාවකින් පසු අද තරගයට එක්වීමට නියමිතය.

අද තරගයේදී පිතිහරඹ අංශයේ වැඩි වගකීමක් නායක දිමුත් කරුණාරත්න, ඇන්ජෙලෝ මැතිව්ස් සහ දිනේෂ් චන්දිමාල්, තිසර පෙරේරා සහ දසුන් ශානක වෙත පැවරී ඇති අතර, නුවන් ප්‍රදීප්, අසිත ප්‍රනාන්දු සහ සුරංග ලක්මාල් වේගපන්දුවෙන් සිය උපරිම දායකත්වය ලබා දෙනු ඇත.

මේ ක්‍රීඩාංගණයේ දී අවසන් වරට එක්දින තරගයක් පැවත්වූයේ 2017 වසරේදී කොදෙව් පිල සහ ඉන්දියාව අතරය. එම තරගයේ ජය හිමි වූයේ කොදෙව් පිලටය. එහිදී ඉන්දීය පිලේ පිතිකරුවන් අසරණ කරමින් කඩුලු 5ක් දවාලූ ජේසන් හෝල්ඩර් සමග ෆේබියන් ඇලන්, අල්සාරී ජෝශප් අද තරගයේදී කොදෙව් පිලේ වේගපන්දු තුරුම්පු බවට පත්වී සිටිති. නායක කීරන් පොලාර්ඩ්, ෂායි හෝප්, ඩැරන් බ්‍රාවෝ සහ නිකලස් පූරන් කොදෙව් පිලේ පිතිහරඹ අංශයේ වැඩි වගකීමක් කරපින්නා ගනු ඇත.

ශ්‍රී ලංකා කණ්ඩායම - (අනුමාන වශයෙන්) දිමුත් කරුණාරත්න (නායක), ධනුෂ්ක ගුණතිලක, දිනේෂ් චන්දිමාල්, ඇන්ජෙලෝ මැතිව්ස්, නිරෝෂන් දික්වැල්ල, තිසර පෙරේරා, දසුන් ශානක, වනිඳු හසරංග, ලක්ෂාන් සඳකැන්, නුවන් ප්‍රදීප්, සුරංග ලක්මාල්.

කොදෙව් පිල - (අනුමාන වශයෙන්) කීරන් පොලාර්ඩ් (නායක), එවින් ලුවිස්, ෂායි හෝප්, ෆේබියන් ඇලන්, ඩැරන් බ්‍රාවෝ, නිකලස් පූරන්,ජේසන් හෝල්ඩර්, අල්සාරී ජෝශප්, රොමාරියෝ ශෙපර්ඩ්,කෙවින් සින්ක්ලෙයාර්, අකීල් හොසේන්.



# වසරකට වැඩි නිහැඬියාවකින් පසු පාසල් ක්‍රිකට් සූදානම්
## ලියාපදිංචිය අවසන් අදියරේ: 15දා සිට තරග

ප්‍රින්ස් ගුණසේකර

කොරෝනා වසංගතය හේතුවෙන් වසරකට වැඩි කාලයක් නවතා දමා තිබූ අන්තර් පාසල් 19න් පහළ ක්‍රිකට් තරගාවලිය තවත් දින 5කින් එනම් ලබන 15 වැනිදා සිට ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයේ ලේකම් කමල් ඉන්ද්‍රජිත් මහතා පැවැසුවේ මේ වන විට තරගාවලියේ කණ්ඩායම් ලියාපදිංචිය අවසන් අදියරේ පවතින බවයි. කණ්ඩායම් ලියාපදිංචිය සඳහා මේ මස 14 වැනිදා දක්වා කාලය දීර්ඝ කොට ඇතැයි ඒ මහතා සඳහන් කළේය. තරගාවලිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය මේ වන විට ලැබී ඇත.

අන්තර් පාසල් 19න් පහළ ක්‍රිකට් තරගාවලියේ ටියර් ‘ඒ’ හා ටියර් ‘බී’ කාණ්ඩ දෙකට කණ්ඩායම් 18 බැගින් ඇතුළත් වන අතර, පළමු වටයේ තරග අප්‍රේල් 9 වැනිදා අවසන් වේ. 19න් පහළ ක්‍රිකට් තරගාවලියේ සියලු තරග මැයි මස 2වැනිදා වන විට අවසන් කිරීමට ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය සැලසුම් කොට ඇත.

මෙම තරග සඳහා කණ්ඩායමේ ක්‍රීඩකයන් හා විනිසුරුවන් දෙපළ පමණක් සම්බන්ධවන අතර, වෙනත් පළාතකට කණ්ඩායම ප්‍රවාහනයේදී කොන්දේසි පනවා ඇත. එවැනි අවස්ථාවකදී කණ්ඩායම උපරිම 20කට සීමා කිරීමට පාසල් ක්‍රිකට් සංගමය උපදෙස් ලබාදී ඇත. තරග දෙකෙන් දෙකට පීසීආර් පරීක්ෂණ පැවැත්වීමට කණ්ඩායම් භාර කළමනාකාරීත්වය කටයුතු කිරීම අනිවාර්ය වේ.

එමෙන්ම තරග පැවැත්වෙන ක්‍රීඩාංගණ පිහිටි ප්‍රදේශයට අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමාගේ හෝ නිලධාරීතුමියගේ අවසරය ලබා ගැනීම අනිවාර්යවන බවත් ප්‍රේක්ෂක සහභාගීත්වයෙන් තොර විය යුතු බවත් දැනුම්දී තිබේ.

ක්‍රිකට් ක්‍රීඩාව සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කළ පාසල් ක්‍රීඩා යළි ආරම්භ කිරීමේ චක්‍රලේඛයේ දෙවැනි කාණ්ඩයට ඇතුළත්වන අතර, එය අඩු මධ්‍යම අවදානම් සහිත ලෙස දක්වා තිබේ. තවද ක්‍රිකට් තරග බොහෝ විට ශාරීරික දුරස්ථභාවය පවත්වාගත හැකි කණ්ඩායම් ක්‍රීඩාවක් ලෙස හඳුන්වාදී ඇති බැවින් ගැටලුකාරී තත්ත්වය අවම වී ඇත.

මේ අතර පාසල් මහා ක්‍රිකට් තරග ද සංවිධාන කිරීමට එම විදුහල්වල තරග කමිටු කටයුතු කරමින් සිටී. සෑම වසරකම කොළඹ පැවැත්වෙන මහා ක්‍රිකට් තරග සෞඛ්‍ය හේතූන් මත පිට පළාත්වල ක්‍රීඩාංගණ කිහිපයකදී පැවැත්වීමට එම විදුහල් තරග සංවිධාන කමිටු කටයුතු යොදා තිබේ. එයට හේතු වී ඇත්තේ ක්‍රිකට් කණ්ඩායම් දෙකේ ක්‍රීඩකයන් හා නිලධාරීන් ජෛව බුබුළකට ඇතුළත් කොට කොරෝනා වළක්වාලීමේ අරමුණ ඇතිවය.

# අපේ ක්‍රිකට් ප්‍රවීණයෝ ඉන්දියාවේදී වැඩ පෙන්වති

ඉන්දියාවේ රායිපූර්හි පැවැති ලොව ප්‍රවීණ ක්‍රීඩකයන් සහභාගීවන ‘රෝඩ් සේෆ්ටි වර්ල්ඩ් සීරිස්’ ක්‍රිකට් තරගාවලියේ පෙරේදා පැවැති තරගයෙන් දකුණු අප්‍රිකා ලෙජන්ඩ්ස් පිල පරාජය කොට ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් පිල කඩුලු 9ක විශිෂ්ට ජයක් අත්කර ගත්තේය. ඕවර් 20 නිමා වීමට තවත් පන්දු 40ක් ඉතිරිව තිබියදී ජයගත් ශ්‍රී ලංකාව ප්‍රසාද ලකුණු සටහනේ ලකුණු 12ක් ලබා ඉන්දියාව හා සම තත්ත්වයකට පත්විය.

කාසියේ වාසිය දිනාගත් ශ්‍රී ලංකාව තරගයේ ප්‍රථමයෙන් පන්දුවට පහරදීමට දකුණු අප්‍රිකා ලෙජන්ඩ්ස් කණ්ඩායමට ආරාධනා කළ අතර, ඕවර් 18.5කදී ලකුණු 89කට සීමා විය. එහිදී ඇන්ඩෘ පුටික් ලබාගත් ලකුණු 35 හා සැන්ඩර් ඩී බ්‍රයන් ලකුණු 15ක් ලබා ගැනීම හැර සෙසු පිතිකරුවෝ අසාර්ථක වූහ. පන්දු යැවීමේදී කුලසේකර, රංගන හා ජයසූරිය කඩුලු 2 බැගින් බිඳහෙලා දක්ෂතා දැක්වූහ.

ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම ඕවර් 13.2 කදී කඩුල්ලක් දැවී ලකුණු 92ක් රැස්කරමින් තරගයේ ජය තහවුරු කළේය. විශිෂ්ට ඉනිමක් ක්‍රීඩා කළ ටී. එම්. ඩිල්ෂාන් පන්දු 40කදී නොදැවී ලකුණු 50ක් හා උපුල් තරංග පන්දු 31කදී ලකුණු 27ක් ලබා ගත්හ.

**දකුණු අප්‍රිකා ලෙජන්ඩ්ස් කණ්ඩායම ලකුණු 89 (18.5)**

ඇන්ඩෘ පුටික් 35, සැන්ඩර් ඩී බ්‍රයන් 15 (නුවන් කුලසේකර 13/2, රංගන හේරත් 11/2 , සනත් ජයසූරිය කඩුලු 24/2 )

**ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම කඩුල්ලක් දැවී ලකුණු 92 ( 13.2)** සනත් ජයසූරිය 8, ටී. එම්. ඩිල්ෂාන් නොදැවී 50, උපුල් තරංග නොදැවී 27 ( ගානට් කෘගර් 23/1)

ශ්‍රී ලංකාව සහභාගීවන මීළඟ තරගය අද බංග්ලාදේශ ලෙජන්ඩ්ස් පිල සමග පැවැත්වේ.




# ඉන්දියාව ලෝක ටෙස්ට් අවසන් සටනට

එංගලන්ත කණ්ඩායම සමඟ අමදාබාද්හිදී පැවැති සිව්වැනි සහ අවසන් ටෙස්ට් තරගයෙන් ඉනිමක සහ ලකුණු 25ක ජයක් අත් කර ගත් ඉන්දීය පිල තරග 4කින් සමන්විත මේ තරගාවලිය 3-1ක් ලෙස ජය ගැනීම නිසා අයිසීසී ටෙස්ට් ලෝක ශූරතාවලිය අවසන් තරගයේ ස්ථානය වෙන් කර ගැනීමට සමත් විය.

මේ ජය සමඟින් ඔස්ට්‍රේලියානු බලාපොරොත්තු බිඳ දැමූ ඉන්දියාව අයිසීසී ටෙස්ට් ලෝක ශූරතාවලියේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගැනීමට සමත් විය. නවසීලන්තය දෙවැනි ස්ථානයට පත් වුවද ඔවුන් කලින්ම අවසන් තරගයේ ස්ථානය වෙන් කර ගෙන තිබිණි. මේ අනුව ඉන්දියාව සහ නවසීලන්තය ලබන ජූනි මස 18 වැනිදා සිට 22 වැනිදා දක්වා එංගලන්තයේ ලෝඩ්ස් ක්‍රීඩාංගණයේදී අවසන් තරගයට එක්වීමට නියමිතය.

ඉන්දියාව මේ තරගයෙන් පරාජය වූයේ නම් ඔවුන් ප්‍රසාද ලකුණු සටහනේ පහතට වැටෙන අතර ඒ අනුව ඔස්ට්‍රේලියාවට අවසන් තරගයට පිවිසීමට අවස්ථාව තිබිණි.

# රග්බි ක්‍රීඩිකා තනූජාට ආසියාවේ තනතුරක්

ෆවුස් මොහොමඩ්

මෙරට කාන්තා රග්බි ක්ෂේත්‍රය තුළින් බිහි වූ විශිෂ්ටතම ක්‍රීඩිකාවක වන තනූජා වීරක්කොඩි ආසියානු රග්බි සංගමයේ තානාපතිවරියක් ලෙස (Asia Rugby Unstoppable Ambassador) පත් කර තිබේ. රග්බි ක්‍රීඩාවෙන් විශිෂ්ට දක්ෂතා දැක්වීම සහ ක්‍රීඩාව වෙනුවෙන් කරනු ලබන සේවාව සැලකිල්ලට ගනිමින් රටවල් 32ක් අතුරින් තෝරාගත් 16 දෙනා අතරට ශ්‍රී ලංකාවෙන් තනූජා තෝරාගෙන ඇති අතර, ඉදිරියේදී ඇය ශ්‍රී ලංකා කාන්තා රග්බි ක්ෂේත්‍රය නියෝජනය කිරීමට ලෝක රග්බි සම්මේලනයට ද ඇතුළත් වනු ඇත.

අවිස්සාවේල්ල සීතාවක ජාතික පාසලෙන් ක්‍රීඩාවට පිවිසි මේ විශිෂ්ට ක්‍රීඩිකාව 1999 වසරේදී එවකට 13 හැවිරිදි ක්‍රීඩිකාව ලෙස රග්බි ක්‍රීඩාවට පිවිසි අතර, 2003 වසරේදී පළමුවරට ජාතික කාන්තා රග්බි කණ්ඩායම නියෝජනය කළේය. 2008 වසරේදී ශ්‍රී ලංකා කාන්තා රග්බි පිල නියෝජනය කරමින් ආසියානු රග්බි තරග බිමට පිවිසි ඇය 2013 වසරේදී ශ්‍රී ලංකා සත් සාමාජික කාන්තා රග්බි කණ්ඩායමේ නායිකාව ලෙස පළමුවරට ශ්‍රී ලංකා කාන්තා රග්බි පිලට ආසියානු සත් සාමාජික රග්බි තරගබිමේ 5 වැනි ස්ථානය ගෙන දීමට විශිෂ්ට දායකත්වයක් ලබා දුන්නාය. ඇය ක්‍රීඩාවෙන් සමුගත්තේ මේ වසරේ මුල් භාගයේදීය.

ජාතික කණ්ඩායමට අමතරව ශ්‍රී ලංකා නාවික හමුදා කාන්තා රග්බි කණ්ඩායමට ද ක්‍රීඩා කළ ඇය ක්‍රීඩාවේ රැඳී සිටියදීම ශ්‍රී ලංකා රග්බි ආයතනයේ කාන්තා රග්බි සංවර්ධනය සඳහා පූර්ණකාලීනව සිය දායකත්වය ලබා දුන්නාය.

‘මෙරට කාන්තා රග්බි ක්‍රීඩාව වෙනුවෙන් ක්‍රීඩාවෙන් හා පරිපාලන කටයුතුවලින් මා දැක්වූ දායකත්වය මෙහිදී ඔවුන්ගේ අවධානය යොමු වුණා. ඒ වගේම ආසියානු රග්බි සංගමය මෙහෙයවූ විවිධ වැඩසටහන්වලට හා සමුළුවලට එක්වී තිබීමත් එක හේතුවක් වුණා. ඒ අනුවයි මම මේ තානාපති තනතුරට පත් වුණේ. ඒ අනුව ඉදිරියේදී ආසියානු රග්බි සංගමයේ කාන්තා රග්බි ක්‍රීඩාව සම්බන්ධ සාකච්ඡාවලට සහ වෙනත් ක්‍රියාකාරකම්වලට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මම සහභාගි වෙනවා.‘ තනූජා වීරක්කොඩි ‘දිනමිණට’ ප්‍රකාශ කළාය.



ඇය ක්‍රීඩිකාවක ලෙස ජාතික කණ්ඩායම නියෝජනය කිරීමත්, දරු දෙදෙනකුගේ මවක ලෙස කාර්ය බහුල ගෘහ ජීවිතයක් ගත කරමින් සිටියදීම මෙරට කාන්තා රග්බි සංවර්ධන කාර්යයට සක්‍රියව දායකත්වය ලබාදීමත් මේ තනතුර පිරිනැමීමේදී ආසියානු රග්බි සංගමයේ අවධානය යොමු වී තිබිණි.

‘මම කාන්තා රග්බි සංවර්ධන කාර්යයට එක්වුණේ 2015 වසරේදියි. ශ්‍රී ලංකා රග්බි ආයතනය සමග එක්වී යාපනය හැර සෙසු පළාත්වල මේ කාන්තා රග්බි සංවර්ධන ව්‍යාපෘති ඉතා සාර්ථකව සිදු කිරීමට දායකත්වය ලබා දුන්නා. අපි කෙටිකාලීන මෙන්ම දිගු කාලීන වශයෙන් මෙරට කාන්තා රග්බි සංවර්ධනය සැලසුම් කර තිබෙනවා. මේ සඳහා ශ්‍රී ලංකා රග්බි ආයතනයේ වත්මන් සභාපති රිස්ලි ඉල්යාස් සහ කාන්තා රග්බි ප්‍රධානී රියර් අද්මිරාල් එච්ජ්යූඩී. හෙට්ටිආරච්චි මහත්වරු විශාල සහයෝගයක් ලබා දෙනවා. අපි දැනටමත් අන්තර්ජාලය ඔස්සේ පළාත් හා දිස්ත්‍රික් මට්ටමෙන් මේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටිනවා.‘ තනූජා වීරක්කොඩි කීවාය.

# ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයෙන් මේ වසරේ ප්‍රධාන තරගාවලි 3ක්

ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය මේ වසරේ ප්‍රධාන මලල ක්‍රීඩා තරගාවලි 3ක් පැවැත්වීමට කටයුතු සංවිධාන කරයි. කොරෝනා අර්බුද හේතුවෙන් මාස කිහිපයක් මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පුහුණුවීම් සිදු කිරීමට නොහැකි වුවද දැන් සාමාන්‍ය පරිදි මලල ක්‍රීඩා සංචිත ක්‍රියාත්මකව පවතින බව ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ සභාපති මේජර් ජෙනරාල් පාලිත ප්‍රනාන්දු මහතා පවසයි.

ඒ මහතා එසේ පැවැසුවේ ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේදී පසුගියදා පැවැති මාධ්‍ය හමුවේදීය.

ලබන අප්‍රේල් මාසයේ මලල ක්‍රීඩා තේරීම් තරගාවලියක් පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර, එහිදී සංචිතගත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා මැන බැලීමට හැකියාව ලැබේ. ඔලිම්පික් ක්‍රීඩා උලෙළට පෙර මැයි මාසයේ ජාතික මලල ක්‍රීඩා ශූරතාවලිය පැවැත්වෙන අතර, අගෝස්තු මාසයේ ජාතික කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලිය පැවැත්වීමට කටයුතු සංවිධාන කොට ඇතැයි ප්‍රනාන්දු මහතා පැවැසීය.

ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියේ දක්වන දක්ෂතා අනුව ඔලිම්පික් සුදුසුකම් ලබා ගැනීමේ අවස්ථා උදාකර ගත හැකි බවත්, ජාතික කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියට සහභාගීවන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මේ වසරේ අගෝස්තු මාසයේ කෙන්යාවේ නයිරෝබි නුවර පැවැත්වෙන ලෝක කනිෂ්ඨ ශූරතාවලියට සහභාගීවීමේ දොරටු විවර වන බවත් ඔහු පෙන්වා දුන්නේය.

“ ජාතික මලල ක්‍රීඩා සංචිත මූලික අරමුණු 2ක් අනුව ක්‍රියාත්මක වෙනවා. මේ වසරේ ඔලිම්පික් පරිසාධන මට්ටමට ළඟාවීම හා 2022 චීනයේ හැන්ග්ෂූ හී පැවැත්වෙන ආසියානු ක්‍රීඩා උළෙලේ පදක්කම් දිනා ගැනීම අරමුණු කොට සංචිත දෙක පුහුණුවීම් ආරම්භ කළා. දැනටමත් ඒ සඳහා කණ්ඩායම් දෙකක් සූදානම් කොට ඇති අතර, ක්‍රීඩක ක්‍රීඩිකාවන් 21කින් යුත් සුපිරි ජාතික සංචිතය හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 22කින් යුත් ජාතික සංචිතය සෞඛ්‍ය නිර්දේශ අනුව වැඩ ආරම්භ කොට තිබෙනවා. ඔවුන්ට අවශ්‍ය සියලු පහසුකම් මේ වන විටත් සූදානම් කොට හමාරයි. ඔවුන් ඔලිම්පික් හා ආසියානු සිහින සැබෑ කර ගැනීමට කැපවිය යුතුයි” මලල ක්‍රීඩා සභාපතිවරයා පැවැසීය.



මලල ක්‍රීඩා සංගමයේ සභාපති මේජර් ජෙනරාල් පාලිත ප්‍රනාන්දු

ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය ඔලිම්පික් ඉලක්ක සහිත ඉසව් කිහිපයක් සූදානම් කරමින් පවතින අතර, මීටර් 100 පිරිමි, මැරතන් කාන්තා , දුර පැනීම පිරිමි, මීටර් 3000 බාධක දිවීම කාන්තා, මීටර් 400 සහය දිවීම පිරිමි, මීටර් 400 මිශ්‍ර සහය දිවීම යන ඉසව් ඒ සඳහා සූදානම් කොට ඇත.

මෙම සහය දිවීමේ කණ්ඩායම් පෝලන්තයේදී මැයි 1දා සිට පැවැත්වෙන ලෝක සහය දිවීමේ ශූරතාවලියට සහභාගී කරවීමට අපේක්ෂා කෙරේ. ඔලිම්පික් සුදුසුකම් ලබා ගන්නා සහය දිවීමේ කණ්ඩායම් 16 තෝරා ගැනීමේදී සහය දිවීමේ ලෝක ශ්‍රේණිගත කිරීම අනුව පළමු කණ්ඩායම් 8ක් හා ලෝක ශූරතාවලියේ පළමු කණ්ඩායම් 8ක් සුදුසුකම් ලබන හෙයින් පෝලන්තයේ පැවැත්වෙන ලෝක සහය දිවීමේ ශූරතාවලියට සහභාගීවීම ශ්‍රී ලංකාවට ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ වැඩ සටහන් අනුව මේ වසරේ පුහුණුකරුවන්ගේ පාඨමාලා රැසක් සංවිධාන වී ඇති බවද ප්‍රනාන්දු මහතා පැවැසීය.

වත්මන් දේශපාලන තත්ත්වය හා මේ දිනවල රටට එල්ල වී ඇති මානව හිමිකම් චෝදනා ගැන නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය ඇමැති විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොළ මහත්මියගෙන් සහ මානව හිමිකම් සහ උතුරේ දේශපාලනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝ ගනේෂන් මහතා සමඟ කළ සාකච්ඡා දෙකකි මේ.

# රටක් ගෙන යා යුත්තේ ජනතා මතවාදයට අනුව මිස සමාජ මාධ්‍ය මත නොවේ

## රාජ්‍ය ඇමැතිනි සීතා අරඹේපොළ



**● ඔබේ අමාත්‍යාංශයේ කාර්ය භාරය පිළිබඳව කතා කළ හොත්?**

අපේ අමාත්‍යාංශයට පැවරුණ වගකීම් රාශියක් තිබෙනවා. වෘත්තීය පුහුණුවත්, නිපුණතා සංවර්ධනයත් එක් කොටසක් ලෙසත් පර්යේෂණ සහ නව නිපැයුම් යන්න තවත් කොටසක් ලෙසත් සලකා ගෙන අප කටයුතු කරනවා.

**● ඒ පිළිබඳව තව දුරටත් විස්තර කරන්න?**

අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් කිසි හිදැසක් පාසල් අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය අතර තිබෙනවා නම් එය සම්පූර්ණ කරන එක අපේ අමාත්‍යාංශයේ අරමුණක්.

වසරකට ලක්ෂ තුනහමාරක පමණ පාසල් ජීවිතයට එකතු වන දරුවන්ගෙන් උසස් පෙළ සමත් වී විශ්වවිද්‍යාලයට යන්නෙ කොටසක් පමණයි. මෙහිදී උසස් අධ්‍යාපනයට නොයා නවතින දරුවන් විවිධ වූ ක්ෂේත්‍ර සඳහා මෙන්ම රැකියා සඳහා යොමු වෙනවා. නමුත් හරි අධ්‍යාපනයක් සහ මගපෙන්වීමක් නොමැති එම පිරිස් සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. නැත්නම් ඔවුන් නොපුහුණු ශ්‍රමිකයන් බවට හෝ වෘත්තීය පුහුණුවක් හෝ යම් කිසි හෝ ඉගෙනීමක් නැති පිරිසක් බවට පත් වෙනවා. එවිට විවිධ ක්ෂේත්‍රවල පුරුද්දෙන් හා පළපුරුද්දෙන් රැකියාවේ යෙදෙන පිරිසක් ලෙස ඔවුන් හැඳින් විය හැකියි. මේ තත්ත්වය නිසා මෙරට මෙන්ම විදෙස් රටවලදීත් ශ්‍රමිකයින් ලෙස ඔවුන්ට ලැබෙන අභිමානය, වේතනය සහ රැකියාවේ උසස්වීම්වලදී ගැටලු ඇති වෙනවා.

**● ඒ සඳහා ක්‍රියා කරන ආකාරය පිළිබඳව සඳහන් කරන්න?**

මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන කාර්මික විද්‍යාල තිහක් සහ අදාළ විද්‍යාල ලෙස තවත් නවයක් පවතිනවා. යුනිර්වසිටි ඔෆ් ටෙක්නොලොජි ආයතන හයක් ද පවතිනවා. වෘත්තීය පුහුණු අධිකාරිය තිබෙනවා. එහි ප්‍රාදේශීය ආයතන දෙසිය පනහකට වඩා පවතිනවා. ආධුනිකත්ව මණ්ඩලය තිබෙනවා. සාගර විශ්වවිද්‍යාලය, ජර්මානු කාර්මික විද්‍යාලය, එන්.අයි.බී.එම්., හරිත විශ්වවිද්‍යාලය ආදිය මෙම අමාත්‍යාංශය යටතේ පවතිනවා. මෙම ආයතන තුළින් ලක්ෂයකට, එක්ලක්ෂ විසිදාහකට වගේ ප්‍රමාණයකට අධ්‍යාපන වෘත්තීය සුදුසුකම් ලබා දීම සිදු වෙනවා.

**● වෘත්තීය පුහුණුව ලබා දීමේ ප්‍රමාණය තවත් වැඩි කිරීමට සහ දරුවන් සඳහා නවීන ක්‍රමවේද භාවිතා කරන්නට බලාපොරොත්තු වෙනවා ද?**

වෘත්තීය අධ්‍යාපනය සඳහා දරුවන් බඳවා ගැනීම වැඩි කරන්න ඕනෑ. ඒවගේම මෙම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල පුහුණුව ලබන දරුවන් සඳහා කාලයට උචිත පාඨමාලා, නව උපකරණ, නව ක්‍රමවේද හඳුන්වා දිය යුතුයි. ඒ සඳහා ක්‍රියා කරමින් පවතිනවා.

කොරියානු ආධාර යටතේ සාගර විශ්වවිද්‍යාලය නවීකරණය කරනවා. ජර්මානු කාර්මික විද්‍යාලයේ පාඨමාලා හදාරන දරුවන් ප්‍රමාණය දෙගුණයක් කරන්න බලාපොරොත්තු වෙනවා. මෙම ආයතනයේ නිර්දේශයන්ට අනුව ප්‍රාදේශීයව පුහුණුවීම් ආයතන පිහිටුවනවා. ඒ වගේම සියලුම ළමා නිවාසවල සිටින දරුවන්ට වෘත්තීය පුහුණුවක් ලබා දීමේ යෝජනා අප ඉදිරිපත් කර තිබෙනවා.

**● වෘත්තීය පුහුණුව ලබන දරුවන්ට රැකියා අවස්ථා සොයා දීමට වැඩපිළිවෙළක් තිබෙනව ද?**

ඔව්. ඔවුන් රැකියා සඳහා යොමු කළ යුතුයි. මේ සඳහා දත්ත බැංකුවක් සාදා පෞද්ගලික ආයතන සමඟ දේශීය සහ විදේශීය වශයෙන් ක්‍රියා කරනවා. විදේශ රැකියා අමාත්‍යාංශය සමඟත් අප මේ පිළිබඳව කතා කළා. අවබෝධතා ගිවිසුමක් අස්සන් කළා.

**● වෘත්තීය පුහුණුව ලබන දරුවන්ට ලබා දීමට බලාපොරොත්තු වන වෙනත් දෑ මොනව ද?**

දරුවන්ට ශිෂ්‍යාධාර ක්‍රමයක් පටන් ගැනීමට අදාළ ප්‍රතිපාදන මෙවර අයවැයෙන් අපට ලැබුණා. ආර්ථික අපහසුතා ඇති දරුවන්ට මාර්තු මාසයේ සිට මෙම ශිෂ්‍යාධාරය ලබා දෙන්න පටන් ගන්නවා.

**● විද්‍යා හා තාක්ෂණය දෙසට අවධානය යොමු කළ හොත්?**

අප බලාපොරොත්තු වෙනවා පර්යේෂණ ක්‍රම රටට වැඩදායී ලෙස යොදා ගන්න. ඒ තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීමට අපට හැකි වෙනවා. ආතර් සී. ක්ලාක් ආයතනය, ජාතික විද්‍යා පදනම, මූලික අධ්‍යයන ආයතනය පර්යේෂණ කටයුතු සිදු කරනවා. නව සොයා ගැනීම් කරන අයට තම සොයා ගැනීම ව්‍යාපාරයක් බවට පත්කර ගැනීමට අවශ්‍ය පදනම සකස් කර දෙනවා.

**● මානව හිමිකම් කොමසාරිස්වරිය අපේ රටට එරෙහිව චෝදනා එල්ල කරනවා? ඒ පිළිබඳව ඔබගේ අදහස කුමක් ද?**

මෙම ප්‍රශ්නයට අප ඉතා කල්පනාකාරීව මුහුණ දිය යුතුයි. පුද්ගල මතවාද නිසා හෝ විවිධ හේතුන් නිසා රටක් ලෙස අපට පරාජය ලබන්න බැහැ. මහ කොමසාරිස්වරිය අපේ රටට එරෙහිව අභූත චෝදනා රාශියක් එල්ල කර තිබෙනවා. රජය මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා.

**● සමගි ජන බලවේගය වත්මන් රජයට අභියෝගයක් වෙයි කියලා ඔබ සිතනව ද?**

විපක්ෂයක් ක්‍රියා කරන ක්‍රමවේදයක් තිබෙනවා. රජයක් කරන හොඳ වැඩ විවේචනය කරන්න එපා කියා විපක්ෂයකට කියන අවස්ථාත් තිබෙනවා. විපක්ෂය හැම වෙලාවෙම උත්සාහ කරන්නෙ බලය ලබා ගන්න. විපක්ෂය තේරුමක් නැතිව නඟන අභූත චෝදනාවලට සැලෙන්නෙ නැතිව හරි මාර්ගයේ ගියහම කිසි කෙනෙක් අභියෝගයක් වෙන්නෙ නැහැ.

**● රට තුළ තේරුමක් නැති ප්‍රශ්න නිර්මාණය වනුයේ මේ රටේ ක්‍රියාත්මක වන ජාතික සංවිධානවල ක්‍රියා කලාපය නිසා බවට ඇතැමුන් චෝදනා කරනවා?**

ජාතිකවාදී කණ්ඩායම් හැමදාම රට රැක ගත්තා. ඔවුන් ද ඇතැම් අවස්ථාවල වැරදි මත නිසා වැරදි පාරවල යා හැකියි. ජාතිකවාදී බලවේගවලට දොස් පැවරීමෙන් රටකට ඉදිරියට යන්න බැහැ. මේවා හැමදාම රට වෙනුවෙන් පෙනී සිටි ව්‍යාපාර.

**● 1971 සහ1989 කැරලිකාරී තත්ත්වයන්ට මෙන්ම එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය ඇති වීමට මේ රටේ අතීතයේ සිට පාලනය කළ පාලකයින් වගකිව යුතු බවට මතයක් පවතිනවා.?**

මේ රටේ දේශපාලනය කරන බොහෝ දෙනාගේ පැවැත්ම තිබෙන්නෙ ඊළඟ ඡන්දයත් සමඟ. ඔවුන් බොහෝ දෙනා කුමන හෝ අන්දමින් තම බලය රැක ගැනීමට උත්සාහ කරනවා. රටේ බොහෝ ප්‍රශ්නවලට දේශපාලකයින් වග කියන්න ඕනෑ.

**● හැටනව ලක්ෂයක් ඡන්දය ලබා ගත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජනතාවට සාධාරණය ඉෂ්ට කරයි කියලා ඔවුන් බලාපොරොත්තු වෙනවා?**

මෙම හැටනව ලක්ෂය තුළ විවිධ බලාපොරොත්තු තිබූ අය සිටිය හැකියි. රටේ ජනාධිපතිවරයා ඉන්නේ හැටනව ලක්ෂයක ජනතාව වෙනුවෙන් නොව රටේ සමස්ත ජනතාව වෙනුවෙන්. රටක් පාලනය කිරීමේදී ලෝකය සමඟ කටයුතු කළ යුතු වෙනවා.

**● සමාජ මාධ්‍ය තුළින් වත්මන් පාලනයට එරෙහිව විවිධ ප්‍රචාර සිදු වෙනවා?**

ඇතැම් පිරිස් රජය විසින් කරන කටයුතු පිළිබඳව නිවැරදිව සොයා බලනවාට වඩා සමාජ මාධ්‍ය තුළින් රටේ නායකයා සහ රටේ අනාගතය පිළිබඳව තීරණ ගන්න උත්සාහ කරනවා. සමාජ මාධ්‍ය මත නොවේ රටේ සමස්ත ජනතාවගේ මතවාදය අනුව රටක් ගෙන යා යුතුයි. සමාජ මාධ්‍ය කියන්නෙ ඉතා සුළු පිරිසකගේ දර්ශනය ඉදිරිපත් වන කැඩපතක් පමණයි.

> ජාතිකවාදී කණ්ඩායම් හැමදාම රට රැක ගත්තා. ඔවුන් ද ඇතැම් අවස්ථාවල වැරදි මත නිසා වැරදි පාරවල යා හැකියි. ජාතිකවාදී බලවේගවලට දොස් පැවරීමෙන් රටකට ඉදිරියට යන්න බැහැ. මේවා හැමදාම රට වෙනුවෙන් පෙනී සිටි ව්‍යාපාර.

**● විශේෂඥ වෛද්‍යවරියක් වන ඔබ ඇයි දේශපාලනයට පැමිණියේ?**

මගේ වෘත්තියත් සමඟ සිටින විට රටේ ඇති වන ගැටලු පිළිබඳව මට ලැබුණ අවස්ථාවන් අනුව අදහස් ප්‍රකාශ කරමින් යම් කිසි මතවාදයක් රට තුළ ගොඩනැගුවා. රටට නායකයෙක් ගෙන ඒමට මගේ දායකත්වය ලබා දුන්නා. පසුව මට ලැබූ තනතුරු අනුව මා දේශපාලන ලෝකයට පැමිණ තිබෙනවා.

**● ඉදිරියේදී ඔබට කැබිනට් ඇමැතිකමක් ලැබෙයි කියලා බලාපොරොත්තුවක් තිබෙනව ද?**

කැබිනට් ද නැද්ද කියා ඇමැතිකම පිළිබඳ ප්‍රශ්න මට නැහැ. ගැටලුවක් තිබුණා නම් මම ඒ පිළිබඳව කතා කරනවා. මට ලැබෙන වගකීම නිසියාකාරව රටට ඉෂ්ට කරනවා.

**● ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ක්‍රියා කලාපය ඔබ දකින්නෙ කෙසේ ද?**

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ජනතාවට විය යුතු සේවය වළක්වන හෝ මඟ හරින නායකයකු නොවේ.

**● රටේ ජනතාවට ආර්ථික ගැටලු ඇති වී තිබෙන බවට විපක්ෂයේ පිරිස් චෝදනා කරනවා.?**

විපක්ෂය ලෝකයෙන් අයින් වෙලා තමයි රටේ ප්‍රශ්න පිළිබඳව බලන්නෙ. කොවිඩ් වසංගතය නිසා ලෝකයේ සමස්ත ආර්ථිකයේම ගැටලු ඇතිවෙලා. ලෝකයේ රටවල රැකියා නැතිවීමේ තත්ත්වයන් තිබෙනවා. එවැනි තත්ත්වයක් යටතේ අපේ රට ගැටලු විසඳමින්, සංවර්ධන කටයුතු කරමින් මේ යන ගමන පිළිබඳව අප සියලු දෙනා සතුටු වෙන්න ඕනෑ.

**● කොවිඩ් සඳහා ලෝකයේ තිබෙන එන්නත්වලින් සියයට සියයක් ප්‍රතිඵල ලබා ගන්න බැහැ නේ ද?**

එන්නතක් ජනතාවට ලබා දීමේ අරමුණු තිබෙනවා. රෝග ව්‍යාප්තිය නැවැත්වීමට, රෝගයේ සංකූලතා අඩුකිරීමට එන්නත් ලබා දෙනවා. වසංගතයන් ලෝකයෙන් තුරන් කර දැමීම සඳහා එන්නත් දෙන අවස්ථා තිබෙනවා. ශරීරයේ ප්‍රතිශක්තිකරණය වැඩි කිරීම සඳහා ද එන්නත් පාවිච්චි කරනවා. කොවිඩ් සඳහා එන්නත් වර්ග ගණනාවක් ලෝකය තුළ භාවිත වනවා. ඉදිරියේදී තවත් එන්නත් හෝ ඖෂධයක් පැමිණෙයි. කොවිඩ් වයිරසය ඇවිත් තවම ටික කාලයයි.

උපාලි කරුණාරත්න

# බලය බෙදා දීම කියන්නේ ප්‍රගතිශීලී සංකල්පයක්

## පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝ ගනේෂන්



**● ඔබ මානව හිමිකම් පිළිබඳව කතා කරන දේශපාලනඥයෙක්?**

මානව හිමිකම් පිළිබඳව ලෝකයම කතා කරනවා. එය ලෝකය පිළිගත් සංකල්පයක්. මිනිසා දියුණු වෙන්න, දියුණු වෙන්න මානව හිමිකම් පිළිබඳව කතා කිරීම වැඩි වෙලා තිබෙනවා. මානව හිමිකම් පැත්තකට දමා, ඒවා උල්ලංඝනය කර සමාජයකට, රටකට, ජාතියකට ඉස්සරහට යන්න බැහැ.

මම මානව හිමිකම් විෂයට ඉතා කැමැතියි. මිනිසා කියන්නෙත් සත්වයෙක්. හැබැයි අපි දියුණු වෙච්ච සතෙක්.

**● මානව හිමිකම් සම්බන්ධයෙන් ඔබ කටයුතු කරන්නෙ?**

මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගැටලු පැන නැඟි අවස්ථාවල මා ඒවා සම්බන්ධයෙන් කතා කළා. හඬක් නැඟුවා.

**● එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය අපේ රටට එරෙහිව එල්ල කරන චෝදනාවලට එරෙහිව අපි කෙසේ ක්‍රියා කළ යුතු ද?**

අපි මේ රටට ආදරෙයි. හැබැයි රට එකක්. රට පාලනය කරන දේශපාලනය එකක්. මේක අප පටලවා ගත යුතු නැහැ. පාලනය කරන රජයට තිබෙන කැමැත්ත රටේ කැමැත්ත කියා පෙන්වන්න ඇතැමුන් උත්සාහ කරනවා. අපි දේශප්‍රේමීයි. අපේ රට ලෝක සමාජය තුළ කොන් වෙන්නෙ නැතිව, පරාජය වූ රාජ්‍යයන් නොවෙන්න වගබලා ගැනීම කාගේත් යුතුකමක්. ඒක අප කරනවා.

**● එල්. ටී.ටී. ඊ සංවිධානය පැවැති සමයේ දෙමළ ජනතාවට ප්‍රශ්න ඇති වුණා නේ ද?**

එල්.ටී.ටී. ඊ සංවිධානය ත්‍රස්ත කල්ලියක් ලෙස සන්නද්ධ අරගල කිරීමේ ස්ථානයට තල්ලුවීමට මේ රටේ කාලයක් තිස්සේ වරින් වර සිටි පාලකයින් වග කියන්න ඕනෑ. දමිළ ජනතාවගේ ගැටලුවලට පිළිතුරු ලබා නොදීම මෙයට හේතුවක්. එල්.ටී.ටී ඊය විනාශ වුණා. ජනතාවට සාධාරණය ඉෂ්ඨ නොවුණොත් මෙවැනි සංවිධාන ඉදිරියේදී ද ඇති විය හැකියි.

යුද්ධය යනු විනාශකාරී දෙයක් කියා දෙමළ ජනතාව දන්නවා. ඒ නිසා කවුරුත් යුද්ධයට කැමැති නැහැ. යුද්ධය දැක්ක නැති ළමයි දැන් සිටිනවා. සාධාරණය ඉෂ්ඨ නොවුනොත් ඔවුන් නැවත අරගල කරා යා හැකියි.

**● මේ වන විට යුද්ධය පැවැතුණ ප්‍රදේශවල ප්‍රජාතන්ත්‍රවාදය ඇති වෙලා නේ ද?**

ආර්ථික ප්‍රශ්න වගේම දේශපාලන ප්‍රශ්න එම ප්‍රදේශවල තිබෙනවා. දමිළ ජනතාවට නොයෙක් ප්‍රශ්න පවතිනවා. පාරවල්, ආරෝග්‍යශාලා, පාසැල් හැදුවා කියා ඇතැම් ප්‍රශ්න විසඳෙන්නෙ නැහැ. මේවා හැදීම පිළිබඳ ලබාදෙන අයිතිය තමයි දේශපාලන අයිතිය. එයත් අදාළ ප්‍රදේශයේ දෙමළ ජනතාවට දෙන්න ඕනෙ. නැතිව කොළඹ සිට මේවා ගැන තීරණය කිරීම වැරදියි.

**● දෙමළ ජනතාව නියෝජනය කරන්න පාර්ලිමේන්තුවේ ජනතා නියෝජිතයින් සිටිනවා?**

ඔව්. එහෙත් පළාත් සභා ක්‍රමය යටතේ තිබෙන බලතල ලබාදිය යුතුයි. ඒවාට සම්පූර්ණ අයිතිය ලබා දී නැහැ. එහිදී පළාත් සභා ක්‍රමයට වඩා ලොකුවට යන්න ඕනෑ කියා මා කියන්නෙ නැහැ. උතුරු නැගෙනහිර සිදු විය යුතු ව්‍යාපෘති, සංවර්ධනය පිළිබඳව තීරණය කරන්න අයිතිය අදාළ ප්‍රදේශයේ ජනතාවට ලබා දෙන්න ඕනෑ. 13 වන සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නැහැ.

තමාට දීපු බලය මහ ඇමැති ධූරයේ සිටිමින් විග්නේෂ්වරන් මහත්තයා කළා ද නැද්ද කියන එක වෙනම ප්‍රශ්නයක්. විග්නේෂ්වරන් මහත්තය අදාළ ප්‍රදේශයට සේවයක් කළේ නැත්නම් ඔහුගේ පක්ෂය පරාජය කර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හෝ කුමන හෝ කණ්ඩායමකට ජනතාවට ඡන්දය දිය හැකියි.

**● මේ වන විට පළාත් සභා ක්‍රමය අහෝසි කළ යුතු බවට මතයක් රට තුළ ගොඩනැගෙමින් පවතිනවා නේද.?**

අවශ්‍ය නැහැ කියන අයට එය නොදී සිටිය හැකියි. පළාත් සභා අවශ්‍යයි කියන ප්‍රදේශවලට එය ලබා දිය යුතුයි. දකුණු පළාතට පලාත් සභා එපා නම් එම ප්‍රදේශයට එය අවශ්‍ය නැහැ. උතුරට එය අවශ්‍ය නම් ලබා දෙමු. බලය බෙදාදීම කියන්නෙ ප්‍රගතිශීලී සංකල්පයක්.

**● මේ වගේ කුඩා රටකට පළාත් සභා මොකට ද?**

ඇයි ස්වීට්සර්ලන්තයේත් එහෙම ක්‍රමයක් තිබෙනවා.

**● නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය ද?**

අවශ්‍යයි. අපේ පක්ෂයේ යෝජනාත් ඒ සඳහා ඉදිරිපත් කර තිබෙනවා. අදාළ කමිටුව අප සමඟත් ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන බව ප්‍රකාශ කර තිබෙනවා.

**● ඇයි ඔබ එක්සත් ජාතික පක්ෂය ප්‍රතික්ෂේප කළේ?**

රනිල් මහත්තයගෙ යුගය දැන් අවසන්. සජිත් යුගය ආරම්භ වෙලා තිබෙනවා. මේක සොබාවයක්.

**● උතුරු නැගෙනහිර බහුලව තිබෙන බෞද්ධ පුරා වස්තු පිළිබඳව එම ප්‍රදේශවල දමිළ දේශපාලනඥයින් දමිළ ජනතාව නොමග යවමින් තිබෙන බවට චෝදනාවක් පවතිනවා?**

පුරාවිද්‍යාව කියා නමක් දාගෙන දෙපාර්තමේන්තුව සහ, දකුණේ සිටින දේශපාලනඥයින් සිංහල ජනතාව නොමග යවනවා කියා මා ප්‍රකාශ කරනවා. උතුරු නැගෙනහිර විශාල ලෙස බෞද්ධ පුරා වස්තු තිබෙනවා. මේවා දමිළ බෞද්ධ සිද්ධස්ථාන. උතුරු නැගෙනහිර මෙන්ම දකුණු ඉන්දියාවේ බෞද්ධයො අතීතයේ සිට ඉන්නවා. බෞද්ධකම කියන්නෙ සිංහල ජනතාවට විතරක් අයිති දෙයක් නොවේ. මගේ නිවසෙත් පූජා කාමරයේ බුදුහාමුරුවන්ගේ පිළිම තිබෙනවා. සුනිල් ආරියරත්න මහාචාර්යතුමා දමිළ බෞද්ධයන් පිළිබඳව ග්‍රන්ථයක් ද ලියා තිබෙනවා. දෙමළ ජනතාව සහ සිංහල ජනතාව අතර සමගියට අපට පහසුවෙන්ම බෞද්ධ ධර්මය යොදා ගත හැකියි. සිංහල සහ දමිළ ජනතාවට ඉතා සහෝදරත්වයෙන් ජීවත් වෙන්න පුළුවන්.

**● යාපනය ප්‍රදේශයේ බුදු පිළිමයක් හදන්න අමාරු තත්ත්වයක් නේද පවතින්නෙ?**

මේ රටේ ඇතැම් පිරිස්වල මෝඩකම නිසා එවැනි තත්ත්වයන් ඇති වී තිබෙනවා. කවුරුත් බෞද්ධ ධර්මයට විරුද්ධ නැහැ. බුදුහාමුදුරුවන්ගේ ධර්මය කියන්නෙ දර්ශනයක්. හින්දු සහ බෞද්ධ ධර්මය ඉතා සමීපයි.

**● මේ රටේ බහුතරය සිංහල ජනතාව නේද.?**

ඔව්. බහුතර ජනතාව සිංහල. ඒක තමයි යථාර්ථය. හැබැයි අනූ නවය සියය වෙන්න තව එකක් අවශ්‍යයි. හැත්තෑපහ සියය වෙන්න විසිපහක් අවශ්‍යයි. මෙම සියය තමයි ශ්‍රී ලංකාව. මට සිංහල රටත් එපා. දෙමළ රටත් එපා. මුස්ලිම් රටත් එපා. මගේ රට ශ්‍රී ලංකාව.

**● උතුරේ දරුවන් සිංහල භාෂාව ඉගෙන ගත යුතුයි නේ ද?**

සිංහල භාෂාවට මා ඉතා කැමැතියි. ඒක සුන්දර භාෂාවක්. සිංහල ජනයා දෙමළ බසත්, දෙමළ ජනයා සිංහල බසත් ඉගෙන ගැනීම ඉතා වැදගත්. මේක නිවැරදිව සිදු වුව හොත් මහා ලොකුවට මවාගෙන සිටින ජාතික ප්‍රශ්නය අවසන් වෙනවා.

> සිංහල භාෂාවට මා ඉතා කැමැතියි. ඒක සුන්දර භාෂාවක්. සිංහල ජනයා දෙමළ බසත්, දෙමළ ජනයා සිංහල බසත් ඉගෙන ගැනීම ඉතා වැදගත්. මේක නිවැරදිව සිදු වුව හොත් මහා ලොකුවට මවාගෙන සිටින ජාතික ප්‍රශ්නය අවසන් වෙනවා.

**● ඔබ නායකත්වය දරන දෙමළ ප්‍රගතිශීලී සන්ධානය පිළිබඳව කතා කළ හොත්?**

උතුරු- නැගෙනහිරහින් පිටත ජීවත් වන දෙමළ ජනතාව වෙනුවෙන් මෙම පක්ෂ ක්‍රියාත්මක වෙනවා. මෑත දවසක මෙම පක්ෂයේ නම ජාතික ප්‍රගතිශීලී සන්ධානය කියා වෙනස් කිරීමට බලාපොරොත්තු වෙනවා. ජාතියක් පදනම් කරගෙන පක්ෂ හැදීමේ සංකල්පයෙන් ඉවත් වීම මේකට හේතුව ලෙස මා සඳහන් කරනවා.

**● එක්සත් ජාතික පක්ෂය පසුගිය මහ මැතිවරණයේදී විශාල පරාජයක් ලැබුවෙ ඇයි.?**

සුළු උත්තරයක් තමයි මේකට දෙන්න තිබෙන්නෙ. එයට හේතුව ජනතාව කැමැති නොවීම.

**● සජිත් ප්‍රේමදාස මහතාත් එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය බලාපොරොත්තු වුණා නේ ද?**

පසුගිය මහ මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය විශාල පරාජයක් ලැබුවා. එම නිසා එක්සත් ජාතික පක්ෂය සජිත් ප්‍රේමදාස මහතාට බාර දෙයි කියා අප සිතුවා. සිදු විය යුතුව තිබුණේ එයයි. එහෙත් රනිල් වික්‍රමසිංහ මහතා එය කළේ නැහැ.

**● සමගි ජන බලවේගය සහ එක්සත් ජාතික පක්ෂය එකතු වීමක් පිළිබඳව මේ දිනවල කතා බහක් තිබෙනවා.?**

එක්සත් ජාතික පක්ෂයට සමගි ජන බලවේගය සමඟ එකතු වෙන්න පුළුවන්.

**● වතු කම්කරුවන්ගේ දීමනා සම්බන්ධයෙන් ඔබගේ අදහස ?**

ඒ දෙස අප බලා සිටිනවා.

**● දෙමළ ජනතාවට මේ රටේ ඕනෑම ස්ථානයක වාසය කරන්න පුළුවන්. සිංහල ජනතාවත් ඒ අයිතිය තියෙන්න ඕනෑ නේද?**

උතුරු පළාතේ සිංහල ජනතාව පදිංචි වීම කාටවත් විරුද්ධ වන්න බැහැ. මේ රටේ ඕනෑම ස්ථානයක ශ්‍රී ලාංකිකයො ලෙස පදිංචි වීමට අපට අයිතිය තිබෙනවා. හැබැයි පදිංචි වීම එකක්. පදිංචි කරවීම තව එකක් ලෙස මා දකිනවා.

සිංහල පුද්ගලයෙක් උතුරේ පදිංචි වීමට හදන අවස්ථාවක කාටවත් එයට විරුද්ධ වන්න බැහැ. එවැන්නකට කවුරුන් හෝ විරුද්ධ වෙනවා නම් මම එයට විරුද්ධ වෙනවා.

# විදෙස් මල

## අත්‍යවශ්‍යම දේ

බළලුන්ට
එදිනෙදා දේවල් ගැන
මතක ඇත්තේ මොනවාද?
නිදන්නට උණුසුම්ම තැන,
කෑම ඇත්තේ කොතැනද,
වේදනා දෙන දේ ගැන,
තමන්ගේ හතුරන් ගැන
පක්ෂීන්ගේ කරදරය,
පසෙහි උණුසුම් පුසුඹ
දූවිලිවල ප්‍රයෝජනවත් බව,

ඔවුන්ට මතකයි
ඇඳක කිරි කිරිය
අයිතිකරුගේ පා හඬ
මාළු කද්දී අම රස,
කිරි බඳුනක සොඳුරු බව
බළලුන්ට මතක ඇත
එදිනෙදා දේවල්වල
වැදගත්ම කොටස
ඔවුන් අපට වඩා
සුවෙන් නිදන්නේ එබැවිනි

අප
නොවැදගත් දේ
මතකයේ රඳවාගෙන
හදවත් බිඳගනිමිනි

**Brian Patten**
**පරිවර්තනය**
**හෙල්මලී ගුණතිලක**

## දොඩමළුව

මන්දාරම් අහසකට
ලස්සනයි පෑයුවම දේදුන්න
සිතිජ මායිමේ කොනක
එබී බලනවා වාගෙයි ඇය

කළු කරන් අහසම
බරවෙච්ච වලාකුළු කැටිය
තරහෙන් බුම්මගෙන
ලොකු ඇස් දෙකෙන් හිනාවෙන
ඈ වගේමයි අද හරියටම නුඹ

කහට වැඩි තේ එකක් එක්ක
ලී බංකුව උඩ
හිටියැකි පැය ගාණක්ම
දුක්බර හින්දි තනුවකට
හැකි වේවි හිතම අවුස්සන්න

'අහස' නුඹට හැකි අද
මා එක්ක දොඩමළු වෙන්න
නුඹට මතකද ඇයව
මට හමුවෙච්ච මුල් දිනය

**ප්‍රදීප්. එන්. අතුකෝරල**

## අවසන් මැදිරියේදී ලියූ කව

අන්තිම දුම්රියේ අන්තිම පෙට්ටියේ
හිස් වූ අසුන්වලටත් සිසිල දී කැරකෙයි
මෝඩ විදුලි පංකා
සිනාසෙමි මම එයට
බලමි වීදුරු කවුළුවෙන් එපිට
පසුකර ඇදෙයි විදුලි පහන්, රුස්ස ගස්
හොල්මන් අවතාර ලෙසින්

දුම්රිය මැදිරිය දෙපසින් ඇදී යන
මඟ ලකුණු විලස අපැහැදිලිව
සබඳ මට සිහිවෙයි පසුකර ආ කාලය
දැනේ කුසගින්නක්,
නොමැත කෑමක් තවමත්
ලියන්නට ඕනෑ කවියක්
ඔන්න රාගම!
බසින්නට සිදු වෙයි මෙතනින්

**ජගත් ප්‍රසන්න කුරුගම**



## රාහුලෝ ජාතං

උදෑසන රැස්වීම අතරේ
සුළං ඇවිදින් ගහන වේගෙට
කොඩිය විසිවෙයි ටිකක් පස්සට
බොඳ නෙතින් රාහුල බලාගෙන

කඳුළු පාත්තර උඩුගං ගෙනියන්න
දෑසකට පුළුවන්ද
නේරංජනාවක් වෙන්න
සිනිඳු අත්තල තමයි
දන්නෙ කඳුළක සීතලම උණුහුම

"ඊයෙ රෑ ජරමර
පුතායි මායි ඇරුණම
දන්නෙ නෑ මෙහේ කවුරුත් වෙන"
නවත්වා ගිය කන්ථක පිටින් බැස
හිස ආදරෙන් සිඹ
අම්මා කියූ වග
ජවාධික සුසුමකි මතක් කර දී ගිය

"අනේ පව් අම්මාට"

කළු කූඹි හිස් පේළි අතරින්
එබී බැලුවාම අම්මාව සොයමින්
ගුරු තරු යාය මැද
සඳත් උන්නා ආවාට හංගන්

සාරි පට කර වටේ ලාගෙන
තැළුම් සීරුම් මුවාකරගෙන
දුක්බරම මදහසකි
නලියන කඳුළු සඟවන

අම්මයි මායි දෙන්නත්
එතෙර වෙන්නම් කොහොමහරි
තාත්තේ පුළුවන්ද බුදු වෙන්න

**හර්ෂණී මහත්මා ආරච්චි**

# වසන්ත යුගය

නොනැවතී හමා යනු පිණිස

නො: 35. ඩී.ආර්. විජයවර්ධන මාවත,
දිනමිණ, ලේක්හවුස්, කොළඹ 10
kavi.dinamina@lakehouse.lk

## ප්‍රේමය වියපත්ය

ඇඟිලුව නමුදු සමනල තටු ළපටි දොහේ
එහි මටසිලිටිකම් බිඳ ඉහ නිකට පැහේ
කොහි වුව ඒක එහෙමයි, දොස් තැබිය නොහේ
වියපත් නොවන සමනල තටු ඇතිද කොහේ

පිටු ඉර ඉරා යළි යළි ඇඳි සිහිනවල
කටු සටහනත් සුවඳයි ඒ දවස්වල
තටු පලඳවා මල් අහුරා හිඩැස්වල
කැටුවම ආ විසල් ප්‍රේමෙකි වසත් කල

ඉගිලෙන්නට කියා දුන් ඒ ටිකම ඇති
සිහිලැල් වන වදුලු නොදුටිමි, කමක් නැති
පසුකර යද්දි කඳු වැටි ගිරි දුර්ග පැතී
සමහර විටෙක නොදැනුණි වැටුණැයි හති

නැටුවත් නැතත් පෙරහරකැයි පසක් කළ
දුටුවත් නොදුටුවා සේ හිත සකස් කළ
වැටුණත් පැටලිලා තටු, කටු අගිස්වල
නටුවත් සිඹිම් මල් පර වූ හවස් කල

**ඉන්ද්‍රා ලියනගේ**

## පොරොත්තුව

ඉපලක් දරාගත් ගහක්
මුලට කියනව ඇතිද රහසක්
උරාගෙන තව වතුර පොහොරක්
ඉවසමුද එනකල්ම දල්ලක්,

ගෙවුණත් මහා හුග කාලයක්
පිපෙන්නට බැරිම නෑ

අපි ළඟත් එක මලක්

**සුමාලි ජයවර්ධන**

## නුඹේ කවිය

ඉද හිටක ලියන කවියෙන් නිදි බින්ද
හැමදාම නොලියන්නේ ඇයි නිශ්ශබ්ද
කල්පනා කරලා වටහා ගත්තා මම
මලක පෙති මොන තරම් සියුමැලි ද

**උද්‍යාන් සම්පත් අමේෂන් ජයසේකර**



## සිය සිය


අතින් අත වෙළා
හේමන්තයන් සියයක
ඔහේ ඇවිද ගිය පටු මංපෙත
වැටී සිටිය රන්පත්
කලබල කළ
කුඩා සුළං රැල්ලකි
මතකය

සියක් ශිශිර රාත්‍රීන් අඟ
සිරගත
මිදී ගිය සිහින තුළ
සිටියදී
මගේ දෙතොල මත පතිතව
ඔබේ හාදුවක තෙත් බර

වසන්ත සියයක
පෙති නොහැරුණු
කුඩා කුසුම්
රොන් කෙමි මත
රහස් තවරන
මිමිණුම් හඬ
ඔබේ සුසුම් උණුසුම
උරපත මත

එකසිය එක් වැනි ගිම්හානයේ
ඉර මැදියම
කඩා හැලෙන
මිදිවැල් ආරුක්කුව යට
ඔබේ ලෙමන් තේ බඳුනෙහි
දිය බිඳු මත
කුඩා හදවතක් අඳිනෙමි
සුළැඟිල්ලෙන් අද

**අමා අලුත්ගේ**



## සිනාසෙන සැටි සොයමි

ඇතෙක් බරට මහ දුකක්
පපුව ඇතුළේ තියෙනවා,
එකක්වත් ඉන් කියාගන්නට
කෙනෙක් මං තව හොයනවා

බිඳක් නෑරම කඳුළු
දෑස අත්හැර වැටෙනවා,
දින සති මාස ගෙව ගෙවා
සිනාසෙන සැටි හොයනවා

"තවත් ඉද හිට රෑට,
හීනෙනුත් මං අඬනවා"

**පුලියන්කුලමේ විමලබුද්ධි හිමි**

## අම්මා


ගඟ මැද්දේ හද පළුව එකපාර ගිලෙන කොට
සිහිනවල පවා නුඹ මම දැක්කේ හරි යසට
"ඊගාව සීසර් එක ඔය අම්ම" කියනකොට
බය හිතුණු වේදනා පිරිමැද්දේ හීනියට

මිතුරු වී එක් සිතක් "පළවැනියනේ" ඇසූ විටෙක
සුසුමකින් ලියැවුණේ උත්තරේ නෙත් කොනක
කතුරු අඬු හිනැහුණේ යන්තමට වගෙ මතක
ඉතුරු වුණු වේදනා පිරිමැද්දේ හීනියට

හිරි වැටුණු ඉණ පහළ මම දැක්කේ නැතුවාට
උඩ පහළ ගිය නූල දැක්ක මම කළු පාට
හඬාගෙන දූ ඇවිත් ළං වෙද්දී පුඩුවකට
තවත් මොන සතුටක්ද මේ ලොවේ අම්මෙක්ට

**අයේෂා හංසනී ලියනගේ**

# උපුටා ගත් කවි




## රාජ්‍ය සම්මාන ලද මුවා කී කවිය

"රිස්සක් කරනු කියමින
තිස්ස වෙත ගිය පැමි, බැතියෙන"

කැලේ මැද්දෙදි
කියැවුණා, නම් එහෙම නිකමට
වැලේ වැල් නැති
වැලුත් මට සලකන්නෙ හරහට
රූළේ උන් දැන්
මොනව කිව්වත් හිතෙන විදිහට
මලේ, දිව්වෙ
එදා මං රජ මුවෙක් හැටියට

ඇන්ද කහ සිවුරක්
කෙනෙක් කී අමුතු වචනෙට
වැන්ද රජු හිනැහුණා
මා දෙස බලා හිමිහිට
ඇද්ද දුනු හී බිම දමා
යළි ගිහින් රජගෙට
නින්දගම් විසි හතක්
වෙන් කෙරුවා ලු මුවෙකුට

ලිව්ව, ලියැවෙන පොතක
ඒ ගැන වගක් නැතිකොට
දිව්ව එක ගැන
දුකත් හිතෙනව නේ ද මුවෙකුට

**අනුරාධා නිල්මිණී**
**මදහසක මැදියම**
**සන්ථව ප්‍රකාශන**

## කඳු හිසක ඉවසුම්

මිහිදුම් වලාකුළු පුරනා මධු සාද
කොපමණ තරම් මහ කඳු උසුලනවාද
ලැබුණත් විසල් තුරු පවසන අවවාද
හැඬුමන් නතර වුණ දවසක් තිබුණාද

අබලන් ගල් කුළට හිරුගේ කිරණ වැටී
දුටුවද තැනින් තැන එබිකම් කරන හැටී
දිය ඇලි යටින් සැඟවී ගල් අතර ගැටී
රහසේ ගලා යයි කන්දේ කඳුළු කැටී

පෙම් බැඳි අහස ළඟ කඳු මුදුනක මෙලෙක
කාටත් හොරා සඟවා ගන්නැති පසෙක
එනමුදු රිදුණ තැන උතුරා ගිය දිනෙක
පපුවක් දිය නොවී තිබුණොත් පුදුමයක

ළඟකදි පටන් දුක විමසන තේ වතුය
හඬමින් වැලඳගත්තේ සුමිතුරු අතුය
සමුගත් අතීතයෙ සෙවණැල්ලක තතුය
රැය මෙන් දහවලද දැන් අඳුරට නතුය

සීතල සැඩ සුළං හෝ හඬ ගතට පනී
මහ වැසි නිතර ඇවිදින් පපු ගැබට අනී
ඉවසා බැරිම විට හදවත දුබල විණී
කන්දක් එහෙව් තැන සිය දිවි නසා ගනී

**ගිමන්ත සෙහාන්**

## ප්‍රේමෙන් මිස මලින්

හිතාදර කවි මිතුර
දුකට, තනියට ළඟ ඉන්න
ඒත් මේ පෙම් සඳැසට
පිළිතුරු ගොතනු නොහැකිය

හත් පෙති මලේ පෙති හතම
මගේ නමට හැලුවාට
පර මලක් ලෙස වැටෙන්නට බෑ
නුඹේ උයනේ තව එක

දියව යන සේ මගේ ළය
ලියන්නට බෑ ඔබට හැර
දනිම් ප්‍රේමෙන් මිස මලින්
පුදනු බෑ කවියෙක්ව

හිතාදර කවි මිතුර
දුක, තනියට ළඟ උන්න
නැවත කවි මට නොලිවාට
නැතේ කිසිවක් හද තුළ

**ආයු ප්‍රනාන්දු**



# බීඩි දුම

## කෙටි කතාව



ජයරත්නට අවුරුදු පනහකට වැඩි මිසක් අඩු නැත. හැඩි දැඩිය. ගමන බකලය. බරට අඩිය තියන්නේ පොළොව සමඟ අරියාදුවට මෙනි. මූණේ වම් කොනට වන්නට ඉන්නෙක් ඇත. ගමන බිමන බිම බලාගෙනය. කවුරුන් හෝ මුලච්චි වුවහොත් හිස ඔසවා බලයි. ඉදින් නොදන්නෙක් නම් නැවත බිම බලා ගනී. දන්නෙක් නම් නවතී. වචනයක් දෙකක් කතා කරයි.

ජයරත්න අප අසල්වාසී පවුලක දරුවන් අතරින් වැඩිමලාය. ඇගේ තරමට මොළය වැඩෙන්නේ නැත. සීමිත වැඩ කොටසක් කරයි. කඬේ යයි, අතුපතු ගායි, පොල් ඔයයි, පත්තරේ යන්තම් අකුරු ගැට ගසා කියවයි. සල්ලි අඳුරන්නේ පාටිනි. පනහේ කොළ නිල් පාටයි, සීයේ කොළ රතු පාටයි ආදී වශයෙනි. කාටවත් කරදරයක් නැත. බවලතුන්ට ගරු කටයුතුය.

ජයරත්නට කොටු කොටු කලිසම් කීපයක්, කර නැති ටී ෂර්ට් කීපයක් ඇත. සෝද සෝදා ඒවාම අඳියි. සෙරෙප්පු නැත. හවසට වෙළේ ළිඳෙන් සිත් සේ නායි. බාල්දියට දියත් ගෙන ගෙදර යයි. කොහේ හෝ වැටී නිදයි.

ජයේගේ පවුලත් අපේ පවුලත් හිතවත්ය. කොස්, වරකා පළු, පොළොස් ගැට ඉහළ පහළ යයි. ලෙඩේදී, දුකේදී පිහිට වෙයි. අප කුඩා කල, ජයේගේ නිවස පිහිටි හිස් මූකලන් ඉඩම හරහා වැටුණු පාරෙන් පාසල ඇරී නිවසට යන විට ජයේ මඟ ඉඳ තනි රකී. ඇඹුල් ඇඹිල්ල, ගඳපාන, කිරිල්ල ආදී ගඩා ගෙඩි කඩ-කඩා දෙයි. ඒ ආදරය අදත් එලෙසමය.

ජයේගේ කිව හැකි වැරැදි ඇත්තේ දෙකකි. පළමු වැන්න විහිළුවලට කෝප වීමයි. "ඇඬෝ, බකලයා, හූ" කොල්ලෝ කොලොප්පම් කර දුවයි. ජයේ පස්සෙන් අඹයි. එහෙමත් දවසක කොල්ලෙක් ඔහුගේ අතටම අසු වෙයි. යකා මෙන් මදක් රවාගෙන සිට, කොල්ලා අත්හැර දමයි. කොල්ලන් ජයේට ආදරේය. ඉදින් ඒ වරදක්යැයි කියන්නටත් බැරිය.

අනෙක් වරද තිස්සේම බීඩි බීමයි. කොට කලිසම් සාක්කුවේ බීඩි මිටියක් හා ගිනි පෙට්ටියක් වරදින්නේ නැත. ජයේ, බීඩිය දල්වාගෙන කටේ ගසාගත් පසු අතකින් අල්ලන්නේ නැත. අළු කඩන්නේ නැත. කෝච්චියක් සේ දුම් දම දමා, පිඹ-පිඹ යයි. බීඩියේ රස්නය දෙතොලට දැනෙන විට 'තුක්' ගා කෙළ ගසා දැල්ල පිටින්ම බීඩි කොටේ කොහේ හෝ විසි කරයි. එක් වරක් ගොයම් කොළේකට ගිනි ඇවිළී මහ අලකලංචියක් විය.

ජයේට බීඩි බීම හුරු කළේ කිරිහොදා මුදලාලිය. ඒ තමන්ගේ මඩිය තරකර ගන්නටය. ජයේගේ නිවසට මයිල බාගයක් පමණ දුරින් සුප්‍රසිද්ධ මහා විද්‍යාලයකි. කිරිහොදා මුදලාලිගේ කඩය පිහිටියේ ඒ නුදුරේමය. ඉදිරිපස සිල්ලර වෙළෙඳාමය. පිටුපස තැබෑරුමය.

කිරිහොදා, ජයේට මුලින්ම හුරු කරන්න හැදුවේ කසිප්පුය. පූරුවේ පිනකට මෙන් ජයේට කසිප්පු පත්තියං වූයේ නැත. ජයේගේ අම්මා දෙනෝදාහක් පිරිස මැද කඩේ මුදලාලිට අමු තිත්තෙන් බැණ වැදුණේය.

"මගෙ අසරණයට දහ ජරාව පෙව්වට තොට හෙණ හත ගහන්න ඕනි කිරි හොදෝ"

මුදලාලි තැබෑරුමට වී මීක් නැතුව සිටියේය.

පස්සෙන් පහු කාරණා කරුණු කාරණා අමතක වී කඩේට ආ ජයේට බීඩි හුරු කර ජයේලෑ අම්මාගෙන් ඒකට වාඩුව ගත්තේය.

ජයේ අබිබගාත නිසා ආණ්ඩුවෙන් සුළු පිං පඩියක් ලැබේ. එය කොටස් වශයෙන් අම්මාගෙන් ඉල්ලාගෙන බීඩි බොයි. අම්මා අකමැති වුණත්, ජයේගෙන් බේරෙන්නට බැරිය. මුදල් ලැබෙන තුරුම අත දිගු කරගෙන පස්සෙන්ම එයි. අම්මා රෙදි අල්මාරිය අවුස්සා කීයක් හෝ ජයේ අතට දෙයි. මඟ හමු වන අයගෙන්ද සල්ලි ඉල්ලා ගනී.

"ලොකු මල්ලි රුපියල් විස්සක් දියං බීඩි බොන්ඩ"

මම පසුම්බියෙන් රුපියල් විස්සක් ඇද දෙමි.

මහා විද්‍යාලයේ ක්‍රීඩා ජම්බෝරියක් පැවැත්වුණේ මෑතකදීය. පිට පළාත්වලින් පැමිණි ක්‍රීඩක, ක්‍රීඩිකාවෝ එහි කඳවුරු බැඳගත්හ. සුදු ඇඳගත්, කිරි කොක්කු මෙන් මානව මානවිකාවෝ මහ පාරේ උඩටත් පහළටත් දුවති. සාය කොට ඇඳගෙන දුවන කෙල්ලන්ගේ කලවා ඉර එළියට දිලීසේ. ඒ දැක කුලප්පු වූ ජම්බෝරියේ උදව්වට පිටින් ආ වනචරයෙක් කළු කැපෙන හැන්දෑවක කෙල්ලක පාසල පිටුපස පිහිටි ලන්දකට ඇදගෙන ගියේය. කෙල්ලට මහ හදිය වීම නූලෙන් වැළකී ගියේ ගමේ උකුසු ඇස්වලට පින්සිදු වන්නටය. ක්ෂණයකින් ජම්බෝරියම ලන්ද පීරුවේය. කලබල වූ වනචරයා කෙල්ලගේ ඇඳුම් ඉරා දමා ලන්දේම සැඟවී වහන් වුණේය. පොලිසිය පැමිණ විපරම් කළද උගේ ලොම් ගසක දෙයක්වත් හමු වූයේ නැත.

කෙල්ල සිටියේ සිහිමදවය. ජම්බෝරිය භාර වෛද්‍යවරිය වතුර ඉස, පවන් සලා ඇයට සිහි කැඳෙව්වාය.

"ඒ යකා මගෙ මූණට දුමක් පිම්බා. ඊට පස්සෙ මට මොනවාවත් මතක නෑ"

කෙල්ල කීවාය. ඇය රෝහල්ගත කෙරිණි. ඈ ඊට පසු ජම්බෝරියට ආවේ නැත.

දුමක් පිඹ කෙල්ලන් ලන්දට ඇදගෙන යන 'යකෙක්' ගැන බියක් ගමේත්, පාසලේත්, ජම්බෝරියේත් පැතිර ගියේය. පොලිස් ආරක්ෂාව යෙදවිණි. අපරාධකරු නිදැල්ලේ නිසාම තත්ත්වය උග්‍ර විය. කෙල්ලන් හැන්දෑකරේ කල එළි බැස්සේම නැත.

සති දෙකක ජම්බෝරියේ මේ අලකලංචිය සිදු වූයේ මුල් සතියේය. ජම්බෝරියෙ අවසන් දින ළං වත්ම, මේ අඳුරු පැහැ සිදුවීම කාගේත් මතකයෙන් මදක් රුටා ගියේය. අවසන සරඹ සංදර්ශනයේ, පෙළපාළියේ හා ක්‍රීඩා උලෙළේ පුහුණුවීම් කටයුතු යහමින් සිද්ධ විය. ක්‍රීඩා ජම්බෝරියේ සිටි දරුවන්ගේ මවුපියන්ද එකා දෙන්නා ගමට සැපත් වී සිටියහ.

ජයේට ගමේ සිදු වන උත්සවය සහ අනෙක් උප සිදුවීම් වගේ වගක් නොවීය. සුපුරුදු ලෙස, ඔහු සිටියේ ඔහුගේම ලොවේය. බීඩි බොමින් තැන තැන ගියේය.

අපිට කොස් ඉරු අරන් ආවේය. රුපියල් විස්සක්ද ඉල්ලා ගත්තේය.

අවසන් පෙළපාළියේ පෙරහුරුව මහ දවාලියේ 'චල් චල්-ඩොංඩොං' අනුකරණයෙන් බෑන්ඩ් ගසමින් මහ පාරේ ඉහළට ගියේය. ජයේ, බීඩියක් බොමින් කිරිහොදාගේ කඩයට, පහළට ගියේය. අන්තිම බීඩියේ කොනක් කටේ දැල්වෙමින් තිබුණි. පාරේ ගිය බෑන්ඩ් කණ්ඩායමේ කෙල්ලන් අතරින් රිංගමින්, අළුවා කපන්නාක් මෙන්ය ජයේ පාරේ ගියේ. කෙල්ලක ජයේගේ මූණට මූණ හමු විය. කෙල්ලත්, ජයේත් වමට දකුණට එහෙට මෙහෙට පැන්නේය. ජයේට තරහා ආවේය. සැර දුම් පාරක් කෙල්ලගේ මුහුණටම පිම්බේය. කෙල්ල, බෙර ගෙඩියත් පෙල්ලාගෙන 'දඩෝං' ගා බිම ඇද වැටුණි. ජයේ මෝල් ගස් ගිල්ලාක් මෙන් පාර මැද හිටගෙන සිටියේය. සෙසු කෙල්ලන්ද "මෙන්නෝ දුම් පිම්බෝ, මෙන්නෝ සිහි නැති උනෝ, මෙන්නේ උස්සන් යන්න හදනවෝ" යි කෑගසමින්, ට්‍රම්පට්, බෙරගෙඩි, මවුත් ඕගන් බිම දමා හතර අත දිව ගියෝය. වටේ සිටි පිටගංකාරයෝ එක රොත්තට ජයේ පිටට පැන අහු වෙන එකෙන් ජයේට සලකන්නට පටන් ගත්තේය.

"මේකා වෙන්නැති එදත් කෙල්ලෙක් ඇදන් ගියේ"

ගම්කාරයෝදඑ් මැද්දට පැන්නාහ.

"අතෑරපියව් අසරණයව"

රංඩුවක් ඇවිළී ගියේය. ගමේ සිටි පොලිසිය මැදිහත් විය.

කාණ්ඩය දෙපසට වන විට, සෙනඟ ගොඩ මැද්දේ ලේ පෙරාගෙන ජයේ වැතිර සිටියේය. ජයේද, කෙල්ලද රෝහල් ගත විය.

පසුව ආරංචි වූ පරිදි කෙල්ල කලන්තෙ දමා ඇත්තේ අවුවේ සැරට මිසක් බීඩි දුමට නොවේ.

ජම්බෝරියේ අවසන් උත්සවය පැවැත්වුණි. වැඩි කල එළියක් නොවීය. ගම්මු හූත් කීහ.

**රසික වික්‍රමනායක**



සී. ගමගේ - සොරණාතොට සමූහ

# බදුල්ල මහ රෝහලේ
## වෛද්‍යවරියන් දෙදෙනකු ඇතුළු 36කට කොවිඩ්


බදුල්ල මහ රෝහලේ පිළිකා ප්‍රතිකාර ඒකකයේ වෛද්‍යවරියන් දෙදෙනකු, හෙදියන් දෙදෙනකු, කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවකයන් දෙදෙනකු ඇතුළු 36 දෙනකුට කොවිඩ්-19 වයිරසය ආසාදනය වීම හේතුවෙන් එම පිරිස බිඳුනුවැව, කහගොල්ල, මහනුවර කොවිඩ් ප්‍රතිකාර ඒකක වලට පසුගියදා (7) ඇතුළත් කළ බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ඌව පළාත් සම්බන්ධීකාරක, බදුල්ල මහ රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මධ්‍යම කමිටු සාමාජික වෛද්‍ය පාලිත රාජපක්ෂ මහතා පැවැසීය.

බදුල්ල මහ රෝහලේ පිළිකා ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටි පුද්ගලයන් දෙදෙනකු සහ බදුල්ල සිට කොළඹ රිජ්වේ රෝහලට මාරු කර යැවූ කුඩා දරුවකු ද කොවිඩ් 19 වයිරසය ආසාදිත වී මියගිය බවද හෙතෙම කීය . මේ පිරිස අතර බදුල්ල මහ රෝහලේ පිළිකා ප්‍රතිකාර ඒකකයේ වෛද්‍යවරියක, ගැබිනි වෛද්‍යවරියක හෙද කාර්ය මණ්ඩලයේ දෙදෙනකු, කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවකයන් දෙදෙනකු, පිළිකා රෝගීන් 22ක්, සහ රෝගීන් බලා ගැනීමට පැමිණි උපස්ථායිකාවන් අටදෙනකු සිටින බවද හෙතෙම කීය .

බදුල්ල මහ රෝහලේ පිළිකා ඒකකයේ ප්‍රතිකාර ලබා අම්පාර ප්‍රදේශයට ගිය පිළිකා රෝගියකු කොවිඩ් 19 ආසාදිතයකු ලෙස හඳුනාගෙන පිළිකා ඒකකයේ වෛද්‍ය, හෙද, කනිෂ්ඨ කාර්ය මණ්ඩලය ඇතුළු පිළිකා රෝගීන්ට බදුල්ල මහ රෝහලේ දී සිදු කළ හදිසි පීසීආර් පරීක්ෂණයකින් අනතුරුව මෙසේ මෙම පීසීආර් වාර්තාවලින් මේ කොවිඩ් 19 ආසාදිත පිරිස හඳුනා ගනු ලැබූ බව වෛද්‍ය පාලිත රාජපක්ෂ මහතා සඳහන් කළේය.

මීට අමතරව බදුල්ල පිළිකා ප්‍රතිකාර ඒකකයේ සෙසු වෛද්‍යවරුන් ඇතුළු හෙද කාර්ය මණ්ඩලය, කනිෂ්ඨ සේවක පිරිස මෙන්ම නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටි රෝගීන් මෙන්ම රෝගීන්ට උපස්ථාන කිරීම සඳහා රෝගීන් අසල රැඳී සිටි පිරිස පීසීආර් පරීක්ෂණයට භාජනය කළ බවත් ඔවුන්ගේ පීසීආර් පරීක්ෂණ වාර්තා ලැබීමට නියමිතව ඇතැයි සඳහන් කළ වෛද්‍ය පාලිත රාජපක්ෂ මහතා දැනට බදුල්ල මහ රෝහලේ පිළිකා ප්‍රතිකාර ඒකකයට බාහිර පුද්ගලයන් කිසිවකුට ඇතුළු වීමට ඉඩ නොදෙන බවත්, වෙනත් රෝගීන් ඇතුළත් කර නොගන්නා බවද පැවැසීය.

මේ අතර පිළිකා ප්‍රතිකාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදී කොවිඩ් 19 වයිරසය ආසාදිත වී බදුල්ල මහ රෝහලේ දී මියගිය 72 හැවිරිදි පුද්ගලයකුගේ මළසිරුර පෙරේදා (6) රාත්‍රි කෝවිඩ් ආරක්ෂිත උපදෙස් පිළිපදිමින් සෞඛ්‍ය නීති රීති අනුගමනය කරමින් බදුල්ල ආදාහනාගාරයේදී සිදු කෙරිණි.



දිනමිණ දසත
දස අත ම එක තැන

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

## ගංජා සහ ඇත් දළ යුගළක් සමඟ 5ක් අත්අඩංගුවට



යුද හමුදාව හා නෙඩුන්කේණි පොලීසිය විසින් සිදු කළ මෙහෙයුමකදී නෙඩුන්කේණි පට්ටකුඩිඉරිප්පු ගම්මානයෙන් කේරළ ගංජා තොගයක් හා ඇත් දළ යුගළක් සමඟ පුද්ගලයන් පස් දෙනකු පසුගියදා (3) අත්අඩංගුවට ගෙන තිබේ.

යුද හමුදා කඳවුරක් අසල පුද්ගලයන් දෙදෙනකු කේරළ ගංජා අලෙවි කරන බවට යුද හමුදාවට ලැබුණු තොරතුරක් මත ඔවුන් දෙදෙනාව පරීක්ෂා කිරීමේදී කේරළ ගංජා ග්‍රෑම් 250ක් හමු වී තිබේ.

ඔවුන් දෙදෙනාව අත්අඩංගුවට ගත් යුද හමුදාව ඔවුන්ව නෙඩුන්කේණි පොලීසිය වෙත රැගෙන ගොස් පොලීසිය සමග ඔවුන්ගේ නිවෙස් පරීක්ෂා කිරීමේදී තවත් කේරළ ගංජා හා ඇත් දළ යුගලයක් ළඟ තබා ගෙන සිටි පුද්ගලයින් තුන් දෙනකු අත් අඩංගුවට ගැනීමට හැකි වී තිබේ.

සැකකරුවන් පස් දෙනා හා කේරළ ගංජා තොගයද ඇත් දළ යුගළ ද ඉදිරි පරීක්ෂණ සඳහා නෙඩුන්කේණි පොලීසිය වෙත බාර දී ඇති අතර සැකකරුවන් වවුනියාව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබේ.

ආර්.එම්. විජේරත්න - හාලිඇළ සමූහ

## ජයගම මහාබෝධි ප්‍රජා සංවර්ධන සමිතියේ ලේ දන්දීමේ පින්කම දා...



බදුල්ල, ජයගම මහාබෝධි ප්‍රජා සංවර්ධන සමිතිය මෙහෙයවූ ස්වේච්ඡා ලේ දන්දීමේ කඳවුර ඉකුත්දා සිරිමල්ගොඩ ඉලුක්තැන්න ශ්‍රී විමල විවේකාශ්‍රම විහාරස්ථානයේදී පැවැත්විණි. ලේ පරිත්‍යාගශීලීහු සියයකට අධික පිරිසක් එහිදී ලේ පරිත්‍යාග කළහ.

ඉලුක්තැන්න ශ්‍රී විමල විවේකාශ්‍රම විහාරාධිපති ශාස්ත්‍රපති පූජ්‍ය පේඅරාවේ විමලධම්ම හිමියන්ගේ අනුශාසනා පරිදි විවිධ ග්‍රාමීය සංවිධාන ඇතුළු ප්‍රදේශවාසීන්ගේ සහයෝගයෙන් ජයගම මහාබෝධි ප්‍රජා සංවර්ධන සමිතිය මගින් ප්‍රථම වතාවට සංවිධාන කළ මේ ලේ දන්දීමේ කඳවුර බදුල්ල මහ රෝහලේ ලේ බැංකුවේ කාර්ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කෙරිණි.

ඌරුබොක්ක විශේෂ - ඒ.පී. දයාචන්ද්‍ර

## නිවසෙකට ඇතුළු වී දේපළ සොරකම් කළ යුවළකට ශරීර ඇප

රාත්‍රි කාලයේ වසා තිබූ නිවසෙකට ඇතුළු වී පිටුපස දොර කඩා රුපියල් 20000 ක් වටිනා දේපළ සොරකම් කළ අඹුසැමි යුවළක් රොටුඹ පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු වරදකරුවන් බවට පිළිගන්නා බවට කියා සිටීම හේතුවෙන් මොරවක වැඩ බලන මහෙස්ත්‍රාත් සී.එස්. දිසානායක මහතා විසින් එක් අයකුට රුපියල් පන්දහස බැගින් දෙදෙනාට රුපියල් දස දහසක මුදල් ඇප සහ එක් අයකුට රුපියල් ලක්ෂය බැගින් ශරීර ඇප තැබීමෙන් පසු මුදාහරින ලෙසට නියෝග කෙරිණි.

වැඩබලන පොලිස් ස්ථානාධිපති පො.ප. අබේරත්න මහතාගේ උපදෙස් අනුව පො.කො.76382 ප්‍රියංකර මහතා අධිකරණයට කරුණු දැක්වීය. නිවෙසේ දොරගුළු වසා දමා ගිය අවස්ථාවේ පිටුපස දොර කඩා නිවස තුලට ඇතුල් වී නිවසේ තිබූ රුපියල් පන්දහසක් වටිනා නිදන ඇඳක්, දරුවාට දැමීමට තිබූ රුපියල් 2500ක් වටිනා කාපට් එකක්, රුපියල් 1500ක් වටිනා කුරුඳු කැත්තක්, අඩි 6ක් උස රුපියල් 2200ක් වටිනා අලවංගුවක්, සෙරෙප්පු ජෝඩුවක්, රුපියල් 2900ක් වටිනා 2ජීබී සහ 8ජීබී මෙමරි චිප් 2 ක්, සිම් පතක්, රූපවාහිනී යන්ත්‍රය, සබ්බුපර් යන්ත්‍රය, ජාතික හැඳුනුම්පත ඇතුළු ලියකියවිලි සහිත බෑගයක්, ඇතුළු භාණ්ඩ සොරකම් කර ඇති බවට රොටුඹ ඌරව ප්‍රදේශයේ පුද්ගලයකුගෙන් පැමිණිල්ලක් ලැබුණා.

මේ දේපළ සොරකම් කර ඇත්තේ රොටුඹ ඌරව ප්‍රදේශයේ පදිංචි අයකු බවට සැකකරන බවටත් එම පැමිණිලිකරු පැමිණිල්ලෙන් දන්වා ඇත. ඒ අනුව අදාළ පුද්ගලයා අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී සැකකරුගේ නිවෙස පිහිටි ඉඩමේ සඟවා තිබියදී නිදන ඇඳ, අලවංගුව, කුරුඳු කැත්ත ඇතුළු සොරාගත් භාණ්ඩ වලින් කොටසක් සොයා ගත් අතර ජාතික හැඳුනුම්පත සහ වැදගත් ලියකියවිලි සහිත බෑගය සැකකරුගේ බිරිඳ ළඟ තිබී සොයා ගනිණි. මේ සොරකම කිරීම සඳහා සැකකරුගේ බිරිය සම්බන්ධ බවට තොරතුරු අනාවරණය වුණා. ඒ අනුව රාත්‍රි කාලයේ නිවෙසක් බිඳ රුපියල් 20000කට වැඩි දේපළ සොරකම් කිරීම සම්බන්ධයෙන් අඹුසැමි යුවළ අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කෙරිණි.

ගිරිඋල්ල සමූහ - ඩබ්.ඒ. සරත්

## පන්නල සාහිත්‍ය උත්සවයේදී ප්‍රාදේශීය මාධ්‍යවේදිනියට ජයග්‍රහණ රැසක්



සංස්කෘතික කටයුතු දෙපාර්තුමේන්තුව සහ පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සංවිධාන කළ 2020 සාහිත්‍ය උත්සවය කොරෝනා වසංගතය හේතුවෙන් අවලංගු කරනු ලැබිණි.

එහෙත් එහි තරග ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය පසු ගිය දා පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී සිදු කෙරිණි. මේ තරගවලදී ප්‍රාදේශීය මාධ්‍යවේදිනියක වූ ආර්.ඒ. ප්‍රියංකා රූපසිංහ ඉංග්‍රීසි මාධ්‍ය කෙටිකථා තරගයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රථම ස්ථානයත්, වයඹ පළාත් තෙවන ස්ථානයත් හිමිකර ගත්තාය. ඒ හැර පන්නල කොට්ඨාසයේ සිංහල නිසඳැස් ප්‍රථම ස්ථානයත්, ඉංග්‍රීසි පද්‍ය රචනා දෙවන ස්ථානයත් හිමි කර ගැනීමට ඇය සමත් විය. ඇයට හිමි ත්‍යාග සහ සහතිකපත් පන්නල සංස්කෘතික නිලධාරිනී සීතා කුමාරි ලියනගේ මහත්මිය අතින් පිරිනැමුණු අවස්ථාව මෙහි දැක් වේ.

අනුරාධපුර මධ්‍යම විශේෂ - බී.එම්. විජේසූරිය

## පොහොය දිනයේ වැඩි මිලට මත්පැන් විකිණූ නගර සභා සේවකයා දඩ කයි

රජයේ මත්පැන් තැබෑරුම් වසාදමා තිබූ පසළොස්වක පොහොය දිනයේදි බලපත්‍රයක් නොමැතිව වැඩි මිලට මත්පැන් අලෙවි කිරීමේ චෝදනාවට අධිකරණය හමුවේ වරද පිළිගත් හිටපු නගර සභා සේවකයකුට රුපියල් පහළොස්දහසක දඩ මුදලක් ගෙවන ලෙස අනුරාධපුර ප්‍රධාන මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ජනක ප්‍රසන්න සමරසිංහ මහතා නියෝග කළේය.

පසළොස්වක පොහොය දිනයේ අනුරාධපුර නගරයට පැමිණි පිටස්තර පුද්ගලයන්ට සැකකරු නීතිවිරෝධිව මත්පැන් අලෙවි කරනා බවට අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයට ලැබුණු තොරතුරු මත අත්අඩංගුවට ගැනීම සිදුකර තිබිණි. සැකකරු ඉකුත්දා (26) අත්අඩංගුවට ගෙන පොලිස් ඇපමත මුදාහැරීමෙන් පසුව (5) අධිකරණයට ඉදිරිපත් කෙරිණි.

පොලිස් කණ්ඩායම අනුරාධපුර නිවත්තකචේතිය විද්‍යාලය අසලට ගොස් පොලිස් උපාය දූතයකු යොදවා රජයේ මත්පැන් බෝතල භාගයක් රුපියල් දහසක මුදලක් ලබාගැනීමෙන් පසුව සැකකරු අත්අඩංගුවට ගැනීම සිදුකළ බව අධිකරණයට දැන්වූවේය.

සැකකරු සන්තකයේ තිබි වැඩි මිලට අලවි කිරීමට තබාගෙන සිටි විස්කි බෝතල් එකක් රජයේ මත්පැන් බෝතල් 16ක් බීර ටින් 17 ක් පොලිසිය අත්අඩංගුවට ගත් බවත් සැකකරු අනුරාධපුර මහ නගර සභාවේ මීට පෙර සේවය කර රැකියාව අහිමිවීමෙන් පසු රජයේ මත්පැන් වැඩි මිලට අලවිකිරීම සිදුකර තිබෙනා බවත් පොලිසිය අධිකරණයට දැන්වුවේය. අත්අඩංගුවට ගත් සැකකරුට දඩ නියම කළ විනිසුරුවරයා නඩු භාණ්ඩ වශයෙන් අධිකරණයට ඉදිරිපත් කර තිබූ රුපියල් හතළිස් දහසක පමණ මත්පැන් තොගය රාජසන්තක කර විනාශ කිරීමට නියෝග කළේය.

මාතලේ දිස්ත්‍රික් සමූහ- ඒ.ඒ.එල්. ඩයස්

## කොත්තුරොටි හබය දුරදිග ගොස් හතරක් රෝහලේ

ගලේවෙල පොලිස් බලපෙදෙසට අයත් පහළවැව නගරයට නුදුරින් පිහිටි හෝටලයකට පැමිණි තරුණයින් පිරිසක් කොත්තුරොටි අඩු මිලට ඉල්ලීම නිසා ඇතිවූ බහින්බස්වීමක් දුරදිග යාමෙන් එහි සේවකයන් සමඟ ඇති කරගත් ගැටුමකින් සිව්දෙනකු තුවාල පසුගිය දා (06) රාත්‍රි දඹුල්ල වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මූලික රෝහලට ඇතුළත්කර ඇත. මෙයින් දෙදෙනකුගේ තත්ත්වය තරමක් බරපතළ බව පොලීසිය කියයි.

සිද්ධිය සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂණයේදී හෙළිවී ඇත්තේ මේ තරුණ පිරිස හෝටලය වෙත පැමිණ එහිදි මත්පැන් පානය කර කොත්තු රොටියක් ගැන ඇති කරගත් බහින්බස් වීමක් මෙසේ දුරදිග යාමෙන් මේ ගැටුම සිදුවී ඇති බවය.

මෙසේ ගැටුමෙන් තුවාල ලබා රෝහල් ගතකර ඇත්තේ වයස අවුරුදු 20-40 අතර සිව්දෙනෙකි. මොවුන් තලකිරියාගම, මැල්සිරිපුර සහ බුවැලිකඩ යන පෙදෙස්හි පදිංචිකරුවන් බව පොලීසිය පවසයි. මෙම සිද්ධිය සම්බන්ධයෙන් ගලේවෙල පොලීසිය විසින් වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

හල්දුම්මුල්ල සමූහ - සිරිල් සෙනෙවිරත්න

## හාල්අටුතැන්න නව ආදාහනාගාරය විවෘත කරයි



ඌව පළාත් සභා ප්‍රතිපාදන යටතේ මිලියන 25.5 ක වියදමකින් හල්දුම්මුල්ල ප්‍රාදේශිය සභාවට අයත් හාල්අටුතැන්න පොදු සුසාන භූමියේ ඉදි කරන ලද නව ආදාහනාගාරය බදුල්ල දිස්ත්‍රික් පාර්ලීමේන්තු මන්ත්‍රී ඌව පළාත් හිටපු ප්‍රධාන ඇමති චාමර සම්පත් දසනායක මහතා විසින් සමරු ඵලකය නිරාවරණය කර විවෘත කළ අයුරු.

බදුල්ල දිස්ත්‍රික් පාර්ලීමේන්තු මන්ත්‍රී හපුතලේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රධාන සංවිධායක තිස්ස කුට්ටිආරච්චි, හල්දුම්මුල්ල ප්‍රාදේශිය සභාවේ සභාපති අශෝක් කුමාර්, ඌව පළාත් සභාවේ හිටපු මන්ත්‍රී ප්‍රගති අනුශල්‍ය, පළාත් පාලන කොමසාරිස් මංගල විජේනායක මහතවරු ද මෙහි සිටිති.

චිත්‍රරත්න කළුආරච්චි - හිඳෝගම සමූහ

## අනුරාධපුරය දිස්ත්‍රික්කයේ මාර්ග රැසක සංවර්ධනයට දස ලක්ෂ 6700ක්




උතුරු මැද පළාත් ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේ මාර්ග රැසක සංවර්ධන කටයුතු මහාමාර්ග අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා (04) දින ආරම්භ කෙරිණි.

මේ යටතේ කිලෝමීටර් විසි හතක දිගින් යුත් තලාව - කැකිරාව මාර්ගය (B 213), කිලෝමීටර් හතක දිගින් යුත් කැකිරාව - ගනේවල්පොළ මාර්ගය (B212) කිලෝමීටර් හතළිස් පහක දිගින් යුත් ගනේවල්පොළ - දාච්චිහල්මිල්ලෑව මාර්ගය (B133) කාපට් අතුරා සංවර්ධනය කිරීමට නියමිතය.

මිලියන හයදහස් හත්සිය හතළිස් පහක (6745) මුළු වියදම යටතේ කිලෝමීටර් අසූවක දුරක් සංවර්ධන කෙරේ.

පසුගිය යහපාලන රජය මේ මාර්ග සඳහා කැබිනට් අනුමැතියකින් තොරව සංවර්ධන කටයුතු ආරම්භ කරන මුවාවෙන් මුල් ගල් තබා ඇතත් සංවර්ධන කටයුතු සිදුවී නොමැත.

මේ අවස්ථාවට ඉඩම් අමාත්‍ය එස්. එම්. චන්ද්‍රසේන, රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ, උතුරුමැද හිටපු ප්‍රධාන අමාත්‍ය එස්.එම්. රංජිත් මහත්වරුන් ඇතුළු ප්‍රාදේශීය දේශපාලන නියෝජිතයෝ, මාර්ග සංවර්ධන අධිකාරියේ උතුරු මැද පළාත් අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීහු සහභාගි වූහ.

මැදකොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ

## කොළඹ දරිද්‍රාධාරලාභී පවුල් සංඛ්‍යාව ඉහළට

කොළඹ මහනගර සභා බල ප්‍රදේශයේ දරිද්‍රාධාරලාභී දරු පවුල් ඒකක සංඛ්‍යාව 13,000 සිට 14500 දක්වා වැඩි කිරීමටත් නාගරික මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශ අනුව නාගරික මහජනාධාර දෙපාර්තමේන්තුව කටයුතු කරගෙන යයි.

පුරපතිනි රෝසි සේනානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් කොළඹ මහ නගර සාලාවේ කමිටු රැස්වීම් ශාලාවේදී පැවැති මුදල් පිළිබඳ ස්ථාවර කාරක සභාව නාගරික කොමසාරිස් නීතිඥ රෝහිණී දිසානායක නාගරික පුණ්‍ය කොමසාරිස් ශාලිකා රණවීර නාගරික භාණ්ඩාගාරික භාණ්ඩාගාරික මහත්මියන් විසින් ඉහතකී යෝජනාව ඉදිරිපත් කළහ. රෝසි සේනානායක පුරපතිනිය විසින් මෙම යෝජනාව නිර්දේශ කළාය.

පුණ්‍ය කොමසාරිස් ශාලිකා රණවීර මහත්මියගේ ඉහත වාර්තාව සලකා බලා 2021 වසරේ ජනවාරියේ සිට ක්‍රියාත්මකව පවතී. තවද දැනට දරිද්‍රතා ආධාර ලබන පවුල් ඒකක සංඛ්‍යාව අතර සමෘද්ධිලාභී පවුල් ප්‍රමාණ්‍ය කොළඹ මහ නගරසභා සීමාවෙන් පිටත පදිංචි අය ආදිය සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට නාගරික කොමසාරිස්තුමිය පුණ්‍ය කොමසාරිස්තුමිය වෙත උපදෙස් ලබා දුන්නාය.

කන්තලේ සමූහ - සුමිත්‍රා කුමාරිහාමි

## සිවිල් ආරක්ෂක භටයන්ට විදුලි වැට නඩත්තු කිරීමේ පුහුණුව

දිවයින පුරා ජන ජීවිතයට දැඩි ලෙස බලපෑම් කරන අලි මිනිස් ගැටුම අවම කර ගැනීම සඳහා සිවිල් ආරක්ෂක භටයන් ට විදුලි වැට නඩත්තු කිරීම සම්බන්ධයෙන් මනා පුහුණුවක් ලබා දීමට බලාපොරොත්තු වන බැවින් එම පුහුණු වැඩසටහනේ එක් පියවරක ආරම්භය පසුගිය සිකුරාදා කන්තලේ 20 බැරියල් හන්දිය විදුලිවැට කුටිය තුළදී සිදුකෙරිණි.

මේ පිළිබඳව අදහස් දක්වමින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ විදුලිවැට භාරව කටයුතු කරන වනජීවී අඩවි ආරක්ෂක කැළුම් බණ්ඩාර මහතා අප සමග මෙසේ පැවැසුවේ ය. " දිවයින පුරා සිවිල්ආරක්ෂක බළකායේ සෙබළුන් තුන්දහස් එකසීයක පමණ පිරිසක් මේ වනවිට වනජීවී දෙපාර්තමේන්තුවට සහාය බළකායක් වශයෙන් අනුයුක්ත කරලා තියෙනවා. ඔවුන් හට විදුලිවැට නඩත්තුව පිළිබඳව පුහුණු කිරීමේ සමාරම්භක අවස්ථාවයි මේ. සෞඛ්‍ය නීති රීති වලට අනුව අද දින පහළොවකට පමණක් පුහුණුව දෙනවා.මෙහි අධීක්ෂණ කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නියෝජනය කරමින් එක් මහත්මයෙකුත්, ග්‍රාම නිලධාරි හා දේශපාලන අධිකාරිය එක්ව සිදු කිරීමට නියමිත බැවින් ඔවුන් හට ද පුහුණුව ලබා දීමට කටයුතු කරන බවත් පැවසීය. මේ අවස්ථාවට කන්තලේ වනජීවී අඩවි ආරක්ෂක බුද්ධික ලක්ෂාන්, ග්‍රාම නිලධාරි අමරසිංහ මහත්වරුන් ද සිවිල් ආරක්ෂක නිලධාරීහු ඇතුළු පිරිසක් සහභාගි වූහ.

මිහිර විජේසේකර - මාරවිල සමූහ

# කාන්තා දිනය සමරා රුක් රෝපණ වැඩසටහනක්



ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාලිගාවත්ත සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන විසින් කඩුපිටි ඔය ඉවුරු දෙපස රුක් රෝපණ වැඩසටහනක් පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක ප්‍රියන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (08)පැවැත්විණි. මහවැව ප්‍රාදේශීය ලේකම් නදීජා හේරත් මහත්මිය ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

කේ.ඒ. මෛත්‍රීපාල - දමන සමූහ

# කුසලධම්ම හිමි දෙවර්ෂ පූර්ණ සිහිකර බෝධිප්‍රාකාරයක් පූජා කරයි



නැගෙනහිර බොදු පුනරුදය ඇති කරමින් දරණාගම කුසලධම්ම නාහිමිපාණන් වහන්සේගේ දෙවර්ෂ පූර්ණ පින්කම වෙනුවෙන් ආරම්භ කළ බෝධිප්‍රාකාරය නිර්මාණය කිරීමේ පින්කම ආරම්භ කරමින් අම්පාර කීනවත්ත හිඟුරාණ ශ්‍රී බෝධිමළු විහාරයේ අභිනව බෝධිප්‍රාකාරය නිමකර පූජා කිරීම සිහිපත් කරමින් හිඟුරාණ කීනවත්ත ශ්‍රී බෝධිමළු විහාරාධිපති ශුස්ත්‍රපති පූජ්‍ය ඇතිමලේ ආනන්ද නාහිමිපාණන් වහන්සේ විසින් මෙම පින්කම සිහිගන්වමින් කොළඹ 07 ශ්‍රී සම්බෝධි විහාරාධිපති බෞද්ධයා මාධ්‍ය ජාලයේ සභාපති පූජනීය බොරලන්දේ වජිරඤාණ ස්වාමින්වහන්සේ හට සිහිවටනයක් පිරිනැමූ අයුරුයි මේ.

අනුර දිසානායක - මල්ලවපිටිය සමූහ

# මත් ද්‍රව්‍ය චෝදනාවකට හිරේ යැවූ ගොකරැල්ලේ සිසුවා තවමත් හිරේ

මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීමේ චෝදනාව යටතේ ගොකරැල්ල පොලීසිය විසින් මීට මාස පහකට පෙර අත්අඩංගුවට ගනු ලැබූ උසස් පෙළ විභාගයට පෙනී සිටීමට නියමිතව සිටි සිසුවකුට අගතියක් සිදුව ඇති බවත් අත්අඩංගුවට ගැනීම නීතිවිරෝධී බව පොලිස් කොමිසම විසින් මවුපියන්ට දන්වා ඇතත් මෙම සිසුවා මේ වන තුරුත් නිදහස් කිරීමට බලධාරීන් පියවර ගෙන නැති බව ගොකරැල්ල පොලිස් බල ප්‍රදේශයෙන් වාර්තා වේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාගොල්ල ග්‍රාමයේ පදිංචි ඩී.ඒ. කාංචන ප්‍රදීප් ධර්ම තිලක් වන 19 හැවිරිදි පාසල් සිසුවා අත්අඩංගුවට පත්වන්නේ ඔහු 2020 අ.පො.ස. උසස් පෙළ විභාගයට කලා විෂය ධාරාව ඔස්සේ පෙනී සිටීමට සූදානම්ව සිටියදීය.

2020 ඔක්තෝබර් 10 වැනිදා විභාගයට දින දෙකක් තිබියදී ගොකරැල්ල පොලිසියේ දූෂණ විමර්ශන අංශයේ නිලධාරීන් පිරිසක් විසින් මෙම සිසුවා අත්අඩංගුවට ගනු ලැබූයේ ගංජා සන්තකයේ තබා ගත් බව කියමිනි. පොලීසියට ගෙන ගොස් මෙම සිසුවාට අමානුෂික ලෙස පහර දී ඇති අතර පසුව හෙරොයින් ළඟ තබාගත් බවට "බී" වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කර තිබේ.

මෙසේ අත්අඩංගුවට පත් සිසුවාට උසස් පෙළ විභාගයට පෙනී සිටීමේ අවස්ථාව අහිමිවී ගොස් තිබිණි.

ඔහුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලීම් කළද ඊට ද අවස්ථාව ලබා නොදුන් බව මවුපියෝ පවසති. සිසුවා බන්ධනාගාර ගත කොට මාස 5ක් පමණ ගෙවී ගොස් ඇත. මෙම සිසුවා බන්ධනාගාරය තුළදී කොරෝනා වසංගතයට ගොදුරු වීම හේතුවෙන් පීඩාවට පත්ව සිටි බවද මවුපියෝ පවසති.

කාංචන සිසුවා මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ නීතිවිරෝධී අයුරින් බවත් ඒ නිසා කාංචනට අගතියක් සහ අපකීර්තියක් සිදුවී ඇති බවත් පොලිස් කොමිසම විසින් කරන ලද පරීක්ෂණයකදී හෙළිදරව් වූ බව සඳහන් ලේඛනයක් එම කොමිසම විසින් කාංචනගේ මවුපියන් වෙත එවා තිබුණත් මෙවැනි මානව හිමිකම්, මූලික අයිතිවාසිකම් කඩ කිරීමක් සිදු කර ඇති පොලිස් නිලධාරීන් හට දඬුවමක් ලබා දීම මේ වන තෙක් සිදු වී නැත.

එම්.පී. කුමාර - කොටදෙණියාව සමූහ





# මීරිගම ඕල්කට් මහ විදුහලේ දරුවන්ගේ මානසිකත්වය නංවන්න වැඩසටහන්

වසරක් තිස්සේ අධ්‍යාපනික කටයුතු අඩාලව පවතින පාසල් දරුවන්ගේ මානසිකත්වය ඉහළ නංවමින් ඔවුන්ගේ අධ්‍යාපනය නඟා සිටුවීමේ වැඩසටහන් ගණනාවක් මීරිගම දෙල්වල ශ්‍රීමත් ඕල්කට් මහ විදුහල ආරම්භ කොට තිබේ.

මෙම වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා දරුවන් එදිනෙදා මුහුණදෙන ප්‍රශ්න ගැටලු කියවෙන කෙටි චිත්‍රපට නිෂ්පාදනය මේ වන විටත් ආරම්භ කර ඇත. ඒ යටතේ කෙටි චිත්‍රපට දෙකක් නිපදවා තිබේ. වර්තමානයේ පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සිදු කිරීම සඳහා උපයෝගී කර ගන්නා ඔන්ලයින් පහසුකම් ලබා ගැනීමේ දී මුහුණ දෙන ගැටලු පිළිබඳව පළමු කෙටි චිත්‍රපටියෙන් කියවේ. දරුවන් පහසුකම් ලබා ගැනීමට නොහැකිව පසුවෙන අන්දමත් එම පහසුකම් ඇති දරුවන් ඒවා ප්‍රයෝජන ගනනා අන්දමත් විග්‍රහ කර ඇත.

එමෙන්ම ඔන්ලයින් පාඩම් විවිධ සමාජ ස්ථරවලට බලපාන අන්දම මේ මගින් පැහැදිලි කර දීමට සමත් වී ඇත.

මේ ආකාරයට කෙටි චිත්‍රපට කිහිපයක් නිෂ්පාදනය කිරීමෙන් පසුව කෙටි චිත්‍රපට උළෙළක් පවත්වා මේ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුම්වත් කිරීමට කටයුතු කෙරේ.

කොරෝනා උවදුර මැද පාසල් එන දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමටද ගෙන ඇති පියවර අගනේය. ඒ අනුව පාසල් සිසුන්ගේ ඩෙස්ක් වටා ඉටි රෙදි ආවරණ සකසා ඇති අන්දම දැකිය හැකිය.





එන්. නවරත්න - මීගහකිවුල සමූහ

# රටට ආදර්ශයක් එක් කළ සිවිල් ආරක්ෂක නිලධාරියා

සුළු මුදලකටත් ඇන කොටා ගනිමින් ගහ මරා ගන්නා සමාජයකට අපූරු ආදර්ශයක් එක් කර දෙමින් මහ මග වැටී තිබූ රුපියල් ලක්ෂ එකහමාරක් පමණ වටිනා රන් මාලයක් අහුලා එය එහි හිමිකරුට බාර දීමට කටයුතු කළ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත ආරක්ෂක නිලධාරියකු මීගහකිවුල ග්‍රාමීය සංවර්ධන බැංකු පරිශ්‍රයේදී මුනගැසිනි. මීගහකිවුල ග්‍රාමීය සංවර්ධන බැංකුවේ ආරක්ෂක නිලධාරියෙකු ලෙස සේවය කරන බී.ඩබ්ලිව්. ජයන්ත ගුණතිලක මහතා මෙම සද්ක්‍රියාව සිදු කර ඇත.



ගලේවෙල මධ්‍යම සමූහ

# නිලගම රාජමහා විහාරස්ථානයේ පුරාවස්තු අනතුරේ

මාතලේ දිස්ත්‍රික්කයේ කන්ද පල්ල කෝරලයේ රජමහ විහාර භූමියේ ගල්කුලක් මත කොටා ඇති අනුරාධපුර යුගයට අයත් යැයි සැලකෙන සෙල්ලිපිය සංරක්ෂණය කිරීමට පුරා විද්‍යා අංශය පියවර නොගැනීම නිසා එය විනාශ වෙමින් පවතින බව ප්‍රදේශවාසීහු පවසති. මෙම ස්ථානයේ ගල්ගුහාවල වළගම්බා රජු සැඟවී සිටින්නට ඇතැයි ජනප්‍රවාදවල සඳහන් වේ. මෙම ස්ථානයේ දැවැන්ත ගල්කුලුවලින් සමන්විත වෙයි. එම රජු මෙම ස්ථානයේ සැඟව සිටියදී විහාරය ඉදිකරන්නට ඇතැයි සැලකේ. එම කාලවකවානුව තුළ මෙම සෙල්ලිපියද ඉදි කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. එම සෙල්ලිපියට අමතරව අදාළ විහාර භූමියේ චෛත්‍ය නටබුන් ඇතුළු පුරාවස්තු රැසක් විනාශ වෙමින් පවතින බව විහාරාධිපති මඩහපොළ ගුණරත්න හිමියෝ පැවැසූහ. ඒ නිසා මෙම සෙල්ලිපිය ඇතුළු පුරාවස්තු සංරක්ෂණය කර එය මතු පරපුරට රැක දීමට පුරා විද්‍යා නිලධාරීන් විසින් කඩිනමින් පියවර ගතයුතු බව උන්වහන්සේ පැවැසූහ.

දසත - දස අත ම එක තැන

සෙනවිරත්න කහටපිටිය - බොරලැස්ගමුව සමූහ

# කටුකුරුඳුවත්ත වසමේ 30ට වැඩි අයට කොවිඩ් එන්නත



දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නගරාධිපති නාවලගේ ස්ටැන්ලි ඩයස් මහතාගේ උපදෙස් පරිදි රත්මලාන ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය ජයලත් ගුණතිලක මහතාගේ සංවිධායකත්වයෙන් කටුකුරුඳුවත්ත ග්‍රාම සේවා වසමේ වයස අවුරුදු 30ට වැඩි අය සඳහා කෝවිෂීල්ඩ් එන්නත ලබාදීම පසුගිය දින 3ක් පුරාවට ගල්කිස්ස ශ්‍රී ජනනන්දනාරාම විහාරස්ථානයේ දී සිදුකරනු ලැබීය.

මෙම වැඩසටහනට ශ්‍රී ජනනන්දනාරාමාධිපති යටිනුවර විජිතසිරි හිමි අනුශාසනා පරිදි කටුකුරුඳුවත්ත ග්‍රාම නිලධාරි පූර්ණ මුරමුදලි සමෘද්ධි නියාමක සිරිමල්, කොට්ඨාස සෞඛ්‍ය පරීක්ෂක ගැමුණු සාලිය පෙරේරා යන මහත්වරු ඇතුළු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, හෙද කාර්ය මණ්ඩලය සහභාගිවී සිටියහ.

ආර්. ඥාණදාස - අම්බලන්ගොඩ සමූහ

# වේනමුල්ල සුමනාරාමයේ බුදු මැදුර කඩා වැටෙන්න ඔන්න මෙන්න



අම්බලන්ගොඩ, වේනමුල්ල සුමනාරාම විහාරස්ථානයේ තිබෙන බුදු මැදුරේ වහල සහ පිට මාලයේ බිත්ති අබලන් වීම නිසා ඒවා කඩා බිඳ දමා ඇතුල් මාලයේ වහල සම්පූර්ණයෙන්ම අලුතින් සකස් කෙරිණි. පිට මාලයේ වහල සහ බිත්ති බැඳ බුදු පිළිමයක් ද තැත්පත් කිරීමට කටයුතු යොදා තිබේ.

එම කටයුතු සම්පූර්ණ කර ගැනීමට රුපියල් ලක්ෂ විස්සක පමණ මුදලක් වැය වන බවත් එම මුදල සපයා ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බැවින් බුදු මැදුරේ ඉතිරි වැඩකටයුතු අතපසු වෙමින් පවතින බවත් විහාරාධිපති දෙයියන්දර ගුණානන්ද හිමියෝ පැවසූහ. කවුරුන් හෝ දානපතියකු මෙයට ආධාර කිරීමට ඉදිරිපත් වන්නේ නම් එය මහඟු පින්කමක් බව ද එම හිමියෝ පෙන්වා දෙති.

ඒ.පී. දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

# බාල වයස්කාරිය රැගෙනගිය තරුණයා සහ මවට ඇප

වයස අවුරුදු 14ක පාසල් සිසුවියක් රැගෙන ගිය තරුණයකු සහ එයට අනුබල දුන් තරුණයාගේ මව ඌරුබොක්ක පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු මොරවක මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ශශිකා මිතුනආරච්චිගේ මෙනවිය විසින් එක් සැකකරුවකුට රුපියල් පනස්දහස බැගින් මුදලින් ඇප සහ රුපියල් ලක්ෂයේ ශරීර ඇපය බැගින් ඇප තැබීමෙන් පසු මුදාහරින ලෙසටයි.

නැවැත ලබන මාර්තු 30 දින අධිකරණයේ පෙනී සිටින ලෙසට මවට සහ පුතාට නියෝග කළාය. දැරිය වෛද්‍ය පරීක්ෂණයක් සඳහා දැරියගේ මව භාරයේදී රෝහල්ගත කරන ලෙසට පොලීසියට නියෝග කළේය. මෙසේ මුදල් සහ ශරීර ඇප මත මුදාහරිනු ලැබුවේ පිටබැද්දර සියඹලාගොඩ බටහිර පදිංචි අබේවික්‍රම බටගොඩගේ විනෝද් මධුශංක (19) සහ කෝට්ට කංකානම්ගේ රේණුකා සමන්මලී (41) පුතා සහ මවයි. පැමිණිල්ල වෙනුවෙන් පොලිස් ස්ථානාධිපති ප්‍ර.පො.ප. සමරවික්‍රම මහතාගේ උපදෙස් අනුව පො.සැ. 56012 ප්‍රේමරත්න මහතා අධිකරණයට කරුණු දැක්වීය.

හැටන් මධ්‍යම විශේෂ

# ව්‍යවසායකයන් ඇගයීමේ උළෙළක්




ලෝක කාන්තා දිනය නිමිති කර ගෙන ජාතික ඉතිරි කිරීමේ බැංකුව හැටන් ශාඛාව මඟින් ප්‍රදේශයේ කාන්තා ව්‍යවසායකයන් ඇගයීමේ උළෙළක් පැවැත්විණි.

එහිදී එම ව්‍යවසායකයන් සඳහා මුව ආවරණ, දැත් පිරිසිදුකාරක ද්‍රව්‍ය ඇතුළු ත්‍යාග කට්ටල ලබා දීම ජාතික ඉතිරි කිරීමේ බැංකුව හැටන් ශාඛා කළමනාකාර කෝසල ගුණතිලක මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි.

එහිදී එක් කාන්තා ව්‍යවසායිකාවක් සඳහා තැගි ප්‍රදානය කළ අයුරුයි මේ.

# දශක 3කක් ත්‍රස්තවාදයේ පීඩා දරාගත් ශ්‍රී ලංකාව අද සිටින තැන ගැන පුදුමයි

## රජය එක්සත් ජාතීන්ට කියයි

**මහින්ද අලුත්ගෙදර**

දශක 3කට ආසන්න කාලයක් පුරා පැවති ත්‍රස්තවාදයේ පීඩාව දරාගත් රටක් ලෙස, ශ්‍රී ලංකාව අද සිටින ස්ථානයේ සිටීම පවා විස්මය දනවන්නක් බව ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානය හමුවේ ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකාව තුළ අද වනවිට සාමය පවතින අතර හාස්‍යයට කරුණක් වන්නේ, සාමය කරදරකාරී පරිසරයක් ලෙස දකින අය ද අප අතර සිටීම බවද සාමය යනු රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් නම් වූ ත්‍රස්තවාදයේ ඉත්තන් හරහා ක්‍රියාත්මක වන ඔවුන්ගේ භූදේශපාලනික අභිලාෂයන් සඳහා පිළිකුල් සහගත කරුණක් බවද එක්සත් ජාතීන් සඳහා ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත මොහාන් පීරිස් මහතා ප්‍රකාශ කරයි.

එක්සත් ජාතීන්ගේ ගෝලීය ත්‍රස්තවාදය මැඩ පැවැත්වීමේ උපාය මාර්ගයේ හත්වන ද්විපාර්ශ්වීය සමාලෝචන රැස්වීම අමතමින් මොහාන් පීරිස් මහතා මේ බව සඳහන් කළේ යැයි විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඒ මහතා පෙන්වා දී තිබෙන්නේ ශ්‍රී ලංකාව එම අඳුරු කාල සීමාවේ සිට බොහෝ දුරක් පැමිණ තිබෙන අතර ඒ ගැන සැබවින්ම සිතා බැලුව හොත්, දශක 3කට ආසන්න කාලයක් තිස්සේ පැවති ත්‍රස්තවාදයේ පීඩාව දරාගත් රටක් ලෙස, අප අද සිටින ස්ථානයේ සිටීම පවා තරමක් දුරට විස්මයක් බවත් අපගේ රට තුළ සාමය පවතින අතර එය සාර්ථකත්වය පිළිබඳ කතාවක් බවත්ය.

හාස්‍යයට කරුණක් වන්නේ, සාමය කරදරකාරී පරිසරයක් ලෙස දකින අය ද අප අතර සිටීම බව පෙන්වාදී තිබෙන පීරිස් මහතා සාමය යනු රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් නම් වූ ත්‍රස්තවාදයේ ඉත්තන් හරහා ක්‍රියාත්මක වන ඔවුන්ගේ භූදේශපාලනික අභිලාෂයන් සඳහා පිළිකුල් සහගත කරුණක් බවද අද අප දකින්නේ වඩාත් නවීන කූටෝපායන් මඟින් ත්‍රස්තවාදීන් අපේ රජයන්, සිවිල් සමාජ සංවිධාන, පෞද්ගලික අංශයේ ආයතන, ආගමික සංවිධාන, අධිකරණය සහ මානව ක්‍රියාකාරකම්වල සමස්ත දර්ශනය වෙත ප්‍රවේශ වී ඇති බවද සඳහන් කර ඇත.

කෙසේ වෙතත්, ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මකව පවතින අතර අභියෝග ද තවමත් පවතින බවට සැකයක් නොමැති බව පෙන්වාදී තිබෙන ඒ මහතා කෙසේ වෙතත්, ශ්‍රී ලාංකික ජනතාවගේ දරාගැනීමේ හැකියාව සහ රජයේ ශක්තිමත් නායකත්වය සමඟ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ද සහයෝගය ඇතිව නීතියේ ආධිපත්‍යයට සහ මානව හිමිකම්වලට නිසි ගෞරවයක් දක්වමින් මෙම අභියෝගයන්ට අප අඛණ්ඩව මුහුණ දෙන බවට විශ්වාස කරන බව සඳහන් කර තිබේ.

මෙම ත්‍රස්ත කණ්ඩායම් අද කෙතරම් බලවත් ද යත්, අප නියෝජනය කරන ජාත්‍යන්තර සංවිධාන පවා එහා මෙහා කිරීමට, ත්‍රස්තවාදයට එරෙහි අපගේ අඛණ්ඩ සටන උදාසීන කිරීම සඳහා අපගේ මානව හිමිකම් යාන්ත්‍රණ වැනි අපගේම යාන්ත්‍රණ භාවිතා කිරීමට ඔවුන්ට ශක්තිය ඇති බවද අපට මානුෂික හදවත් ඇති බව ඔවුහු දන්නා බවද කියා තිබෙන මොහාන් පීරිස් මහතා ත්‍රස්තවාදීන් සහ අන්තවාදීන්ගේ තෝතැනි ඇති කිරීම සඳහා එවැනි මානුෂිකත්වය අවභාවිත කිරීමට අපට ඉඩ දිය නොහැකි බවද පවසා ඇත.

අපට බල්ලන් සමඟ දඩයම් කරමින් සිටිය දී, හාවා සමඟ දුවන ලෙස ද පෙනී සිටීමට නොහැකි අතර ත්‍රස්තවාදයට අපගේ පණිවුඩය හඬනගා පැහැදිලිව ලබාදිය යුතු බවද එම පණිවුඩය පැහැදිලිවම ශුන්‍ය-ඉවසීමක් වියයුතු අතර, මානව හිමිකම් සඳහා වූ අපගේ කැපවීම, දේශපාලන න්‍යාය පත්‍රයක පදනම මත ව්‍යුහගතව ඇති ත්‍රස්තවාදී වැඩසටහන් පහසුවෙන් සනාථ කිරීම සඳහා වන අවස්ථාවක් නොවන බවද සඳහන් කර තිබේ.

කෙසේ වෙතත්, ත්‍රස්තවාදයෙන් ආරක්ෂා වීම සඳහා මහජනතාවට මූලික අයිතියක් ඇති බවට බ්‍රිතාන්‍ය රජයේ හිටපු අමාත්‍යවරයෙකු වූ ඩේවිඩ් බ්ලන්කට් සාමිවරයා විසින් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව වෙත කරන ලද ප්‍රකාශය පිළිබඳ සන්දර්භය හමුවේ, ත්‍රස්තවාදයට එරෙහි අරගලය සහ මානව හිමිකම්වලට ගරු කිරීම යන කරුණු තුළ පැවතිය හැකිමෙම කදිම සමතුලිතතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා සාමාජික රටවලට ප්‍රතිචාර දැක්විය හැකි මාර්ගෝපදේශ මූලධර්ම, ත්‍රස්ත මර්දන උපාය මාර්ගය විසින් මෙම සභාවට නිර්දේශ කරන්නේ නම් එය වඩාත් සාදරයෙන් පිළිගනු ඇති අතර පහසුව පදනම් කරගෙන එක් එක් සිද්ධිය අනුව කටයුතු කිරීම බියගුළු, සම්මුතිවාදී ප්‍රතිචාරයක් ලෙස හැඟී යා හැකි බවද හෙතෙම සඳහන්කර ඇත. ත්‍රස්තවාදීන් සහ ඔවුන්ගේ සමාන අදහස් දරන සහචරයින් දිරි ගන්වනු ලබන්නේ මෙම ප්‍රවේසම් සහගත රාජ්‍යතාන්ත්‍රික පණිවිඩ හේතුවෙන් වන අතර, ව්‍යවස්ථාමයවාදයේ පාලනය අහිමි කර නොගෙන, දේශීය හා ගෝලීය වශයෙන් ත්‍රස්ත මර්දන උපාය මාර්ගයක් සඳහා ශ්‍රී ලංකාව කැපවී සිටින බවට සහතික කර ගත යුතු බවද පෙන්වා දී ඇත.

ශ්‍රී ලංකාව සියලුම ආකාරවල ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට හිතකර ප්‍රචණ්ඩ අන්තවාදය සහ එහි ප්‍රකාශනයන් හෙළා දකින අතර, අපගේ ජනතාවගේ අභිවෘද්ධිය පිණිස නව්‍ය හා ප්‍රායෝගික විසඳුම් සෙවීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාව තුළ සිය කාර්යභාරය අඛණ්ඩව ඉටුකර තිබෙන බවද හෙතෙම පෙන්වා දී තිබේ.

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය යටතේ කරනු ලබන**

**නිවේදනයයි**

සමාගමේ නම :
**ලූ ෆෝචූන් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**
ලියාපදිංචි අංකය : පීවී 106362,
දිනය : 2015 ජුනි 17 දින,
ලිපිනය : අංක 20, ඩීන්ස්ටන් පෙදෙස, කොළඹ 03.
www.agsarma.com

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.**

සමාගමේ නම :
**වෙසල්ස් ග්ලෝබල් (පීවීටී) එල්ටීඩී**
සමාගමේ අංකය : PV00233509,
ලියාපදිංචි ලිපිනය :
අංක 112/1, ශ්‍රී විමල මාවත, වලාන, පානදුර.
සංස්ථාගත කළ දිනය : 2021 ජනවාරි 23.
**සමාගම් ලේකම්**

---

හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 204/04, උලහිටියාව, මිද්දෙනිය ලිපිනයේ පදිංචි **දන්දෙනියෙ ආරච්චි ගේ කුසුමලතා** වන මම මෙතැන් පටන් **දන්දෙණි ආරච්චි ගේ කුසුමලතා** වන බව ශ්‍රී ලංකා ජනරජයේ පොදු ජනතාවටත්, මෙයින් දැනුම් දෙමි.

මෙයට : **(වෙනස් වූ නම)**
**දන්දෙණි ආරච්චි ගේ කුසුමලතා**

---

# රන් භාණ්ඩ වෙන්දේසියක්

සීමාසහිත බුත්තල සමුපකාර ග්‍රාමීය බැංකු සමිතියේ බුත්තල, ඔක්කම්පිටිය, පැලවත්ත, සෙල්ලකතරගම, කුකුරම්පොළ, මාලිගාවිල, හොරබොක්ක යන ග්‍රාමීය බැංකු වෙත 2019.12.31 දින දක්වා සහ 2020.08.31 දින දක්වා උකස් කරන ලද එහෙත් 2021.03.23 දින දක්වා බේරා නොගන්නා උකස් භාණ්ඩ 2021.03.24 දින පෙ.ව. 9.00 ට බුත්තල ග්‍රාමීය බැංකු පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේදී පැන නගින ගැටලු වෙතොත් එහි අවසාන තීරණය වෙන්දේසි කමිටුවේ තීරණය වන්නේය.

**දුරකථන අංකය - 055-2270030**
**ෆැක්ස් අංකය - 055-2273588.**

**ඩී.එම්. සුරංග සුජිත් දිසානායක,**
**සාමාන්‍යාධිකාරී,**
**සී/ස බුත්තල සමුපකාර ග්‍රාමීය බැංකු සමිතිය, බුත්තල.**
**2021.03.03**

---

ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නො. 01, ගයාන් බෝපගේ මාවත, කිරගන්දිගොඩ, හික්කඩුව ලිපිනයේ පදිංචි **මාදම්පගේ රුවන් කුමාර සිල්වා** නමින් හැඳින්වූ මා මෙතැන් පටන් **මාදම්පගේ රුවන් කුමාර ද සිල්වා** නමින් හඳුන්වනු ලබන බව උතුම් වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**මෙයට - එම්. ආර්. කේ. ද සිල්වා**

---

# ප්‍රසම්පාදන දැන්වීමයි

## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

### 42(KVA)21(KVA) ධාරිතාව සහිත සූර්ය පැනල පද්ධතියක් සවිකිරීම සඳහා

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.
(දකුණු පළාත තුළ ලංසුකරුවන් සඳහා ලංසු ඉදිරිපත් කළ හැකි අතර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලංසුකරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ)

**ටෙන්ඩර්පත් නිකුත් කරන අවසාන දිනය**

**2021 මාර්තු 24 දින ප.ව. 2.00 දක්වා වේ.**

ඔබගේ මිල ගණන් පිටපත් දෙකකින් යුක්තව ලේකම්, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව නමින් 2021 මාර්තු 25 දින ප.ව. 2.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ භාර දිය හැක.
මිල ගණන් බහාලන කවරයේ වම් කෙළවර

**"සූර්ය පැනල සවි කිරීම - 2021"**

යනුවෙන් සඳහන් කළ යුතුය.

**ටෙන්ඩර්පත් විවෘත කිරීම 2021 මාර්තු 25 ප.ව. 2.30 ට**
බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී සිදු කරනු ලබයි.

**සිරිල් මුණසිංහ,**
**සභාපති,**
**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.**

---

# බේරා නොගත් රන් භාණ්ඩ වෙන්දේසිය

පෑන් ඒෂියා බැංකුවේ සියලුම ශාඛාවල රන් ණය සහ උකස් ණය ලබා ගැනීම සඳහා උකස් කරන ලදුව 2020.12.31 දින හෝ ඊට පෙර බේරා ගැනීමට නියමිතව තිබූ එහෙත් 2021.03.19 වෙනිදා තෙක් බේරා නොගත් භාණ්ඩ 2021.03.20 වන දින සිට දිනපතා (භාණ්ඩ අවසාන වන තෙක්) පෙ.ව. 9.00 සිට

**කුරුණෑගල ශාඛාවේදී**
(නො. 22, සූරතිස්ස මාවත, කුරුණෑගල.)
ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් නිවේදනය කර සිටිමු. වෙන්දේසිය අවලංගු කිරීම හෝ කල් දැමීමේ බලය බැංකුව රඳවා ගනු ඇත.

**පෑන් ඒෂියා බැංකුව**
සැබවින්ම ශ්‍රී ලාංකීයයි

සහකාර සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම් හා පරිපාලන)
නො. 450, ගාලුපාර, කොළඹ 03.

---

# ලංසු ආරාධනයට කෙරෙන සංශෝධනයයි

**ආරක්ෂක අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා භාවිතා කළ BELL 206 JET RANGER B3 වර්ගයේ පුහුණු කටයුතු සඳහා යොදාගන්නා හෙලිකොප්ටර් යානා 04 ක් මිල දී ගැනීම**
**(ලංසු භාරගැනීමේ අවසන් දිනය දීර්ඝ කිරීම)**

1. 2020 දෙසැම්බර් 13 වන දින සිළුමිණ, සන්ඩේ ඔබ්සර්වර් සහ තිනකරන් පුවත්පත්වල පළ කරන ලද ප්‍රසම්පාදන දැන්වීමට සම්බන්ධව ලංසු භාරගැනීමේ අවසන් දිනය පහත පරිදි සංශෝධනය කෙරේ.

**ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය,**
**තැ.පෙ. 1592,**
**කොළඹ 02.**

**ගුවන් හමුදාධිපති**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**සංවර්ධන අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

# ලංසු ආරාධනයයි

## මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා ලංසු කැඳවීම
### (RDA/DPR/BUS SERVICE/2021/36)

1. **මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති**, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන්, "**මගනැගුම මහමැදුර**" සහ "**සෙත්සිරිපාය සංකීර්ණයේ**" කාර්ය මණ්ඩලයට පහත මාර්ග ඔස්සේ වසර දෙකක කාලයක් (**2021-2023**) ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා 2016 වසර හෝ ඊට පසු රථවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ බස් සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

- **අගලවත්ත - දොඩංගොඩ - කොට්ටාව - මගනැගුම මහමැදුර - බත්තරමුල්ල.**
- **බුලත්සිංහල - ගැලනිගම - කොට්ටාව - බත්තරමුල්ල.**
- **කොච්චිකඩේ - මීගමුව - ජා ඇල - පෑලියගොඩ - බත්තරමුල්ල.**
- **අවිස්සාවේල්ල - කඩුවෙල - බත්තරමුල්ල.**
- **පාදුක්ක - ගොඩගම - මාලඹේ - බත්තරමුල්ල.**
- **හොරණ - පොල්ගස්ඕවිට - කොට්ටාව - පන්නිපිටිය - බත්තරමුල්ල.**
- **කළුතර - රත්මලාන - අත්තිඩිය - මිරිහාන - පිටකෝට්ටේ - බත්තරමුල්ල.**
- **ගාල්ල - බද්දේගම - කුරුඳුගහහැතැක්ම - බත්තරමුල්ල.**
- **අලුත්ගම - වැලිපැන්න - කොට්ටාව - බත්තරමුල්ල.**
- **බණ්ඩාරගම - කැස්බෑව - කොට්ටාව - බත්තරමුල්ල.**
- **කිරිඳිවැල - පූගොඩ - දොම්පෙ - මල්වාන - බණ්ඩාරවත්ත - කඩුවෙල - බත්තරමුල්ල.**

2. ක්‍රියාත්මක කරන නියෝජිතායතනය වන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය යි.

3. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

4. ලංසුව, ලංසු කැඳවීමේ අවසන් දිනයේ සිට **ලිත් දින 91 ක්** වලංගු විය යුතු ය.

5. **රු.50,000.00** ක ලංසු ආරක්ෂණයක් සමග (**2021.08.03 දක්වා වලංගු**) ලංසු ඉදිරිපත් කළ යුතු ය. ලංසු ආරක්ෂණයක් නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ලංසු ලේඛනයේ සෑම පිටුවකම ලංසුකරුවා විසින් කෙටි අත්සන තැබිය යුතු අතර ඔහුගේ නිල මුද්‍රාව තැබිය යුතු ය.

7. **ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, 4 වන මහල, මගනැගුම මහමැදුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** පිහිටි කාර්යාලයේදී කාර්යාල වේලාවන් තුළ නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය.

8. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2021.03.12 සිට 2021.04.05** දක්වා කාර්යාල වේලාවෙන් **පැය 09.00 සිට පැය 15.00** අතර කාලය තුළ නැවත ගෙවනු නොලබන **රු.2300.00 (වැට් සහිත)** ටෙන්ඩර් ගාස්තුවක් අධ්‍යක්ෂ ජනරාල්, මාර්ග සංවර්ධන අධිකාරිය නමට ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ **ගිණුම් අංක 0000001943** ට ගෙවා **අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, 4 වන මහල, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිලදී ගත හැකිය. ලංසු ලේඛන මිලදී ගන්නා විට ගෙවීම් පත්‍රිකාවේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත අනුව, ටෙන්ඩරය ලබාගැනීමට සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී සිටිය යුතු ය.

9. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුතුව **2021.04.06** දින ප.ව. 2.00 ට පෙර **සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, මගනැගුම මහ මැදුර, අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** ලිපිනයට අතින් ගෙනැවිත් හෝ ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතු ය. කරුණාකර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර "**මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය ................. වෙත ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් කැඳවීම**" යනුවෙන් සටහන් කළ යුතු ය. **ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂප කරනු ලැබේ.**

10. ලංසු භාරගැනීම අවසන් වූ වහාම **ප්‍රසම්පාදන අධ්‍යක්ෂ කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, 4 වන මහල, මගනැගුම මහමැදුර, අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** පිහිටි අධ්‍යක්ෂ කාර්‍යාලයේදී ලංසු විවෘත කරනු ඇත. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන්ට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

11. වැඩි දුර විස්තර සඳහා කරුණාකර දුරකථන අංක **011-2884790** ඔස්සේ **අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, මාර්ග සංවර්ධන අධිකාරිය** අමතන්න.

**සභාපති**
**මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව,**
**මාර්ග සංවර්ධන අධිකාරිය.**

# නැවත ප්‍රසම්පාදන දැන්වීම

## ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වනු ලබන රෝහල් සඳහා නොපිසූ ආහාර සැපයීම - 2021

ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පහත සඳහන් රෝහල් සඳහා නොපිසූ ආහාර සැපයීම සඳහා, නැගෙනහිර පළාතේ සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ප්‍රසම්පාදනකරුවන්ගෙන්, ප්‍රාදේශීය සේඛ්‍ය සේවා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ප්‍රසම්පාදන කැඳවනු ලැබේ.

| කා. අංක | ආයතනයේ නම | ආපසු ගෙවනු ලබන තැන්පතු රු. | දේපළ සහතිකවල වටිනාකම |
|---|---|---|---|
| 01. | මූලික රෝහල – කින්නියා | 35,000 | 100,000 |
| 02. | මූලික රෝහල – මූතූර් | 35,000 | 100,000 |
| 03. | මූලික රෝහල – පුල්මෝට්ටේ | 6,000 | 75,000 |
| 04. | ප්‍රාදේශීය රෝහල – කෝමරංකඩවල | 8,000 | 75,000 |
| 05. | ප්‍රාදේශීය රෝහල – සේරුවිල | 6,000 | 75,000 |
| 06. | ප්‍රාදේශීය රෝහල – කිලිවෙට්ටි | 9,000 | 75,000 |
| 07. | ප්‍රාදේශීය රෝහල – සේරුනුවර | 6,000 | 75,000 |
| 08. | ප්‍රාදේශීය රෝහල – තිලාවෙලි | 5,000 | 75,000 |
| 09. | ප්‍රාදේශීය රෝහල – තම්පලකාමම් | 4,000 | 75,000 |
| 10. | ප්‍රාදේශීය රෝහල – තෝපූර් | 7,000 | 75,000 |

01. මේ පිළිබඳ උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ප්‍රසම්පාදනකරුවන්ට වැඩිදුර තොරතුරු ලබාගැනීම හා ප්‍රසම්පාදන ලේඛන නොමිලේ, අංක 120, උසාවි පාර, ත්‍රිකුණාමලේ යන ලිපිනයෙහි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලයේදී රාජකාරී කාලය තුළදී පරීක්ෂා කර බැලිය හැක.

02. ත්‍රිකුණාමලේ, උසාවි පාර, අංක 120 හි පිහිටි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ 10.03.2021 සිට 25.03.2021 දක්වා රාජකාරි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා, සෑම ලේඛනයක් සඳහාම නැවත නොගෙවන ගාස්තු වන රු. 1,000/– බැගින් ගෙවා, මේ සඳහා වූ ප්‍රසම්පාදන ලේඛන මිලදී ගත හැක.

මෙම ලේඛන මිලදී ගන්නා අවස්ථාවේදී පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතුය.

(අ) සෑම රෝහල් සඳහාම G 170 පෝර්මයේ, ඉහත සඳහන් දේපළ සහතික සඳහා වූ මුදල සඳහා එම රෝහල පිහිටා ඇති අවස්ථාවක හෝ කොන්ත්‍රාත්කරු පදිංචිවී සිටින විටදී ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද සහතික, මෙම සහතික, නිකුත්කළ දින සිට 06 මාස සඳහා වලංගු විය යුතුයි.

(ආ) තම ආයතනයේ ලිපි ශීර්ෂයේ, ලිපියක් ඉදිරිපත් කිරීමෙන් මෙම ප්‍රසම්පාදන ලේඛන ලබාගත හැක.

(ඇ) ව්‍යාපාර ලියාපදිංචි සහතික.

03. සෑම ඉල්ලුම්පතක්ම, 26.03.2021 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ, **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, 120, උසාවි පාර, ත්‍රිකුණාමලය"** යන ලිපිනයට භාරදිය යුතුයි. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන ප්‍රසම්පාදන ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලිපිකවරයේ / කවරයේ වම් උඩ කෙළවරේ අදාළ රෝහලෙහි නම වෙන වෙනම සඳහන් කළ යුතුයි.

අවසාන දිනදී, ප්‍රසම්පාදන වසන ලද විගස, ත්‍රිකුණාමල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දේශනා ශාලාවේදී ප්‍රසම්පාදනකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ඒවා විවෘත කරනු ලැබේ.

04. වැඩිදුර විස්තර, ත්‍රිකුණාමලේ උසාවි පාර, 120 අංකයෙහි පිහිටි, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන අංශයේ හා 026–2220103 යන දුරකථන අංක ඔස්සේ ලබාගත හැක.

05. ප්‍රසම්පාදනය සඳහා වූ අවසාන තීරණය ගැනීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුයි.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,**
**120, උසාවි පාර,**
**ත්‍රිකුණාමලය.**

# REGIONAL DIRECTORATE OF HEALTH SERVICES, JAFFNA

## INVITATION FOR BIDS (IFB)

## PROCUREMENT OF MEDICAL EQUIPMENT & SERVICE

A. The Regional Procurement Committee invites sealed bids from eligible and qualified bidders for the Supplies, Works as specified in following Table.
   01) Medical Equipment
   Bidding will be conducted through National Competitive Bidding procedure

B. To be eligible for contract award the successful bidder shall not have been blacklisted and shall meet the following requirements
   1) Bidders shall have valid business registration
   2) and business registration for supply of respective Works, Supplies and Service
   3) Regional preference and CIDA grade preference will apply as stipulated in Public Finance Circular No. 4/2016(ii)

C. Interested eligible bidders may obtain further information from the Regional Director of Health Services, Jaffna (Contact No. (021 2222278/4557 ext 20), during office hours and inspect the Bidding Documents at the same address on any working day from 9.00am to 3.00pm except 12.30 to 13.30 hours.

D. A complete set of English Bid documents may be purchased by interested bidders on submission of "Application for Bid Documents" available in this office and upon payment of a **non refundable** fee as specified in the table by cash on working days from 12.03.2021 to 05.04.2021 during 09.00 Hours to 15.00 Hours.

E. Bids must be delivered on or before 10.00 Hours of 06.04.2021 to the address given below or deposited in the tender box available at the Room of **Additional Regional Director of Finance (TPM)**. Bids will be opened immediately after the closing of the bids in the presence of the bidders or their representatives.

F. Bids shall be valid for a period 90 days from the last date fixed for receiving of Bids or any extended period and Bid Security is valid for 118 days from the bid opening.

G. Pre bid meeting will be held on 01.04.2021 at 10.00am in RDHS Office Jaffna.
   01) Table I – 10.00am

I. Procurement Committee will have the right to make final decision in regard to the acceptance of bids.

| Reference No. | Item | Qty | Non refundable fee | Bid Security |
|---|---|---|---|---|
| NP/RDHS/PSSP/ME/2021/01 | Laryngoscope Adult | 09 | 1,000.00 | 115,000.00 |
| | Laryngoscope Paediatric | 12 | | |
| | Auroscope | 10 | | |
| | Stethoscope | 17 | | |
| | BP Apparatus | 26 | | |
| | Ambu bag (Paediatric) | 06 | | |
| | Ambu bag (Adult) | 08 | | |
| | Ambu bag(Neonatal) | 02 | | |
| | Ophthalmoscope | 01 | | |
| NP/RDHS/PSSP/ME/2021/02 | CTG Machine | 06 | 1,000.00 | 110,000.00 |
| | ECG Machine | 06 | | |
| | Nebulizer | 04 | | |
| | Pulse Oxymeter | 06 | | |
| | Multiparamonitor | 02 | | |
| | Admission Bed | 06 | | |
| | Water distiller | 01 | | |
| | Sucker | 06 | | |
| | Digital Weighing Balance | 01 | | |
| | Dressing Trolley | 01 | | |
| | Instrumental Trolley | 01 | | |
| NP/RDHS/PSSP/ ME/2021/03 | Hydro Thermometer | 04 | 1,000.00 | 500.00 |
| NP/RDHS/Main RO Plant/2021/04 | Service Agreement for Maintenance of RO Plant | 03 | 1,000.00 | 20,000.00 |

**Chairperson**
**Regional Procurement Committee**
**RDHS Office, Jaffna.**

## 1964 අංක 28 රදන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනිතන් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වන වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : එච්ඩීඑස්/ එල්එන්ඩී/ 10/එෆ්/1/5

මහජන කටයුත්තක් සඳහා මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම් රජයට අත්කර ගෙන ඇත. වැඩි විස්තර සඳහා 2021 ක් වූ පෙබරවාරි මස 19 වැනි දින අංක : 2215/46 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ගැසට් පත්‍රය බලන්න.

### උපලේඛනය

| | | |
|---|---|---|
| පළාත | - | දකුණ |
| දිස්ත්‍රික්කය | - | හම්බන්තොට |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | හම්බන්තොට |
| සුළු කෝඨාසය | - | මාගම්පත්තුව |
| ග්‍රාම නිලධාරී කොට්ඨාසය | - | අංක 91, කැලියපුර සහ අංක 95, ගොන්නෝරුව |
| ගමේ නම | - | ගොන්නෝරුව සහ කැලියපුර |
| පිඹුරු අංකය | - | අ.භූ.පි. අංක 4/278/645 |
| කැබලි අංක | - | ඊ 3352 – ඊ 3430 (කැබලි 61) |
| ප්‍රමාණය | - | හෙක්ටයාර් 3.7214 |

**ප්‍රාදේශීය ලේකම්,**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**හම්බන්තොට.**

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**හම්බන්තොට.**
2021.03.03

# රැකියා ඇබෑර්තු



## දැන්වීමයි

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව නැගෙනහිර පළාත

### නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම උපදේශක - III ශ්‍රේණියට පළාත් කුසලතා පදනම මත බඳවාගැනීම සඳහා වන විවෘත හා සීමිත තරග විභාගයන් - 2021

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම උපදේශක – III ශ්‍රේණියට පළාත් කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා වන විවෘත හා සීමිත තරග විභාගයන් සඳහා සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021.03.31 දින වේ.

සියලුම අයදුම්කරුවන් අයදුම්පත් යොමු කිරීමට පෙර පහත සඳහන් නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියට පිවිස වැඩි විස්තර හා සුදුසුකම් පරීක්ෂා කර, ආදර්ශ අයදුම්පතට අනුව අයදුම්පත් යොමු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. නිසි පරිදි ඉදිරිපත් කරනු නොලබන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*www.ep.gov.lk → Exams & Results → Recruitment Exam*

**එම්.වයි. සලීම්,**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**නැගෙනහිර පළාත.**
2021.03.10

# සී/ස ලංකා නැව් සංස්ථාව

## (වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය)

## ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා පවතින ඇබෑර්තුව පිරවීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1) සාමාන්‍යාධිකාරී තනතුර - HM 2-3 (ඇබෑර්තු 01)

➢ **සුදුසුකම්** :

**බාහිර අපේක්ෂකයින්** :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / අලෙවි කළමනාකරණය / වාණිජ්‍ය / ඉංජිනේරු / විද්‍යාව හෝ ගණිතය පිළිබඳ උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් තිබීම හෝ නාවික ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබාගත් ආයතනික සාමාජිකත්වය ලබා තිබීම

සහ

පළමු උපාධිය ලබාගැනීමෙන් අනතුරුව නාවික ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක පිළිගත් සංස්ථාවක, මණ්ඩලයක හෝ වෙළඳ ආයතනයක අවම වශයෙන් අවුරුදු 18 ක සනාථ කළ හැකි පළපුරුද්ද හා ඉන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද තිබිය යුතුය.

➢ **අභ්‍යන්තර අපේක්ෂකයින්** :

සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාර තනතුරේ (HM 2-2 කාණ්ඩයේ) අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද තිබීම.

➢ **වැටුප් පරිමාණය** : HM 2-3 - 2016: රු. (98,215 - 12 x 2700 - 130,615)

සංශෝධිත වැටුප අනුව, තෝරාගනු ලබන අපේක්ෂකයා HM 2-3 වැටුප් පරිමාණයේ මූලික වැටුප රු. 98,215 /- වැටුපෙහි පිහිටවනු ලැබේ.

මෙම වැටුපට අමතරව රජය සතු ව්‍යවසායන් සඳහා ගෙවනු ලබන සියළුම අනෙකුත් අදාළ දීමනා ගෙවනු ලැබේ.

➢ **වයස් සීමාව** : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට සහ රාජ්‍ය අංශයේ ඉල්ලුම් කරුවන්ට අදාළ නොවේ.

➢ **බඳවාගැනීමේ ක්‍රමවේදය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

➢ **ප්‍රතිලාභ** :

1. සේ.අ.අ. / සේ.නි.භා.අ.
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගලික අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිත නොකළ වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනා / උත්සව ණය අදාළ පරිදි
6. සහනශීලි නියමයන් මත නිවාස ණය සහ අනෙකුත් සේවක මණ්ඩල ණය
7. සහනශීලි වාහන ණය
8. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 05/2017 අනුව වෘත්තීය දීමනාව
9. PED චක්‍රලේඛ අංක 01/2015 (i) අනුව ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

**පොදු උපදෙස්**

- සියලුම අයදුම්පත් තමා විසින් සත්‍ය බවට සහතික කළ අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සඳහා සහතිකපත්වල පිටපත් සමග උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව ලියාපදිංචි තැපෑලෙන් **2021 මාර්තු 20 වන දින හෝ ඊට ප්‍රථම, සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව, අංක. 27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් මාවත), කොළඹ 01** ලිපිනයට හෝ **hr@cscl.lk** යන විද්‍යුත් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.
- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

**සභාපති**
**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**
**අංක. 27, MICH ගොඩනැගිල්ල**
**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය), කොළඹ 01**

**වැඩි විස්තර සඳහා 071-445 2898 - මානව සම්පත් අංශය, සීමාසහිත ලංකා නැව් සංස්ථාව**

2021 මාර්තු 10 බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ
සාර භූමියේ හරිතානන්දය
පැලැස්ස
2021 මාර්තු 10 බදාදා



අත් නොහැරීම

ඡායාරූපය - පේෂල පසන් කරුණාරත්න

# සොබාදහමේ සුන්දරත්වය

## පිඹුරත්තෑව වැව



**වියළි** කලාපය වූ කලි ශ්‍රී ලංකාවේ තිබෙන දේශගුණික කලාප අතුරින් සුවිශේෂ එකකි. මන්ද, එහි ඊටම ආවේණික වූ ජෛව විවිධත්වයක් පැවතීමයි. විශාල සහ කුඩා වැව් රාශියක් තිබීම මෙයට හේතු වී තිබේ. මෙහිදී පිඹුරත්තෑව වැවට හිමි වන්නේ සුවිශේෂී තැනකි. එබැවින් කුරුල්ලන් නැරඹීමට ද වියළි කලාපය කදිම තෝතැන්නකි.

බසයෙන් හෝ දුම්රියෙන් පොළොන්නරුවට පැමිණෙන ඔබට එතැන් සිට බසයෙන්, මනම්පිටිය-අරලගන්විල-මාදුරුඔය මාර්ගයේ පැමිණ, මාදුරුඔය හමුදා පුහුණු පාසල ආසනනයෙන් බැස, පිඹුරත්තෑව වැවට පහසුවෙන් ළඟා විය හැකිය. වැවෙහි සුන්දරත්වය දැක ගත හැකි වන්නේ උදෑසන සහ සවස් කාලයේදීය. ජලජ පක්ෂීහු වැව වටා පරිසරයේ සුන්දරත්වය වැඩි කරති.

වැව වටපිටාවේ තිබෙන කඳු, නරඹන්නන්ගේ සිත් ඇද ගනී. වැව ආසන්නයට ගිය ඔබට සැන්දෑ කාලයේදී ඉර බැස්මත් සමඟ දැක ගන්නට ලබෙන්නේ අපූරු දසුනකි. වැව් ඉස්මත්තෙන් හමා එන මඳ සුළඟ ගෙන දෙන්නේ පෙර නොවූ විරූ ආස්වාදයකි. වැවේ බැස සිටින සහ වැවට පියඹා එන ජලජ පක්ෂීහු උදෑසන සහ සැන්දෑ කාලයේදී පරිසර සුන්දරත්වය වැඩි කරති. එබැවින් කුරුල්ලන් නැරඹීමට මෙම වැව් පරිශ්‍රය කදිම තෝතැන්නකි.

වැවට එන කුරුල්ලන් අතර හීන් කුරුමිණී කුරුල්ලා (Green Bee-eater), මහ කුරුමිණී කුරුල්ලා (Blue-tailed Bee-eater), කලපු කිරලා (Black-winged stilt), කොක් විශේෂ (Herons), ගෝමර පිළිහුඩුවා (Pied Kingfisher), ළැම සුදු පිළිහුඩුවා (White-throated Kingfisher), පොරෝ කෑදැත්තා (Malabar Pied Hornbill), රත් යටිමල් කිරලා (Red-wattled Lapwing), බ්‍රාහ්මණ උකුස්සා (Brahminy Kite), දියකාවුන් (Cormorants) සහ තව බොහෝ කුරුල්ලෝ ඇතුළත් වෙති. එපමණක් නොව, වැව අවට තිබෙන කැලෑබද ප්‍රදේශවල වියළි කලාපයේ දක්නට





ලැබෙන සමනල්ලු ද සිටී. එබැවින් මෙම වැව් පරිශ්‍රය පරිසරවේදීන් සඳහා කදිම ස්ථානයකි.

එහෙත්, මෙම වැව පරිශ්‍රයට පරිසරය අත්විඳින්න එන ඔබ ප්‍රවේසම් විය යුතුය. මන්ද, සවස් කාලයේදී අලි රංචු පැමිණෙන නිසාය. මිනිසුන් වශයෙන් අප පරිසරයේ කොටසක් පමණක් නිසා සතා සිව්පාවුන්ටත් එය භුක්ති විඳීමට ඉඩ දිය යුතුය. සමූහ සංචාරකයන් වශයෙන් හෝ තනිව ඔබ පැමිණිය ද, මෙම සුන්දර පරිසරය විනාශ කිරීම හෝ දූෂණය කිරීම සිදු නොකළ යුතු වේ. ප්ලාස්ටික් දවටන හෝ බෝතල් හැර යෑම කිසිසේත්ම නො කළ යුතු දෙයකි.

**සුචිත්‍ර ලලින්ත පණ්ඩිතරත්න**

# වන වියානක අසිරිය



**වන** මල් මුදා හළ සුගන්ධය වා කැටිති හා මුසුව හදවතට රිංගා ප්‍රේමණීය හැඟුම් සමුදායකින් සිත සුපහන් කරයි. හදවතට නැගෙන සෑම රුහිරු බිඳුවක්ම ප්‍රේමණීය බවෙන් නැහැ වෙයි, ඔපවත් වෙයි. මේ හරිත පාරාදීසය මැදින් මම සෙමෙන් පියවර තබමි. වන වියනේ තුරු පත් අතරින් පෙරී එන හිරු කිරණ කණිකාවකින් පණ ලබන සිතුවම් මිහිලියගේ සියොලඟ වසා ඇති සළුව හැඩ කරයි. මිහිමත තුරුලිය පැනුණු දා සිට සෑම උදෑසනකම මේ මෝස්තරයෙන් මහී කාන්තාව සිය සළුව හැඩගන්වන්නීය.

සුළඟ සිය සියුම් අතැඟිලි තුඩින් තුරුපත් මඬුලු පිරිමැද ඒ සිතුවමට සජීවී බව මුසු කරයි. මේ සෞන්දර්යය සෙනෙහසේ උල්පතයි. ඒ උල්පතින් නැගෙන සෙනෙහස සදාතනිකය. කිසිදා අමතක නොවන බව එහි ඇති සුවිශේෂ ගුණයයි. ඒ සදාතනික ආදරයෙන් ඔපවත්ව මේ හරිත මග ඔස්සේ ඔබේ පා සටහන් තැබීමට මේ හොඳම කාලයයි. ජීවිතයේ ක්ෂේම භූමිය වෙත අප රැගෙන යන්නේ ඒ උන්මාදනීය ජීවනානන්දයයි.

කළුතර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මායිම සටහන් කරන අත්වැල්තොටින් ඇරඹෙන දිගන්න වෙත දිවෙන මග සංචාරයට තෝතැන්නකි. කළුකන්දාව මේ මගෙහි හමුවන අවසන් ගම් පියසයි. අද එය සෙමෙන් සෙමෙන් ඊට ඔබ්බෙන් ඇති මහා වන සාගරය විසින් ගිල ගනිමින් පවතී. ඒ නිසාම එහි වෙසෙන මිනිසුන් මෙන්ම පරිසරයෙහි ද ඇත්තේ සුවිශේෂ බවකි. එහි හද ගැස්මෙහි ඇති වෙනස ඉව කරන්නට මම ඔබට ඇරයුම් කරමි.

අත්වැල්තොට යන නාමයම මේ සුවිශේෂ බවට ඉඟි සපයයි. එදා මේ වන මණ්ඩියෙහි විසූ අලි ඇතුන් අල්ලා වෙන්දේසියේ විකුණා තිබේ. මේ අලි වෙන්දේසිය පවත්වා ඇත්තේ අද අත්වැල්තොට හංදිය ලෙස හඳුන්වන ස්ථානයේදීය. අලි වෙන්දේසිය සඳහා රැගෙන විත් ඇත්තේ වන බිමෙන් සපයා ගන්නා ලද වැල් මගින් යොත් සාදා එකට බැඳීමෙනි. එදා ඇතුන් වැලින් බැඳ රැගෙන ආ තොට ඇත් වැල් තොට බවට පත්ව පසුව අත්වැල් තොට සේ ජනවහරට එක්ව ඇත. සකු බස ප්‍රගුණ කළෝ ඊට හස්ති ලතා තීර්ථය යනුවෙන් නම් තැබූහ.

මහ හොර ගස් පහ පසු කර තවත් මයිල කිහිපයක් ඉදිරියට යත්ම මුණ ගැසෙන්නේ රුසිගල ආරණ්‍ය සේනාසන ප්‍රවේශයයි. එදා ඍෂීන්වහන්සේලා විසුවා යැයි සැලකෙන නිසා මෙය "ඍෂි ගල" ලෙස නම් ලබා පසුව උච්චාරණයේ පහසුව පිණිස රුසිගල යනුවෙන්



භාවිත වූ වග ජනප්‍රවාදයෙහි එයි. මේ ශාන්ත වන බිම මැද එදා මෙහි විසූ ඍෂීන්වහන්සේ කොතරම් නිසංසලත්වයක් අත්විඳින්නට ඇත්ද?

ඍෂිගල පිවිසුමෙන් ඔබ්බට හමුවන හෙල් දැත්ත මේ ගමනේදී හමුවන දුෂ්කර ඉසව්වකි. වැසි සමයන්හිදී මේ මගෙහි ගලා එන දිය පහරට සේදී ගොස් ඇති මේ මඟ දෙපස වන ගැබෙහි සොඳුරු බව නෙත තවරා ඒ දුෂ්කර මාවතෙහි නොනැවතී ඉදිරියට එන්න යැයි අපට ඉඟි කරයි. සසර පුරුදු නොවෙනස්ව රකින බිඟු කැල එක් මලෙකින් අනෙක වෙත පියඹති. උන්ගේ ගුමු ගුමු නද උණුසුම් හැඟුමකට හදවතට ඇරියුම් කරයි. ප්‍රේමයේ සදාතනික සුන්දරත්වය සිතෙහි අනුරාව නංවයි. සංසාර ගමනේ පොදි බැඳ කරපින්නා ගෙන පැමිණෙන බර පොදි මේ ක්ෂේම භූමියේදී නොදැනීම ඔබෙන් ගිලිහෙයි. නිමේෂයකට සිත සමාධි ගත වෙයි. ගත සුවපත් වෙයි. භාවනාව සඳහා වෑයමින් දරන සියලු උත්සාහයන් එය නිෂේධනය කරයි. එහෙත් නොදැනීම ඔබේ සිත සියලු හැඟුමින් මිදී එක් අරමුණකට පැමිණ ක්ෂණයක් නොවෙනස්ව පවතී. සැබෑ භාවනාවේ පරම සුවය එයයි. මේ වන පෙත ඔබට තිළිණ කරන අමරණීය සිහිවටනය ඒ සුපහන් නිමේෂයයි. භාවනාවේ පරම සුන්දරත්වයයි.

හෙල්දැත්තේ සිට ඉදිරියට වැටී ඇත්තේ තැනිතලා මඟකි. දෙපස වැසී ඇති තුරු ගොමුවෙන් සුසැදි මේ හරිත උමඟ ඔස්සේ ඉදිරියට යෑම පාරාදීසයකට පා නැගීමක් බඳුය. අපගේ පැමිණීම පිළිබඳව සිය වනගත මිතුරන්ට පවසන්නට මෙන් 'බ්ලූ බොට්ල්' සමනලයෙක් මේ හරිත මාවතේ වේගයෙන් ඉදිරියට පියා සලයි.

**දුමින්ද ජයවර්ධන**





පළාත - **වයඹ**
දිස්ත්‍රික්කය - **පුත්තලම**
ප්‍රා.ලේ. කොට්ඨාසය - **ආරච්චිකට්ටුව**

# සුන්දර ආනවිලුන්දාව



ශ්‍රී ලංකාවේ පිහිටි අන්තර්ජාතික රැම්සා තෙත් බිම් තුනෙන් දෙවැනි වරට ප්‍රකාශයට පත් කරන ලද තෙත්බිම වන්නේ ආනවිලුන්දාවයි. එය පිහිටා ඇත්තේ වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම කොළඹ ප්‍රධාන මාර්ගයේ ය. ලෝක සංරක්‍ෂණ සංගමය මගින් මෙහි ජෛව විවිධත්ව, පාරිසරික සහ තෙත් බිම භාවිතය පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමෙන් පසු 2001 අගෝස්තු මස 03 වැනිදා මෙය අන්තර්ජාතික රැම්සා තෙත් බිමක් වශයෙන් ප්‍රකාශයට පත් කෙරිණි.

ඒ සමගම අභය භූමියක් ලෙසින් ද නම් කර තිබිණි. පසුව වන ජීවී හා වන සංරක්ෂණ යන ආයතන ද්විත්වයේ එකතුවෙන් අදාළ අභය භූමිය තුළ 2000 වසරේ කඩොලාන ප්‍රතිස්ථාපනය කරමින් එය කඩොලාන සංරක්ෂිත කලාපයක් බවට පත් කිරීම ද ආරම්භ කර තිබේ.

එවකට ආනවිලුන්දාව ප්‍රදේශය ආශ්‍රිතව ලන්දේසීන්ගේ විවිධ ක්‍රියාකාරකම් සිදු වූ බව පෙනෙන්නට තිබේ. පුත්තලම කලපුව ආශ්‍රිතව ලන්දේසීන්ගේ ප්‍රධාන නැංගුරම් පොළ පිහිටා තිබූ අතර, රට තුළ බඩු ප්‍රවාහනය සඳහා ඔවුහු පුත්තලම සිට කොළඹ කැලණි ගංගාව දක්වා කෘත්‍රිම ඇළ මාර්ගයක් තැනූහ. මෙම ඕලන්ද ඇළ (පාරු ඇළ) අද ආනවිලුන්දා අභයභූමියේ එක් මායිමක් බවට පත්ව තිබේ.

එකල මෙහි වන අලි බහුලව සිටි අතර, “අලියා එරුණු වළ” යන අර්ථ කථනයට ද්‍රවිඩ බසින් “ආන උලන්දඩු” ආනඋලන්දන් වී පසුව ආනවිලුන්දාව වූ බවයි පැරැණියන් පෙන්වා දෙන්නේ.

මිරිදිය තෙත් බිම්, වෙරළබඩ (කිවුල් දිය) තෙත් බිම් හා තෙත් බිම් ආශ්‍රිත භෞතික හා කෘෂිකාර්මික තෙත්බිම් වශයෙන් පරිසර පද්ධති තෙවර්ගයක් ලෝක සංරක්‍ෂණ සංගමය මගින් මෙහි අධ්‍යයනයට ලක් කර තිබේ.

මිරිදිය තෙත් බිම් යටතේ වැව්වල පාවෙන හා අනෙකුත් ජලජ වෘක්‍ෂලතාදිය ද, වගුරු බිම් හා ඒ ආශ්‍රිත කලකදී ජලයෙන් යට වන තෘණ භූමි ද, පන් ශාක සහිත වගුරු බිම් ද අර්ථ දැක්වේ.

කිවුල් දිය පරිසර පද්ධති යටතේ කඩොලාන, ලවණහැල් ආශ්‍රිත ජලයෙන් යට වන තෘණ බිම්, පාරු ඇළ යනාදිය අයත් වේ.

වැව් බැම්ම ආශ්‍රිත වෘක්‍ෂලතා, ජලයෙන් යට වන කුඩා වනාන්තර, ලඳු කැලෑ, තෘණ බිම්, ඇළ මාර්ග ආශ්‍රිත වෘක්‍ෂ ප්‍රජා, කුඹුරු හා අතරමැදිව පිහිටි වෘක්‍ෂලතා, ගෙවතු ශාක යනාදිය භෞමික හා කෘෂිකාර්මික පරිසර පද්ධති යටතට ගැනේ.

අභය භූමිය තුළින් ශාක විශේෂ 264 ක් හඳුනාගෙන ඇත. මේ අතුරින් විශේෂ ශාක වර්ග 110 ක් වන අතර, පඳුරු විශේෂ 54 ක් මෙන්ම පැළෑටි විශේෂ 68 ක් සහ වැල් වර්ග 30 ක් හා අපිශාක දෙකක් ද වාර්තා වේ.

මුළු ශාක විශේෂ අතුරින් 22 ක් ජලාශ්‍රිත ශාක වේ. ඖෂධ ශාක ද බහුලව හමු වන අතර, මෙහිදී හමු වන පුපුළු ශාකය ශ්‍රී ලංකාවට ආවේණික ශාකයක් වන අතර, මෙය ඉපැරැණි හෙළ වෙදකම අනුව පැරැණි තුවාල සඳහා කදිම ඖෂධීය ශාකයක් බව ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ සඳහන් වේ. දේශීය තර්ජනයට ලක් වූ කෙකටිය විශේෂ, හා කළුවර ශාකය ද මෙහිදී වාර්තා වේ.

අභය භූමිය තුළින් පෘෂ්ඨවංශික ජීවීන් විශේෂ 274 ක් වාර්තා වන අතර, මෙයින් 237ක් දේශීය විශේෂය. විශේෂ 37ක් පර්යවනික පක්‍ෂීහුය. සමස්තයෙන් විශේෂ 10ක් ශ්‍රී ලංකාවට ආවේණිකයෝය. 19ක් දේශීය වශයෙන් තර්ජනයට ලක් වූ විශේෂ ලෙස සැලකේ.

මෙහිදී වාර්තා වන මිරිදිය මත්ස්‍යයින් ගණන 29කි. කිවුල් දිය මත්ස්‍ය විශේෂ 18ක්, උභයජීවී විශේෂ 9ක්, උරග විශේෂ 30ක්, වාර්තාවේ. මෙයින් මගුරා, දංකොළ පෙතියා, ඉපිලකඩයා, ලංකා බැඳි මැඩියා, සහ සිකනලුන් විශේෂ 2ක් ශ්‍රී ලංකාවට ආවේණික වේ.

ආනවිලුන්දාව දේශීය පක්‍ෂි විශේෂ 131කට හා පර්යවනික පක්‍ෂි විශේෂ 37කට වාසස්ථාන හා ආහාර බිමක් ලෙස වැදගත් සේවාවක් ඉටු කරයි. ශ්‍රී ලංකාවට ආවේණික වලි කුකුළා, අළු කෑඳැත්තා, හීං කොට්ටෝරුවා යන පක්ෂි විශේෂ මෙහි දක්නට ලැබේ.

පර්යටනික සමයේදී ජලාශ්‍රිත පක්ෂීන් විශාල ප්‍රමාණයක් මෙහි දක්නට ලැබෙන අතර සුදු කොකුන්, දියකාවන්, විවරතුඩුවා, නිල්කිතලා, කොරවක්කා, බළල් සේරා, සිලිබිල්ලා, වැලිඔලෙවියා, කහකරමල් කිරලා, රත් කරමල් කිරලා, පැස්තුඩුවා, පාත්තයෝ, වල්තාරාවෝ ප්‍රධාන වෙති.

මීට අමතරව ක්ෂීරපායි විශේෂ 20ක් පමණ මෙහි ජීවත් වන අතර මේ අතර තර්ජනයට ලක් වූ විශේෂ වන්නේ හඳුන් දිවියා, වල් බළලා, උණහපුළුවාය. ලංකාවට ආවේණික රිළවා ද මෙහි සුලබව සිටියි.

තවද, සමනල විශේෂ 74ක් මෙහි වාර්තා වන අතර දේශීය වශයෙන් තර්ජනයට ලක් වූ සමනල විශේෂ 12ක් ඒ අතර වෙති.

සංචාරක මෙන්ම පර්යටන පක්ෂීන්ගේ තෝතැන්නක්ව ඇති මෙම අභය භූමිය තුළ දැනට රතු දත්ත පොතේ වඳ වී යෑමේ තර්ජනයට ලක්ව ඇති දේශීය කුරුලු විශේෂ රැසක්ගේ ප්‍රධාන වාසභූමිය බවට ඇත්තේ මෙමු අභය භූමියයි.











අලංකාර වැව් පද්ධතිය ආශ්‍රිතව පවතින ජෛව විවිධත්වය ස්වභාව දහමට අපූර්වත්වය එක් කරන්නේ විවිධ වූ විසිතුරු මසුන්ගෙන් සේම ජලජ ශාක ආශ්‍රිතව ජලයේ ජීවත් වන්නා වූ කුරුලු විශේෂ හේතුවෙනි.

බටහිර දිසාවට වන්නට පිහිටා ඇති ස්වාභාවික හැමිල්ටන් ඇළ හා බැඳුණු ධීවර කර්මාන්තයට මහත් රුකුලක් ලෙස ස්වාභාවික කඩොලාන පරිසර පද්ධතිය අමිල මෙහෙවරක් මෙන්ම සෘජු දායකත්වයක් නිරායාසයෙන්ම ලබා දෙයි. ඉස්සන්, කකුළුවන් මෙන්ම මත්ස්‍යයන්ගේ අභිජනන ක්‍රියාවලියට සෘජු දායකත්වයක් මෙම ස්වාභාවික කඩොලාන සම්පත මගින් සිදු වන බව පැවසේ.

මනදොළ පිනවන සොඳුරු පාරාදීසයක් බඳු, නිහැඬියාවෙන් පිරී ගිය මෙම හුදෙකලා වන කොමළිය ඇගේ පහස ලැබීමට නන් දෙසින් පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ සිත්වලට ලබා දෙන්නේ ඉමහත් ආස්වාදයකි.

ගිරි ශිඛරයේ සිට හමා එන මඳ පවනට සිලි සිලි රාවය දෙමින් සලිත වන අතුපතුර විහිදුන වනස්පතීන්ගේ පිහිටීම හේතුවෙන් පවතින ගොම්මන් අඳුර ආලෝකයට සාප කරන්නාක් මෙන් එහි යන අයට දැනෙන්නේ පර්වතයකින් වසා ගත් ලෙනක් තුළට ඇතුළු වූවාක් මෙනි.

ඝන වලාකුළුවලින් වැසී වැහිබර කාලගුණයකට අත වනමින් සිටින්නාක් මෙන් අඳුරු වනය තුළ ඇත්තේ පුදුමය දනවන අමුතුම අකාරයේ මිහිරි අත්දැකීමක් සමග දිගු නිහැඬියාවකි.

ගොදුරු ලොබින් ඒ මේ අත සැරිසරන පක්ෂීන්ගේ කිචි බිචි නාදය හද මුසපත් කරවන සුලුය. සත්ත්ව ලෝකයේ විස්මිත සතුන්ගේ නිර්මාණාත්මක කැදලි අතරින් කැපී පෙනෙන්නා වූ වඩු කුරුල්ලාගේ විස්මිත නිර්මාණ වනය සින්නකරයට නතුකර ගෙන ඇත්තාක් මෙන් බැලු බැලු අත දිස් වේ.

වැව් අතරේ ඒ මේ අත පාවෙමින් මසුන් දඩයමේ යන පක්ෂීන් අතරේ දියකාවා ඉන් ප්‍රමුඛස්ථානයක් ගනී. රැළි පිට රැළි නගන ජලයේ ලස්සන පෙන බුබුළු නැගේ කියන්නා සේ පෙණ බුබුළු මතු කරමින් දියේ පිහිනා යන මසුන්ගේ විස්මිත රැඟුමන් සිත් මන්මත් කර වන සුලුය.

'කාලය වනය සියල්ල සඟවා ගනී' කියන්නා සේ මෙහි යන එන ඕනෑම අයකුට කාලය පිළිබඳ එතරම් සැලකිල්ලක් නොදක්වන තරමට නැරඹිය හැකි දේ කියා නිම කර නොහැකි තරම්ය. හිම්දිරි උදයේ පායා එන අරුණැල්ලේ රඟ දෙන මොනර රැඟුමෙහි අගය අමතක කරන්නට නොහැකිය. අති සුන්දර වූ මොනර රැඟුම් තැනින් තැන වනයේ සුන්දරත්වය දෙගුණ තෙගුණ කරවයි. දිවා කාලයත් රාත්‍රී කාලයත් එකම අඳුරකින් වසා ගෙන ඇති ෘමම අභය භූමිය තුළ සෑම සතෙකුම නිදහසේ සැරිසැරීම ඔවුන්ටම ආවේණික සම්ප්‍රදායකින් යුක්තය.

වෛවර්ණයෙන් හැඩ ගැන්වුණ අත්තටු සලමින් ඉගිලෙන සමනලුන් වනයට එකතු කරවන්නේ අමුතුම ආකාරයේ විචිත්‍රත්වයකි. විදේශීය රටවල සිට පැමිණෙන බොහෝ සංචාරකයන් සමනලුන් පිළිබඳ ගවේෂණයට එක්වීම පැහැදිලිව සඳහන් කළ යුතුය.

ගුම්...ගුම්... නද දෙමින් වනයේ වන මල්වල පැණි බුදින මී මැස්සන්, බඹරුන් සේම දෙබරුන්ගේ එකමුතුකම ගජමුතුවලට එහා ගිය බවක් දක්නට ලැබෙන්නේ ඔවුන්ගේ වද තුළදීය.

කෙමෙන් කෙමෙන් ඉර අවරදිගින් බැස ගොම්මන් අඳුරට එළියට එන හඳුන් දිවියා, වල් බළලා සේම හිවල්ලු ද රාත්‍රී කාලය පුරාවටම වනයේ රජ කරති. රාත්‍රිය ඔවුන්ගේ ආධිපත්‍යයට නතු කර ගනිමින් වනය තුළ රංචු වශයෙන් ද දැක ගත හැකිය.

මිනිසාට මෙන්ම සෑම සත්ත්වයකුටම ජීවත් වීමේ අයිතිය ඒ අකාරයෙන්ම ලැබිය යුතුව තිබේ. ඒ අයිතිය වෙනුවෙන් මිනිසුන් උද්ඝෝෂණ, අරගල කරමින් මෙවැනි සුන්දර පරිසර පද්ධති වනසා ඉඩම් අත්පත් කර ගැනීමට වෑයම් දරද්දී මොවුන්ගේ අයිතිය වෙනුවෙන් කතා කිරීමට මොවුන්ට නොහැකි නිසා ඒ හිංසා පීඩා උපේක්ෂා සහගතව විඳ දරා ගෙන සිටින මෙවැනි සතුන්ගේ හෙට දිනය සුරැකිය යුතුව තිබේ.

කේ. ප්‍රියංකර කළුපහන




# අපේ අලවල යස රස ගුණ



හිඟුරල




රාජඅල

"කලා රසය තිබුණත් නියගලා මලේ - මළානේද කෑවොත් නියගලා අලේ" යනු ප්‍රසිද්ධ කවි දෙපදයකි. ඉන් කියැවෙන්නේ ලොව තිබෙන හලාහල විෂ සහිත අල වර්ගයන් ගැනය. ලොව පිපෙන මල් වර්ග අතර ඉතාම සුන්දර මලක් ලෙස නියගලා මල හඳුනාගත හැකිය.

සොබාදම් මාතාව වෙතින් මිහිලිය ලද අගනා දායාදයක් ලෙස 'අල' හඳුන්වා දිය හැකිය. ලෝකයේ විවිධ දේශගුණික තත්ත්වයන් යටතේ පොළොව යට බහින අල වර්ග ඉතා විශාල ප්‍රමාණයක් තිබේ. මින් මනුෂ්‍යයන් ආහාරයට ගත හැකි අල වර්ග මෙන්ම හලාහල විෂ සහිත අල වර්ග ද හඳුනා ගෙන තිබේ. ආහාරයට ගත් විට තමන් කවුද අනෙකා කවුද යැයි හඳුනාගත නොහැකි ලෙස සිහිය විකල් වෙන බව කියන 'නඟා මැරූ අල' යනුවෙන් ද හැඳින්වෙන අල වර්ගයක් ද ඇති බව පැවසේ.

අල වර්ග අතරින් ලොව පුරා වැඩියෙන්ම ජන පරිභෝජනය සඳහා වගා කරනු ලබන්නේ 'අර්තාපල්' බවට වාදයක් නැත. අප කවුරුත් දෛනිකවම වාගේ රස බලන අල වර්ගය අර්තාපල්ය.

වනචාරී ගෝත්‍රිකයන් මෙන්ම අප රටේ වැදි ජනයාත් වැඩිපුරම ආහාරයට ගන්නේ 'කටුවල' නොහොත් 'කටු අල' නම් වූ, ඇතැම් විට එක අල වැලක ගෝණියක ඇසිරිය හැකි තරම් විශාල තනි අලයක් බහින බව කියැවෙන ඉතා රසවත් පෝෂණීය අල වර්ගයය.

ශ්‍රී ලංකාවේ මිනිසුන් ආහාරයට ගන්නා අල වර්ග අතර සුදු සහ දම් යන පාට දෙකක් සහිත ප්‍රභේද දෙකක් ඇති 'රාජ අල' වඩාත් ජනප්‍රිය බව පෙනේ. ගර්භිණී මාතාවන්ට මුල් අවධියේදී ආහාරයට ගැනීමට සුදුසු බවට ගැමි ජනතාව විශ්වාස කරන 'හිඟුරල' ද රසවත් අල වර්ගයකි. මෙය හැරුණු විට මෙරට ආහාරයට ගන්නා අල වර්ග අතර කිරි අල, බතල, සුදු සහ රතු බුත්සරණ අල, කිරි කොඩොල්, ඉසුරු දේසාල, ඉන්නල, මයියොක්කා, රාබු, කැරට්, බීට්රූට්, තුන්මස් අල ප්‍රධාන තැනක් ගනී.

විනෝදයට තම්බාගෙන වට වී රස බලන අල වර්ගයක් ලෙස ආටිචෝක් හඳුන්වා දිය හැකිය. බිම අල බහින රාජ අල වැල ඉහළ ගිය විට වැලේ එල්ලෙන උඩල ද සැබවින්ම රස ගෙන දෙන අල වර්ගයන්ය. රාබු, කැරට්, බීට්රූට්, හොඩල, තුන්මස් අල මෙන්ම බිත්තර වැනි 'ආටිචෝක්' ද මේ අතර වේ.

ලෝකයේ වඩාත්ම පෝෂණීය අල වර්ගයක් ලෙස සැලකෙනුයේ 'ජින්සෙන්' හෙවත් 'මැන්රූට්' නම් වූ අල වර්ගයය. මේවා

වාජීකරණ ගුණයෙන් යුතු බව ප්‍රකටය. චීනයේ කොරියාවේ සහ ජපානයේ මේවා බහුල ලෙස වගා කරනු ලබයි.

අල වර්ගවල පෝෂණ ද්‍රව්‍ය රැසක් අඩංගු වන අතර ශක්තිජනක ආහාරයක් ලෙස ද සැලකේ. මේ අතරින් කිඩාරම් අල අර්ශස් රෝගයට ගුණදායක වේ. අප රටේ දඹල කරල් ව්‍යංජන සඳහා බහුලව භාවිත කළ ද මැලේසියාව වැනි රටවල දඹල වගා කරනු ලබන්නේ අල ලබා ගැනීම සඳහාය. ඒවායේ පෝෂණ ගුණය අධික බව කියැවේ.

නිමල් විජයතුංග

දිනමිණ සශ්‍රීක
ශූර ගොවියන්ගේ රාජධානිය





# කඩොලාන ආශ්‍රිතව හැදෙන රසවත් පලතුරු කිරල

ශ්‍රී ලංකාවේ සෑම කඩොලාන ප්‍රජාවකම කිරල දැකිය හැකිය. මෙහි ව්‍යාප්තිය ශුෂ්ක, වියළි හා තෙත් කලාපීය යන දේශගුණික කලාප තුනටම අයත් කඩොලාන ප්‍රජාවල පැතිරී ඇතත් බහුලව ඇත්තේ තෙත් කලාපයේ කඩොලානවලය.

මීටර් 2 -20 ක් පමණ උසට වැඩෙන ශාකය අයහපත් කාලගුණ ප්‍රදේශ තුළ මීටර් 02ක් පමණ උසට වැඩේ. එසේම කලමැටිය කඩොලාන ප්‍රජාවේ මීටර් 20ක් පමණ උසට වැඩුණු ශාක දැකිය හැකි අතර එකම විශේෂය සහිත ශාක ලෙස හෙක්ටයාර් 2-3ක කොටසක විහිදී පවතී. සමහර ශාකවල අධික ලෙස අතු බෙදෙන අතර, අතු බොහෝ විට පහළට එල්ලී වැටුණු ආකාරයක් දැකිය හැකිය. පත්‍ර සම්මුඛ ව පිහිටන අතර තරමක් මාංශල ගතියක් දක්වයි. නිපත්‍ර නැත. පත්‍ර නාරටිය කුඩාය. මේරූ පත්‍ර දණ්ඩාකාර හෝ ප්‍රත්‍යණ්ඩාකාරය. ළපටි පත්‍ර ලංසාකාර වන අතර, පත්‍ර නාරටිය රෝස පාටය. පත්‍ර අග බොහෝ විට පත්‍ර ඇතුළට කර කැවී ඇත. ශාකයේ පාදස්ථයේ තරමක් ඇටවුම සහිතය. හොඳින් වර්ධනය වූ මූල පද්ධතියක් ඇත. පොළොවට සමාන්තරව වර්ධනය වන තිරස් මුල් ශාකයේ සිට මීටර් 5-10 පමණ ඈතට වර්ධනය වේ. මේ මුල්වලින් සෘණ ගුරුත්වාකර්ෂී වායුධර මුල් ඇති වේ. මේවා මීටර් 1-2ක් පමණ දිගට වැඩෙන අතර, පළල සෙ.මී. 10ක් පමණ වේ. ශාකයේ කඳ කොළ පාටට හුරු දුඹුරු පාටය. බොහෝ විට කඳේ මතුපිට පොත්ත කුඩා කොටස්වලට ගැලවේ. මේ නිසා කඳ මතුපිට පොත්ත කුඩා කොටස්වලට කැඩී ගොස් ඇති ආකාරය පැහැදිලිව පෙනේ.

පුෂ්ප විශාලය. සෙ.මී 3-6 පමණ පළල් වන අතර, ඉතා පැහැදිලිව දක්නට ලැබේ. අතුවල පත්‍ර අතර හෝ කුඩා අතුවල අංකුරවලින් හෝ පුෂ්ප තනි තනිව ඇති වේ. සමහර විට 2-3ක් වුවත් එකට ඇති වේ. මනි පත්‍ර 6-8ක් පමණ ඇත. කොළ පාටය. මනි පත්‍ර පාදස්ථයෙන් එකතු වී පුනීලයක් වැනි කොටසක් සාදයි. මනි පත්‍ර අග කොටස් නිදහස්ව ඇති අතර, පුනීලාකාර මනියෙන් සෙ.මී. 2ක් 3ක් ඉහළට දික් වී පවතී. කුඩා දිගටි රතුපාට දළ 6-8ක් පමණ ඇත. මනිපත්‍ර සමඟ ඒකාකාරීව පිහිටයි. රේණු විශාල සංඛ්‍යාවක් ඇත. මනිය තුළ රේණු පාදස්ථව ගිලී පවතී.

ඵලය කොළ පාටය. මේරූ ඵලය මතුපිට ආවරණය දිලිසෙන සුළු ස්වභාවයක් පෙන්වයි .සෙ.මී 4-8ක් පමණ පළලය. මනි පත්‍ර ඵලය අවස්ථාවේ ද පවතී. ඵලය මාංසලය. බීජ විශාල ප්‍රමාණයක් ඇත. මේරූ ඵලය මොළොක් ගතියක් දක්වන අතර ආවරණය කහ පාටට හුරු ළා කොළ පාටක් ගනී. මෙම ඉදුණු ඵලය විවිධාකාරයට ආහාරයට ගනු ලැබේ.

කිරල ගෙඩි පලතුරක් ලෙසට භාවිත කරයි. විශේෂයෙන් දිවුල් කිරි සාදා ගන්නා ආකාරයට කිරල ගෙඩිවලින් රසවත් පානයක් සාදා ගත හැකිය.දර හා දැව සඳහා ද භාවිත කරයි. සමහර ප්‍රදේශවල මීටර් 10-20ක් උස්ව වැඩී ඇති ගස්වල දැව වටිනාකමක් ඇත.

ඒ.පී. ගුණරත්න



# ඉඟුරු පල්පයක් සකස් කර ගන්නේ මෙහෙමයි

බොහෝ ප්‍රදේශවල මේ ඉඟුරු අස්වනු නෙළන අවදියයි. එහිදී මේරූ පසු අස්වැන්න නෙළීමෙන් ගුණාත්මක බවින් ඉහළ වැඩි අස්වැන්නක් නෙළා ගත හැකිය. දේශීය ඉඟුරු නැතිනම් සිංහල ඉඟුරු වර්ගය සිටුවා මාස 9-10ක් ගත වන විට ද, චීන ඉඟුරු වර්ගය සිටුවා මාස 8 ක් ගත වන විට ද අස්වැන්න මේරීම සිදු වේ. මේරූ පසු අස්වනු නෙළන විට ඉඟුරු පඳුරේ කොළ කහ පැහැ වී වියළී ගොස් තිබෙනු පෙනේ. ඉඟුරු අස්වනු නෙළන අවධිය අවසාන නිෂ්පාදිතය අනුව වෙනස් විය හැකිය. වියළි ඉඟුරු, ඉඟුරු කුඩු, සිද්ධි ඉඟුරු හා බීජ ඉඟුරු ආදිය සැකසීම සඳහා මේරූ පසු අස්වැන්න නෙළීම කළ යුතුය. ඉඟුරු මේරීමෙන් පසු අස්වැන්න නෙළීම පමා වන විට අල කුණු වීමට හා නැවත පැළ වීමට හැකියාව තිබේ. අගය එකතු කළ නිෂ්පාදන සිදු කිරීමේදී ඉඟුරුවල කෙඳි ගතිය අඩු වීම වඩාත් සුදුසුය. නොමේරූ අවස්ථාවේ අස්වැන්න නෙළීම මඟින් කෙඳි ගතිය අඩු ඉඟුරු ලබා ගත හැකි වන අතර චීන ඉඟුරු අගය එකතු කළ නිෂ්පාදන සිදු කිරීමට වඩාත් සුදුසුය.

ඉඟුරු වැඩි අස්වැන්නක් තිබෙන කාලයට පල්පයක් සාදා කල් තබා ගැනීම වඩාත් සුදුසුය. මෙය ව්‍යංජන, මස් වර්ග පිසීමේදී සෘජුවම භාවිත කළ හැකිය. මෙහිදී ඉඟුරු පල්පය ආකාර දෙකකට සකස් කර ගත හැකිය. ඒනම් තනිකර ඉඟුරු පමණක් යොදා ගෙන සහ ඉඟුරු සුදු ලූණු මිශ්‍රණයක් ලෙස පල්පය සැකසීමයි. මෙහිදී පහත පියවර අනුගමනය කළ යුතුය.

## ඉඟුරු අස්වනු නෙළීම

ඉඟුරු අස්වනු නෙළන අවස්ථාවේදී පසේ ප්‍රමාණවත් තෙතමනයක් තිබීම වැදගත්ය. එසේ වූ විට පසේ තරමක් තෙතමනයක් පවතී නම් වඩාත් පහසුය. එම අවස්ථාවේදී උදලු මුල්ලුවක් භාවිත කිරීමෙන් අලවලට හානි නොවන සේ ගලවා ගත හැකි වනු ඇත. අස්වැන්න නෙළන විට මුළු පඳුරේම අස්වැන්න එකවර නෙළ, අල වෙන් කර ගැනීම සිදු කළ යුතුය. ගලවන ලද ඉඟුරුවල පස් ඉවත් කර මුල් කැපිය යුතුය. ඉන්පසු පස් හා අපද්‍රව්‍ය ඉවත් වන තුරු හොඳින් අතුල්ලා සෝදන්න. පසුව ජලය බේරී ඉවත් වන ලෙස පවනේ වියළා ගන්න.

සෝදා ගත් ඉඟුරු පැය 12 ක් වතුරේ ගිල්වා තබන්න. එවිට පොතු ඉවත් කිරීම පහසු වේ. පොතු ඉවත් කරන යන්ත්‍රය හෝ උණ පතුරක් භාවිතයෙන් හෝ පොතු ඉවත් කරන්න. ඉන්පසු එම ඉඟුරු සෝදා ගන්න. මෙහිදී කිසිවිටකත් යකඩ මිශ්‍ර උපකරණ ඉඟුරු පොතු ඉවත් කිරීමට යොදා නොගත යුතුය. පිහියක් යොදා ගනී නම් සුදු යකඩවලින් තැනූ පිහියක් විය යුතුය.

ඉන්පසු ඉඟුරු 2% සිට්‍රික් අම්ල ද්‍රාවණයක ගිල්වා තම්බා ගන්න. 2% සිට්‍රික් අම්ල ද්‍රාවණය සාදා ගන්නේ ජලය ලීටර් 1කට සිට්‍රික් අම්ලය ග්‍රෑම් 20 දිය කර ගනිමිනි. තැම්බූ ඉඟුරු සිහින්ව පෙති කපා බර ග්රෑම් 500 ට ලුණු ග්‍රෑම් 50ක් හා විනාකිරි මිලිලීටර් 25 ක් සිට්‍රික් අම්ලය ග්රෑම් 2ක් යොදා හොඳින් අඹරා ගන්න. මේ සඳහා පල්පර මැෂින් එකක් භාවිතයෙන් ද අඹරා ගත හැකිය. පසුව ජීවානුහරණය කළ සුදුසු බෝතල්වල අසුරාගන්න. බෝතල් ද්විත්ව තාපනයට (double boiling) ලක් කොට විනාඩි 10ක් 15ක් පමණ තබා ඇසිරීමෙන් කල් තබා ගැනීමේ කාලසීමාව දික් කර ගත හැකි වේ.

වීදුරු බෝතල් ජීවානුහරණය කිරීම සඳහා නටන ජලයේ විනාඩි 15 ක් තම්බා ගැනීම හෝ අවන් එකක සේල්සියස් අංශක 150 උෂ්ණත්වයේ විනාඩි 10ක් රත් කිරීම සුදුසු වේ.



## ඉඟුරු මිශ්‍ර සුදු ලූනු පල්පය

මේ සඳහා හොඳ ඉල්ලුමක් වෙළෙඳපොළ තුළ පවතී. ගලවන ලද ඉඟුරුවල පස් ඉවත් කර මුල් කැපිය යුතුය. ඉන්පසු පස් හා අපද්‍රව්‍ය ඉවත් වන තුරු හොඳින් අතුල්ලා සෝදන්න. පසුව ජලය බේරී ඉවත් වන ලෙස පවනේ වියළා ගන්න.

සෝදා ගත් ඉඟුරු පැය 12 ක් වතුරේ ගිල්වා තබන්න. එවිට පොතු ඉවත් කිරීම පහසු වේ. පොතු ඉවත් කරන යන්ත්‍රය හෝ උණ පතුරක් භාවිතයෙන් හෝ පොතු ඉවත් කරන්න. ඉන්පසු එම ඉඟුරු සෝදා ගන්න. මෙහිදී කිසිවිටෙකත් යකඩ මිශ්‍ර උපකරණ ඉඟුරු පොතු ඉවත් කිරීමට යොදා නොගත යුතුය. පිහියක් යොදා ගනී නම් සුදු යකඩවලින් තැනූ පිහියක් විය යුතුය.

සුදු ලූනු ද පොතු ඉවත් කර හොඳින් සෝදන්න.

ඉන්පසු ඉඟුරු 2% සිට්‍රික් අම්ල ද්‍රාවණයක ගිල්වා තම්බා ගන්න. 2% සිට්‍රික් අම්ල ද්‍රාවණය සාදා ගන්නේ ජලය ලීටර් 1කට සිට්‍රික් අම්ලය ග්රෑම් 20ක් දිය කර ගනිමිනි. තැම්බූ ඉඟුරු සිහින්ව පෙති කපා බර ග්රෑම් 300 ට සුදු ලූනු ග්රෑම් 200ක්, ලුණු ග්රෑම් 50ක් හා විනාකිරි මිලිලීටර් 25 ක්, සිට්‍රික් අම්ලය ග්‍රෑම් 2ක් යොදා හොඳින් අඹරා පල්පයක් සකස් කර ගන්න. පසුව ජීවානුහරණය කළ සුදුසු බෝතල්වල අසුරා ගන්න. ඉන්පසු නිෂ්පාදනය ශීතකරණයක ගබඩා කොට මාස 3ක 6ක් පමණ කාලයක් තබා ගත හැකිය.

ව්‍යාපාරයක් ලෙස කෙනෙක් මෙය සිදු කරයි නම් අනුමත කල් තබා ගැනීමේ ද්‍රව්‍යයක් භාවිත කළ හැකිය.

මෙහිදී ඉඟුරු කිලෝග්රෑම් 1කට සෝඩියම් මෙටා බයි සල්පයිට් මිලි ග්‍රෑම් 150 දමනු ලැබේ. බෝතල් හා අසුරන කෝප්ප 4% සෝඩියම් මෙටා බයි සල්පයිට් ද්‍රාවණයකින් සෝදා ඇසිරීම වඩා සුදුසුය.

**එම්. කිර්තිරත්න**
**උපදෙස් -**
**තුෂාරි ලියනගේ**
**සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ)**
**පසු අස්වනු තාක්ෂණ අංශය**







# සොසේජ් එකක් ඇතුළේ සමබල ආහාර වේලක්



කොස්, පොළොස් කිවුවම ශ්‍රී ලංකාවේ විතරක් නෙමෙයි මේ වෙනකොට ලෝකයේ බොහෝ රටවල ජනතාව ආහාරයට ගන්න කැමතිම කෑමක්. කොස්වලින් විවිධ කෑම වර්ග එහෙමත් හදන නිසා විශේෂයෙන් ඒ සඳහා කැමැත්තක් දක්වනවා. ගමේ, නගරයේ ඕනෑම තැනක දානෙ ගෙයකදි වගේම මංගල කටයුත්තකදීත් පොළොස් මාළුව නම් වරදින්නේ නෑ. නිර්මාංස ජීවිතයකට හුරුපුරුදු වුණ අයට නැතිවම බැරි දෙයක් තමයි පොළොස් මාළුව. පොළොස් කියන්නේ රසවත් මෙන්ම ඉතාම පෝෂ්‍යදායක ආහාරයක්. මේ නිසාමයි කිරි දෙන දරුවන් ඉන්න අම්මලාට වැඩිපුරම පොළොස් ආහාරයට දෙන්නේ. මෙතරම් ගුණදායක පොළොස් දරුවන් සඳහාත් අලුත්ම ආකාරයට සකසා දෙන්නට ඇරැව්වල පන්නිපිටියේ නිලූෂිකා උදයංගනී මුණසිංහ සමත් වී සිටිනවා.

**● දරුවන් සඳහා සුවිශේෂී ආකාරයට ඔබ පොළොස් සකස් කරන්නේ කොහොම ද?**

දරුවන්ට පොළොස් කවන්න අමාරුයි වගේම වර්තමානයේ ඉන්න අම්මලා, තාත්තලාට පොළොස් ගෙඩියක් කපලා සුද්ධ කරලා උයන්න දන්නෙත් නැහැ. ඒවගේම ඒ වැඩේට ඒ අය කම්මැළියි. අනෙක ගොඩක් කාන්තාවන් කාර්යබහුල නිසා වෙලාවකුත් නැහැ. විශේෂයෙන් නාගරිකව ජීවත්වන අයට මේ සඳහා කාලයක් නැහැ. මේ නිසා දරුවන්ට පොළොස් ආහාරය සඳහා එක්කර ගැනීමේ අවස්ථාව මඟහැරී තිබෙනවා. එයින් ලැබෙන පෝෂණය දරුවන්ට ලැබෙන්නේ නැහැ. මේ නිසා මම කල්පනා කළා දරුවන්ට පොළොස් කැවීමේ අලුත් ක්‍රමයක් ගැන. හැම දරුවෙක්ම සොසේජස් කන්න කැමතියි. මේ නිසා මම පොළොස්වලින් සොසේජස් හදනවා. මෙතනදී මම පොළොස් සමඟ දරුවන්ට සමබල ආහාර වේලක් ලබා දෙනවා.

**● සොසේජස් එකකින් ඔබ කොහොමද සමබල ආහාර වේලක් දෙන්නේ?**

මේ සඳහා මම පොළොස් සමඟ සහල්, ධාන්‍ය වර්ග, කොස් ඇට පිටි සහ පලා වර්ගත් එකතු කරනවා. මේ සඳහා රතු තම්පලා තමයි ගොඩක් භාවිත කරන්නේ. රතු තම්පලා සැපයුම මදි වුණොත් ඒ වෙනුවට මම ගොටුකොළ යොදා ගන්නවා. එහෙම බැලුවාම එතන පොළොස්, සහල්, ධාන්‍ය, පලා කොළ වගේම තෙල් දාන නිසා මේදයත් එකතු වී සමබල ආහාර වේලක් හැදෙනවා. දරුවකුට සොසේජස් කරල් 3, 4ක් කෑවාම බත් කන්න ඕනත් නෑ.

**● මේ සඳහා රස එක් කරන්නේ කොහොම ද?**

කෘත්‍රිම රසකාරක කිසිවක් යොදන්නේ නැහැ. ස්වාභාවික පහේ වර්ගවලින් තමයි මේ සොසේජ් එක රස ගන්වන්නේ. එනසාල්, කරාබු නැටි, සැල්දරි කොළ, කුරුඳුපොතු, සුදු ලූනුත් එක් කරනවා. මේ සඳහා කල් තබාගන්නා ද්‍රව්‍ය කිසිවක් එක් කරන්නෙත් නැහැ. මෙහි විශේෂත්වය එයයි.

**● ඔබ කියූ සැම දෙයක්ම එක්කරලා සොසේජ් එකක් සකස් කරන ආකාරය ගැනත් පැහැදිලි කළොත්?**

දැනට මා ළඟ ලොකු මැෂින් නැහැ. සොසේජස්වලට අවශ්‍ය සියලු දේම ඇඹරුම් යන්ත්‍රයෙන් අඹරා ගන්නවා. දැනට මම මේ මිශ්‍රණය ඔතන්නේ කෙසෙල් කොළවල. ඉන්පසු හුමාලයෙන් තම්බා ගෙන අධි ශීතකරණයේ තබනවා. මේවාත් අනෙක් සොසේජස් වගේම ගැඹුරු තෙලේ බැදගෙන ආහාරයට ගන්න පුළුවන්.





නිලූෂිකා උදයංගනී මුණසිංහ

**● සාමාන්‍ය පොළොස් ගෙඩියකින් සොසේජස් කොපමණ ප්‍රමාණයක් හදන්න පුළුවන් ද?**

සාමාන්‍යයෙන් පොළොස් ගෙඩියකින් සොසේජස් 100ක් හදන්න පුළුවන්. මේ සඳහා තව බොහෝ දේවල් එකතුවෙන නිසා මෙපමණ ප්‍රමාණයක් සාදා ගත හැකියි.

**● දරුවන් පමණක් නොවෙයි නිර්මාංශ අයත් මේ අලුත් ආහාරයට කැමැත්තක් දක්වනව ද?**

ඔව්. නිර්මාංස අය විශේෂයෙන් මේකට කැමතියි. මම මේකට සොසේජස් කියන්නෙත් නැහැ. පොළොස් ගොල්ගි කියලයි කියන්නේ.

**● මේ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඔබ සපයා ගන්නේ කොහොම ද?**

මතුගම මගේ උපන් ගමයි. එම ප්‍රදේශයේ මට සැපයුම්කරුවන් පිරිසක් සිටිනවා. මම මේ සඳහා තෝරා ගත්තේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා සිටි දැන් පුනරුත්ථාපනය වී සිටින තරුණ පිරිසක්. ඒ අයට රැකියා දෙන්න කවුරුත් කැමති නැහැ. ඒ අය සමාජයෙන් කොන් වී සිටිනවා. මම ඒ අයට කරන උදව්වක් විදියට ඒ අය ලවා පොළොස්, කොස් ඇට, පලා වර්ග ගෙන්වා ගන්නවා. ඒ වගේම වෙළෙඳපොළේ තිබෙන මිලට වඩා වැඩි මිලක් මම ඒ අයට ගෙවනවා.

**● පොළොස් ගොල්ගි සඳහා වැඩි ඉල්ලුමක් තිබෙන්නේ කාගෙන් ද?**

මෙය මම තවම වෙළෙඳපොළට ඉදිරිපත් කරලා නැහැ. දැනට මේ ප්‍රදේශයේ වෛද්‍යවරු, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, ප්‍රධාන සෞඛ්‍ය නිලධාරි ඇතුළු පිරිසක්, පාසලේ ගුරුවරු වගේම ගර්භිණී මව්වරුන්ගෙන් මට ඇණවුම් ලැබෙනවා. මේ පිරිසගෙන් කටින් කට ගොස් මට ඇණවුම් වැඩි වී තිබෙනවා.

**● මේ සඳහා ලැබෙන ප්‍රතිචාර කොහොම ද?**

හැමෝම මෙය හොඳයි කියනවා. පොළොස්වලට හොඳ ආදේශකයක් වගේම රසකාරක මොනවත් නැති සියයට සියයක්ම ස්වාභාවික නිසා ගොඩක් අය කැමතියි. දරුවනුත් කැමතියි. මෙහි රසයේ වෙනසක් දැනෙන්නේ නැහැ.

**● ඔබ තවමත් මේ අලුත් සොසේජ් එක වෙළෙඳපොළට දැම්මෙ නැත්තේ ඇයි?**

මේ සඳහා අවශ්‍ය කේසිං එක තවම ලැබී නැහැ. ඒ රෝලෙන් සොසේජස් 2000ක් පමණ හදන්න ඕනෑ. එපමණ ප්‍රමාණයක් රඳවා තබා ගන්න අධි ශීතකරණ පහසුකම් මට තවම නැහැ. වෙළෙඳපොළට යැවීමේදීත් අධි ශීතකරණ පහසුකම තිබෙන්න ඕනෑ. විශාල අමුද්‍රව්‍ය ප්‍රමාණයක් අඹරා ගැනීමේ පහසුකමත් දැනට මට නැහැ. ඒ සඳහා සෞරිං මැෂින් එකක්, ස්ටීම් කරන මැෂින් එකක්, ස්ටීම් කබඩ් එකක් වීනෙන් ඇණවුම් කළා. ඒවා අප්‍රේල් මාසයේ මට ලැබේවි. ඒ වගේම තත්ත්ව සහතිකයත්, බාර්කෝඩ් එකත් ලබාගෙනම මේ නිෂ්පාදන වෙළෙඳපොළට දාන්න මම අරමුණු කරගෙන සිටිනවා. මේ සියල්ල සඳහා මම නිෂ්පාදනාගාරයක් මේ වෙනකොට හදමින් පවතිනවා. මේ මාසයේ 15 වෙනකොට එහි වැඩ නිම වේවි.

**● ඔබ ඉදිරියේදී පොළොස්වලින් තවත් දේවල් හදන්න බලාපොරොත්තු වෙනව ද?**

පොළොස් ඩ්‍රම්ස්ටික්, කැවුම් සහ බයිට් වර්ගත් හදන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ වගේම දරුවන් සඳහා පොළොස් සෝස් එකකුත් හදන්න සැලසුම් කර තිබෙනවා. ඒවගේම තැඹිලි සහ කුරුම්බා වතුර ටින් කරලා විදෙස් වෙළෙඳපොළට යවන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා බදු පදනම යටතේ රජයෙන් ඉඩමක් ඉල්ලුම් කළා. කාබනික පොහොර දාලා වගා කරලා එයත් ළඟදීම ආරම්භ කරනවා.

පොළොස් සොසේජස් පිළිබඳව හෝ ඒ සම්බන්ධ තාක්ෂණික දැනුම හෝ ලබාගැනීමට අවශ්‍ය ඕනෑම කෙනෙකුට kawumkokis.com@gmail.com ඊමේල් ලිපිනය ඔස්සේ නිලූෂිකා උදයංගනී මුණසිංහ සමඟ සම්බන්ධ විය හැකියි.

චතුමී පිටිපන

2021 මාර්තු 10 කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.